320 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 320 - இல. 05
Volume 320 - No. 05

2025 ජූලි 23වන බදාදා
2025 யூலை 23, புதன்கிழமை
Wednesday, 23rd July, 2025

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

කථානායකතුමාගේ සහතිකය [තීරුව 717]

ජාතික විගණන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 717]

ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් නගන ලද චෝදනා පිළිබඳව විමර්ශන හා පරීක්ෂණ කර වාර්තා කිරීම සඳහා 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 06 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කමිටුවේ අවසන් වාර්තාව සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි පියවර [තීරුව 718]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 723-772]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

SVAT ක්‍රමයේ සිට යෝජිත VAT ආපසු ගෙවීමේ ක්‍රමයට පරිවර්තනය වීමේදී ඇතිවන බලපෑම [තීරුව 776]

කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රමාදය [තීරුව 782]

වී මිලදී ගැනීම සහ සහල් ආනයනය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති:

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 784]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු වරුණ ලියනගේ මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 790]

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 791-892]

කල් තැබීමේ ප්‍රශ්න [තීරු 892-900]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

சபாநாயகரது சான்றுரை [ப: 717]

தேசிய கணக்காய்வு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 717]

திரு. ரி.எம்.டபிள்யூ. தேசபந்து தென்னகோன் அவர்களைப் பொலிசுப் பரிசோதகர் தலைமையதிபதி பதவியிலிருந்து அகற்றுமாறு கோரும் குற்றச்சாட்டுகளுக்கான காரணங்கள் தொடர்பில் புலனாய்வு மற்றும் விசாரணை செய்து அறிக்கையிடுவதற்காக 2002ஆம் ஆண்டின் 05ஆம் இலக்க, அலுவலர்களை அகற்றுதல் (நடவடிக்கைமுறை) சட்டத்தின் 06ஆம் பிரிவின்கீழ் நியமிக்கப்பட்ட விசாரணைக் குழுவின் இறுதி அறிக்கை தொடர்பில் எடுக்கவேண்டிய அடுத்த கட்ட நடவடிக்கைகள் [ப: 718]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 723-772]

தனி அறிவித்தல் மூல வினா:

SVAT முறையிலிருந்து VAT திருப்பிச் செலுத்தும் முறை எனும் மாற்றத்தின் விளைவுகள் [ப: 776]

காங்கேசன்துறை துறைமுகத்தைப் புனரமைப்பதில் தாமதம் [ப: 782]

நெல் கொள்வனவு மற்றும் அரிசி இறக்குமதி தொடர்பான அரசாங்கத்தின் கொள்கைகள்:

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 784]

தனி உறுப்பினர் சட்டமூலங்கள்:

கோதாகொட குணரதன நாஹிமி மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு வருண லியனகே] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 790]

கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 791-892]

ஒத்திவைப்பு வினாக்கள் [ப: 892 - 900]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
- Speaker's Certificate [Col. 717]
- National Audit (Amendment) Bill: Petition to the Supreme Court [Col. 717]
- Future Steps to be Taken on the Final Report of the Committee of Inquiry Appointed in Terms of Section 06 of the Removal of Officers (Procedure) Act, No. 5 of 2002 to Investigate and Inquire into the Alleged Grounds on which the Removal of Mr. T.M.W. Deshabandu Tennakoon from the Office of the IGP has been Sought [Col.718]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 723-772]

QUESTION BY PRIVATE NOTICE:
- Effects of Transition from SVAT System to VAT Refund System [Col. 776]
- Delay in Renovating Kankesanthurai Port [Col. 782]

GOVERNMENT POLICIES ON PURCHASE OF PADDY AND IMPORT OF RICE:
- Statement by Minister of Trade, Commerce, Food Security and Co-operative Development [Col.784]

PRIVATE MEMBERS' BILLS:
- Kodhagoda Gunarathana Nahimi Foundation (Incorporation) – [The Hon. Waruna Liyanage] – Read the First time [Col. 790]

COMPANIES (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed as amended [Cols. 791-892]

ADJOURNMENT QUESTIONS [Cols. 892-900]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 ජූලි 23වන බදාදා
2025 யூலை 23, புதன்கிழமை
Wednesday 23rd July, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් 2025 ජූලි 23 දින "සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන), සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) සහ සේවකයන්ගේ ජාතික අවම වේතනය)සංශෝධන) "නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

II

ජාතික විගණන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
தேசிய கணக்காய்வு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
NATIONAL AUDIT (AMENDMENT) BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ජාතික විගණන (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

III

ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් නගන ලද චෝදනා පිළිබඳව විමර්ශන හා පරීක්ෂණ කර වාර්තා කිරීම සඳහා 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 06 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කමිටුවේ අවසන් වාර්තාව සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි පියවර

திரு. ரி.எம்.டபிள்யூ. தேசபந்து தென்னகோன் அவர்களைப் பொலிசுப் பரிசோதகர் தலைமையதிபதி பதவியிலிருந்து அகற்றுமாறு கோரும் குற்றச்சாட்டுகளுக்கான காரணங்கள் தொடர்பில் புலனாய்வு மற்றும் விசாரணை செய்து அறிக்கையிடுவதற்காக 2002ஆம் ஆண்டின் 05ஆம் இலக்க, அலுவலர்களை அகற்றுதல் (நடவடிக்கைமுறை) சட்டத்தின் 06ஆம் பிரிவின்கீழ் நியமிக்கப்பட்ட விசாரணைக் குழுவின் இறுதி அறிக்கை தொடர்பில் எடுக்கவேண்டிய அடுத்த கட்ட நடவடிக்கைகள்

FUTURE STEPS TO BE TAKEN ON THE FINAL REPORT OF THE COMMITTEE OF INQUIRY APPOINTED IN TERMS OF SECTION 06 OF THE REMOVAL OF OFFICERS (PROCEDURE) ACT, No. 5 OF 2002 TO INVESTIGATE AND INQUIRE INTO THE ALLEGED GROUNDS ON WHICH THE REMOVAL OF MR. T.M.W. DESHABANDU TENNAKOON FROM THE OFFICE OF THE IGP HAS BEEN SOUGHT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 ජූලි 22 වැනි දින සභාගත කරන ලද, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) සහ 3 (ඉ) වගන්ති ප්‍රකාරව, පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් සිදු කරන ලදැයි චෝදිත විෂමාචාර ක්‍රියා සහ/හෝ ධුරයේ බලතල බරපතළ අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමේ ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශනය කර එහි සොයා ගැනීම් වාර්තා කිරීම සඳහා එකී පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව පත්කරන ලද පරීක්ෂණ කමිටුවේ වාර්තාව සම්බන්ධව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව මෙම සභාවට පැහැදිලි කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව, 2025 ජූලි 22 වැනි දින සභාගත කරන ලද මෙම වාර්තාවේ මෘදු පිටපත ඉංග්‍රීසි භාෂාවෙන් එදිනම පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි උඩුගත කිරීමට කටයුතු කරනු ලැබ ඇත.

තවද, 2025 ජූලි 22 වැනි දින මෙම සභාවේ දී ලද අවසරය ප්‍රකාරව මෙම වාර්තාව මුද්‍රණය කිරීමෙන් පසු මෙම ගරු සභාවේ මන්ත්‍රීවරයන්ගේ පරිශීලනය සඳහා බෙදාහැරීමට කටයුතු කරනු ලැබේ.

මෙම වාර්තාව අනුව, පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා වරදකරු බවට තීරණය වී ඇති බැවින්, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව ඒ මහතා ධුරයෙන් ඉවත් කිරීම සඳහා වන යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කිරීමට ඉන් අනතුරුව කටයුතු කරනු ලැබේ.

[ගරු කථානායකතුමා]

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 ප්‍රකාරව පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කිරීමෙන් සම්පූර්ණ දින 5ක් ගත වූ පසු මෙම යෝජනා සම්මතය පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලබන අතර, ඒ සම්බන්ධව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන දිනයක දී විවාදයට ගත හැකි වේ.

පාර්ලිමේන්තුවේ (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් බහුතරයක් මන්ත්‍රීවරයන් මෙම යෝජනා සම්මතයට පක්ෂව ඡන්දය දුනහොත්, එකී පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව ඒ මහතා අප්‍රමාදව ධුරයෙන් ඉවත් කිරීම සඳහා ගරු ජනාධිපතිවරයා දැනුවත් කරනු ලැබේ.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ඔබතුමා ප්‍රකාශ කළා මෙම සභාවේ මන්ත්‍රීවරයන්ගේ පරිශීලනය සඳහා මෙම වාර්තාව මුද්‍රණය කරනවා කියලා. අපි විශ්වාස කරනවා, එය භාෂා තුනෙන්ම මුද්‍රණය කිරීමට ඔබතුමා අවසර දෙයි කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එය භාෂා තුනෙන්ම මුද්‍රණය කිරීමට අවසරය ලබා දී තිබෙනවා.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Annual Report of the Lady Lochore Loan Fund for the year 2023;

(ii) Annual Report of the Sri Lanka Accounting and Auditing Standards Monitoring Board for the year 2023; and

(iii) Annual Performance Report of the Inland Revenue Department for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Order made by the Minister of Finance, Planning and Economic Development under Section 22 of the Foreign Exchange Act, No. 12 of 2017 and published in Gazette Extraordinary No. 2441/14 of 18th June, 2025.

I move that this Order be referred to the Committee on Public Finance.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(ii) 2024 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2024 වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(v) 2024 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා කම්කරු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, කෝට්ටේ, ඇතුල්කෝට්ටේ, අංගම්පිටිය පාර, අංක 50/5 දරන ස්ථානයෙහි පදිංචි පී.ටී. ජයවර්ධන මහතාගෙන් සහ අදාළ පාර්ශ්වවලින් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රත්න ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) තංගල්ල, ඇන්නපිටිය පාර, අංක 66/1 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ජී.පී. ඉන්ද්‍රදේව මහතාගෙන් ලැබුණු පෙත්සම;
(2) තිස්සමහාරාම, පුංචි පාලම, මෝල්කැපූ පතාන, "හංසි" යන ලිපිනයෙහි පදිංචි ඒ.ජේ. පියුමි නිමාෂා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;
(3) අම්බලන්තොට, පලුගහගොඩැල්ල යන ලිපිනයෙහි පදිංචි එස්.ඒ. දයාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ
(4) බරවකුඹුක, වැටිය, "චතුවිලා" අංක 79/බී දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ජී.එම්.එම්.එන්. ලක්ෂිත මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) රත්නපුර, දොඩම්පේ, කුරුගම්මෝදර යන ලිපිනයෙහි පදිංචි හත්තැල්ල විදානෙලාගේ රෝහිනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;
(2) රත්නපුර, ඉහළ හකමුව, ජයමිණි බෝධිය යන ලිපිනයෙහි වැඩවාසය කරන පූජ්‍ය කළුකොඳයාවේ ධම්මරතන හිමිගෙන් ලැබුණු පෙත්සම; සහ
(3) කුරුවිට, තෙප්පනාව, කළුකැලේ, අංක 282/21සී දරන ස්ථානයෙහි පදිංචි එම්.ඩී. නිලන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්කම් ඉල්යාස් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු චානක මාදුගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -517/2025- (3), ගරු හර්ෂණ රාජකරුණා මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -630/2025- (1), ගරු රෝහිත අබේගුණවර්ධන මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රතිසංස්කරණය කරන ලද ජලාශ සහ වැව්: කුරුණෑගල දිස්ත්‍රික්කය
புனரமைக்கப்பட்ட குளங்கள் மற்றும் நீர்த்தேக்கங்கள்: குருநாகல் மாவட்டம்
RESERVOIRS AND TANKS RESTORED : KURUNEGALA DISTRICT

794/2025

3. ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජලාශ, මහා පරිමාණ වැව් හා සුළු පරිමාණ වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති ඉහත වැව් සහ ජලාශ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒවා අතරින් පසුගිය වර්ෂ දහය (10) තුළ පිළිසකර කරන ලද සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒවා පිළිසකර කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) "සාර්ප්" නමින් වාරි ව්‍යාපෘතියක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ පිළිසකර කරන ලද වාරි ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) "සාර්ප්" ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සම්පාදනය කර ගත් ආකාරය කවරේද;

(v) සම්පාදනය කර ගත් මුළු ප්‍රතිපාදනය කොපමණද;

(vi) ඒ අතරින් කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය කොපමණද;

(vii) එම ව්‍යාපෘතිය යටතේ වැවක පිළිසකර කරන ලද අංග කවරේද;

(viii) එම ව්‍යාපෘතිය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள நீர்த்தேக்கங்கள், பெரிய அளவிலான குளங்கள் மற்றும் சிறிய அளவிலான குளங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) குருநாகல் மாவட்டத்திலுள்ள மேற்படி குளங்கள் மற்றும் நீர்த்தேக்கங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அவற்றில், கடந்த பத்து (10) வருடங்களில் புனரமைக்கப்பட்ட எண்ணிக்கை ஒவ்வொரு வருடத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அவற்றைப் புனரமைப்பதற்காகச் செயற்படுத்தப்பட்ட கருத்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையில் 'சார்ப்' என்ற பெயரில் நீர்ப்பாசனத் திட்டமொன்று முன்னெடுக்கப்படுகின்றதா என்பதையும்;

(ii) அந்தக் கருத்திட்டத்தின்கீழ் புனரமைக்கப்பட்ட நீர்ப்பாசனத் திட்டங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) 'சார்ப்' கருத்திட்டம் குருநாகல் மாவட்டத்தில் நடைமுறைப்படுத்தப்பட்டதா என்பதையும்;

(iv) அந்தக் கருத்திட்டத்துக்கான நிதி ஒதுக்கீடுகள் பெற்றுக்கொள்ளப்பட்ட முறை யாது என்பதையும்;

(v) பெற்றுக்கொள்ளப்பட்ட மொத்த நிதி ஒதுக்கீடு யாது என்பதையும்;

(vi) அவற்றில் குருநாகல் மாவட்டத்துக்கென ஒதுக்கப்பட்ட நிதி ஒதுக்கீடு எவ்வளவு என்பதையும்;

(vii) அந்தக் கருத்திட்டத்தின்கீழ் குளமொன்றில் புனரமைக்கப்பட்டுள்ள பாகங்கள் யாவை என்பதையும்;

(viii) அந்தக் கருத்திட்டம் தற்போது நடைமுறையில் உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the number of reservoirs, large-scale tanks, and small-scale tanks in Sri Lanka, separately;

(ii) the number of such tanks and reservoirs in the Kurunegala District, separately;

(iii) the number of tanks and reservoirs that have been restored, out of them in each year during the last ten (10) years, separately; and

(iv) the projects that were implemented to restore the said tanks?

(b) Will he also inform this House -

(i) whether an irrigation project known as 'SARP' is underway in Sri Lanka;

(ii) the number of irrigation projects that have been restored under the above project;

(iii) whether the 'SARP' project was implemented in the Kurunegala District;

(iv) the manner in which provisions were obtained for the said project;

(v) the total amount of provisions obtained accordingly;

(vi) the allocation made for the Kurunegala District, out of them;

(vii) the parts of a tank that have been restored under the project concerned; and

(viii) whether the project is currently underway?

(c) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

	ජලාශ	මහා පරිමාණ/මධ්‍යම පරිමාණ වැව්	සුළු පරිමාණ වැව්
වාරිමාර්ග දෙපාර්මේන්තුව	-	241	-
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	-	-	15,958
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	22	654	-

(ii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ කුරුණෑගල කලාපය ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාස පහක් යටතේ පාලනය වන අතර, කුරුණෑගල කලාපයේ පිහිටි වැව් හා ජලාශ සංඛ්‍යාව පහත පරිදි වේ.

ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසය	මහා පරිමාණ වැව්/ජලාශ	මධ්‍යම පරිමාණ වැව්/ ජලාශ
හිරියාල	03	02
නිකවැරටිය	02	01
වාරියපොල	01	00
කටුගම්පොල	00	03
ගල්ගමුව	03	04
එකතුව	09	10

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ සුළුවාරි වැව් 5,733කි.

(iii) පසුගිය වර්ෂ කිහිපය තුළදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත ලැබුණු ප්‍රතිපාදන මඟින් හා ව්‍යාපෘති මඟින් ලැබුණු ප්‍රතිපාදන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ප්‍රතිසංස්කරණය කළ වැව් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වර්ෂය	වැය ශීර්ෂය/ ව්‍යාපෘතිය	ප්‍රතිසංස්කරණය කරන ලද වැව්/ ජලාශ සංඛ්‍යාව	වැව්/ ජලාශයේ නම
2021-2023	වාරි සෞභාග්‍යා වැඩසටහන	01	බතලේගොඩ වැව
2023	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂ	08	උස්ගල සියඹලාගමුව වැව දැදුරු ඔය ජලාශය මාගල්ල වැව මාකඳුර වැව ජය වැව (පාලුකඩවල වැව) බතලේගොඩ වැව කිනියම වැව අත්තරගල්ල වැව
2024	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා වාරිමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂ		උස්ගල සියඹලාගමුව වැව දැදුරු ඔය ජලාශය මැද්දේකැටිය වැව කිඹුල්වානා වැව මාගල්ල වැව මාකඳුර වැව ජය වැව (පාලුකඩවල වැව) බතලේගොඩ වැව හක්වටුනා ඔය හුලුගල්ල වැව මසුරන්කොට්ටේ වැව කිනියම වැව මැඩියාව වැව අත්තරගල්ල වැව මහ ගල්ගමුව වැව අබකොල වැව
2024	IWWRMP	01	මහනාන්නේරිය වැව

2025 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත ලැබුණු ප්‍රතිපාදන මඟින් මේ වන විටත් කුරුණෑගල කලාපය තුළ සිදු කරන ප්‍රතිසංස්කරණ කටයුතු පහත දක්වා ඇත.

වැය ශීර්ෂ / ව්‍යාපෘතිය	වැව / ජලාශයේ නම	සිදු කරන සංවර්ධන කාර්යයන්
වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ශීර්ෂ	මාගල්ල වැව	දකුණු සොරොව්ව අසල ජල කාන්දුව අලුත්වැඩියාව
	මැඩියාව වැව	පිටවාන් නිර්මිතය නවීකරණය
	අත්තරගල්ල වැව	වැව් බැම්ම ප්‍රතිසංස්කරණය

[ගරු සුසිල් රණසිංහ මහතා]

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වැව් අතුරින් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පසුගිය වසර 10 ඇතුළත පිළිසකර කරන ලද වැව් සංඛ්‍යාව:

වර්ෂය	පිළිසකර කරන ලද වැව් සංඛ්‍යාව
2015	00
2016	00
2017	161
2018	186
2019	172
2020	309
2021	159
2022	06
2023	107
2024	143

(iv) වාර්ෂිකව දෙපාර්තමේන්තු වැය ශීර්ෂ හා අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ ලැබෙන ප්‍රතිපාදන මඟින් සහ වාරි සෞභාග්‍යා වැනි ව්‍යාපෘති යටතේ පසුගිය වසර කිහිපය තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැව්වල අලුත්වැඩියා කටයුතු හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත. තවද, වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය - DSWRPP, දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - CRIP - හා දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩ සටහන් ප්‍රවේශය - CResMPA - වැනි ව්‍යාපෘති හරහාද මහා පරිමාණ හා මධ්‍යම පරිමාණ වැව් නවීකරණ කටයුතු සිදු කර ඇත.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති:

- සුළුවාරි අලුත්වැඩියාව
- ගම සමඟ පිළිසඳරක්
- ග්‍රාමීය එල්ලංගා පද්ධති වැඩි දියුණු කිරීම
- ගොවීන්ගේ භාරකාර අරමුදල
- සපිරි ගමක් වැඩසටහන
- වැව් ගම් පුබුදුව
- ගංවතුර හානි අලුත්වැඩියාව
- KICK Start ව්‍යාපෘතිය
- දේශගුණ සුහුරු ව්‍යාපෘතිය
- සම්පත් බැංකු ව්‍යාපෘති
- රොන්මඩ ඉවත් කිරීම
- SLCDF
- SARP
- World Vision
- SAPP

(ආ) (i) ඔව්, 2023 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක වෙමින් පවතී.

(ii) වාරි ව්‍යාපෘති 100ක් ක්‍රියාත්මක කිරීම තමයි "සාර්ප්" ව්‍යාපෘතියේ අරමුණ.

(iii) ඔව්, (වැව් 14ක වැඩ අවසන්. දෙවන අදියර යටතේ වාරි ව්‍යාපෘති 05ක් ක්‍රියාත්මක වෙමින් පවතී.)

(iv) IFAD (International Fund for Agricultural Development)

(v) රුපියල් මිලියන 1,349කි.

(vi) රුපියල් මිලියන 290කි.

(vii)
- වැව් බැම්ම ප්‍රතිසංස්කරණය
- වාන ප්‍රතිසංස්කරණය
- සොරොව්ව ප්‍රතිසංස්කරණය
- වේලි පද්ධති ප්‍රතිසංස්කරණය හා කොන්ක්‍රීට් කිරීම
- යටිගහ සංවර්ධනය හා අනෙකුත් ව්‍යුහ සැකසීම
- ට්‍රැක්ටර් පැන්නුම් හා ජල හැරවුම් සකස් කිරීම
- වැව් පිටිය පිරිසිදු කිරීම හා කට්ටකඩුව සලකුණු කිරීම

(viii) ඔව්.

(ඇ) අදාළ නොවේ.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ "සාර්ප්" ව්‍යාපෘතිය යටතේ ගල්ගමුව මැතිවරණ බල ප්‍රදේශය තුළ වැව් විශාල ප්‍රමාණයක් පිළිසකර කර තිබෙනවා. වැවේ තිබෙනවා, ඉස්මත්ත කියලා එකක්. ඒක සංරක්ෂණය කිරීම සඳහා අලුතින් වන ගහනය ඇති කරන්න උත්සාහ කර තිබෙනවා. පැළ සිටුවීමේ ව්‍යාපෘතියකුත් ඇවිත් තිබෙනවා. නමුත්, ප්‍රදේශයේ ඉන්න ජනතාවගෙන් මතු වෙන ප්‍රධාන විවේචනය තමයි, මේ වන ගහනය සඳහා ගස් සිටුවීමේ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක සහ ජනතාව මුළා කරන ව්‍යාපෘතියක් කියන එක. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශය දැනුවත් වීමක් හෝ මූල්‍යමය පැත්තෙන් වෙච්ච විනාශය සම්බන්ධයෙන් යම් විගණනයක්, නැත්නම් පරීක්ෂණයක් සිදු වෙලා තිබෙනවාද කියලා මම දැනගන්න කැමතියි.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, විදේශ ආධාර යටතේ වාරිමාර්ග ව්‍යාපෘති සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘති 11ක් විතර ක්‍රියාත්මක වෙනවා. දළ වශයෙන් ඩොලර් බිලියනයක ආධාර මුදල් යටතේ මේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. වැව් තෝරා ගැනීමේදී සහ ප්‍රතිසංස්කරණය කළ යුත්තේ වැවේ මොන නිර්මිතයද කියන ඒවා සම්බන්ධයෙන් ගොවි සංවිධාන සහ

ජනතාව ප්‍රශ්න කරනවා; අපට යම් යම් දේවල් වාර්තා කරනවා. ඒවා ගැන අපි සොයා බැලීම් කරනවා. අපි රජය භාර ගන්නකොට මේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් තිබුණේ. මේ පිළිබඳව සොයා බලන්න අපේ ගරු ඇමතිතුමා විද්වත් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒක ඉංජිනේරුවරුන්ගෙන් සහ ව්‍යාපෘති සම්බන්ධ අත්දැකීම් බහුල විද්වතුන්ගෙන් යුතු කමිටුවක්. ඒ කමිටුව මඟින් දැනටත් මේ ව්‍යාපෘති සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදු කරමින් තිබෙනවා. මේ ව්‍යාපෘතිවල සිද්ධ වෙලා තිබෙන්නේ මොනවාද, සිද්ධ වෙලා තිබෙන අකටයුතුකම් මොනවාද, අකාර්යක්ෂමතා සිද්ධ වෙලා තිබෙනවාද, මේ ව්‍යාපෘති සාර්ථක කරගන්නේ කොහොමද සහ අපි කොයි ආකාරයෙන්ද ඒවා මෙහෙයවිය යුත්තේ කියන නිර්දේශ මේ සමාලෝචන කමිටුවෙන් අපට ලබන සතියේ ලැබෙනවා. ඒ අනුව අපි ක්‍රියාත්මක වෙන්න බලාපොරොත්තු වෙනවා. මේ නිශ්චිත කාරණය සම්බන්ධයෙන් අපට වාර්තා වෙලා නැහැ. ඒ සම්බන්ධයෙන් සොයා බලන්න පුළුවන් කියලා ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

වැවක් කියන්නේ සාමාන්‍යයෙන් ජන ජීවිතය තුළ ඉතාම වැදගත් ක්ෂේත්‍රයක්, වැදගත් අංගයක්. විශේෂයෙන්ම කුරුණෑගල කියන්නේ වැව් විශාල ප්‍රමාණයක් තිබෙන, ලංකාවේ වැඩිම වැව් සනත්වයක් තිබෙන දිස්ත්‍රික්කයක්. වැවක් ගැඹුරු කර ගැනීම සඳහා විශේෂ තාක්ෂණික ක්‍රියාවලියක් යනවා. නමුත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒ වැව් ගැඹුරු කර ගැනීම හා සම්බන්ධ තාක්ෂණික නිලධාරින්ගේ යම් හිඟයක් තිබෙනවා. වර්තමාන රජය යටතේ "වාරි මහිම අපේ උරුමය" කියලා වාරි ව්‍යාපෘතියක් ආරම්භ වෙලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, 9වැනි මාසයේ 30වැනි දාට පෙර මේ සෑම ව්‍යාපෘතියක්ම අවසන් කරන්න කියලා. නමුත් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි තාක්ෂණික නිලධාරින්ගේ හිඟය. ඒ හින්දා 9වැනි මාසයේ 30වැනි දාට ඉස්සෙල්ලා දැනට මුදල් වෙන් වෙලා තිබෙන වාරි ව්‍යාපෘති අවසන් කර ගැනීම පිළිබඳ ලොකු ගැටලුවක් මතු වෙලා තිබෙනවා. මේ ක්‍රියාවලිය ගොවිජන සේවා මධ්‍යස්ථාන, කුරුණෑගල දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතන තුන හරහා සිද්ධ වෙන්නේ. ඒ නිසා අපට නිශ්චිතව දින වශයෙන් මේ කටයුතු අවසන් වන කාලයක් කියන්න බැහැ. 9වැනි මාසයේ 30වැනි දා දක්වා තිබෙන්නේ ඉතාම කෙටි කාලයක්. මේ තාක්ෂණික ගැටලුව අවසන් කර ගැනීම සඳහා නිශ්චිතව දින වශයෙන් කොපමණ කාලයක් යනවාද කියන එක සම්බන්ධයෙන් මේ ගරු සභාව දැනුවත් කරන්නේද කියන ප්‍රශ්නය මම අහනවා, ගරු කථානායකතුමනි.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරින්ගේ හිඟයක් තිබෙනවා. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ තිබෙන වැව් ප්‍රතිසංස්කරණය කරන්න ගියාම ඒ කටයුත්තට මැදිහත් වෙන්නේ බොහෝ දුරට පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව. කුරුණෑගල දිස්ත්‍රික්කයේ නම්, වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව තේ. ඒ දෙපාර්තමේන්තුවේත් තාක්ෂණික නිලධාරින්ගේ අඩුවක් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ඒක නිසා මේ වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති හරියට ක්‍රියාත්මක කර ගන්න යම් යම් බාධා ඇති වෙලා තිබෙනවා. නමුත් 30,000ක් බඳවා ගන්නවා කියලා රජය දැනටමත් තීරණයක් අරගෙන තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයටත්, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවටත් තාක්ෂණික නිලධාරින් බඳවා ගැනීම සඳහා යම් යම් ප්‍රමාණයන්ගෙන් අනුමැතීන් ලැබිලා තිබෙනවා. අපි වැඩිමනත් විධියට අගමැතිතුමියගේ කාර්යාලයේ තිබෙන සමාලෝචන කමිටුවට වාර්තා කරලා තිබෙනවා, තාක්ෂණික නිලධාරින්ගේ හිඟයක් තිබෙනවා කියලා. ඒ නිසා, එතැනින් තව යම් ප්‍රමාණයක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. විදේශ ආධාර ව්‍යාපෘති සමහර ඒවායින් තාක්ෂණික නිලධාරින් බඳවා ගැනීමට ඔවුන්ට ප්‍රතිපාදන තිබෙනවා. ඒ යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට තාක්ෂණික නිලධාරින් යම් ප්‍රමාණයකට බඳවා ගෙන තිබෙනවා. ඒ බඳවා ගැනීම් සියල්ල කළත් බාධාවක් තිබෙනවා. ඒක පිළිගන්නවා. ඒ සම්බන්ධයෙන් අපි විවිධ විධියට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. නිලධාරින්ගේ හිඟය තිබෙන සමහර තැන්වලට වෙනත් තැන්වලින් නිලධාරින් යොදවමින් තමයි කටයුතු කරන්නේ. කුරුණෑගල දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් සොයා බලනවා කියලා මම ඔබතුමාට පොරොන්දු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

1989.02.08 දින හෝ ඊට ආසන්න දිනකදී ශ්‍රී දළදා මාලිගාවේ ආරක්ෂක නිලධාරින්ට පහර දීම: විස්තර

1989.02.08ஆம் திகதி அல்லது அதற்கு அண்மித்ததொரு தினத்தில் ஸ்ரீ தலதா மாளிகையின் பாதுகாவலர்கள்மீது நடாத்தப்பட்ட தாக்குதல்: விபரம்

ATTACK ON SECURITY PERSONNEL OF SRI DALADA MALIGAWA ON OR AROUND 08.02.1989: DETAILS

805/2025

4. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1989 පෙබරවාරි 08 වන දින හෝ ඊට ආසන්න දිනයක දී බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ බඳු වූ ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින ශ්‍රී දළදා මාළිගයේ ආරක්ෂකයන්ට පහර දීමක් සිදු වූ බව දන්නේද;

(ii) එසේ නම්, එම අවස්ථාවේදී පැහැර ගන්නා ලද අවි ආයුධ, සිදු වූ ශාරීරික හා වෙනත් භෞතික හානි වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පහර දීමට සම්බන්ධ වූ පුද්ගලයන් ජනතා විමුක්ති පෙරමුණට හෝ එහි සන්නද්ධ අංශය වූ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයට සම්බන්ධ බව පොලිස් පරීක්ෂණ අනුව හෙළි වී තිබේද;

(iv) එම පහර දීමට සම්බන්ධ වූ පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(v) ඔවුන්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(vi) එම පහරදීමේ අරමුණ දළදා වහන්සේ පැහැර ගැනීම හෝ විනාශ කිරීම බව විමර්ශන අනුව හෙළි වී තිබේද;

(vii) එම සිද්ධියට අදාළ පොලිස් වාර්තා හා විමර්ශන වාර්තා ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1989 பெப்ருவரி 08ஆம் திகதி அல்லது அதற்கு அண்மித்தவொரு தினத்தில் பௌத்த சமயத்தவர் களின் அதியுயர் பீடமாகிய புனித தந்தம் வைக்கப்பட்டுள்ள ஸ்ரீ தலதா மாளிகையின் பாதுகாவலர்கள்மீது தாக்குதல் நடாத்தப்பட்டது என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அச்சந்தர்ப்பத்தில் பறித்தெடுக்கப் பட்ட ஆயுதங்கள், இடம்பெற்ற உடல் மற்றும் ஏனைய பௌதிக சேதங்கள் ஆகியன வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி தாக்குதலுடன் தொடர்புடைய மக்கள் விடுதலை முன்னணியுடன் அல்லது அதன் ஆயுதக் குழுவாகிய தேசப்பற்றுடைய மக்கள் இயக்கத்துடன் தொடர்புடையவர்களென பொலிஸ் விசாரணைகளின் அடிப்படையில் கண்டறியப்பட்டுள்ளதா என்பதையும்;

(iv) மேற்படி தாக்குதலுடன் தொடர்புடைய நபர்கள் கைதுசெய்யப்பட்டுள்ளனரா என்பதையும்;

(v) அவர்களுக்கெதிராக மேற்கொள்ளப்பட்டுள்ள சட்டரீதியான நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) மேற்படி தாக்குதலின் நோக்கமானது, புனிதத் தந்தத்தை கடத்திச் செல்லுதல் அல்லது அழித்தல் சார்ந்ததாக இருந்ததென விசாரணைகள் ஊடாகக் கண்டறியப்பட்டுள்ளதா என்பதையும்;

(vii) மேற்படி சம்பவம் தொடர்பிலான பொலிஸ் அறிக்கைகள் மற்றும் விசாரணை அறிக்கை களைச் சமர்ப்பிக்க முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that an attack took place on the security personnel of the Sri Dalada Maligawa where the Sacred Tooth Relic, which is the utmost treasure for Buddhists, is enshrined, on or around February 08, 1989;

(ii) if so, separately, the details of the weapons seized, and the bodily injuries and other physical damages caused during the said incident;

(iii) whether it has been discovered through police investigations that the persons involved in the attack were affiliated with the Janatha Vimukthi Peramuna - JVP - or its armed wing, the Deshapremi Janatha Vyaparaya - Patriotic People's Movement;

(iv) whether the persons involved in the attack have been arrested;

(v) the legal actions that have been taken against them;

(vi) whether it has been discovered through investigations that the objective of the said attack was to seize or destroy the Sacred Tooth Relic; and

(vii) whether he will present the police reports and investigation reports relating to that incident?

(b) If not, why?

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)

(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) තොරතුරු නොමැත.

(iii) තොරතුරු නොමැත.

(iv) ඔව්. ශ්‍රී දළදා මාලිගාවේ මුරපොළට පහරදීමට සැලසුම් කළ සැකකරුවන්ට, සැලසුම් කටයුතු සඳහා සහාය වීම හේතුවෙන් ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා සැකපිට සැකකාරියන් 09දෙනෙකු අත්අඩංගුවට ගත් බවට පමණක් තොරතුරු ඇත.

(v) තොරතුරු නොමැත.

(vi) තොරතුරු නොමැත.

(vii) අපරාධ විමර්ශන කටයුතු අවසන් වී අවුරුදු 36කට අධික කාලයක් ගතවී ඇති බැවින් නිශ්චිත තොරතුරු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් වාර්තා නොමැත.

(ආ) පැන නොනඟී.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)

(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, 1989 පෙබරවාරි 8වැනි දින හෝ ඊට ආසන්න දිනයකදී සිදු වුණු මේ ප්‍රහාරයෙන් අනතුරුව, ඒ වාගේම එල්ටීටීඊ සංවිධානය විසින් එල්ල කරපු ප්‍රහාරයෙනුත් පස්සේ විශේෂයෙන්ම මහානායක හිමිවරුන්ටත් පොලිස් ආරක්ෂාව ලබා දුන්නා. ඒ වාගේම, මාලිගාව ඉදිරිපිට තිබුණු වාහන ගමන් ගත් මාර්ගයේ වාහන ධාවනය කිරීම නවත්වා එම මාර්ගය වසා දමන්නටත් කටයුතු කළා.

එදා එතැනදී සිදුවීම් ගණනාවක් සිද්ධ වෙනවා. එතැන කොස්තාපල්වරයෙකුට පිහියෙන් අනිනවා. සාමාන්‍ය පුද්ගලයෙකු ඝාතනය වෙනවා. ඒ වාගේම, ඒ සිද්ධියේදී කකුල අහිමි වෙච්ච පුද්ගලයෙක් අදටත් ලේවැල්ල ප්‍රදේශයේ ජීවත් වෙනවා කියලා නිරංජන් විජේරත්න හිටපු දියවඩන නිලමේතුමා පවසනවා. ඇත්තටම අද සිටින ජීවමාන සාක්ෂිය තමයි එතුමා. එතුමාගෙන් ප්‍රශ්න කළොත් මේ පිළිබඳව වැඩිදුර තොරතුරු -විස්තර- ලබා ගන්න හැකියාව තිබෙනවා.

නමුත්, මම අද මෙතැනදී ප්‍රශ්න කරන්න යන්නේ මෙන්න මේ කාරණයයි. මේ ප්‍රහාරයෙනුත්, එල්ටීටීඊ ප්‍රහාරයෙනුත් පස්සේ වෙනත් ප්‍රහාර සිද්ධ වෙන්න ගියා කියලා කොතැනකදීවත් සඳහන්

වෙන්නේ නැහැ. සහරාන්ගේ පාස්කු ප්‍රහාරය ඇතුළු ඒ ආශ්‍රිත සිද්ධිවලදී මේක සිදු වුණා ද කියන්න මම දන්නේ නැහැ. නමුත්, කුමන කාරණාවක් නිසා හෝ මේ මාලිගාව ඉස්සරහා මාර්ගය වසා තැබීමට කටයුතු කර තිබෙනවා. මේ නිසා අද මහනුවර ප්‍රදේශයේ දැඩි වාහන තදබදයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාහන තදබදය නිසාම මහනුවර නගරය ලංකාවේ වැඩිම පරිසර දූෂණය සිද්ධ වෙන නගරය කියලා පරිසරවේදීන් චෝදනා කරලා තිබෙනවා.

මම අහන ප්‍රශ්නය මේකයි. ඔබතුමන්ලා කියන විධියට දැන් අද වෙනකොට ජාතික ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් නැහැ. එල්ටීටීඊ එකෙනුත්, ජනතා විමුක්ති පෙරමුණෙනුත් එදා දළදා මාලිගාවට ප්‍රහාරයක් එල්ල වුණත්, දැන් ආයෙත් ඒ සියලුදෙනාම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයට ඇවිල්ලා තිබෙනවා. ඒක වෙන්න ඕනෑ. ඒක තමයි හොඳ. ආයෙත් මේ කාලය ඇතුළත කොහොමටත් එහෙම දෙයක් සිදු වෙන්නේ නැති බව අපට විශ්වාස කරන්න පුළුවන්. ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලුවකුත් නැති නිසා දැන් ඔබතුමන්ලා උතුරේ කඳවුරු අයින් කරනවා; පොලිසිය අයින් කරනවා; මහාමාර්ග අරිනවා; කඳවුරු ඉවත් කර ගන්නවා. පාතාලය සුමට ලෙස මර්දනය කිරීමක් කරනවා. පාතාලය අතර සිදු වන හුදෙකලා මරා දැමීම්, මරා ගැනීම් හැරුණුකොට ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලුවකුත් නැහැ කියලා ඔබතුමන්ලා කියනවා. *[බාධා කිරීමක්]* වියුෂන් ගන්නත් ඔබතුමා එන්න කිව්වා, කොළොම්බු කැටයක් හොයා ගන්න බැරි වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අතුරු ප්‍රශ්නය තමයි අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් විනාඩි දෙකක් ගතවුණා. මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අතුරු ප්‍රශ්නය තමයි අහන්නේ, ගරු කථානායකතුමනි. මේ ටික කියන්නේ නැතුව ඒක අහන්න බැහැ. පොඩ්ඩක් අහගෙන ඉන්න, ඔබතුමා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් විනාඩි දෙකක් ගතවුණා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඒ නිසා මම කියන්නේ, - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අහන්න, ඉතින්. දැන් විනාඩි දෙකයි. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
හොඳයි. ඉතින් නිශ්ශබ්ද වෙන්න කියන්න. නිශ්ශබ්ද වුණාම මම ප්‍රශ්නය අහනවා. *[බාධා කිරීම්]* ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් නැති එක ගැන විස්තරයක් කරන එක නරකද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් විනාඩි තුනක් ගතවෙලා තිබෙනවා, අතුරු ප්‍රශ්නයට.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ, දැන් මේ විධියේ තත්ත්වයක් තිබෙද්දී -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්නයට විනාඩි තුනයි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. දැන් මේ මාර්ගය වසා තැබීම නිසා පරිසර දූෂණයක් සිද්ධ වෙන බව ප්‍රකාශ කරනවා. ඒ පිළිබඳව මහා නායක ස්වාමීන් වහන්සේලාත් එක්ක කථා කරගෙන, විකල්ප මාර්ගයක් හැටියට අම්පිටිය ප්‍රදේශයෙන් පේරාදෙණියට මාර්ගයක් සකස් කරන්න කියලා කාලයක් තිස්සේ යෝජනා වුණා. එය නොවෙයි නම්, ඒ තදබදය ඉවත් කරලා පරිසර දූෂණය නැති කරන්නට ඔබතුමන්ලා ගන්නා තීරණයක් තිබෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ප්‍රශ්නය අහන්න. දැන් ඔබතුමිය අතුරු ප්‍රශ්නයට විනාඩි තුනක් ගත්තා .

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, ඇත්තටම ගත්තොත් මේ තදබදය කියන එක ජාතික ආරක්ෂාවට සහ ඔබතුමාටත් අයිති විෂයයක්. එම නිසා ඔබතුමන්ලා මේ සම්බන්ධව යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්නවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, අතුරු ප්‍රශ්නය අහන්න ඔබතුමිය විනාඩි 4ක කාලයක් අරගෙන තිබෙනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අනේ, පොඩ්ඩක් කට වහගෙන අහගෙන ඉන්නකෝ ඔබතුමා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය කාටද කථා කරන්නේ? කාටද කථා කරන්නේ?

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අතුරු ප්‍රශ්නය ඇහුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමිය කාටද කථා කරන්නේ? අතුරු ප්‍රශ්නය අහන්න විනාඩි 4ක කාලයක් ගත්තා. හැදියාවකින් කථා කරන්න, ගරු මන්ත්‍රීතුමිය. *[බාධා කිරීම්]*

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු කථානායකතුමනි, මෙතුමිය හිතනවා නම් මේක ඉස්කෝලේ කියලා, එහෙම නැත්නම් පන්ති කාමරය කියලා, මම හිතනවා, ගුරුවරියකටවත් නොගැළපෙන විධියට තමයි එතුමිය කථා කරන්නේ කියලා. "කට වහගෙන ඉන්න" කියලා ඔබතුමාට කියනවා නම්, මේ සභාවට මූලාසනයක් අවශ්‍ය නැහැ නේ. එහෙම නම් මේ පාර්ලිමේන්තුවට මූලාසනයක් මොකටද?

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය අතුරු ප්‍රශ්නය අහන්න විනාඩි 4ක කාලයක් ගත්තා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
කරුණාකරලා එතුමියට ඒ කථාව ඉල්ලා අස්කර ගන්න කියන්න. *[බාධා කිරීම්]*

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ අතුරු ප්‍රශ්නය මොකක්ද? කරුණාකරලා ඔබතුමියගේ ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අතුරු ප්‍රශ්නය ඇහුවා. ඒකට උත්තර ලබා දීමට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා උත්තර දෙන්න. *[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ඒකට අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මෙතැන වැරදි වෙන්නේ මේ නිසායි. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. ස්ථාවර නියෝග 92. (ආ) යටතේ මේ පාර්ලිමේන්තුවේ කටයුතු බැහැර වන එක මට පහදන්න දෙන්න. කරුණාකරලා ඔබතුමා හැමදාම මගින් නවත්වන්න එපා. *[බාධා කිරීම්]* ඔබතුමා මූලසුන හරියට පාවිච්චි කරන්නේ ආණ්ඩු පක්ෂයට විතරයි. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, වාඩිවෙන්න. *[බාධා කිරීම්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
වාඩිවෙන්න පුටුව තිබෙනවා. ඒක අපි දන්නවා. හැබැයි, ඔබතුමා - *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, පිළිතුර ලබා දෙන්න. *[බාධා කිරීමක්]* ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමා, ඔබතුමා - *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මම ඇහුවේ වහලා තිබෙන පාර ගැන සහ පරිසර දූෂණය ගැන.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, අදාළ ප්‍රශ්නය පැහැදිලි කර ගැනීමටයි අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මගේ අතුරු ප්‍රශ්නය ඒ මුල් ප්‍රශ්නයට අදාළ නැද්ද, ගරු කථානායකතුමනි? ඒ සිද්ධිය නිසායි පාර වැහුවේ. මම අහන්නේ ඒ වහපු පාර පිළිබඳව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, මෙක අහගන්නකෝ. ඔබතුමිය මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය දන්නවා නේ. මට තේරෙන්නේ නැහැ, ඔබතුමිය අතුරු ප්‍රශ්නය අහන විධිය ගැන. මීට කලිනුත් මම පැහැදිලිව කියා තිබෙනවා, අතුරු ප්‍රශ්නයක් ඇසිය යුත්තේ අදාළ මුල් ප්‍රශ්නය තුළින් පැන නඟින යම් කිසි ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහාය කියලා. නමුත්, ඔබතුමිය වෙන දෙයක් අහනවා. ඒක අහන්නත් ඔබතුමිය විනාඩි 4ක් ගන්නවා. ඔබතුමිය මේ කරන්නේ කාලය කා දැමීමක්. ඒකේ තේරුමක් නැහැ. ඔබතුමියගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, ඔබතුමා මම අහපු ප්‍රශ්නය නැවත බලන්න.

ඒ ප්‍රහාර නිසා තමයි ආරක්ෂාව වෙනුවෙන් පාර වැහුවේ. ඒ නිසා ඇති වෙච්ච තත්ත්වයක් නිසා තමයි පාර වැහුවේ. මම කියන්නේ, ඒ පාර වහපු නිසා වාහන වැව රවුම වටේ කැරකෙන නිසා පරිසර දූෂණය සිද්ධ වෙනවා. ඒ නිසා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අර මැක්කාගේ කථාව වාගේ නේ කථා කරන්නේ. *[බාධා කිරීමක්]*

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
පරිසරය දූෂණය වන නිසා විකල්ප මාර්ගයක් සකස් කරන්න යෝජනාවක් තිබුණා. ඒක ක්‍රියාත්මක වෙනවාද කියලා තමයි මම ඇහුවේ. මේ ප්‍රශ්නය අදාළ වෙන්නේ නැත්තේ ඇයි? ඇයි මේක ප්‍රශ්නයක් කර ගන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ප්‍රශ්නය හොඳට කියවාගන්න. ඔබතුමිය අහන ප්‍රශ්නයවත් ඔබතුමිය දන්නේ නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම මේකටම අදාළ ප්‍රශ්නයක් අහන්නේ. ගරු ඇමතිතුමා කිව්වා, අවුරුදු 36ක් ගත වෙලා තිබෙන නිසා මේ සම්බන්ධව තොරතුරු නැහැ කියලා. මා ළඟ මේ සම්බන්ධව තොරතුරු තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මහජන ආරක්ෂක ඇමතිතුමා නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. 1989 පෙබරවාරි 8වැනි දා දළදා මාළිගාවේ මුරපොළවල් පහකට පහරදීලා, T-81 රයිෆල් තුවක්කු 09ක්, T-56 රයිෆල් තුවක්කු 02ක් ඇතුළු ගිනි අවි 17ක් පැහැරගෙන ගිහින් තිබෙනවා. ඒ වාගේම මේකට සම්බන්ධ වෙලා තිබුණු නිසානරංගල සුදලිකාරගේ පත්මා චාන්දනී අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ වාගේම මාතලේ ගංගා, මංගලිකා, නදීකා, ලිලන්ති සහ වීරසිංහ යන අයව අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ වාගේම තිබ්බටුවාවේ ඤාණරතන කියලා හාමුදුරුනමක් තමයි කිරිච්චියක් අරගෙන ගිහිල්ලා නිලමේතුමාගේ බෙල්ලට තියලා තිබෙන්නේ. ඒ වාගේම 1818න් පස්සේ 1989දී තමයි පෙරහැර කරන්න බැරි වුණේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තමයි මේ අහන්නේ, ගරු කථානායකතුමනි. කුඹල් පෙරහැර කරන්න බැරිව දළදා කරඬුව අතේ තියාගෙන තමයි දියවඩන නිලමේතුමා ආවේ. මම හිතනවා, ඔබතුමා පොලිසියේ හිටපු කෙනෙක් විධියටත්,- *[බාධා කිරීමක්]* ඉතින් ඉන්නකෝ. *[බාධා කිරීමක්]* ප්‍රශ්නය අහන්න දෙන්නකෝ. *[බාධා කිරීම්]*

පොලිසියේ හිටපු නිලධාරියෙක් මෙන්ම වර්තමාන මහජන ආරක්ෂක ඇමතිතුමා ද වන ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම අවුරුදු 36කට පසුවත් මේ සම්බන්ධ තොරතුරු තිබෙනවා, ගරු ඇමතිතුමා. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, මේ පිළිබඳව සොයා බලා ඒ තොරතුරු සභාගත කරන්න කටයුතු කරන්න කියලා. මොකද, මේ සම්බන්ධ තොරතුරු එහෙමපිටින්ම තිබෙනවා. ඒවා වාර්තා වෙලාත් තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මේ සම්බන්ධව අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ. එහෙම නැතුව, ප්‍රශ්නයක් විධියට නොවෙයි මම මේ කාරණය ඉදිරිපත් කළේ.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමා, මම මේ සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් දුන්නා. තොරතුරු නොමැති බව පොලිසිය වාර්තා කරලා තිබෙනවා. ඒක තමයි තත්ත්වය. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපේ ළඟ තව ඒවා තිබෙනවා. *[බාධා කිරීමක්]* තොරතුරු ගේන්න. *[බාධා කිරීම්]* ගමගෙදර කරලා තිබෙන්නේ වැඩේ. *[බාධා කිරීම්]* අර ඉන්නේ,- *[බාධා කිරීම්]* ඒකයි දඩබඩගාලා නැඟිටලා කෑ ගැහුවේ. *[බාධා කිරීම්]* තව නැඟිටලා කථාත් කරනවා. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට කිව්වා, මාතලේ මිනී වළ ගැන. ඒකේ මිනී ඇට කටු 140 ගණනක් හම්බවෙලා තිබෙනවා. ඒ මිනීමරුවන්ගේ දූවලා තමයි මෙතැන මේ ඉන්නේ. ඒ නිසා අපි ඒ පිළිබඳව පරීක්ෂණ කරනවා. අද මෙතැන ඉන්න සමහරු පෞද්ගලික වධකාගාර හිමියෝ. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, කාටවත් ආරෝපිත චෝදනා කරන්න බැහැ. ඒක ඔබතුමා දන්නවා. *[බාධා කිරීම්]* නැහැ, ආරෝපිත චෝදනාවක්. මෙතුමා කිව්වා, මේ පෞද්ගලික වධකාගාර තියාගෙන ඉන්න කට්ටිය ලු, මේ ඉස්සරහ ඉන්නේ. අපට කියන්න, ඒ කවුද කියලා. ඒ කවුද කියලා කියන්න. *[බාධා කිරීම්]* ඒ කවුද කියලා කියන්න. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, 1987, 1988, 1989 කාලයේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා පෞද්ගලික වධකාගාර තියාගෙන හිටියා කියන එක අමුතු දෙයක්ද? *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ඒ බෝම්බ ගැහුවාය කියන කෙනා මේගොල්ලන්ගේ පක්ෂයෙන් නුවරින් ඡන්දය ඉල්ලුවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
හරියට හරි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඒ බෝම්බ ගහපු කෙනා එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දය ඉල්ලුවා. 1988-89 කාලයේ එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ මේ රටේ 60,000ක් දෙනා මැරුවා, වධකාගාර පවත්වාගෙන ගියා කියන එක දන්නේ නැහැ කියන්න අපි මැරිලා ඉපදුණාද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ අයගේ නම් කියන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නම් නොවෙයි, ඒ අයට නඩු දාලා අධිකරණය මාර්ගයෙන් අත්අඩංගුවට ගන්නවා. ඒක මතක තියාගන්න. *[බාධා කිරීම්]* ඒ පිරිස අධිකරණය මාර්ගයෙන් අත්අඩංගුවට ගන්නවා. හොරකම් කරලා විතරක් නොවෙයි, මිනීත් මැරුවා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5, ගරු සුසන්ත කුමාර නවරත්න මහතා. ගරු කර්මාන්ත නියෝජ්‍ය ඇමතිතුමා, පිළිතුරු දෙන්න.

රොක් පොස්පේට් අපනයනය: අනුගමනය කළ අවිධිමත් ක්‍රමවේදය
ரொக் பொஸ்பேட் ஏற்றுமதி: பின்பற்றப்பட்ட முறையற்ற நடைமுறை
EXPORT OF ROCK PHOSPHATE: IRREGULAR METHODOLOGY FOLLOWED

857/2025

5\. **ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2023 හා 2024 යන වර්ෂවල සීමාසහිත ලංකා පොස්පේට් සමාගම විසින් අපනයනය කරන ලද රොක් පොස්පේට් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එප්පාවල රොක් පොස්පේට් අගය එකතු කිරීමකින් තොරව අපනයනය නොකරන ලෙස දී ඇති බුලංකුලම නඩු තීන්දුවට සහ 2012.11.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ඒවා අපනයනය කර ඇති බව දන්නේද;

(iii) පොස්පේට් අපනයනය කිරීම සඳහා ගැනුම්කරුවන්/සමාගම් තෝරා ගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව තෝරා ගන්නා ලද සමාගම් කවරේද;

(vi) ලබා දී තිබූ සීමාවන් ඉක්මවා එම සමාගම් විසින් රොක් පොස්පේට් අපනයනය කර තිබේද;

(vii) එසේ නම්, එම එක් එක් සමාගම විසින් සීමාව ඉක්මවා අපනයනය කර ඇති රොක් පොස්පේට් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) 28%ක් වන ප්‍රතිශත සීමාව ඉක්මවා, 38%ක ප්‍රතිශතයකින් යුතු රොක් පොස්පේට් අපනයනය කර ඇති බව දන්නේද;

(ix) එසේ නම්, ඒ හේතුවෙන් සිදු වී ඇති අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளில் வரையறுக்கப்பட்ட லங்கா பொஸ்பேட் கம்பனியால் ஏற்றுமதி செய்யப்பட்ட ரொக் பொஸ்பேட்டின் அளவு ஆண்டுவாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(ii) எப்பாவல ரொக் பொஸ்பேட்டை பெறுமதி சேர்க்காது ஏற்றுமதி செய்யக்கூடாதென வழங்கப்பட்டுள்ள புலங்குலம வழக்குத் தீர்ப்பு மற்றும் 2012.11.02ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்துக்கு முரணாக அது ஏற்றுமதி செய்யப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(iii) பொஸ்பேட் ஏற்றுமதி செய்வதற்கான கொள்வனவாளர்களை/கம்பனிகளைத் தெரிவுசெய்கையில் முறையான பெறுகைச் செயன்முறை பின்பற்றப்பட்டுள்ளதா என்பதையும்;

(iv) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) முறையான பெறுகைச் செயன்முறையின்றி தெரிவுசெய்யப்பட்ட கம்பனிகள் யாவை என்பதையும்;

(vi) வழங்கப்பட்டுள்ள வரையறைகளை மீறி மேற்படி கம்பனிகள் ரொக் பொஸ்பேட்டை ஏற்றுமதி செய்துள்ளனவா என்பதையும்;

(vii) ஆமெனில், மேற்படி ஒவ்வொரு கம்பனியும் வரையறைகளை மீறி ஏற்றுமதி செய்துள்ள ரொக் பொஸ்பேட்டின் அளவு வெவ்வேறாக யாதென்பதையும்;

(viii) 28%ஆன சதவீத வரையறையை மீறி 38%ஆன சதவீதத்தில் ரொக் பொஸ்பேட் ஏற்றுமதி செய்யப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ix) ஆமெனில், அதன்காரணமாக ஏற்பட்டுள்ள நட்டம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House -

(i) the quantity of rock phosphate exported by Lanka Phosphate Limited in each of the years 2023 and 2024, separately;

(ii) whether he is aware that Eppawala rock phosphate has been exported in violation of the Determination issued by the Court in the Bulankulama case, which ruled that the said rock phosphate should not be exported without value addition, and in violation of the Cabinet Decision dated 02.11.2012 regarding the same;

(iii) whether a formal procurement procedure has been followed in selecting the buyers/ companies for the export of rock phosphate;

(iv) if not, the reasons for that;

(v) the names of the companies that have been selected without following a formal procurement procedure;

(vi) whether the companies concerned have exported rock phosphate, surpassing the permitted limit of the same;

(vii) if so, the quantities of rock phosphate that each of the companies has exported in excess of the permitted limit, separately;

(viii) whether he is aware that rock phosphate with a percentage of 38 per cent, which is much higher than the stipulated 28 per cent limit, has been exported; and

(ix) if so, the amount of the loss that has been caused by that?

(b) If not, why?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා පිළිතුරු ලබා දෙන්න. *[බාධා කිරීම්]* සියලුම ගරු මන්ත්‍රීවරු වාඩිවෙන්න.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Speaker, our Party has only one Member of Parliament. The time we get allocated for debates is

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

minuscule. If this is the way you all are going to waste time during Questions for Oral Answers, please do not cut time from us. The Hon. Leader of the House spoke for about 10 minutes, which was totally irrelevant.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Do you not see the Opposition wasting time?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, point of Order එකක්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
I rose because he mentioned my name.

ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]* You may better donate a watch to the Hon. Ponnambalam. I only spoke for about two or three minutes.

ගරු කථානායකතුමනි, එක කාරණයක් තමයි, පැහැදිලිව මම පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කළේ නැහැ. ඉතා පැහැදිලිව මගේ නම සඳහන් කරලා, මාව ඉලක්ක කරලා කිව්ව නිසා තමයි මම කිව්වේ. අත්‍යවශ්‍ය දෙයකට විතරයි මම මැදිහත් වෙන්නේ. *[බාධා කිරීම්]* ඒගොල්ලන් තමයි කාලය නාස්ති කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න.

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු කථානායකතුමනි, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා ජාතික වැදගත්කමක් තිබෙන සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සහ පොස්පේට් නිධිය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් විමසා තිබෙනවා. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ලංකා පොස්පේට් සමාගම විසින් රොක් පොස්පේට් අපනයනය කර නැහැ, ගරු මන්ත්‍රීතුමනි. නමුත්, අපනයනය සඳහා එප්පාවල රොක් පොස්පේට් මිලදී ගෙන දේශීය සමාගම් 03කට 2023 හා 2024 වර්ෂවලදී රොක් පොස්පේට් මෙට්‍රික්ටොන් 29,882.05ක් අළෙවි කර තිබෙනවා. *[බාධා කිරීමක්]*

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?*[බාධා කිරීමක්]* ඔබතුමාගේ point of Order එක කියන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ Point of Order එක තමයි, සභානායකතුමා කවිරත්න මැතිනිය වෙත ආරෝපණය කරලා-*[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආරෝපණය කළේ නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මිනීමරුවෙකුගේ දුව යනුවෙන් ප්‍රකාශ කළා. ඒක වැරදියි. කරුණාකරලා,-*[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා පිළිතුර ලබා දෙන්න. *[බාධා කිරීම්]*

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
මේ අවුරුදු දෙක ඇතුළත මෙට්‍රික්ටොන් 29,800ක් අපනයනය කරන්න ලබා දීලා තිබෙනවා ආයතන තුනකට. ඒවා තමයි, D.M. Traders, No. 46, Niwanthidiya, Piliyandala; Disaru International Engineering Company (Pvt.) Limited, Gangasiripura, Tissamaharamaya and Ichiban (Pvt.) Limited, Piliyandala. ඒ ආයතන තුනට තමයි දීලා තිබෙන්නේ.

(ii) අපනයනය සඳහා පොස්පේට් අළෙවි කිරීමේ ක්‍රමවේදය අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ SC/FR 301/2023 දරන නඩුව විභාග වන බැවින් මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවක් නොමැත. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Speaker, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වෛද්‍ය රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉතින්, මම කියන එක ඇහෙන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇහෙනවා. ඔබතුමාට මයික් එක දීලා තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, Standing Ordersවල- *[බාධා කිරීම්]* පොඩ්ඩක් සද්ද නැතුව ඉන්නකෝ. ස්ථාවර නියෝග 33 (2) බලන්න. එහි පැහැදිලිව තිබෙනවා. මා ළඟ එය ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන නිසා මම ඉංග්‍රීසි භාෂාවෙන්ම කියවන්නම්. Standing Order No. 33(2) states, I quote:

> "The Speaker may limit the time allowed for raising of supplementary questions and answers thereto."

ඊයේ දවසේ පැය ගණනක් Answer එකක් දුන්නා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය point of Order එකක් නොවෙයි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
පොඩ්ඩක් ඉන්න. මේක අහන්නකෝ; මගේ point of Order එක අහන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, පිළිතුර ලබා දෙන්න. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, let him raise his point of Order. *[Interruption]*

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීම්]* Point of Order එකක් නැහැ, එතැන.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, පිළිතුර දෙන්න.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

(iii) පොස්පේට් අපනයනය කර ඇති සමාගම් තුන තෝරා ගැනීමේදී ලංකා පොස්පේට් සමාගම විසින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර නැත.

ගරු කථානායකතුමනි, මේගොල්ලෝ කරපු හොරකම් ගැන තමයි මේ කථා කරන්නේ. මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නෙත් කාලයක් තිස්සේ කරපු හොරකම් ගැන. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, let him raise his point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ. ගරු කවිරත්න මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ point of Order එක කියන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා මාව ඉලක්ක කරගෙන මට ඇඟිල්ල දිගු කර කිව්වා, මිනීමරුවාගේ දුව කියලා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමියගේ නම ඉලක්ක කළේ නැහැ. *[බාධා කිරීම්]* ඔබතුමියව point කළේ නැහැ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුර ඉදිරිපත් කරන්න.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

(iv) ලංකා පොස්පේට් සමාගමේ 340වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එවකට ලංකා පොස්පේට් සමාගමේ සිටි සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් දීලා තිබෙනවා ප්‍රසම්පාදන ක්‍රමවේදයට පිටින් මේ දෙය ලබා දෙන්න. ඉතින්, මේ හොරකම්වලට උත්තර තමයි මේ කියැවෙන්නේ. එතකොට තමයි මේ කෑගහන්නේ.

(v) මේවා ලබා දී තිබෙනවා ආයතන 3කට. D.M. Traders, No. 46, Niwanthidiya, Piliyandala; Disaru International Engineering Company (Pvt.) Limited, Gangasiripura, Tissamaharamaya සහ Ichiban (Pvt.) Limited, Piliyandala කියන සමාගම් තුනට තමයි මේ අයිතිය ලබා දී තිබෙන්නේ.

(vi) එවකට සිටි ලංකා පොස්පේට් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබෙනවා, මෙට්‍රික්ටොන් 30,000ක් අපනයනය සඳහා අළෙවි කිරීමට. ඒකෙන් 29,000ක් තමයි ලබා දී තිබෙන්නේ.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

(vii) මේවායින් එක සමාගමක් තමන්ගේ quota එක අබිබවා අපනයනය කර තිබෙනවා, ලබා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම මේ D.M. Traders කියන සමාගමට මෙට්‍රික්ටොන් 10,000යි දිය යුතුව තිබෙන්නේ. නමුත්, ඒගොල්ලන් මෙට්‍රික්ටොන් 24,357ක් ලබාගෙන තිබෙනවා. අනික් ආයතන දෙක 10,000ක quota එක ගත්තාට ඒගොල්ලන් ඊට වඩා අඩු ප්‍රමාණයක් තමයි ලබාගෙන තිබෙන්නේ.

(viii) සීමාව ඉක්මවා අපනයනය කර තිබෙන බව අපි දන්නවා. සියයට 38ක ප්‍රතිශතයෙන්, සියයට 33ක ප්‍රතිශතයෙන් හා සියයට 30ක ප්‍රතිශතයෙන් පොස්පේට් අපනයනය කර තිබෙනවා. මේ සඳහා විශේෂයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ විගණනයක් සිද්ධ වෙනවා.

(ix) මේ නිසා වෙච්ච අලාභය කොපමණද කියලා මේ වෙලාව වෙනකොට ගණනය කර නැහැ. නමුත්, මේ ක්‍රියාවලිය, මේ පර්යේෂණය සහ විගණනය මේ අවස්ථාවේදී සිද්ධ වෙමින් පවතිනවා.

(ආ) අදාළ නොවේ.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම ගත්තොත්, මේ පොස්පේට් නිධිය අනුරාධපුර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, රටටම වටිනා සම්පතක්. මේ වෙනකොට එම කර්මාන්තශාලාව තුළ තිබෙන යන්ත්‍ර සූත්‍ර දවසින් දවස අබලන් වෙමින් තිබෙනවා. ඒ නිසා ඒවා පිළිසකර කිරීමට විශාල පිරිවැයක් දරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විධියට අවධානය යොමු කර තිබෙනවාද?

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මෙය ජාතික සම්පතක්. 1971දී තමයි මේ නිධිය හොයා ගෙන තිබෙන්නේ. පොස්පේට් ඒ විධියටම භාවිත කරන්න බැහැ, ලංකාවේ කෙටි කාලීන භෝගවලට. ඒ සම්බන්ධයෙන් කළ පර්යේෂණ මත වර්තමාන රජය දෙසැම්බර් මාසයේ කැබිනට් අනුමැතියක් ලබා ගත්තා, Single Super Phosphate හදන්න. එදා සිට මේ මාස කිහිපය ඇතුළත අපේ නිලධාරින් මහන්සි වෙලා ඒ සම්බන්ධව තිබෙන නීතිමය බාධා ඉවත් කරගෙන, විශේෂයෙන්ම නීතිපතිතුමාගේ උපදෙස් පරිදි ඒ බාධා ඉවත් කරගෙන කටයුතු කර තිබෙනවා. ඒ අනුව අපි සතුටින් කියන්න කැමැතියි, පොස්පේට් නිධිය පාවිච්චි කරලා Single Super Phosphate හදලා, ලංකාවට ආනයනය කරන පොහොර ප්‍රමාණය අඩු කරගෙන මේ ජාතික සම්පතින් ප්‍රයෝජනයක් ගැනීමට Expressions of Interest call කරන්න කැබිනට් අනුමැතිය ලබා ගැනීමටත් මේ වෙනකොට Cabinet Paper එකක් යොමු කර තිබෙන බව.

ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුතු ඉතා ඉක්මනින් සිදු වෙයි කියන විශ්වාසය කර්මාන්ත අමාත්‍යාංශයට තිබෙනවා. ජනතාව බලාපොරොත්තු වුණු විධියටම එම පොස්පේට් නිධියෙන් ප්‍රයෝජනයක් ගන්න අපි කටයුතු කරනවා. ඒ සම්බන්ධයෙන් පෞද්ගලික අංශයෙන් යෝජනා කැඳවීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමත් ඉදිරි සති කිහිපය ඇතුළත සිද්ධ වෙනවා.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ලංකා පොස්පේට් සමාගම විසින් රුපියල් මිලියන 20කට වැඩි වියදමක් සිදුකර, වාරියපොළ කනත්තේවැව ප්‍රදේශයේ විශාල ගබඩාවක් ඉදිකර තිබෙනවා. මේ වනවිට එම ගබඩාව යම් පාර්ශ්වයක් විසින් අත්පත් කරගෙන තිබෙනවා. එම ගබඩාව නොමැතිකම නිසා මේ සමාගමට ඉදිරි කටයුතු කරගෙන යන්න බැරි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමා දන්නවාද, ඒ සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියා මා දැනගන්න කැමැතියි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ගරු මන්ත්‍රීතුමනි, අපිට ඒ පිළිබඳව තොරතුරු වාර්තා වෙලා තිබෙනවා. අපි සමස්ත සැලැස්මක් සකස් කරනවා, විශේෂයෙන්ම අගය එකතු කිරීමේ අලුත් ක්‍රියාවලියක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න. ඒක රජයත්, පෞද්ගලික අංශයත් එකතු වෙලා කරන කටයුත්තක්. මේ අදාළ ගබඩාව සහ ආයතනයට අයත් ඒ අවශ්‍ය සම්පත් නැවත භාවිතයට ගැනීම පිළිබඳව මේ වෙනකොට අමාත්‍යාංශය මඟින් පර්යේෂණ කටයුතු කරගෙන යනවා. ඒ අනුව, සම්පත් අවභාවිතයක් වෙලා තිබෙනවා නම් අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරන බවට කර්මාන්ත අමාත්‍යාංශය විධියට අපට සහතික වෙන්න පුළුවන්.

සංචාරක ආකර්ෂණ ප්‍රදේශ: මාතර දිස්ත්‍රික්කය
சுற்றுலாப் பயணிகளை ஈர்க்கும் பிரதேசங்கள்: மாத்தறை மாவட்டம்
AREAS OF TOURIST ATTRACTION: MATARA DISTRICT

866/2025

6. ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සංචාරක කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) මාතර දිස්ත්‍රික්කයේ ඇති සංචාරක ආකර්ෂණයක් සහිත ප්‍රදේශ කවරේද;

(iii) ඒවා අතරින් ගැසට් පත්‍රයක් මඟින් සංචාරක ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ කවරේද;

(iv) කොටපොල හා පිටබැද්දර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සංචාරක ආකර්ෂණයක් ඇති ස්ථාන බොහොමයක් ඇති බව දන්නේද;

(v) එසේ නම්, ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක ආවරණය වන පරිදි සංචාරක කලාපයක් නම් කරන්නේද;

(vi) ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள சுற்றுலா வலயங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மாத்தறை மாவட்டத்திலுள்ள சுற்றுலாப் பயணிகளை ஈர்க்கும் பிரதேசங்கள் யாவை என்பதையும்;

(iii) அவற்றுள் வர்த்தமானப் பத்திரிகை ஒன்றின் மூலம் சுற்றுலாத் தளமாகப் பிரகடனப்படுத்தப் பட்டுள்ள பிரதேசங்கள் யாவை என்பதையும்;

(iv) கொடபொல மற்றும் பிட்டபத்தறை ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளில் சுற்றுலாப் பயணிகளை ஈர்க்கும் வகையிலான ஏராளமான இடங்கள் காணப்படுகின்றமையை அறிவாரா என்பதையும்;

(v) ஆமெனில், மேற்படி இரு பிரதேச செயலாளர் பிரிவுகளையும் உள்ளடக்கும் வகையில் சுற்றுலா வலயமொன்று பெயரிடப்படுமா என்பதையும்;

(vi) அதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the number of tourism zones in Sri Lanka;

(ii) the names of the areas of tourist attraction in the Matara District;

(iii) the areas that have been declared as a tourist destination by a gazette notification, out of them;

(iv) whether he is aware that there are many places of tourist attraction in the Kotapola and Pitabeddara Divisional Secretaries' Divisions;

(v) if so, whether a tourist zone will be designated to cover the above two Divisional Secretaries' Divisions; and

(vi) the steps that have been taken in that regard?

(b) If not, why?

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) දැනට ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන ප්‍රදේශ ලෙස ගැසට් කර ඇති ප්‍රදේශ සංඛ්‍යාව 24කි.

(ii) මාතර දිස්ත්‍රික්කය ආවරණය කරමින්, මාතර, වැලිගම, මිරිස්ස, ගන්දර, කෝට්ටගොඩ සහ දික්වැල්ල යන ප්‍රදේශ වටා විහිදී ඇති විවිධ සංචාරක ආකර්ෂණ ස්ථාන රැසක් පවතී.

ඕලන්ද බලකොටුව, සුන්දර පොල්හේන, පැරණි ගැටබරු ලෙන් විහාරය, පැරණි චිත්‍ර කෞතුකාගාරය, පූජනීය ශ්‍රී විෂ්ණු දේවාලය සහ පහළ විහාර ලෙන් මාතර දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධාන සංචාරක ආකර්ෂණීය ස්ථාන වේ. තවද ගන්දර, කෝට්ටගොඩ සහ දික්වැල්ල වෙරළ තීරයන් සන්සුන් වෙරළ තීර ලෙස සංචාරක ආකර්ෂණය දිනා ගන්නා අතර දික්වැල්ල ආශ්‍රිතව හුම්මානය පීඹු කුහරය සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස වඩාත් ප්‍රසිද්ධියක් උසුලයි.

(iii) මාතර දිස්ත්‍රික්කය යටතේ හෙක්ටෙයාර 1,040.75ක පමණ භූමි ප්‍රමාණයක් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙස ගැසට් කර තිබේ. මෙයින් ආවරණය කරන්නේ උයන්වත්ත, හිත්තැටිය නැඟෙනහිර, හිත්තැටිය මධ්‍යම, ගොඩගම, කොටුවේගොඩ දකුණ, පොල්හේන, එළියකන්ද දකුණ, මැද්දවත්ත දකුණ, පඹුරණ, තොටමුණ, කොටුව, මඩිහ නැඟෙනහිර සහ මඩිහ බටහිර යන ග්‍රාම නිලධාරි වසම්වලින් සමන්විත ප්‍රදේශයයි.

(iv) කොටපොළ සහ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ආකර්ෂණීය සංචාරක ස්ථාන පවතින බව දනිමි.

(v) කොටපොළ හා පිටබැද්දර සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය සාමාන්‍ය ක්‍රියාවලිය පිළිපදින්නට සිදු වේ. මෙම ක්‍රියාවලියේ පළමු අදියර ලෙස මෙම කලාපය සඳහා අවශ්‍යතාව හඳුනාගැනීම, ආකර්ෂණීය සංචාරක ස්ථාන, කලාප සීමා ආදී කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පවත්වා එහි තීරණ අනුව මහජන දැනුම්දීම් ක්‍රියාවලියට යා යුතුය.

(vi) කොටපොළ හා පිටබැද්දර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ප්‍රදේශයන් සම්බන්ධයෙන් භූගෝලීය පිහිටීම ද සලකා මේවා මාතර නගර සංචාරක සංවර්ධන ප්‍රදේශය විශාල කරමින් එයට ඇතුළත් කළ යුතුද, නැතහොත් අනාගතයේදී සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙස ගැසට් කිරීමට ඇති දෙනියාය සංචාරක සංවර්ධන ප්‍රදේශය යටතට ඇතුළත් කළ යුතුදැයි පළමුව සාකච්ඡා කර තීරණය කළ යුතුය.

(ආ) අදාළ නොවේ.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මේ කාරණය ගැන අවබෝධයක් තිබීම ගැන පළමුවෙන්ම මගේ ස්තුතිය සහ සන්තෝෂය පළ කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම කලාපය බොහෝ කාලයක් තිස්සේ සංචාරකයන් පැමිණෙන ස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. නමුත් පැවති ආණ්ඩු විසින් ඒ ප්‍රදේශය සංචාරක කලාපයක් හැටියට විශේෂකොට, අමාත්‍යාංශය පැත්තෙන්

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

මැදිහත්වීමක් කරලා තිබුණේ නැහැ. සමහර විට මේ ස්ථාන ප්‍රසිද්ධ වුණේ ඔය තරුණයෙක් සමහර විට මුහුණු පොතේ දාපු යම්කිසි පෝස්ට් එකකින් වෙන්න පුළුවන්. ඒ නිසා මෙන්න මේ කටයුතු සඳහා විධිමත් ක්‍රමයක් ඇති කිරීම වැදගත්. මේ සඳහා ඔබතුමා නිලධාරින් පිරිසක් සම්බන්ධ කරලා, විශේෂයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අපේ නායකත්වයත් සමඟ කථා කරලා නිසි ක්‍රමයක් ඇති කරන්න යම් අදහසක ඉන්නවාද කියන එක ගැන තමයි මට දැන ගන්න ඕනෑ.

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, දකුණු පළාතේ සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ක්‍රියාවලට මැදිහත්වීම සඳහා දකුණු සංචාරක කාර්යාංශය පිහිටුවලා තිබෙනවා. එම කාර්යාංශයේ මැදිහත්වීමත් සමඟින් තමයි දකුණු පළාතේ සංචාරක සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙන්නේ. ඒ අනුව දකුණු පළාත් සංචාරක කාර්යාංශයත් සමඟ සාකච්ඡා කර කටයුතු කරන්න අවශ්‍යයි. මම අවසන් ප්‍රශ්නයට දුන්න පිළිතුරත් එක්ක ඇත්තටම මේක දෙනියාය සංචාරක කලාපයේ ගැසට් එකට ඇතුළත් කරන්න පුළුවන්ද, එහෙම නැත්නම්, දැනට තිබෙන මාතර කලාපය තවත් පුළුල් කරලා මේ ප්‍රදේශයත් ඇතුළත් කරනවාද කියන කාරණය ගැන සියලු පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කරලා තීරණයකට එළැඹිය යුතුව තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා අහනවා.

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ලබා දෙන ලද පිළිතුරත් සමඟම, එම ප්‍රශ්නයට අදාළව මම දෙවැනි අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

අපි මේ ප්‍රදේශය මාතර කියලා වෙන් කළාට, ඇත්තටම තිබෙන්නේ දකුණේ සර්ම කලාපීය සදාහරිත තෙත් වනාන්තරය ආශ්‍රිතව. මේක කන්නෙලිය, සිංහරාජය, හේකොක් - හිනිදුම කන්ද - වාගේ කඳු පද්ධතිය සහිත එකක්. අපි භූගෝලීය වශයෙන් යම් යම් වෙන් කිරීම් කළත් මේක එකම පද්ධතියක්. දකුණේ සර්ම කලාපීය සදාහරිත තෙත් කලාපය, ඒ මුළු කලාපයම එකට අරගෙන එක පරිපාලන ව්‍යුහයක් විධියට සකස් කරලා, ගැසට් කරලා මේ ක්‍රියාවලිය කරන එක හොඳයි කියලා හිතනවා. මම හිතන්නේ, රුහුණු සංචාරක කාර්යාංශයත් ඒකම හිතනවා. නමුත්, සංචාරක අමාත්‍යාංශය විධියට ඔබතුමන්ලා මේ සම්පූර්ණ කලාපයම -ගාල්ල හා මාතර දෙකටම අයිති- ගැසට් කරලා එය සංචාරක කලාපයක් බවට පත් කිරීමට කරන වැඩ පිළිවෙළ මොකක්ද කියලා මම අහන්න කැමතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

මම මුලින් සඳහන් කළ පරිදිම මීට අදාළව රුහුණු සංචාරක කාර්යාංශය තමයි මැදිහත් වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් අපි ශ්‍රී ලංකාවේ ආකර්ෂණීය සෑම සංචාරක ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි මැදිහත් වෙනවා. ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු කැඳවමින් ඒ අයගේ යෝජනා සහ ඉදිරි සැලසුම් සාකච්ඡා කරමින් යනවා. ඒ සඳහා අපි ඉදිරියේදී දකුණු පළාතේ දින දෙකක් යොදා ගෙන තිබෙනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, විශේෂයෙන්ම සංචාරක අනුකමිටුව රැස් වෙන අවස්ථාවේදී මේ යෝජනා සාකච්ඡා කරලා අපට වැඩිදුර තීරණවලට එළැඹෙන්න පුළුවන්.

LRC ඉඩම් පෞද්ගලික අයිතියට පැවරීම: දකුණු පළාත

LRC காணிகளை தனியாருக்கு மாற்றல்: தென் மாகாணம்

TRANSFER OF LRC LANDS TO PRIVATE INDIVIDUALS: SOUTHERN PROVINCE

869/2025

7. ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද අවස්ථාවේ, එම කොමිෂන් සභාවට පවරා දෙන ලද දකුණු පළාතේ ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට පුද්ගලික අයිතියට පවරා දී ඇති අක්කර 50ට අඩු ඉඩම් සංඛ්‍යාව, එම එක් එක් ඉඩමේ විශාලත්වය, ඉඩම පවරා දී ඇති පුද්ගලයාගේ නම සහ ඉඩම පවරා දී ඇත්තේ කෘෂිකාර්මික කටයුතු සඳහාද නැතහොත් ව්‍යාපාරික කටයුතු සඳහාද යන්න එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනතෙක් පවරා හෝ බැහැර කර නොමැති ඉඩම්වල නම් හා ඒවායේ විශාලත්වය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ඉඩම් අතරින් මේ වනවිට අධිකරණ ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතින ඉඩම් කවරේද;

(v) නව ව්‍යාපෘති සඳහා ඉල්ලා ඇති ඉඩම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணி மறுசீரமைப்பு ஆணைக்குழு நிறுவப்பட்டபோது, தென் மாகாணத்தில் அந்த ஆணைக்குழுவுக்குச் சாட்டுதல் செய்யப்பட்ட காணிகளின் அளவு, ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அந்தக் காணிகளுள், தற்போது தனியார் உரிமைக்குக் கையளிக்கப்பட்டுள்ள 50 ஏக்கருக்கும் குறைவான காணிகளின் எண்ணிக்கை, அத்தகைய ஒவ்வொரு காணியினதும் விஸ்தீரணம், காணி சாட்டப்பட்டுள்ள நபரின் பெயர் மற்றும் காணி

சாட்டப்பட்டிருப்பது விவசாய நடவடிக்கைகளுக்காகவா இன்றேல் வணிக நடவடிக்கைகளுக்காகவா எனும் விபரங்கள் ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கும் ஏற்ப வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) இதுவரை சாட்டப்படாத அல்லது கையுதிர்க்கப்படாத காணிகளின் பெயர்கள் மற்றும் அவற்றின் விஸ்தீரணம் பற்றிய விபரங்கள் ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கும் ஏற்ப வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) அந்தக் காணிகளுள் தற்போது சட்ட நடவடிக்கைகளுக்கு உட்பட்டுள்ள காணிகள் யாவை என்பதையும்;

(v) புதிய கருத்திட்டங்களுக்காகக் கோரப்பட்டுள்ள காணிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of land of the Southern Province that was transferred to the Land Reform Commission at the time the Commission was established, separately in relation to each Divisional Secretary's Division;

(ii) the number of lands which are less than 50 acres in extent, of which the ownership has been transferred to private individuals, the extent of each of the lands concerned and the name of the person to whom each land has been transferred, and whether those lands have been transferred for business purposes or agricultural purposes, separately in relation to each of the Divisional Secretary's Divisions;

(iii) the names and the extents of lands that have neither been transferred nor disposed of so far, separately in relation to each of the said Divisional Secretaries' Divisions;

(iv) the lands that are currently subjected to legal proceedings, out of the said lands; and

(v) the lands that have been requested for new projects?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඇමුණුම 1හි දක්වා ඇත.

(ii) ඇමුණුම 2හි දක්වා ඇත.

(iii) ඇමුණුම 3හි දක්වා ඇත.

(iv) ඇමුණුම 4හි දක්වා ඇත.

(v) ඇමුණුම 5හි දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

දීර්ඝ පිළිතුරු සහිත ඇමුණුම් 1 සිට 5 දක්වා **සභාගත*** කරමි.

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ඉඩම් කියන්නේ බරපතළ ප්‍රශ්නයක් තිබෙන දෙයක්. ඒ ඉඩම් සෑහෙන ප්‍රමාණයක් අයාලේ ගිහින් තිබෙනවා. අපට ඉදිරියේදී කර්මාන්ත සංවර්ධනය සඳහා සහ කෘෂි කර්මාන්තය සඳහා ඉඩම් අවශ්‍යයි. මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි, මේ ඉඩම් හොඳ පරිහරණයක් සහ විධිමත්ව කළමනාකරණය සඳහා ඔබතුමන්ලාට තිබෙන යෝජනා මොනවාද කියලා. මේ ඉඩම්වලට අදාළව තිබෙන ක්‍රමය වෙනස් කරලා මධ්‍යගත සැලැස්මක් අනුව වැඩ කරන්නේ කොහොමද, ඒ සඳහා දිස්ත්‍රික්ක වශයෙන් ඔබතුමන්ලා අපට දෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා මම දැනගන්න කැමතියි.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් සම්බන්ධයෙන් දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේත් ප්‍රශ්න කෙරෙනවා; කෝප් කමිටුවේදීත් ප්‍රශ්න කෙරෙනවා. කොහොමටත් අපි රජයක් විධියට බලන්නේ ප්‍රධාන වශයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ තිබෙන ඉඩම් කර්මාන්තවලට, කෘෂි කර්මාන්තයට, ආයෝජනවලට ලබා දෙන්නේ කොහොමද කියලායි.

ඒ වාගේම යම් පිරිස් නේවාසිකව ඉන්න ඉඩම් තිබෙනවා. ඒ අයට ඒ ඉඩමේ අයිතිය ලබා දෙන්නේ කොහොමද කියලාත් අපි බලනවා. මේ ක්‍රියාවලිය සංකීර්ණයි. මේවා ඔක්කොම අවුල් කරලා තිබෙන්නේ; අවභාවිත වෙලා තිබෙන්නේ. සමහර ඒවායේ විස්තර සොයන්නත් බැහැ. Files හදලා තිබෙන්නේ. නමුත් අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා; වෙහෙසක් දරමින් සිටිනවා මේවා නිවැරදි කරන්න. ඒත් ඒක කරන්න වෙන්නේ මේවායේ හිටපු මේ නිලධාරින් එක්කම තමයි. මේ ක්‍රියාදාමය ඔස්සේ ම තමයි. ඒ හින්දා සංකීර්ණයි; අමාරුයි; ගැටලුසහගතයි.

නමුත් අපි ඒකට ක්‍රමයක් හදමින් තිබෙනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දිස්ත්‍රික්ක මට්ටමේ තිබෙන ඉඩම් පිළිබඳව අධීක්ෂණයක් කරනවා නම්, සොයලා බලනවා නම්, මේ කටයුත්ත වඩා පහසුයි කියලා මම හිතනවා. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමාට යෝජනා කරන්න කැමතියි, ගාල්ල දිස්ත්‍රික්කයේ වාගේම, හැම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරින්ගෙන් කරුණු විමසමින් මේ ඉඩම් ගැන සොයා බලන්න, අධීක්ෂණය කරන්න කියලා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේක ප්‍රශ්නයක් නොවෙයි, යෝජනාවක් හැටියටයි මම ඉදිරිපත් කරන්නේ.

විශේෂයෙන් දැන් පරිසර ප්‍රශ්නය බරපතළ වෙලා තිබෙනවා. ඒ නිසා LRC ඉඩම්වල පරිසරයට බලපාන ඒ සාධක, ඒ කියන්නේ පරිසරය විනාශ වෙන තැන් තිබෙනවා නම් ඒවා හඳුනාගෙන ඒ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන් ගිං ගං මිටියාවත වාගේ තැන්වල ගොඩක් පරිසර හානි වෙලා තිබෙනවා, ගංගාවලට හානි වෙලා තිබෙනවා. ඒක ගංවතුර තත්ත්වයටත් හේතු වෙලා තිබෙනවා. විශේෂයෙන් ඒ ඉඩම් හඳුනාගෙන වැඩ පිළිවෙළක් යෝජනා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ඒ සම්බන්ධයෙන් අපි කටයුතු කරන්න ලෑස්තියි. මම ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලනවා එවැනි උදාහරණ සහිතව තිබෙන ඒවා ගැන අපට දැනුම් දෙන්න කියලා. අපි ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නම් කියන පොරොන්දුව දෙන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -874/2025- (2), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

පුත්තලම දිස්ත්‍රික්කයේ මුහුදු ඛාදනය: වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග
புத்தளம் மாவட்டத்தில் கடலரிப்பு: தடுப்பதற்கான நடவடிக்கை
SEA EROSION IN PUTTALAM DISTRICT: PREVENTIVE MEASURES

956/2025

9. ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, මුහුදු වෙරළ තීරය ඛාදනයට ලක්වෙමින් පවතින අතර ඒ හේතුවෙන් ඉඩම්, දේපළ සහ ආගමික පිළිම පවා මුහුදට බිලිවෙමින් පවතින බවත්;

(ii) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මැදිහත් වී එම මුහුදු ඛාදනය වළක්වා ගැනීම සඳහා ක්‍රියා කළද, පැවති රජයන් විසින් ප්‍රමාණවත් පරිදි මූල්‍ය ප්‍රතිපාදන වෙන් නොකළ බවත්;

එතුමා දන්නේද?

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ, මුහුදු වෙරළ තීරය ඛාදනයවීම වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தில் கடற்கரை கடலரிப்புக்கு உள்ளாகி வருவதன் விளைவாக காணிகள் மற்றும் சொத்துக்களுடன் சேர்ந்து மதச் சிலைகள்கூட கடலுக்கு இரையாகி வருகின்றன என்பதையும்;

(ii) கரையோரப் பாதுகாப்பு மற்றும் கரையோர வள முகாமைத்துவத் திணைக்களம் தலையீடு செய்து மேற்படி கடலரிப்பைத் தடுப்பதற்கான நடவடிக்கைகளை மேற்கொண்டபோதிலும், கடந்த அரசாங்கங்களால் போதுமான அளவு நிதி ஒதுக்கீடு செய்யப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) புத்தளம் மாவட்டத்தில் கரையோரம் அரிப்புக்குள்ளாவதைத் தடுப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Is he aware that -

(i) the coastal belt in the Puttalam District is severely affected by sea erosion, resulting in the losing of land, property and even religious statues to the sea; and

(ii) although the Department of Coast Conservation and the Department of Coastal Resources Management intervened and worked towards preventing sea erosion, adequate financial provisions have not been allocated by the previous regimes to address the issue?

(b) Will he inform this House of the measures taken to prevent sea erosion on the coastal belt of the Puttalam District?

(c) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය ගත් විට ඉරණවිල, අඹකඳවිල, ඉලන්තඩිය, ආලංකුඩා, කුඩාව, කන්දකුලිය හා කරුකපනේ වෙරළ තීර මේ වන විට ඛාදන තත්ත්වයට මුහුණ පා ඇත. නිරිතදිග මෝසම් සමය හා වරින් වර ඇති වන මුහුදු කුණාටු තත්ත්ව යන ස්වාභාවික හේතු මත මෙම වෙරළ ඛාදන තත්ත්වයේ තීව්‍රතාව වැඩි වී ඇත. වෙරළ ඛාදනය හේතුවෙන් වෙරළබඩ දේපොළ හා ඉඩම් හානි වීම, ජීවනෝපාය මාර්ගවලට ගැටලු පැන නැඟීම ආදී අහිතකර බලපෑම් සිදු වේ.

(ii) වෙරළ ඛාදනයට පිළියම් ලෙස ලොව පිළිගත් සාර්ථකම විද්‍යාත්මක විසඳුම, ගැඹුරු මුහුද කැනීම තුළින් ලබා ගත් වැලි මඟින් වෙරළ ප්‍රතිපෝෂණය කිරීමයි. නමුත් ඒ සඳහා අවශ්‍ය වියදම් දැරීම සඳහා

ප්‍රතිපාදන වෙන් කිරීමට හැකියාව දැනට රටේ පවතින ආර්ථික තත්ත්වය සැලකීමේදී දුෂ්කර වී ඇති බැවින්, වෙරළාරක්ෂක ව්‍යුහය ඉදි කිරීම වැනි දෘඪ විසඳුම් ක්‍රියාත්මක කිරීම මඟින් වෙරළ ඛාදන තත්ත්වය පාලනය කිරීම සඳහා වැඩි අවධානයක් යොමු වී ඇත.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ ඛාදන ගැටලු වළක්වාලීම සඳහා මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා 2026 වර්ෂය සඳහා යෝජිත වැඩ විස්තරය පහත පරිදි වේ.

i) 2025 වසරේ ක්‍රියාත්මක වැඩසටහන්

	වැඩසටහන් විස්තරය	ඇස්තමේන්තු අනුව වෙන් කර ඇති ප්‍රතිපාදන (රුපියල් මිලියන)
1.	උඩප්පුව උතුර මීටර් 200 වෙරළාරක්ෂක රිවෙට්මන්ට් ව්‍යුහය ඉදි කිරීම (2024 වසරේ සිට ක්‍රියාත්මක වන වැඩ අයිතමයකි)	10.5
2.	මුදුකටුව ධීවර තොටුපොළ, T දියකඩන ව්‍යුහය ඉදි කිරීම හා රිවට්මන්ට් ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම	20.00
3.	ලංසිගම මීටර් 80 දියකඩන ව්‍යුහය ප්‍රතිංස්කරණය කිරීම	20.00
4.	හදිසි වෙරළාරක්ෂය ව්‍යුහ ඉදි කිරීම - කරුකපනේ සහ ඉරණවිල	12.00
	2025 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයට වෙරළාරක්ෂක ඉදි කිරීම් සඳහා වෙන් කර ඇති මුදල	62.50

ii) 2026 වසරට යෝජිත වැඩසටහන්

	<u>වැඩසටහන් විස්තරය</u>	<u>අපේක්ෂිත ප්‍රතිපාදන (රුපියල් මිලියන)</u>
1.	ඉරණවිල - අඹකඳවිල ග්‍රොයින ශ්‍රේණිය ඉදිකිරීම	18.0
2.	කල්පිටිය, තුඩාව වෙරළ තීරයේ වෙරළාරක්ෂක රිවෙට්මන්ට් ව්‍යුහය ඉදිකිරීම්	19.0
3.	ආරච්චිකට්ටුව, කරුකපනේ වෙරළාරක්ෂක රිවෙට්මන්ට් ව්‍යුහය ඉදිකිරීම්	16.0
4.	උඩප්පුව දකුණ වෙරළාරක්ෂක රිවෙට්මන්ට් ව්‍යුහය ඉදිකිරීම් හා ග්‍රොයින ප්‍රතිසංස්කරණය	<u>20.0</u>
	2026 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයට වෙරළාරක්ෂක ඉදිකිරීම් සඳහා අපේක්ෂිත මුදල	**73.0**

(ඇ) අදාළ නොවේ.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කියූ පරිදි ඒ ඛාදන තත්ත්වය සලකා බලා මේ වෙනකොට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යම් වැඩ කොටසක් කරනවා. ඒ සඳහා විශේෂ විධියට මැදිහත් වෙමින් තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයට අදාළව ගත්තත් මා ඔය සිට මෝදරගම්මාරු දක්වා විල්පත්තුව, නැත්නම් මන්නාරම කියන ප්‍රදේශයට යනකම්ම කිලෝමීටර 425ක වෙරළ තීරයක් තිබෙනවා. මේ කාලය තුළ වෙරළ ඛාදනය වැඩි වෙමින් තිබෙනවා. වෙරළ ඛාදනය වැඩිවීමෙන් ධීවර ජනතාවට විශාල අලාභ හානි සිදු වෙනවා. භූමියක් කැඩිලා මුහුදට ගියාට පස්සේ නැවත ඒක ප්‍රතිසංස්කරණය කරන්න බැහැ.

ඒ හේතුවෙන් ජනතාවගේ ඉඩම්, තොටුපොළවල්, වාසස්ථාන සහ ආර්ථික කටයුතු අහිමි වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් මුහුදු ආශ්‍රිත, වෙරළ ආශ්‍රිත කර්මාන්ත තිබෙනවා. මාළු අල්ලා කරවල වේළන්නේ වෙරළ තීරයේ. අද ධීවර ජනතාවට ඒවා අහිමි වෙලා තිබෙනවා; ඉඩකඩම් අහිමි වෙලා තිබෙනවා. එතකොට මුහුදට යන මේ සම්පත් ටික නැවත අපට ප්‍රතිපූරණය කරන්න බැහැ. ඒවා ගොඩනහන්න බැහැ. ඒ නිසා ධීවර ක්ෂේත්‍රය බරපතළ ගැටලුවලට මුහුණ පා තිබෙනවා. මීට ඉස්සර ධීවරයන් මුහුදු ගිහිල්ලා ඇවිල්ලා වෙරළට බෝට්ටු ගොඩ ඇරියා. හැබැයි අද ඔවුන්ගේ බෝට්ටු ගොඩ අරින්න තැනක් නැහැ. මහ පාර දක්වාම වෙරළ කැඩිලා දැන් ඒ තැන් අහිමි වෙලා. මේ තත්ත්වය තුළ මේ ධීවර ජීවිත ඉතා බරපතළ විධියට කඩා වැටෙමින් තිබෙනවා. හලාවත ප්‍රදේශයේ කිලෝමීටර ගණනක් දිගට පිහිටි ගල් බැම්මක් තිබෙනවා. අද ඒ ගල් බැම්මට උඩින් මුහුදු රළ ඇවිල්ලා වෙරළ ඛාදනය වෙමින් තිබෙනවා.

කවදාවත් නොවුණු තත්ත්වයකින් මුහුද හැසිරෙමින් තිබෙනවා. මේක විශේෂ තත්ත්වයක්. අපි හිතනවා, ඉදිරියේදී මීටත් වැඩිය වෙරළ ඛාදනය සිද්ධ වෙන්න ඉඩ තිබෙනවා කියලා. ඒක නිසා ගරු අමාත්‍යතුමනි, මේකට විශේෂ මැදිහත්වීමක් අවශ්‍ය වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ඒක නිසා මා ඉල්ලා සිටින්නේ මේකයි. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන කඩිනමින් වෙන් කරන්න. ඔබතුමා ම ඒ ප්‍රදේශයට පැමිණිලා හරි බලලා, අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරන්න. මොකද, මේකට අපට stockpile එකක් ඕනෑ. වෙරළ ඛාදනය වෙද්දී අපිට ඒ වෙලාවට දාන්න ගල් නැහැ. ඒ නිසා පුළුවන් ප්‍රමාණයකින් මැදිහත් වෙලා වැඩි ප්‍රතිපාදන වෙන් කරලා මේ ඛාදනය වළක්වා ගැනීමට කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කාරණයට අවධානය යොමු කිරීම ගැන අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මමත් පෞද්ගලිකව මැදිහත් වෙලා ඔය පැත්තේ නිරීක්ෂණ චාරිකාවක් කරලා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කර ගනිමින් ඉක්මනින් වැඩ පිළිවෙළක් හදනවා කියලා පොරොන්දු වෙනවා. අපි උපරිමයෙන් මැදිහත් වෙන්නම්, මේ ප්‍රශ්නය විසඳීම සඳහා.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු අමාත්‍යතුමනි, අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරනවා කියලා ඔබතුමා පැහැදිලි කළා. මම ඉල්ලා සිටින්නේම මේකට මැදිහත් වෙන්න කියලා තමයි, මේ වෙරළ ඛාදනය වේගවත් වෙලා තිබෙන නිසා. මේකට ඉක්මන් ක්‍රියාමාර්ග අරගෙන ඒ ජනතාවට සාධාරණයක් කරන්න කියාත් මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

කර්මාන්තශාලා පිහිටුවීම සඳහා LRC ඉඩම් ලබා දීම: ගාල්ල දිස්ත්‍රික්කය

தொழிற்சாலைகளைத் தாபிப்பதற்காக LRC காணிகள் வழங்கல்: காலி மாவட்டம்

GRANT OF LRC LANDS TO ESTABLISH FACTORIES: GALLE DISTRICT

997/2025

10. ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ගාල්ල දිස්ත්‍රික්කය තුළ කර්මාන්ත පිහිටුවීම සඳහා පුද්ගලයන් වෙත ඉඩම් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම්වල මේ වනවිට පිහිටුවා ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් ලබා දුන් ක්‍රමය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தில் தொழிற்சாலைகளைத் தாபிப்பதற்காக காணிச் சீர்திருத்த ஆணைக்குழுவால் ஆட்களுக்குக் காணிகள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், இன்றளவில் அக்காணிகளில் அமைக்கப்பட்டுள்ள தொழிற்சாலைகளின் எண்ணிக்கை, ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கமைய வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) மேற்படி காணிகள் வழங்கப்பட்ட வழிமுறை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether the Land Reform Commission has granted lands to individuals for the establishment of factories in the Galle District;

(ii) if so, the number of factories established on those lands upto now, in each Divisional Secretary's Division, separately; and

(iii) the methodology followed in granting the lands referred to above?

(a) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii)

අ.අ	කර්මාන්ත ශාලාව	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
01	සැම්සන් රබර් නිෂ්පාදන (පුද්) සමාගම	අක්මීමන (05)
02	ඩී. සැම්සන් කර්මාන්ත ආයතනය	
03	ස්ටාර් පැෂන් ක්ලෝතින් පුද්ගලික සමාගම	
04	සී/ස ක්ලැසික් කාර්ස් (පුද්) සමාගම	
05	සුජීව ෆාම් හවුස්	
06	දීපා ගාර්මන්ට් පුද්ගලික සමාගම	ඇල්පිටිය (03)
07	බෙටන්ස් ගෘෘප් ඔෆ් කම්පැනි පුද්. සමාගම	
08	කාර්මික සංවර්ධන මණ්ඩලය (කර්මාන්තපුර)	
09	ජෝ ලංකා පුද්ගලික සමාගම	බද්දේගම (02)
10	ස්ටාර් ගාමන්ට් පුද්ගලික සමාගම	
11	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව	තවලම (01)
12	බී. ලෝරන්ස් ද සිල්වා - දියර පොහොර ව්‍යාපෘතිය	රත්ගම (01)

(iii) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ වගන්තිය යටතේ බදු පදනම මත බැහැර කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරයෙනුත් පැහැදිලි වුණා, LRC එකට අයිති ඉඩම් කර්මාන්තශාලා සඳහා බදු දීලා තිබෙනවා කියලා. විශේෂයෙන් ගත්තොත්, ඇල්පිටියේ බෙටන්ස් සමූහ ව්‍යාපාරයට කර්මාන්තශාලාවක් සඳහා ඉඩමක් දීලා තිබෙනවා. හැබැයි, මේ වනවිට ඒක වහලා දාලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, 2019-2020 කාලයේ කොවිඩ් වසංගතය ආවා. මේ කර්මාන්තශාලාව වහලා දාලා තිබුණත්, සම්බන්ධීකරණ කමිටුවේදී තීන්දුවක් අරගෙන දේශපාලන හිතවත්කමකට ලක්ෂ 300ක් -කෝටි තුනකට ආසන්න මුදලක්- ඒ කර්මාන්තශාලාව නැවත අලුත්වැඩියා කිරීම සඳහා ලබා දීලා තිබෙනවා. නමුත් දැනටත් ඒ කර්මාන්තශාලාව වහලා තිබෙන්නේ. දේශපාලන හිතවත්කම්වලට ඉඩම් දීලා, ඒ කර්මාන්තශාලා වහලා දාලා, ඊට

පස්සේ නැවත ඒ කර්මාන්තශාලා දේශපාලන හිතවත්කම්වලට ලබා දීලා නැවත වහලා දාලා තිබෙනවා. ලක්ෂ 300ක් අලුත්වැඩියා කිරීම සඳහා ලබා දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මෙවැනි කර්මාන්තශාලා වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් යම් කර්මාන්තයකට, ව්‍යාපෘතියකට ලබා දුන්නාට පස්සේ ඒ අපේක්ෂිත අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, ගිවිසුම අනුව බදු ගෙවන්නේ නැත්නම් නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගන්න පුළුවන්. මම ඔබතුමා කියන කාරණය පිළිගන්නවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් විවිධ ව්‍යාපෘති සඳහා රට පුරා දීලා තිබෙනවා. කරුණු වාර්තා වෙන විධියට ඒවා අදාළ කර්තව්‍යය වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේවා නැවත පවරා ගෙන සුදුසු ව්‍යාපෘතිවලට, ඇත්තටම ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට දෙන්න ඕනෑ. ඒ ක්‍රියාවලියත් සිදු වෙලා නැහැ. මේ අතින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඉතා අකාර්යක්ෂමයි. ගරු කථානායකතුමනි, ඒ නිසා අපි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් සහකාර නිලධාරින්ට උපදෙස් දීලා තිබෙනවා, ඒ ඉඩම් හඳුනාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, ඒවා අඩාළ වෙලා තිබෙනවා නම්, ඒවාට බදු ගෙවන්නේ නැත්නම් ඒවා නැවත අත්පත් කර ගැනීම සඳහා වෙච්ච නාමලේඛන හදන්න ක්‍රියාත්මක වෙන්න, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා. අපි ඒ ගැන සොයා බලන්නම්.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරනවා; ඉඩම් ලබා දෙනවා. එහෙම නම් ඇත්තටම ඒකේ කර්මාන්තශාලාවක් ක්‍රියාත්මක වෙන එක හොඳයි. හැබැයි, මේ වෙනකොට මේ අය මෙවැනි ඉඩම් අරගෙන අතුරු බදු දෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ ප්‍රශ්නය කලින් අහපු පළමුවැනි අතුරු ප්‍රශ්නයටම සම්බන්ධයි. ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරලා ඉතිහාසයේ දේශපාලනඥයන්ගේ හිතවත්කමට මේවා නැවත තෑගි දුන්නා. එහෙම අරගෙන මේ අය කරන්නේ මේවා නැවත අතුරු බදු දෙන එකයි. මේ ඉඩම්වල ඒ අය කිසිවක් කරන්නේ නැහැ. දේශපාලන හිතවත්කමට මේ ඉඩම් ගන්නවා. අරගෙන නැවත අතුරු බදු දෙනවා. මේ ඉඩම් එහෙම අතුරු බදු දෙන්න පුළුවන්ද? ඒ ආකාරයට අතුරු බදු දීලා තිබෙන ඒවා සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියන එක තමයි දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් මම අහන්නේ.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, අවභාවිතාවන් සිද්ධ වෙනවා. එකක්, මුදල් විධියට. දෙවැනි එක, ඉඩම් විධියට. ඉඩම් විෂය ගත්තාම බොහෝ විට සිද්ධ වෙලා තිබෙන්නේ මෙන්න මේකයි. ව්‍යාපෘති වාර්තාවක් අරගෙන ඇවිල්ලා, ඒ ව්‍යාපෘති වාර්තාව පෙන්නලා බදු ක්‍රමයට හරි මේ ඉඩම තමන් සන්තකයට ගන්නා ක්‍රම ඕනෑ තරම් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. අපට ඒක නිරීක්ෂණය කරන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් අපට වාර්තා වෙනවා; පැමිණිලි එනවා. ඇත්ත ව්‍යාපෘතිවලට එන ආයෝජකයන්ට එන්න කියලා අපි ආරාධනා කරන්න කැමැතියි. ඇත්තටම ආයෝජනය කරන්න එන උදවියට අපි උදව් කරන්න ලෑස්තියි. ඒ අයට අවශ්‍ය පහසුකම් සපයන්න ලෑස්තියි. ඒ අයට අවශ්‍ය ඉඩම් හොයලා දෙන්න අපි ලෑස්තියි. ඒ ක්‍රමවේදය වේගවත් කරන්න අපි ලෑස්තියි. හැබැයි, ව්‍යාපෘතියක් කියලා කොළ කෑල්ලක් ලියාගෙන ඉඩම දිහා බලාගෙන, ඉඩම අත්පත් කර ගන්න එන කට්ටියට නම් අපේ කන විදින්න බැහැ. අපි ඒ සඳහා කමිටු පත් කර තිබෙනවා. පැමිණෙන ඇත්ත ආයෝජකයන්ට පහසුකම් සපයන්නත්, ව්‍යාපෘති වාර්තාවක් ලියාගෙන ඉඩම අත්පත් කර ගන්න එන උදවිය හඳුනාගෙන ඒ අය වෙන් කර ගන්නත්, ඉක්මනින්ම කර්මාන්ත ආරම්භ කරන ව්‍යාපෘති සකස් කරගෙන එන උදවියට අවශ්‍ය පහසුකම් සපයන්නත් අපි වැඩසටහන් ආරම්භ කර තිබෙනවා. මේවා අතුරු බදු දෙන්න බැහැ. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, ඒ විධියට අවභාවිත වෙමින් තිබෙන ඉඩම් හඳුනා ගන්න අපේ ක්‍රියාවලියක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි වේගයෙන් වැඩ කරනවා කියන පොරොන්දුව ලබා දෙන්න කැමැතියි. ඒවා නැවත ඇත්ත ආයෝජකයන්ට, ව්‍යාපෘතීන්වලට ලබාදිය යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

ජාතික පාසල් 1000 වැඩසටහන යටතේ ස්ථාපිත පාසල්: විස්තර

1,000 தேசிய பாடசாலைகள் வேலைத்திட்டத்தின்கீழ் உருவாக்கப்பட்ட பாடசாலைகள்: விபரம்

SCHOOLS ESTABLISHED UNDER THE 1000 NATIONAL SCHOOLS PROGRAMME: DETAILS

517/2025

1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හර්ෂණ රාජකරුණා මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹர்ஷண ராஜகருணா சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon.Harshana Rajakaruna)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ මේ වන විට ජාතික පාසල් ලෙස නම් කරන ලද පාසල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ජාතික පාසලේ නාම පුවරුව හා ප්‍රධාන පිවිසුම් දොරටුව සැකසීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට එම පාසල් පාලනය කරනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශය මඟින්ද; නොඑසේ නම්, අදාළ පළාත් සභාව මඟින්ද;

(iv) ඒ අනුව, මේ වන විට ස්ථාපිත කර ඇති මුළු ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

(vi) එම ජාතික පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය කර ඒවා රේඛීය අමාත්‍යාංශය යටතට ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 1,000 தேசிய பாடசாலைகளை உருவாக்கும் வேலைத்திட்டத்தின்கீழ் இதுவரை தேசிய பாடசாலைகளாக அறிவிக்கப்பட்டுள்ள

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

பாடசாலைகளின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவு வாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(ii) அந்த ஒவ்வொரு தேசிய பாடசாலைக்கும் பெயர்ப்பலகை மற்றும் பிரதான நுழைவாயிலை அமைப்பதற்கு வழங்கப்பட்டுள்ள தொகை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) தற்போது அந்தப் பாடசாலைகள் நிரல் அமைச்சின்மூலம் நிர்வகிக்கப்படுகிறதா இன்றேல், சம்பந்தப்பட்ட மாகாண சபைமூலம் நிர்வகிக்கப்படுகிறதா என்பதையும்;

(iv) அதன்படி, இதுவரை உருவாக்கப்பட்டுள்ள தேசிய பாடசாலைகளின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(v) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(vi) அந்தத் தேசிய பாடசாலைகளின் பௌதிக வளங்கள் அபிவிருத்தி செய்யப்பட்டு, அவை நிரல் அமைச்சின்கீழ் கொண்டுவரப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of schools that have been designated as National Schools under the programme to establish 1000 National Schools in each of the Divisional Secretary's Division, separately;

(ii) the amount of money that was allocated, separately, for the construction of the name board and the main entrance gate of each of the said National Schools;

(iii) whether the schools concerned are currently administered by the Line Ministry or by the respective provincial council;

(iv) accordingly, the total number of National Schools that have been established up to now;

(v) the names of those schools; and

(vi) whether the physical resources of the said National Schools will be developed and the schools will be brought under the purview of the Line Ministry?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ආවරණය වන පරිදි නිර්ණායක පදනම් කර ගනිමින් පාසල් 836ක් මේ යටතේ සංවර්ධනය සඳහා තෝරා ගනු ලැබිණි. මේ අතරින් පාසල් 23ක් මේ වන විට ස්ථාවර නියෝගය නිකුත් කර ජාතික පාසල් බවට පත් කිරීමට පියවර ගෙන ඇත. මෙම පාසල් ලේඛන ඇමුණුම 01** සහ ඇමුණුම 02හි ඇතුළත් කර ඇත.

ඇමුණුම 02

The List of the Selected Schools Declared as National Schools by issiung Standing Order 50 under 1000 National School Development Programme

Serial No.	Province	District	Zone	DSD	Census No	School Name	School Address	Total Students	Plant	Date of Declaring
1	1.Western	11.Colombo	Piliyandala	Ratmalana	114	MOUNT LAVINIA SCIENGE COLLEGE	LAVINIA	1825	0.5	2022.01.07
2	1.Western	11.Colombo	Sri Jayawardenapura	Sri Jayawardanapura Kotte	152	KOTTE SRI JAYAWARDHANAPURA M.V.	MISSION LANE, KOTTE	1382	0.5	2021.01.07
3	1.Western	12.Gampaha	Gampaha	Dompe	1592	DOMPE DEVI B.M.V.	DOMPE	945	0.5	2022.03.08
4	1.Western	13.Kalutara	Kalutara	Panadura	2001	WADDUWA M M.V.	VIJAYA ROAD, WADDUWA	1874		2022.03.14
5	1.Western	13.Kalutara	Matugama	Walallawita	2358	ITTAPANA COLVIN R DE SILVA M.V.	ITTAPANA	799	0.5	2022.03.14
6	2.Central	21.Kandy	Wathegama	Panvila	3108	RAJASINGHE C C	RAJASINGHE C C PANWILA	454	0.5	2022.01.07
7	2.Central	23.Nuwara Eliya	Hatton	Ambagamuwa	5035	HATTON ST. GABRIEL'S GIRLS' COLLEGE	HATTON	1414	0.5	2022.03.08
8	3.Southern	31.Galle	Galle	Akmeemana	6516	JANADIPATHI BALIKA VIDYALAYA	WALAHANDUWA, GALLE	2320	0.5	2022.03.08
9	3.Southern	32.Matara	Mulatiyana (Hakmana)	Kirinda - Puhulwella	7181	PUHULWELLA MADYA MAHA VIDYALAYA	KIRINDA PUHULWELLA	1249	0.5	2022.01.07
10	3.Southern	33.Hambantota	Tangalle	Beliatta	8154	PUWAKDANDAWA DHAMMAPALA BALIKA VIDYALAYA	PUWAKDANDAWA,BELIATTA	455	0.5	2022.03.08
11	4.Northern	41.Jaffna	Vadamarachchi	Vadamarachchi North (Poir	9333	POINT PEDRO METHODIST GIRLS' HIGH SCHOOL	POINT PEDRO	1255	0.7	2022.03.08
12	4.Northern	45.Kilinochchi	Kilinochchi	Pachchilaipalli	10038	PALLAI CENTRAL COLLEGE	A-09 ROAD, PALLAI	746	0.5	2022.01.07
13	5.Eastern	52.Ampara	Kalmunai	Kalmunai	15203	KALMUNAI MAHMUD LADIES COLLEGE	KALMUNAI	2762	0.5	2022.03.08
14	5.Eastern	53.Trincomalee	Trincomalee North	Morawewa	16031	MAHADIWULWEWA M.V.	MAHADIWULWEWA	445	0.5	2022.01.07
15	6.North Western	61.Kurunegala	Kurunegala	Weerambugedara	17003	UHUMEEYA D.S SENANAYAKA MADYA MAHA VIDYALAYA	UHUMEEYA	1798	0.5	2022.01.07
16	6.North Western	62.Puttalam	Chilaw	Dankotuwa	18282	KIRIMATIYAN BUDDHIST GIRLS' COLLEGE	KIRIMATIYANA LUNUWILA	2053	0.5	2022.03.08
17	7.North Central	71.Anuradhapura	Thambuttegama	Thambuttegama	19296	THAMBUTTEGAMA CENTRAL COLLEGE	THAMBUTTEGAMA	3357	0.5	2022.01.07
18	7.North Central	71.Anuradhapura	Kekirawa	Kekirawa	19457	KEKIRAWA VIDYARTHA M.V.	KEKIRAWA	1693	0.5	2022.03.08
19	8.Uva	82.Moneragala	Moneragala	Siyambalanduwa	22073	SIYAMBALANDUWA M.V.	SIYAMBALANDUWA	582	0.5	2022.01.07
20	8.Uva	82.Moneragala	Bibile	Bibile	22270	BIBILE YASHODHARA G.C.	BIBILE	883	0.5	2022.03.08
21	9.Sabaragamuwa	91.Ratnapura	Ratnapura	Kuruvita	23094	KURUWITA CENTRAL COLLEGE	KURUVITA	2074	0.5	2022.01.07
22	9.Sabaragamuwa	91.Ratnapura	Embilipitiya	Godakawela	23544	RAKWANA ST. JOHN'S TAMIL MAHA VIDYALAYA	RAKWANA	1099	0.5	2022.01.28
23	9.Sabaragamuwa	92.Kegalle	Kegalle	Kegalle	24493	KEGALLE SWARNAJAYANTHI M.V.	KEGALLE	2796	0.5	2022.03.08

***** පුස්තකාලයේ තබා ඇත.***
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(ii) 2021 හා 2022 වර්ෂයන්හිදී ජාතික පාසල් හා ද්විතීක පාසල් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන පළාත් වශයෙන් ඇමුණුම 03 මඟින් දක්වා ඇති අතර, එම එක් එක් පාසල් වෙත වෙන් කළ ප්‍රතිපාදන හා වියදම් සම්බන්ධ තොරතුරු වෙන් වෙන් වශයෙන් මෙතෙක් ලැබී නොමැති අතර, ලද විගස ඉදිරිපත් කරමි.

ඇමුණුම 03

2021 - Release of Allocation

			Establish National Schools in Divisional Secreatariat Divisions , Where there is no National Schools		Upgarde facilities of Secondary Schools to establish 1000 National Schools		
			403-02-07-10-2102	403-02-07-10-2001	403-02-07-11-2102	403-02-07-11-2001	
Se.No	Province	No. of Schools	Allocation Rs.	Allocation Rs.	Allocation Rs.	Allocation Rs.	Total Allocation Rs.
1	North Central Province	53	2,000,000.00	2,000,000.00	51,000,000.00	51,000,000.00	106,000,000.00
2	Uva Province	69	3,500,000.00	6,032,278.00	65,500,000.00	66,282,700.00	141,314,978.00
3	Sabaragamuwa Province	102	10,500,000.00	10,500,000.00	91,500,000.00	91,500,000.00	204,000,000.00
4	Central Province	124	62,000,000.00	62,000,000.00	62,000,000.00	62,000,000.00	248,000,000.00
5	North Western Province	102	51,000,000.00	51,000,000.00	51,000,000.00	51,000,000.00	204,000,000.00
6	Western Province	159	79,500,000.00	79,500,000.00	79,500,000.00	84,180,000.00	322,680,000.00
7	Southern Province	93	87,500,000.00	87,500,000.00	5,500,000.00	5,500,000.00	186,000,000.00
8	Northern Province	50	48,500,000.00	48,500,000.00	1,500,000.00	1,500,000.00	100,000,000.00
9	Eastern Province	70	61,500,000.00	61,500,000.00	8,500,000.00	9,500,000.00	141,000,000.00
	Total	822	406,000,000.00	408,532,278.00	416,000,000.00	422,462,700.00	1,652,994,978.00

2022 - Program of establishing 1000 National Schools

			Establish National Schools in Divisional Secreatariat Divisions , Where there is no National Schools	Upgarde facilities of Secondary Schools to establish 1000 National Schools	
			403-02-07-11-2102	403-02-07-11-2001	
Se.No	Province/ Ministry	No of Schools	Allocation Rs.	Allocation Rs.	Total Allocation Rs.
1	North Central Province	53	-	52,200,000.00	52,200,000.00
2	Uva Province	69	-	47,300,000.00	47,300,000.00
3	Sabaragamuwa Province	102	-	56,700,000.00	56,700,000.00
4	Central Province	124	-	75,100,000.00	75,100,000.00
5	North Western Province	102	-	71,500,000.00	71,500,000.00
6	Western Province	159	-	154,100,000.00	154,100,000.00
7	Southern Province	93	-	85,000,000.00	85,000,000.00
8	Northern Province	50	-	40,000,000.00	40,000,000.00
9	Eastern Province	70	-	75,700,000.00	75,700,000.00
10	Education Ministry		200,000,000.00	19,178,000.00	219,178,000.00
	Total	822	200,000,000.00	676,778,000.00	876,778,000.00

(iii) 2021 හා 2022 වර්ෂයේදී යෝජිත 836හි යම් යම් කාර්යයන් සිදු කිරීමට රේඛීය අමාත්‍යාංශය විසින් එක් එක් පළාත් සභා වෙතින් ප්‍රතිපාදන වෙන් කර දී තිබුණ ද, දැනට අනුමත ජාතික පාසල් 396 හැර අනෙකුත් පාසල් රේඛීය අමාත්‍යාංශය යටතට ගැනීමට කටයුතු නොකරන අතර, පැවති ක්‍රමවේදය අනුවම එම පාසල් පළාත් සභා යටතේ පාලනය වනු ඇත.

[ගරු බිමල් රත්නායක මහතා]

(iv) මේ වන විට ස්ථාපිත කර ඇති මුළු ජාතික පාසල් සංඛ්‍යාව 396ක් වේ.

(v) මේ වන විට ස්ථාපිත කර ඇති මුළු ජාතික පාසල් ලේඛනය ඇමුණුම 04** මඟින් දැක්වේ.

(vi) ජාතික පාසල් බවට අනුමත කර ඇති පාසල් 396 හැර අනෙකුත් පාසල් රේඛීය අමාත්‍යාංශය යටතට නොගැනෙනු ඇත. නමුත්, ජාතික පාසල් බවට පත් කිරීමට යෝජනා කර තිබූ අනෙකුත් පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය පළාත් සභා විසින්ම සිදු කෙරෙනු ලබන අතර, රේඛීය අමාත්‍යාංශය විසින් ද එකී පාසල් සංවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

රජයේ සේවකයන් සඳහා වාහන ආනයනය: විස්තර
அரச அலுவலர்களுக்காக வாகனங்களை இறக்குமதி செய்தல்: விபரம்
IMPORTATION OF VEHICLES FOR PUBLIC SERVANTS: DETAILS

630/2025

2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිත අබේගුණවර්ධන මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Rohitha Abeygunawardhana)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය රජය විසින් ශ්‍රී ලංකාවට වාහන ආනයනය කිරීම නවත්වන ලද දිනය කවරේද;

(ii) එම දිනයෙන් පසු රජයේ සේවකයන් සඳහා ආනයනය කර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එම ආනයනය කරන ලද වාහන අතරින් මේ වන විට රජයේ සේවකයන්ට ලබා දී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(v) එම වාහන ලබා දුන් එක් එක් පුද්ගලයාගේ නම, සේවය කරනු ලබන/ලැබූ ආයතනය සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ආනයනය කරන ලද වාහන අතරින් මේ වනතෙක් රජයේ සේවකයන්ට ලබා දී නොමැති වාහන සංඛ්‍යාව කොපමණද;

(vii) එම වාහන ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

*** පුස්තකාලයේ තබා ඇත.*
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த அரசாங்கம் இலங்கைக்கு வாகனங்கள் இறக்குமதி செய்யப்படுவதை நிறுத்திய திகதி யாது என்பதையும்;

(ii) அந்தத் திகதியின் பின்னர் அரச அலுவலர்களுக்காக இறக்குமதி செய்யப்பட்ட வாகனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அதற்காகச் செலவிடப்பட்டுள்ள பணத்தொகை யாது என்பதையும்;

(iv) அவ்வாறு இறக்குமதி செய்யப்பட்ட வாகனங்களில் இதுவரை அரச அலுவலர்களுக்கு வழங்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(v) அந்த வாகனங்கள் வழங்கப்பட்ட ஒவ்வொரு நபரினதும் பெயர், பணியாற்றுகின்ற/ பணியாற்றிய நிறுவனம் மற்றும் பதவி வெவ்வேறாக யாது என்பதையும்;

(vi) இறக்குமதி செய்யப்பட்ட வாகனங்களில் இதுவரை அரச அலுவலர்களுக்கு வழங்கப்படாதுள்ள வாகனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vii) அந்த வாகனங்களை வழங்காமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development :

(a) Will he inform this House the -

(i) date on which the previous Government suspended the importation of vehicles into Sri Lanka;

(ii) number of vehicles that have been imported for public servants since that date;

(iii) amount of money spent on the importation of the said vehicles;

(iv) number of vehicles that have been allocated to public servants so far, out of the imported vehicles mentioned above;

(v) names of the individuals to whom the said vehicles have been allocated, along with the respective institutions they serve/served and their designations, separately;

(vi) number of vehicles that have not yet been handed over to public servants, out of the imported vehicles referred to above; and

(vii) reasons for not handing over the vehicles to public servants?

(b) If not, why?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2020 මැයි 22.

(ii) එදිනෙන් පසුව රාජ්‍ය සේවකයන් සඳහා වාහන ආනයනය කර නොමැත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

මන්මුනෙ උතුර ප්‍රා.ලේ. කොට්ඨාසයේ ඉඩම් බලපත්‍ර සහිත රජයේ ඉඩම්: පදිංචිකරුවන්
மண்முனை வடக்கு பிரதேச செயலாளர் பிரிவில் காணி உரிமப் பத்திரங்களுடனான அரச காணிகள்: குடியேற்றவாசிகள்
STATE LANDS WITH LAND PERMITS IN MANMUNAI NORTH DS DIVISION: SETTLERS

874/2025

8. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. (Dr.) M.L.A.M. Hizbullah)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාලවකවානුව තුළ රජයේ `දීමනා පත්‍ර' හෝ `ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017.01.01 திகதி தொடக்கம் 2025.03.31 திகதி வரையான காலப்பகுதியில், மட்டக்களப்பு மாவட்டத்தின், மண்முனை வடக்கு பிரதேச செயலாளர் பிரிவில், 'அளிப்புப் பத்திரங்கள்' அல்லது 'காணி உரிமப் பத்திரங்கள்' வழங்கப்பட்ட அரச காணிகளில் மக்கள் வசிக்கின்றார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் என்பன யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation :

(a) Will he inform this House -

(i) whether he is aware that people have settled in the State lands for which "grant documents" or "land permits" were given during the period from 01.01.2017 to 31.03.2025, out of the State lands situated in the Divisional Secretary's Division of Manmunai North in the Batticaloa District; and

(ii) if so, total number of such people, their names and other relevant information?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාලකවානුව තුළ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දුන් බලපත්‍ර 136ක තොරතුරු ඇමුණුම 01** ලෙස ඉදිරිපත් කරමි.

***** පුස්තකාලයේ තබා ඇත.***
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු සුසිල් රණසිංහ මහතා]

මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෛ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාලකවානුව තුළ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දුන් දීමනා පත්‍ර 61ක තොරතුරු පහත වගුව මඟින් ඉදිරිපත් කරමි.

DETAILS OF ISSUED LDO GRANTS FOR PUBLIC 2017.01.01-2025.03.31

S/N	Year	Name	Grant Number	GN Division	Present Situation
1	2017	Kasupathy Pakkiyarasa	GR/15/040916	Iruthayapuram East	Rentout
2	2017	Sarathathevi Sinnathambi	GR/15/039745	Iruthaypuram East	Residing
3	2017	Mohan Priyatharshini	GR/15/039752	Kallady Mugathuwaram	Residing
4	2017	Kanthaiya Kumarasamy	GR/15/039749	Kallady Mugathuwaram	Residing
5	2017	Kamalathevi Shanthalingam	GR/15/039753	Kallady Mugathuwaram	Residing
6	2017	Kanakaretnam Nishanthi	GR/15/039748	Kallady Mugathuwaram	Residing
7	2017	Nakeshwaran Subajini	GR/15/039747	Kallady Mugathuwaram	Residing
8	2017	Vadivel Vimalathevi	GR/15/039754	Kallady Mugathuwaram	Permit cancelled and applied for Long Term Lease
9	2017	Karuneshwary Paskaran	GR/15/039750	Kallady Mugathuwaram	Residing
10	2017	Regina Iruthayaraj	GR/15/039751	Kallady Mugathuwaram	Residing
11	2017	Saratha Devid	GR/15/039746	Mamangam	Residing
12	2017	Sivaraj Raveendran	GR/15/045652	Iruthayapuram East	Residing
13	2018	Verginia Peters	GR/15/099864	Dutchbar	Residing
14	2018	Kanapathipillai Vettrivel	GR/15/049865	Palameenmadu	Residing
15	2018	Kirakari Rajenthiram	GR/15/049866	Thiruchendoor	Residing
16	2022	Letrisiya Dilani Mariyaselvam	GR/51/18/51/26630	Iruthayapuram Central	Residing
17	2022	Thiyaharasa Annamary	GR/15/064365	Kallady Mugathuwaram	Residing
18	2022	Klary Aknes	GR/15/064364	Kallady Mugathuwaram	Residing
19	2022	Krakary Santhanammah	GR/15/064363	Kallady Mugathuwaram	Residing
20	2022	Suthakaran Geetha	GR/51/18/51/29176	Navalady	Develop by Grantee
21	2022	Sathiyavany Yoganathan	GR/51/18/26629	Puthunagar	Residing
22	2023	Somasuntharam Poonkothai	GR/51/18/51/29177	Navalady	Develop by Grantee
23	2024	Jude Riyans Bounsar	GR/51/18/36574	Dutchbar	Residing
24	2024	Sellappa Saroja	GR/51/18/36559	Iruthayapuram Central	Residing
25	2024	Antonythas Thusyanthan	GR/51/18/36556	Iruthayapuram East	Rentout
26	2024	Don Simon Ralalage Mangalikka Wijesinge	GR/51/18/38195	Iruthayapuram East	Residing
27	2024	Kathirkamathamby Nallamah	GR/51/18/38194	Iruthayapuram East	Residing
28	2024	Antony mary	GR/51/18/38180	Iruthayapuram West	Residing
29	2024	Michal Joseph Bathlot	GR/51/18/32058	Jeyanthipuram	Residing
30	2024	Tharmaretnam Niranjalathevi	GR/51/18/36593	Kallady Mugathuwaram	Residing
31	2024	Kanthasamy Lakshmi	GR/51/18/36555	Kallady Veloor	Residing
32	2024	Gunaledchumi selvarajah	GR/51/18/36568	Kallady Veloor	Residing
33	2024	Thiyaharaja Iyer Kamalaraja sharma	GR/51/18/36785	Kallady Veloor	Residing
34	2024	Sellathamby Nimaleshwary	GR/51/18/38183	Kallady Veloor	Residing
35	2024	Sellathamby Mangaleshwary	GR/51/18/38182	Kallady Veloor	Residing
36	2024	Ponnaiya Pushpamalar	GR/51/18/38181	Kallady Veloor	Residing
37	2024	Thevasahayam Kosalaruban	GR/51/18/36675	Karuveppankeny	Rentout
38	2024	Kanapathipillai Nagaledsumy	GR/51/18/36562	Kokkuvil	Residing
39	2024	Sellapakkiyam Siththiravel	GR/51/18/38184	Kokkuvil	Residing
40	2024	Maheshwary Joseph	GR/51/18/38178	Koolavady	Residing
41	2024	Sebastian Mariyarose	GR/51/18/36560	Koolavady	Residing
42	2024	Mariya Hodrin Vincent	GR/51/18/36565	Koolavady East	Residing
43	2024	Ramanathan Rajani	GR/51/18/38185	Mamangam	Residing
44	2024	Sivarasa Srithar	GR/51/18/36567	Navalady	Residing
45	2024	Sivarasa Nirmalarajah	GR/51/18/36566	Navalady	Residing
46	2024	Somasuntharam Puwaneshwary	GR/51/18/36552	Navalady	Develop by Grantee
47	2024	Thampiyappa Usulathevi	GR/51/18/32059	Puthunagar	Residing
48	2024	Mylvganam Navashakthi	GR/51/18/36580	Puthunagar	Residing
49	2024	Mylvganam Navarajani	GR/51/18/36577	Puthunagar	Residing
50	2024	Veerasingam Logarani	GR/51/18/36553	Puthunagar	Residing
51	2024	Mylvaganam Navamsan	GR/51/18/36578	Puthunagar	Residing
52	2024	Rajanikanth Krishnakumary	GR/51/18/36573	Seththukudah	Residing
53	2024	Thiyaharaja Krishathevi	GR/51/18/36554	Seththukudah	Residing
54	2024	Santhirathas Krishnathas	GR/51/18/36563	Seththukudah	Residing
55	2024	Chandrathas Chandrakumary	GR/51/18/36564	Seththukudah	Residing
56	2024	Vinasithamby Parameshwary	GR/51/18/36572	Thiraimadu	Residing
57	2024	Franciska Naguleshwaramoorthy	GR/51/18/32056	Thiruchendoor	Residing
58	2024	Priyatharshini Amshrong	GR/51/18/36551	Thiruchendoor	Residing
59	2024	Rajenthiram Aruljothy	GR/51/18/36576	Thiruchendoor	Residing
60	2024	Pancharetnam Kananathan	GR/51/18/36786	Thiruchendoor	Rentout
61	2024	Angalarahini Vasanthakumar	GR/51/18/36570	Thiruchendoor	Residing

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා සභා ගර්භයේ සිටින අවස්ථාවේදීම මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, හෙට දිනයේ විවාදයට නියමිතව තිබුණේ, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත බව ඔබතුමා දන්නවා. ඊයේ දිනයේ ඔබතුමා Parliamentary Business Committee එක කැඳෙව්වා. එතැනදී සාකච්ඡාවට භාජන වුණා, ඒක තාවකාලිකව withdraw කරලා, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව විවාදයට ගැනීමට. ඇත්තවශයෙන්ම අද දිනයේ අපි ඒ කාරණාව පිළිබඳව විපක්ෂයේ දේශපාලන පක්ෂවල නායකවරුන් සමඟ සාකච්ඡා කළා. හැබැයි අපි ඊයේත් පෙන්වා දුන්නා, පැහැදිලි ධවල පත්‍රිකාවක් - White Paper එකක් - නොමැතිව එම විවාදය පවත්වා ගෙන යාම අසාර්ථක කාර්යයක් බව. මොකද, ඇත්තවශයෙන්ම ඒ ධවල පත්‍රිකාව කේන්ද්‍රගත කරගෙන තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව විධිමත් සාකච්ඡාවක් කරන්නට පුළුවන් වන්නේ. නැත්නම් කියන්න පුළුවන්, "නැහැ, මේක ඇතුළත් වෙනවා, මේක ඉවත් වෙනවා" යනාදී වශයෙන්. ඇත්තවශයෙන්ම ඊයේ දවසේ ගරු අග්‍රාමාත්‍යතුමියත් මේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. හැබැයි ඒ ඉදිරිපත් කළේ, ධවල පත්‍රිකාවක් මාර්ගයෙන් නොවෙයි. එහෙම නැත්නම්, ඒ සම්බන්ධයෙන් විධිමත් පත්‍රිකාවක් නොවෙයි ඉදිරිපත් කළේ. ඇත්තටම PowerPoint presentation එකක් කළේ. ඉතින් ඒ PowerPoint presentation එක පදනම් කරගෙන මේ රටේ අධ්‍යාපනයේ සිදු කරන්නට අදහස් කරන පරිවර්තනාත්මක වෙනස පිළිබඳව විවාද කිරීම ඒ තරම් සුදුසු නැහැ; ඒක අවිධිමත්. ඒ නිසා, ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම මේ අවස්ථාවේදී නැවතත් මේ සභා ගර්භය තුළදී මම ඉල්ලීමක් කරනවා. හෙට දවසේ ඒ විවාදය පවත්වන්නට නම් මේ රජය මේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව අඩුම ගණනේ විධිමත් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්නට ඕනෑ. එවිට ඒ පත්‍රිකාව කේන්ද්‍රගත කරගෙන, ඒ ධවල පත්‍රිකාව කේන්ද්‍රගත කරගෙන අපට ඒ විවාදය පවත්වන්නට පුළුවන්.

ඒ වාගේම මම ඔබතුමාට කිව්වා, මේ සඳහා එක් දිනක විවාදයක් නොවෙයි, දින තුනක පමණ විවාදයක් අවශ්‍යයි කියලා. මොකද, පක්ෂ-විපක්ෂ සියලුදෙනාටම මේ පරිවර්තනාත්මක වෙනස ගැන ඉදිරිපත් කරන්න අදහස් රාශියක් ඇති. ඒ නිසා, මම ඉල්ලීමක් කරනවා. හෙට දිනයේ යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ විවාදය පවත්වන්නට නම් රජය විසින් ඉදිරිපත් කරන විධිමත් ධවල පත්‍රිකාවක් අපට අවශ්‍යයි. එහෙම නැතිව PowerPoint presentation එකක් හමුවේ අප මේ විවාදය කිරීම, ඇත්තටම අධ්‍යාපන ක්ෂේත්‍රයට; නිදහස් අධ්‍යාපනයට කරන නිග්‍රහයක් හැටියටයි අපි දකින්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා පෙන්වා දුන් කරුණ පිළිබඳව මම පැහැදිලි කිරීමක් කරන්නම්. ඊයේ Parliamentary Business Committee එකේදී මේ පිළිබඳව අපි සාකච්ඡා කළා. යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව මන්ත්‍රීවරුන් සහ පොදු මහජනතාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් රටේම අවශ්‍යතාවක් තිබෙනවා. ඒ අනුව, දැනුවත් කිරීම් රාශියක් යොදා ගෙන තිබෙනවා. මම හිතන විධියට දැනට අවස්ථා දෙකකදී ගරු අගමැතිතුමියම මේ පාර්ලිමේන්තුවට ඒවා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ එක පියවරක් ලෙස තමයි යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව සාකච්ඡා කිරීමට හෙට දිනයේදී පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලාට අපි අවස්ථාවක් ලබා දීලා තිබෙන්නේ. විපක්ෂයේ ඉල්ලීම මත අපි ඊයේ ඔබතුමාට දැනුම් දුන්නා, යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව පාර්ලිමේන්තුව තුළ අඛණ්ඩ සංවාදයක් පැවැත්වීමට අපි ලැස්තියි කියලා. දින වෙන් කර ගැනීම අවශ්‍යයි. අවසාන වශයෙන් මේක සම්මත වනකල් අවශ්‍ය නම් මාසෙන් මාසය වුණත් යෝජනාවලියක් විධියට සංවාදයක් පවත්වාගෙන යන්න අපි ලැස්තියි. මොකද, මහජනතාව සම්පූර්ණයෙන්ම සම්බන්ධ කර ගන්නේ නැතිව, මහජනතාවට සම්පූර්ණ අදහසක්, සියයට සියයක විනිවිදභාවයක් දෙන්නේ නැතිව, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කිරීම සුදුසුත් නැහැ, කළ යුතුත් නැහැ. ඒ නිසා ආණ්ඩුවේ ස්ථාවරය තමයි උපරිම වශයෙන් මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා හැම වේදිකාවක්ම භාවිත කරන එක. ගරු අගමැතිතුමිය දැන් වෘත්තීය සමිති, ශිෂ්‍ය සංගම්, විවිධ ආචාර්ය, මහාචාර්යවරු මුණ ගැහෙනවා.

මේවා යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ. එතකොට White Papers ඉදිරිපත් කරනවා කියන එක එංගලන්ත පාර්ලිමේන්තුවේ තිබෙන දෙයක්. ගරු කථානායකතුමනි, printing machines නොතිබුණු කාලයේ තමයි White Papers හැදුවේ. White Papers හදන එක අමාරුයි. White Paper යුගයෙන් දැන් අපි ඩිජිටල් යුගයට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා PowerPoint presentations වෙන්න පුළුවන්, වෙනත් තාක්ෂණික මට්ටමකට එන්න පුළුවන්, ඒකෙන් කිසිම නිග්‍රහයක් වෙන්නේ නැහැ. මොකද, printing machines නොතිබුණු කාලයේ තමයි අමාරුවෙන් special White Papers හැදුවේ. ඒවා white කළෙත් අමාරුවෙන්. දැනට තිබෙන දේ තමයි, එවැනි අවසානාත්මක ලියවිල්ලක් නැති නිසා එහෙම එකක් හදන්න අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරලා නැහැ. මොකද, ඒක පුළුල් මහජන සංවාදයකින් පසුව තමයි හදන්න වෙන්නේ, ගරු කථානායකතුමනි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන්නේ සාකච්ඡා, සංවාද තුළින් ගොඩ නැඟිය යුත්තක්. අධ්‍යාපනය පිළිබඳ වැඩි අවබෝධයක් තිබෙන අධ්‍යාපනඥයන්ට, ගුරුවරුන්ට, අධ්‍යාපන අමාත්‍යාංශයට එහි වැඩි වගකීමක් තිබෙනවා.

හැබැයි, ඒ වාගේම පොදු මහජනතාවගේ අදහස් මත හා විවිධ වෘත්තිකයන්ගේ අදහස් මත ද ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සකස් වෙනවා. ඒ නිසා ගරු අගමැතිතුමිය ඉදිරිපත් කරපු PowerPoint presentation එක හෝ වෙනත් කුමන හෝ ලියවිල්ලක් අවසානාත්මක ලියවිල්ලක් වෙන්නේ නැහැ. මොකද, එහෙම අවසානාත්මක ලියවිල්ලක් නැහැ. එහෙම ලියවිල්ලක් තිබෙනවා නම්, අපි නැවත මේ ගැන සංවාද කරමින් ඉන්න අවශ්‍යතාවක් නැහැ. එහෙම නම් අපි ඒක පනත් කෙටුම්පතක් ලෙස ඉදිරිපත් කරනවා. ඒ නිසා අපි ඊයේ ඉතා පැහැදිලිව දැනුම් දුන්නා, මේ සංවාදවල ප්‍රතිඵලයක් ලෙස තමයි අපේ රටේ දරුවන්ට ඉතාම සුදුසු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව අවසාන ලියවිල්ලක් සකස් කරන්න බලාපොරොත්තු වෙන්නේ කියන එක. මට

[ගරු බිමල් රත්නායක මහතා]

හරියටම මාසයක් කියන්න බැහැ. අපේ සාකච්ඡා සම්මුතිය හරහා හදා ගන්නා ඒ ලියවිල්ල ස්ථිර වශයෙන්ම ලබන අවුරුද්දේ ජනවාරි 01වැනි දාට කලින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ නිසා සංවාදයක් තුළ document එකක්, වැඩ පිළිවෙළක් develop කර ගන්නා විධියේ ප්‍රවේශයක තමයි අපි ඉන්නේ. මට ඒ පිළිබඳව කියන්න තිබෙන්නේ ඒකයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අපි ඊයේ Parliamentary Business Committee එකේදී කථා වෙලා මේ සම්බන්ධව තීරණයක් ගත්තා. මෙතැන විවාදයක් නැහැ. අපි හෙට ඒ ගැන විවාද කරමු, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලා සමඟ එකඟ වෙමින් කෙටි අදහසක් පමණයි මට කියන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදහසක් දක්වන්න ඉඩ දෙන්න බැහැ.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. ගරු කථානායකතුමනි, මේ කාරණාව පැහැදිලි කරන්න මට විනාඩියක් ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අහන්නකෝ. ඔබතුමා නැඟී සිටියාම මම ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා, මේ සම්බන්ධයෙන් කියන්න. ඒකට ගරු සභානායකතුමාත් ප්‍රතිචාරයක් දැක්වූවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට තත්පර 30ක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, White Paper එකක් හැටියට අපි අදහස් කරන්නේ, අවසන් document එක නොවෙයි. ඒක discussion document එකක්, සාකච්ඡාවට භාජන කරන මූලික පත්‍රිකාවක්. ගරු සභානායකතුමනි, එහෙම නැතුව අපි ඉල්ලුම් කරන්නේ අවසන් document එකක් නොවෙයි. ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමැතියි, අපට ඉදිරිපත් කරපු කරුණු කාරණා අනුව පැහැදිලිවම ඉතිහාසය - History - කියන විෂය optional විෂයක් කරලා තිබෙනවා, තොරතුරු තාක්ෂණය කියන විෂයත් optional විෂයක් කරලා තිබෙනවා. ඒ දෙකම ස්ථිරවම තිබිය යුතු අනිවාර්ය විෂයයන්. හැබැයි, ඒ පිළිබඳව අවිධිමත්ව සාකච්ඡා කරන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඊයේ Parliamentary Business Committee එකේ කථා වෙලා ගත් තීන්දුවක් තිබෙනවා. ඒ තීන්දුව අනුව අපි හෙට දිනය මේ සම්බන්ධ විවාදය සඳහා වෙන් කර තිබෙනවා. ඒ නිසා හෙට දින ඒක සාකච්ඡාවට ගනිමු.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

SVAT ක්‍රමයේ සිට යෝජිත VAT ආපසු ගෙවීමේ ක්‍රමයට පරිවර්තනය වීමේදී ඇතිවන බලපෑම්
SVAT முறையிலிருந்து VAT திருப்பிச் செலுத்தும் முறை எனும் மாற்றத்தின் விளைவுகள்
EFFECTS OF TRANSITION FROM SVAT SYSTEM TO VAT REFUND SYSTEM

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, I seek permission to raise the following Question under Standing Order 27(2):

It has come to light that effective from 01st of October, 2025, the Simplified VAT - SVAT- mechanism, which has been a vital tool in supporting exporters and deemed exporters with their cash flow requirements, is to be abolished in line with policy directives reportedly linked to the International Monetary Fund, IMF, Extended Fund Facility.

Under the proposed alternative, exporters are to rely on a VAT refund system with an assurance of processing within 45 days. However, there is a widespread concern and distrust among the exporter community with the Inland Revenue Department's historical delays and inefficiencies in processing refunds, some of which have taken months, if not years. Hon. Minister, you know that there are refunds outstanding from 2007, which is roughly 18 years.

The unresolved situation of the imposition of new universal tariffs by the US administration makes Sri Lankan products less competitive, creating an uncontrollable problem for the exporter. As you know, today, Japan has hit a 15 per cent tariff deal with the US; Vietnam has a tariff rate of 20 per cent, the Philippines, 19 per cent and India is looking for a rate of 15 to 18 per cent.

Given the fact that export earnings are crucial to Sri Lanka's economic recovery, foreign exchange stability and employment generation, the sudden withdrawal of the SVAT scheme without an effective and a tested refund mechanism may lead to severe cash flow constraints, possible business closures and loss of export competitiveness. Also, as you know, there are companies now shifting to Dubai, the Bahamas, Malaysia et cetera. And, I just heard that Indonesia has also hit a 19 per cent tariff deal with the US.

Sir, therefore, I respectfully request the Hon Minister to answer the following:

1. රජය මොන හේතුවක් මත මෙතරම් විශේෂිත ආර්ථික තත්ත්වයකදී SVAT ක්‍රමය අවලංගු කිරීමට තීරණය කළාද? වසර ගණනාවක් ගත වූ ආපසු ගෙවීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිහාසය පිළිබඳව අපනයනකරුවන් අතර විශාල විශ්වාස ඌනතාවක් පවතී.

2. වට්ටම් බද්ද ආපසු ගෙවීම් දින 45ක් ඇතුළත සිදු කරනු ඇතැයි කියූ පොරොන්දුව සහතික කිරීමට ඇති නීතිමය, පරිපාලනමය සහ තාක්ෂණික ආරක්ෂක ක්‍රම විශේෂයෙන් මොනවාද?

   මොකද මට ආරංචියි, දැන් මේක risk assessment එකක් අනුව කරලා කොම්පැනි 10කට, 15කට දීලා ඊට පස්සේ සාමාන්‍ය තත්ත්වයකට එනවාය කියන එක. ගරු ඇමතිතුමනි, මේ නිසා අපේ අපනයනකරුවන්ට විශාල බියක් ඇති වෙලා තිබෙනවා.

3. ආපසු ගෙවීම් ප්‍රමාද වීමෙන් අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා තෙවන පාර්ශ්ව විගණන ක්‍රමයක් හෝ සහතිකයක් හඳුන්වා දිය හැකිද?

4. අපනයනකරුවන්ගෙන් වහාම ගෙවීම් ලබන නිසා ආදායම මුදල් මත රඳා සිටින නිශ්චිත අපනයනකරුවන්ට ඇති වන බලපෑම පිළිබඳව රජය ඇගැයීමක් සිදු කර තිබේද?

5. ප්‍රතිපත්ති මාරුවීමේදී අපනයන ක්ෂේත්‍රයේ ව්‍යාපාරික ක්‍රියාකාරිත්වයට බාධා නොවීම සඳහා රජය විසින් මොන ප්‍රතිපත්තිය පිළිගත්තාද?

6. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපාරිකයන්ට ආරක්ෂාව සහිතව, කාලෝචිතව ආපසු ගෙවීම් සිදු කරවීම සඳහා සම්පූර්ණයෙන් සංවර්ධනය කර පරීක්ෂා කළ අවදානම් මත පැන වූ VAT ආපසු ගෙවීම් පද්ධතියක් වාර්තා විය හැකිද?

7. IMF විසින් ලබා දුන් නිර්දේශ සහ එමඟින් රජය විසින් හඳුන්වා දුන් SVAT අවලංගු කිරීමේ සැලැස්ම සහ ඒ සම්බන්ධ සියලුම තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකිද?

   ගරු කථානායකතුමනි, IMF එක සමඟ ගිවිසුම්ගත වුණාට පසුව තමයි ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ඇමෙරිකානු කොම්පැනිවලට අපිත් එක්ක එකඟතා ගිවිසුමක් අත්සන් කරන්න බාධාවක් ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා අපට IMF එකට කියන්න පුළුවන්, ඔබතුමන්ලා අපට මේක කිව්වාට ඔබතුමන්ලාගේ ඇමෙරිකාවෙන් ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා කියලා. මොකද, 2028 වර්ෂය වනකොට එන්නේ භයානක තත්ත්වයක්.

8. SVAT ක්‍රමයෙන් VAT ආපසු ගෙවීම් ක්‍රමයට මාරුවීමේදී අපනයනකරුවන්, නිශ්චිත අපනයනකරුවන් සහ කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයන්, that is micro, small and medium enterprises, විශේෂයෙන් මුදල් ගැටලුවලට මුහුණ දීමේ අවදානම සැලකිල්ලට ගෙන, බැඳි මුදල් පහසුකම්, VAT හරස් වෙළෙඳාම් ක්‍රම හෝ අභිප්‍රායගත අපහසු ගෙවීම් නාළිකා වැනි අතුරු මුදල් සහාය ක්‍රම හඳුන්වා දීමට රජය සූදානම් ද?

ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, මෙහි ප්‍රශ්න 8ක් තිබෙනවා.

1. ප්‍රධාන වශයෙන්ම SVAT system එක නවත්වන්න ගත් තීරණය ඇත්තටම හදිසියේ ගත් තීන්දුවක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. මේ සම්බන්ධයෙන් දීර්ඝ කාලීනව අධ්‍යයනය කරමින් ඇවිල්ලා තිබෙනවා වාගේම, VAT ආපසු ගෙවීම ඒකේම කොටසක්. දැනට parallel systems කිහිපයක් ක්‍රියාත්මක වෙනවා. SVAT, ඒ වාගේම RAMIS එක වෙනුවට unified system එකක් ගෙන ඒම සඳහා ගත් තීන්දුවක් තමයි අපි ක්‍රියාත්මක කරන්නේ. එමඟින් අනිවාර්යයෙන්ම IRD එක develop කරනවා. තිබෙන RAMIS එකේ කලින් තිබුණු අත්දැකීම තමයි මේ refund එක වේගයෙන් එන්නේ නැහැයි කියන එක. නමුත්, දැන් IRD එක ඒ සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනය කරලා තිබෙනවා.

2. Specific legal, administration and technological safeguards අරගෙනද කියන කාරණය තමයි මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ. අද තාක්ෂණය දියුණු තත්ත්වයක තිබියදී අපේ ආණ්ඩුවේත් අරමුණ වෙලා තිබෙන්නේම digitalization පැත්තට මාරු වීම. ඒ අනුව මේ risk assessment system එකෙන් medium, low and high risks assess කරලා within 45 days අපි low and medium risk category එකේ අයට ගෙවීම් සිද්ධ කරනවා. High risk category එකේ අයටත් ඔවුන්ගේ basic verification එකෙන් පසුව අපි ගෙවීම් සිද්ධ කරනවා. *[බාධා කිරීමක්]* නැහැ, risk assessment එක automatically කරන්නේ, system-embedded නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, ඒක තමයි දැන් සාකච්ඡා කෙරෙන්නේ. මේ ජූලිවලදී simulation එක එනවා නේ. ඇත්තටම අපි දැනට risk assessment එක කරන්නේ system-based risk assessment එකක් විධියට.

[ගරු අනිල් ජයන්ත මහතා]

3. System-embedded system එකක් එන නිසා අපට third-party ratification එකකට යෑමේ අවශ්‍යතාවක් නැහැ, මේ තුළින් එයත් සිද්ධ කරන නිසා.

4. Deemed exportersලා සම්බන්ධයෙන් මතු කරපු කාරණයේදී, ඇත්තටම automatically මේ refund එක එනවා නම්, deemed exportersලා ප්‍රශ්නයක් ඇති කර ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේක මේ විධියටම ක්‍රියාත්මක වන තත්ත්වයකදී deemed exportersලාට මොකක්ද වෙන්නේ කියන එක අරගෙන බැලුවොත් තමයි, මේ ප්‍රශ්නය පැන නඟින්නේ. ඒ නිසා ඒකට අදාළ ක්‍රියාමාර්ග, ඒ කියන්නේ cash flow disruption එකක් ඇති නොවන විධියට refund එක කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. *[බාධා කිරීමක්]* ඉස්සෙල්ලා මම පිළිතුර ලබා දීලා ඉන්නම්, ගරු මන්ත්‍රීතුමා.

5. The regulations and the requirements under the regulations would be implemented to facilitate and provide refunds within the earliest possible period, subject to exporters submitting correct information and documents to the system. The compliance requirement is that correct information should be submitted.

6. Yes. As I highlighted earlier, a risk-based system is already adopted, under which the risk is categorized into three categories: high, medium and low. Exporters facing risk have been identified based on the categorization refund mechanism. Then, the refund mechanism will be implemented. The RAMIS system has already been developed to have an e-filing system. This is not possible without having e-invoicing and e-filing of VAT returns. It is being tested. Then, refunds could be paid within 45 days for low and medium-risk categories.

7. The IMF recommendations have already been tabled in Parliament. Further, it is available on the website of the Treasury as well.

8. The IRD is making arrangements to implement the system. According to the system, there would be a risk-based assumption mechanism to provide refunds within the shortest possible time period to minimize any challenges to exporters. Since that has already been discussed to be incorporated in the Act, the new proposal would be brought up as an Amendment to the Act.

Thank you very much.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මම එම ප්‍රශ්නය ඒ වෙලාවේ ඇහුවේ ඒක ඉතාම ප්‍රායෝගිකව තව දවස් 35කින්, 40කින් ක්‍රියාත්මක වන නිසායි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරයෙන් කියනවා, "මේක නිවැරදිව ඉදිරිපත් කරන්න ඕනෑ" කියලා. අපිත් උපකල්පනය කරනවා, අනිවාර්යයෙන්ම ඒක තමයි විය යුත්තේ කියලා. නමුත්, අපේ රටේ මහ බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට තමන්ගේ US Dollars 1.8 billion වරද්දලා කියනවා නම්, කොම්පැනිවලින් වැරදීමක් වන එක ලොකු දෙයක් නොවෙයි නේ. ඒ සම්බන්ධයෙන් කෙටි උත්තර ගන්න පුළුවන්, නිකරුණේ අපනයනකරුවන්ට ප්‍රශ්නයක් ඇති කරන්න. මම අපනයනකරුවන් වෙනුවෙන් කථා කරන්නේ මේ නිසා, ගරු කථානායකතුමනි. සියයට 25ක් පොලී ගෙවමින්, සියයට 36ක් බදු ගෙවමින්, විදුලි බිල හා වතුර බිලත් ගෙවන්න තිබියදී, ට්‍රම්ප්ලාගෙනුත් ප්‍රශ්න ඇති වනකොට ඉතාම අමාරු, අසීරු තත්ත්වයක් තමයි අපේ අපනයනකරුවන්ට ඇති වන්නේ. ලංකාවේ අපනයනවලින් සියයට 63ක් deemed exportersලා හරහා තමයි අපේ අපනයනකරුවන් මේ බිලියන 13 රටට ගෙනෙන්නේ. VAT එක ගෙවන්න පටන් ගත්තාම, ඒ deemed exportersලාගේ cash flow එකට ප්‍රශ්නයක් ඇති වන නිසා ඒක බරපතළ ප්‍රශ්නයක් වනවා. ඉතින්, ප්‍රායෝගික අත්දැකීමක් නැතුව, නොදැනුවත්වම ප්‍රශ්නයක් ඇති වන අපනයනකරුවන් වෙනුවෙන් මම ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, e-filing අත්‍යවශ්‍යයි කියලා. බොහොම හොඳයි. E-filing වනතාක් කල් SVAT එක ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම තමයි මම ඉතා ඕනෑකමින් කථානායකතුමා මඟින් ඔබතුමාගෙන් ඉල්ලන්නේ. මේක අසාධාරණ ඉල්ලීමක් නොවෙයි. ඔබේ e-filing එක හෝ මේකේ VAT එක automatic කරනතාක් කල් විතරක් මේක කල් දමන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ. ඔබට IMF එකට ගිහින් කියන්න පුළුවන්, අපට නොතිබුණු ප්‍රශ්න අද ඇවිත් තිබෙනවා, ඒ නිසා අපේ අපනයනකරුවන් ආරක්ෂා කිරීම අත්‍යවශ්‍යයි කියලා. ඊයේ Anti-dumping Duty එක සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වුණාම වසන්ත සමරසිංහ ඇමතිතුමා කිව්වා, input cost එක ගැන. Input cost එකට මේ ප්‍රශ්නය ඇති වුණාම refund කරන්න මාස හතරක් යනවා කිව්වොත් ඒකෙන් Anti-dumping Duty එකට වුණත් ප්‍රශ්නයක් ඇති වනවා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, ඇත්තටම අපේ ගරු මන්ත්‍රීතුමා මේ මතු කරන අතුරු ප්‍රශ්නයෙන් කියන්නේ දැනට පවතින තත්ත්වය සහ අතීතයේදී පැවැති තත්ත්වයයි. මගේ පිළිතුරේදීත් පැහැදිලි කළේ අපේ VAT refund system එක තුළ parallel systems ගණනාවක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා කියන එකයි. ඉතින්, අපි උපකල්පනය කරන එකම පවත්වාගෙන යමින් නම් මේක abolish කරන්නේ, ඒක ගැටලුවක්. ඒක එහෙම නොවෙයි. අපි ඒ වෙනුවට single system එකකට ගෙන ඒමයි කළ යුත්තේ. එම නිසා අපි ඒ සඳහා මැදිහත් වීමයි කළ යුතු වන්නේ. එහෙම නැතුව parallel පවත්වාගෙන ගියොත් මේ ප්‍රශ්නය පැන නඟිනවා. ඒ සඳහා අපි ප්‍රමාණාත්මක මුදලක් digitalization වෙනුවෙන් වියදම් කරලා තිබෙනවා; තාක්ෂණය කැඳවලා තිබෙනවා. ඔබතුමාට මම අත්දැකීමෙන් කියන්නේ. IRD එක කලින් මේ refund system එක පිළිබඳව කැමැත්තක් දැක්වූයේ නැහැ. දැන් ඒගොල්ලන් ඒ පිළිබඳව කැමැත්තක් දක්වනවා විතරක් නොවෙයි, එම වැඩකටයුත්තත් වේගයෙන් කරමින් ඉන්නවා. අදාළ ආයෝජන සිදු කරමින් පවතිනවා. දැන් RAMIS එක එතැනට ඇතුළත් කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු deemed exportersලාගේ ප්‍රශ්නය ගැන කිව්වොත්, ඇත්තටම exporterට refund එක නිසි පරිදි risk-based ලැබෙනවා නම් ඒක deemed exporterට ලබා දෙන එක exporterගේ වගකීමක්. දැන්

ඒගොල්ලන් දෙන්නේ නැහැ හෝ මොනවා හෝ කියනවා නම් ඒක IRD එකෙන් බේරන්න බැහැ. දැන් වෙලා තිබෙන්නේ exportersලා විසින් deemed exportersලාට දෙන්නේ නැතිකමයි. එතකොට අපි ඒ අය ආරක්ෂා කළ යුතු වනවා. එහෙම නම් නිසි පරිදි මේ refund system එක සිද්ධ වුණාට පස්සේ අනිවාර්යයෙන්ම exportersලාත්, deemed exportersලාත් රැකෙනවා. ඒ වාගේම අපි එතැනට යන්නේ ගරු කථානායකතුමනි, මේ පිළිබඳ තහවුරුව ලබා ගත්තාට පසුවයි. නමුත්, "මේක අසාර්ථක වෙයි, කරන්න බැහැ" කියලා අපි සැක ඇති කරගෙන මහ නවත්වලා කල් ගත කළොත් කවදාවත් මේ ක්‍රමයට එන්නේ නැහැ. අපි ඒ අරමුණ ඇතුව තමයි වේගයෙන් ඒ සඳහා කටයුතු කරමින් යන්නේ. ඒකේ ප්‍රධානම කාරණය හැටියට අපි මේක implement කරන්නේ, with a proper simulation system. ඒක දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ දෙවන ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, දැනටමත්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා පැහැදිලි කර ගැනීමක් සිදු කළා. *[බාධා කිරීමක්]* ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඩොනල්ඩ් ට්‍රම්ප් එක්ක තිබෙන ප්‍රශ්නය නිසා අපනයනකරුවන්ට තමයි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මෙය විවාදයක් කර ගන්න බැහැ. ඔබතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර ලැබුණා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නමුත්, අපි අපනයනකරුවන් ආරක්ෂා කරන්න ඕනෑ. මම අහන්නේ, cash flow එකේ ප්‍රශ්නයක් තිබුණාම Inland Revenue Department එකෙන් මේවා පාවිච්චි කරන්න පුළුවන්ද, බැරිද කියන,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

II

කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රමාදය
காங்கேசன்துறை துறைமுகத்தைப் புனரமைப்பதில் தாமதம்
DELAY IN RENOVATING KANKESANTHURAI PORT

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்களிடம் நான் பின்வரும் வினாக்களைக் கேட்கின்றேன்.

இலங்கையிலுள்ள கேந்திர முக்கியத்துவம் வாய்ந்த துறைமுகங்களில் ஒன்றான காங்கேசன்துறை துறைமுகம் போருக்கு முற்பட்ட காலத்தில் மிகச் சிறப்பாக இயங்கி வந்துள்ளது. அந்த அடிப்படையில், காங்கேசன்துறை துறைமுகத்தை வர்த்தக நோக்கத்துக்கான துறைமுகமாகப் புனரமைப்பதன்மூலம் இந்தியாவுக்கும் அதிலும் குறிப்பாக தென்னிந்தியாவுக்கும் வடக்கு, கிழக்கு பகுதிகளுக்கும் இடையில் பொருள் பரிமாற்றம்சார் வர்த்தக நடவடிக்கைகளிலும், சுற்றுலாப் பயணிகளின் வருகையிலும், அந்நியச் செலாவணியை ஈட்டுவதிலும் பாரிய மாற்றத்தை ஏற்படுத்த முடியும்.

2009 வரையான 30 ஆண்டு கால யுத்தம், பிற்பட்ட 15 ஆண்டுகள் என கிட்டத்தட்ட 45 ஆண்டுகள் அபிவிருத்தியில் பின்தங்கியுள்ள வடக்கு, கிழக்கு மாகாணங்களின் பொருளாதார வளர்ச்சியிலும், இலங்கையின் மொத்தத் தேசிய உற்பத்தியின் கடைசிப் பங்காளியாகவுள்ள வடக்கு மாகாணத்தின் பங்களிப்பை அதிகரிக்கவும் காங்கேசன்துறை துறைமுக அபிவிருத்தி முக்கியத்துவம் பெறுகின்றது. இத்துறைமுக அபிவிருத்திக்காக 65 மில்லியன் அமெரிக்க டொலரை வழங்க இந்தியா முன்வந்துள்ளதால் மீளச் செலுத்தும் தேவையற்ற இந்நிதி உதவிமூலம் மேற்படி துறைமுகத்தைப் புனரமைத்து மீள ஆரம்பிக்க முடியும் என்ற நிலையில், இத்துறைமுகத்தை மீள இயக்குவதற்கான சூழலியல் தாக்க மதிப்பாய்வு அறிக்கையும் - Environmental Impact Assessment Reportஉம் - தயாரிக்கப்பட்டுள்ளது. அதன் பின்னரும் இத்துறைமுக அபிவிருத்தி காலம் தாழ்த்தப்படுவதற்கான காரணம் என்ன என்பதை அமைச்சர் இச்சபைக்கு அறிவிப்பாரா?

01. இலங்கையின் வரலாற்றில் இத்துறைமுகம் கொண்டிருந்த பொருளாதாரப் பங்களிப்பு இப்பொழுது இல்லாமலுள்ளது. இதனை மேம்படுத்த சுற்றுலாப் பயணிகளின் வருகையை அதிகரித்தல் மற்றும் உற்பத்திப் பொருட்களின் ஏற்றுமதி, இறக்குமதி மூலமான அந்நியச் செலாவணியை ஈட்டும் திட்டங்கள் எவையேனும் அரசிடம் உள்ளதா?

02. இத்துறைமுகத்தைப் புனரமைத்து செயற்படுத்துவதற்கான முழுச் செலவையும் இந்தியா பொறுப்பெடுக்க முன்வந்துள்ள நிலையில், புனரமைப்புப் பணிகளை மேற்கொள்வதில் காலம் தாழ்த்தப்படுவது ஏன் என்பதை அமைச்சர் அறிவிப்பாரா?

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

03. இத்துறைமுக அபிவிருத்தியுடன் தொடர்புடைய சூழலியல் தாக்கங்கள் குறித்து முடிவு செய்வதில் தொடர்புடைய திணைக்களங்களின் கால இழுத்தடிப்புகள் காரணமாக உள்ளனவா?

04. காங்கேசன்துறை துறைமுகத்தின் புனரமைப்புப் பணிகள் எப்போது ஆரம்பிக்கப்பட்டு முடிவுறுத்தப்படும் என்பதையும், கப்பல் சேவைகள் எப்போது ஆரம்பிக்கப்படும் என்பதையும் அமைச்சர் இச்சபைக்கு அறிவிப்பாரா?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් සහිතව පිළිතුරක් ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னால் 2025.02.05ஆம் திகதி புதன்கிழமை கேட்கப்பட்ட கேள்வி உட்பட இன்னும் பல கேள்விகளுக்கு இதுவரை பதில் கிடைக்கவில்லை. கௌரவ அமைச்சர் ஹர்ஷன நாணாயக்கார, கௌரவ அமைச்சர் கே.டீ. லால் காந்த ஆகியோர் ஒரு கிழமையில் அவற்றுக்குப் பதில் வழங்குவதாகச் சொன்னார்கள். ஆனால், இதுவரை எனக்கு எந்தப் பதிலும் கிடைக்கவில்லை. இன்று நான்காவது கேள்விக்கு கால அவகாசம் கோரப்பட்டு இருக்கிறது. நான் கடந்த பாராளுமன்ற அமர்வில் சின்ன வெங்காயம் தொடர்பாகக் கேள்வி கேட்டிருந்தேன். அதற்கு வெள்ளிக்கிழமை பதில் வழங்குவதாக அமைச்சர் அவர்கள் சொன்னார். பின்னர், இந்தக் கிழமை பதில் வழங்குவதாகச் சொன்னார். இந்தக் கிழமையும் பதில் வழங்கவில்லை. நிலையியற் கட்டளை 27(2)இன்கீழ் என்னால் கேட்கப்பட்ட நான்கு வினாக்களுக்கு இதுவரை விடை கிடைக்கவில்லை. அவற்றை நான் அமைச்சர்களான கௌரவ கே.டீ. லால் காந்த, கௌரவ ஹர்ஷன நாணாயக்கார, கௌரவ வசந்த சமரசிங்ஹ, கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க ஆகியோரிடம் கேட்டிருக்கிறேன். எனினும், அவற்றுக்குரிய பதில்கள் எனக்குக் கிடைக்கவில்லை. தயவுசெய்து, இதுபற்றி ஏதாவது சொல்லுங்கள்!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාට පිළිතුරු ලැබී නැති ප්‍රශ්න තිබෙනවා නම් අපි ලේකම් කාර්යාලයෙන් ඉල්ලා සිටිනවා, හැකි නම් ඒ පිළිබඳව ආණ්ඩු පක්ෂ සංවිධායක කාර්යාලය දැනුවත් කරන්න කියලා. නමුත්, මම එක් කරුණක් මතක් කරන්න කැමැතියි. මට මතකයක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා -මම හිතන්නේ ඔබතුමා තමයි- ඔය සමූහ මිනී වළවල් සම්බන්ධව ඇසූ ප්‍රශ්නයට ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමා ඉතාම පැහැදිලි, ස්ථිර පිළිතුරු ලබා දුන්නා. නමුත්, අපි අදාළ ඇමතිවරුන් දැනුවත් කරන්නම්, ඔබතුමාට හැකි ඉක්මනින් පිළිතුරු ලබා දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය ගරු වසන්ත සමරසිංහ මැතිතුමා.

වී මිලදී ගැනීම සහ සහල් ආනයනය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති: වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

நெல் கொள்வனவு மற்றும் அரிசி இறக்குமதி தொடர்பான அரசாங்கத்தின் கொள்கைகள்: வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று

GOVERNMENT POLICIES ON PURCHASE OF PADDY AND IMPORT OF RICE: STATEMENT BY MINISTER OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාත්, ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාත් 2025.07.09වැනි දින එකවර ප්‍රශ්න දෙකක් යොමු කළා. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා රතු ලූනු සම්බන්ධව මගෙන් ප්‍රශ්නයක් විමසා තිබෙනවා. ඒකට අදාළ තොරතුරු යම් ප්‍රමාණයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් අපි ලබාගෙන තිබෙනවා. නමුත් සම්පූර්ණ පිළිතුර ලැබී නැහැ. මම උත්සාහ කරනවා මේ සතිය ඇතුළත එතුමා ඇසූ ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුර ලබා දෙන්නට.

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා අහපු ප්‍රශ්නයට පිටු 4ක, 5ක පිළිතුරක් තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, මම මේ පිළිතුර කියවන්නද, සභාගත කරන්නද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ලුහුඬින් කියන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Okay, ලුහුඬින්.

ගරු කථානායකතුමනි, 2025.07.09වැනි දින ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

01. වර්ෂයකට සහල් මෙට්‍රික්ටොන් මිලියන 2.4ක් අවශ්‍යයි. යල සහ මහ කන්න දෙකේ අස්වැන්න අනුව මෙට්‍රික්ටොන් මිලියන 2.7ක සහල් ප්‍රමාණයක් අපට නිෂ්පාදනය කරගත හැකියි කියන අදහස අපට තිබෙනවා. ඒ වාගේම මෙට්‍රික්ටොන් 2.4ක් මිනිස් පරිභෝජනයටත්, මෙට්‍රික්ටොන් මිලියන 0.3ක් -මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක්- අනෙකුත් නිෂ්පාදන සඳහා -විශේෂයෙන් සත්ව ආහාර සඳහා- භාවිත කරන බවට පිළිතුරු ලබා දෙනවා. *[බාධා කිරීමක්]* මිලියන 2.4යි. ඒ වාගේම, යල කන්නය මඟින් රජයේ වී ගබඩාවල; 2025 ජූනි 30වන දා වන විට සතොස සතුව වී මෙට්‍රික්ටොන් 3,700ක් ද, වී අලෙවි මණ්ඩලය සතුව මෙට්‍රික්ටොන් 1,546ක් ද තිබෙනවා. මේ වන විටත් වී මිලදී ගැනීම් සිදු වෙමින් පවතිනවා.

02. අපේක්ෂිත සමස්ත වී අස්වැන්න, යල කන්නය මෙට්‍රික්ටොන් මිලියන 2.09යි. යල කන්නයට අදාළ වී අස්වැන්න මෙට්‍රික්ටොන් 2,091,990යි.

03. වීවල නිෂ්පාදන වියදම තමයි මේ යටතේ අහන්නේ. ඒ අනුව දිස්ත්‍රික්ක කිහිපයක වගා පිරිවැය සහ වියදම මම ඉදිරිපත් කරන්නම්, ගරු කථානායකතුමනි. හම්බන්තොට (වාරි) කිලෝ එකක පිරිවැය රුපියල් 66.05යි. අම්පාර- නැගෙනහිර (වාරි) රුපියල් 69.95යි. අනුරාධපුර (වාරි) රුපියල් 77.35යි. කුරුණෑගල (වාරි) රුපියල් 78.10යි. මහවැලි සී (වාරි) රුපියල් 86.49යි. පොළොන්නරුව වාරි රුපියල් 63.97යි. කළුතර (වර්ෂා) -ඒ කියන්නේ වර්ෂාවෙන් වගා කරන නිසා- රුපියල් 120.22යි. කුරුණෑගල වර්ෂාවෙන් වගා කරන භූමිවල රුපියල් 99.49යි.

04. මේ අවුරුද්දේ වී මිලදී ගැනීම පිළිබඳව රජයේ සහතික මිල ගණන් කිව්වොත්, නාඩු වී කිලෝවක් සඳහා රුපියල් 120ක්, සම්බා වී කිලෝවක් සඳහා රුපියල් 125ක්, කීරි සම්බා වී කිලෝවක් සඳහා රුපියල් 132ක් වශයෙන් අපි මිල නියම කර තිබෙනවා. ඒ වාගේම, ගොවීන් සතුව තෙත වී තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා වී අලෙවි මණ්ඩලයේ නියෝජිතයන් ලෙස නියෝජිතයන් නම් කරලා ඒ අයට වී ගැනීම සඳහා මිලක් නියම කර තිබෙනවා. ඒ අනුව, තෙත වී මිලදී ගැනීම සඳහා නාඩු වී කිලෝවක් සඳහා රුපියල් 102කුත්, සම්බා වී කිලෝවක් සඳහා රුපියල් 105කුත්, කීරි සම්බා වී කිලෝවක් සඳහා රුපියල් 112කුත් ලෙස තෙත වී සඳහා මිල නියම කර තිබෙනවා. ගොවීන් තෙත වී විකුණනවා නම් මේ මිලට විකුණන්න කියන එක තමයි අපි කියා තිබෙන්නේ.

05. ඔව්. වී කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය සඳහා යන පිරිවැයට සියයට 30ක් එකතු කර සහතික මිල නියම කර ඇත. සහල්වල උපරිම සිල්ලර මිල සඳහන් කළොත්, කැකුළු කිලෝවක් රුපියල් 220ක්, නාඩු කිලෝවක් රුපියල් 230ක්, සම්බා කිලෝවක් රුපියල් 240ක්, කීරි සම්බා කිලෝවක් රුපියල් 260ක් වේ.

06. දැනට රජය විසින් වී අලෙවි මණ්ඩලයට වී මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 6,000ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම වී මිලදී ගැනීම සඳහා සතොස ආයතනයට පහසුකම් සැලසීමට භාණ්ඩාගාරය පොරොන්දු වී තිබෙනවා. ඒ වාගේම වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ඉදිරියට ගෙන යනවා. අවශ්‍ය වුණොත් වී මිලදී ගැනීම සඳහා තවදුරටත් මුදල් වෙන් කිරීමට රජය අපේක්ෂා කරනවා.

07. අස්වනු මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 6,000ක් වෙන් කර ඇත. ගොවීන් විසින් වී අලෙවි මණ්ඩලයට වී ලබා දීමේ ප්‍රවණතාවක් ඇති වුවහොත් ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

08. ශ්‍රී ලංකා රේගුවෙහි දත්ත අනුව 2025 වසරෙහි ජනවාරි 01 සිට ජූලි මස 13 දක්වා සහල් මෙට්‍රික්ටොන් 101,267.56ක ප්‍රමාණයක් ආනයනය කර ඇති අතර, එහි ***රක්ෂණ ගැල් කුලී, පිරිවැය*** - CIF - රුපියල් මිලියන 15,351.92ක ප්‍රමාණයක් වේ.

ගරු විපක්ෂ නායකතුමනි, මෙම පිළිතුරට අදාළව තවත් තොරතුරු ප්‍රමාණයක් තිබෙනවා.

09. වගා හානි සඳහා සුවිශේෂී රක්ෂණ ක්‍රමවේදයක් දියත් කිරීම පිළිබඳව රජය අවධානය යොමු කර තිබේද කියන ප්‍රශ්නය මේ යටතේ අසා තිබෙනවා. ඒ පිළිබඳව රජය අනුගමනය කරන රක්ෂණ ක්‍රමවේදයට අදාළ පිළිතුර තිබෙනවා. ඒ සියලු විස්තර මම සභාගත කරන්නම්.

ඒ වාගේම වගා හානි අවම කරගැනීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙළ කුමක්ද කියාත් අසා තිබෙනවා.

භෝග වගාවේදී වගා හානි අවම කර ගැනීමට අදාළ වැඩසටහන් ප්‍රධාන වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එහිදී පහත සඳහන් ක්‍රියාමාර්ග ඇතුළත් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

1. කන්නයට වගා කිරීම
2. යාය එකට වගා කිරීම
3. ඒකාබද්ධ පළිබෝධ පාලනය
4. ඒකාබද්ධ පැළෑටි පෝෂණ කළමනාකරණය
5. පසු අස්වනු තාක්ෂණ උපක්‍රම අනුගමනය
6. විවිධ පාරිසරික තත්ත්වයන් අනුගත භෝග ප්‍රභේද හඳුන්වා දීම
7. දේශගුණ සුහුරු උපක්‍රම අනුගමනය
8. වනසත්ව හානි අවම කිරීමේ උපාය මාර්ග අනුගමනය

   මේ සඳහා ගොවීන් දැනුවත් කිරීම, පුහුණු කිරීම, ප්‍රායෝගිකව ගොවීන් ලවා ක්‍රියාත්මක කරලීම සහ විවිධ ව්‍යාපෘති හරහා ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නවලට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, එම පිළිතුර ලබා දීම පිළිබඳව මා ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මම මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවධානය එක් කාරණයකට යොමු කරවන්න කැමැතියි. ඔබතුමා ඉදිරිපත් කළ දත්ත අනුව; 2024 දත්ත අනුව මෙට්‍රික්ටොන් 2,700,000ක -ඇත්තවශයෙන්ම මට තිබෙන දත්ත අනුව මෙට්‍රික්ටොන් 2,800,000ක- නිෂ්පාදනයක් තිබෙනවා. අවශ්‍යතාව තිබෙන්නේ 2,400,000යි. මේ වාගේ තත්ත්වයක් තුළ ලොකු ප්‍රහේලිකාවක් මතු වෙනවා, නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 2,800,000ක්ව තිබියදී අවශ්‍යතාව වන්නේ 2,400,000ක් නම්, සහල් ආනයනය කිරීමට සිදු වන්නේ ඇයි කියලා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මම ඔබතුමාට යෝජනාවක් කරනවා. මේ වගා, නිෂ්පාදන හා අළෙවිය සම්බන්ධයෙන් චක්‍රයක් තිබෙනවා නේ. මේ චක්‍රය තුළ බරපතළ ඌනතාවක්, විෂමතාවක්, අඩුපාඩුවක් තිබෙනවා. මම යෝජනා කරනවා, මේ ගැන විද්‍යාත්මකව සොයා බලා, එම චක්‍රය නිර්මාණය කරන්න කියලා.

ඊළඟට, මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. ඇත්තම කථා කළොත්, බීජවලට යන පිරිවැය, පොහොරවලට යන පිරිවැය, කෘෂි රසායනවලට යන පිරිවැය, උපකරණවලට යන පිරිවැය කියන සියල්ල ගණනය කර, ඊට පසුව වගා හානිය නිසා සහ වනඅලි-මිනිස් ගැටුම ඇතුළු වනසත්ව-මිනිස් ගැටුම නිසා ඇති වන හානිය කියන සියල්ලත් ගණනය කර බැලුවාම, නිෂ්පාදන වියදම සම්බන්ධව ඔබතුමා ලබා දුන් ඔය සංඛ්‍යාලේඛන යථාර්ථවාදීද, සත්‍යවාදීද කියන ගැටලුවත් තිබෙනවා. මම යෝජනා කරනවා, මේ පිරිවැය ගණනය කිරීම ගැන අලුත් විධියට අලුතින් හිතලා බලන්න කියලා.

තුන්වෙනි කාරණාව හැටියට විශේෂයෙන්ම මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. දැන් ඔබතුමා කිව්වා, වී මිලදී ගැනීමේ ක්‍රමයක් තිබෙනවා කියලා. ක්‍රමය තිබුණාට ඒක මහ පොළොවේ යථාර්ථයක්, සත්‍යයක් බවට පත් වෙලා තිබෙනවාද කියන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. වීවල සහතික මිල රුපියල් 120යි කිව්වාට, කුණුකොල්ලයට තමයි මිලදී ගන්නේ. රුපියල් 80ට 90ට ගන්නේ අස්වනු කැපෙන ප්‍රදේශවල. නමුත් ඒක බරපතළ ගැටලුවක්. ගරු ඇමතිතුමනි, ඔබතුමාටම මතක ඇති මේ කාරණය. මම හිතන්නේ ඔබතුමා නොවෙයි, කෘෂිකර්ම ක්ෂේත්‍රය භාර නාමල් කරුණාරත්න මැතිතුමා එදා යෝජනාවක් කළා. මට මතකයි, අපිත් ඒ යෝජනාවට එතුමාට අපේ ස්තුතිය පළ කළා. මේ සහතික මිල නීතිගත කරනවා කියලා කිව්වා. පාර්ලිමේන්තුවට කෙටුම්පතක් ගේනවා කිව්වා. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, එදා කියපු දේ අද ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන්න කියලා. අපිත් සහයෝගය දෙන්නම්. මේ සහතික මිල පාර්ලිමේන්තු අණපනතක් හරහා නීතිගත කරන්නට කටයුතු කරන්න.

ඒ වාගේම තව කරුණු දෙකක් මම ඔබතුමාට යෝජනා කරන්න කැමැතියි. ඒ තමයි පසු අස්වනු තාක්ෂණය -post-harvest technology- සහ පසු අස්වනු හානිය -post-harvest losses- කියන මේ කරුණු දෙක පිළිබඳව දැඩි අවධානය යොමු කරන්නට ඕනෑ. මොකද, මේ නිසා විශාල හානියක් සිද්ධ වෙනවා, මේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ.

ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට කියන්න කැමැතියි, ඇත්ත වශයෙන්ම අපේ රටේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, දැන් විනාඩි හතරක් ගත වෙලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ප්‍රශ්නවලට පෙරවරු 11.00 - 11.30 වෙනතුරු වේලාව වෙන් වෙලා තිබෙනවා. තව විනාඩි 10ක් තිබෙනවා. මම විනාඩි 10ක් ගන්නේ නැහැ. ඒ නිසා ඒකට අවස්ථාව ලබා දෙන්න.

විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, අපේ රටේ සුළු, මධ්‍ය හා කුඩා පරිමාණයේ සහල් මෝල් හිමියන් අද බරපතළ ගැටලුවකට ලක් වෙලා තිබෙන බව. ඒ නිසා විශේෂයෙන්ම ඒ අයගේ ණය restructure කරන්න - ප්‍රතිලේඛන ගත කරන්නට - යම්කිසි වැඩ පිළිවෙළක් පටන් ගන්න. විශේෂයෙන්ම මිලියන 5 සිට මිලියන 25 දක්වා වූ ඒ කඩා වැටුණු කුඩා, මධ්‍ය සහ ක්ෂුද්‍ර සහල් මෝල් හිමියන්ට ආපසු නැඟී සිටින්නට යම්කිසි ප්‍රාග්ධනයක් ලබා දෙන්න. මොකද, ඒ ගොල්ලන් අසාදු ලේඛනගත වෙලා තිබෙන්නේ. ඒ නිසා ණය ප්‍රතිලේඛන ගත කිරීමකටත්, ඒ අයට ප්‍රාග්ධන ශක්තියක් ලබා දෙන්නටත් කටයුතු කරන්න. මොකද, ඒ අයට ඇප ඉදිරිපත් කරලා ණයක් ලබා ගැනීමේ හැකියාවක් නැහැ. ඔබතුමා දන්නවා ඒ ප්‍රශ්නය. ඒ නිසා ලිහිල් කොන්දේසි මත ඒ අයට නැවත වරක් නැඟී සිටින්නට අවශ්‍ය කටයුතු කරන්න. මොකද, ඒ බොහෝ දෙනෙක් ඉන්නේ CRIB එකේ. සුළු හා මධ්‍ය පරිමාණයේ, කුඩා පරිමාණයේ සහල් මෝල් දැන් විශාල ප්‍රමාණයක් වැහිලා ගිහිල්ලා තිබෙනවා. ඒවා අපි නගාසිටුවන්නට ඕනෑ; තිබෙන සහල් මෝල් ටික ආරක්ෂා කරන්නට ඕනෑ.

ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමැතියි, මේ සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට ආසියානු සංවර්ධන බැංකුව හරහා ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක් ලබා දීමේ ක්‍රියාවලියට එදා විපක්ෂයක් හැටියට අපේ පූර්ණ සහයෝගයත් අපි ලබා දුන්නා, ADB එකේ Country Representativeට කථා කරලා. ඒක හොඳ උදාහරණයක් රජයත්, විපක්ෂයත් එකට එකතු වෙලා මේ රටේ කර්මාන්තකරුවන්ට, ගොවි ජනතාවට, ව්‍යවසායකයන්ට සහන ලබා දුන්නු අවස්ථාවකට. මම මේ අවස්ථාවේ ADB එකේ Country Representativeට මගේ ස්තුතිය පුද කරනවා. US Dollars 100 million ලබා ගන්නට අපි මැදිහත් වුණා. අපිත් සූදානම් ඒ කාර්යය හරහා ඉදිරියටත් අපේ සහයෝගය ලබා දෙන්න.

හැබැයි, මම ඔබතුමාට කියන්න කැමැතියි, ඔබතුමා මේ සභාවට ලබා දුන්නු ඔය දත්ත වර්තමාන පරිසරය, වපසරිය තුළ යාවත්කාලීන වෙන්නට ඕනෑ බව. ඇත්ත වශයෙන්ම එක එක පර්යේෂණායතනවලින් ඔය දත්ත දෙනවා. නමුත් කුඹුරට ගිහිල්ලා බැලුවාම, ගොවි බිමට ගිහිල්ලා බැලුවාම, ගොවියාගේ නිවසට ගිහිල්ලා බැලුවාම මේ පිරිවැය ගණනය කිරීමේ බරපතළ ඌනතාවක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ලබා දුන්නු යෝජනා පිළිබඳව ධනාත්මකව හිතලා බලලා මේ රටේ කෘෂිකර්මාන්තය ගොඩනගන්නට කටයුතු කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Minister, Wasantha Samarasinghe.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සතුටු වෙනවා. මොකද, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා කුඹුරු යනවා කියලා නැවතත් දැන ගන්න ලැබීම පිළිබඳව. බොහොම හොඳයි. නමුත් වී මිල පිළිබඳ ප්‍රශ්නය එන්නේ නිලධාරින්ට විතරක් නොවෙයි, ගරු විපක්ෂ නායකතුමනි. මේ පිළිබඳව මේ ක්ෂේත්‍රයේ ඉන්න ගොවි සංගම් නායකයන්, ගොවීන් ඇතුළු මේ සියලු දෙනා එකතු වෙලා කථා කරලා තමයි වී කිලෝවක නිෂ්පාදන පිරිවැය අක්කරයකට කොච්චර යනවාද කියලා තීරණය කරන්නේ. නියර රහින්න, හාන්න, නියර මඩ තියන්න, මඩ පොහොර ගහන්න, වී වපුරන්න, පැළ සිටුවන්න යනාදී මේ සියලු ක්‍රියාවලිය එක්ක ආවාම, මේ cost එක හදලා තිබෙන්නේ එහෙම තමයි. ඒ නිසා මේ cost එක කාලයෙන් කාලයට වෙනස් වෙනවා, පිරිවැය වෙනස් වෙද්දී. තෙල් මිල වැඩි නම්, ට්‍රැක්ටර් කුලිය වැඩි නම්, පොහොර මිල වැඩි නම්, මිනිස්සුන්ගේ ශ්‍රමයේ මිල වැඩි නම්, එතකොට මිල වෙනස් වෙනවා. ඒ නිසා මිල වෙනස්වීම පිළිබඳව අදාළ ආයතන හදන ගණන් හැදීමේදී ශක්‍යතාව, එහෙම නැත්නම් accuracy එක සාමාන්‍යයෙන් සියයට 95ක ප්‍රමාණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා වී කිලෝවක සහතික මිල තීරණය කරලා තිබෙන්නේ ඒ මත ගරු විපක්ෂ නායකතුමනි. ඒ අනුව තමයි වී කිලෝවක සහතික මිල රුපියල් 120ක් කියලා අපි තීරණය කරලා තිබෙන්නේ. ඒ වාගේම, තෙත වී කිලෝවක මිල රුපියල් 102යි කියලා තීරණය කළේ, තෙත වී කිලෝ 100ක් වේළපුවාම කිලෝ 82යි ඉතිරි වෙන්නේ. උපරිම කිලෝ 85යි. ඒ අනුව ගත්තාම ගොවීන් වී කිලෝ එකක් වේළලා විකුණුවොත් එන ගණන රුපියල් 120කට ආසන්න ගණනක්. ඒක වාසිදායක ගණනක්. ඒ අනුව තමයි රුපියල් 120ක මිල දීලා තිබෙන්නේ.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කියපු පළමු කාරණාව තමයි supply chain එක පිළිබඳ ප්‍රශ්නය. නිෂ්පාදකයා මිලදී ගැනීමේදී සහ පාරිභෝගිකයා අතට යද්දී supply chain එකේ issue එකක් තිබෙනවා. ඒක හරි. වී අලෙවි මණ්ඩලයේ ගබඩා ටික වහලා දාලා, ගබඩා යාළුවන්ට දීලා වී කිලෝවක් මිලදී ගන්නේ නැති රටක තමයි අපට වී මිලදී ගන්න වෙලා තිබෙන්නේ. වී නිෂ්පාදනය මෙට්‍රික්ටොන් මිලියන හතරහමාරකට වැඩි ප්‍රමාණයක් තිබිය දී, ඒකෙන් සහල් නිෂ්පාදනය මිලියන 2.7ක් වෙනකොට, අපේ සහල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රමාණයත් වැඩි වෙලා තිබෙනවා. සහල් ආශ්‍රිත කර්මාන්ත වැඩි වුණාම, විශේෂයෙන් කුකුළු මස් නිෂ්පාදකයන්, බිත්තර නිෂ්පාදකයන් මේ වී මිලදී ගැනීම කරනවා, වෙළෙඳ පොළේ බඩඉරිඟු මිල ඉහළ යනකොට. ඒ නිසා ඒගොල්ලන් මෙට්‍රික්ටොන් ලක්ෂ තුනක් පමණ පසුගිය කාලයේ වී මිලදී අරගෙන තිබෙනවා. ඒ වාගේම, සහල් පිටි නිෂ්, බියර් සඳහා -විවිධ නිෂ්පාදන සඳහා- සහල් මෙට්‍රික්ටොන් 18,000ත්, 20,000ත් අතර ප්‍රමාණයක් යනවා. ඒ නිසා අපේ පරිභෝජනයට මිලියන 2.4ක ප්‍රමාණය ඉතිරි වෙනවාද කියන ප්‍රශ්නයත් දැන් අපට තිබෙනවා.

අපේ මිලියන 2.7ක් වෙච්ච සහල් නිෂ්පාදනයෙන් මිලියන 2.4ක් ඕනෑ, average ලෙස පරිභෝජනයට. හැබැයි, ඒකත් වෙනත් නිෂ්පාදනවලට පස්සේ මේ ජනගහන වර්ධනයත් එක්ක, මිනිස්සු පාන් පිටි කනවාද, බත් කනවාද කියන කාරණයත් සැලකිල්ලට ගත්තාම ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා මේ ඉදිරිපත් කරපු ලේඛන වාගේම, අපි පොදු ක්‍රියාවලිය අතුළේත් වී මිලදී ගැනීම සඳහා හදපු යාන්ත්‍රණය ඇතුළේත් අපි උත්සාහ කරනවා මේ supply chain එක ඇතුළේ පාලනයකට අවශ්‍ය මැදිහත්වීම කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි ආණ්ඩුව බිලියන 40ක් කන්නයකට ණය දෙන්නේ වී මිලදී ගැනීම සඳහා පෞද්ගලික අංශයට. ඔබතුමා මතු කරපු සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ටත් අඛණ්ඩව ණය දීම් කළා. මෙවරත් CRIB එකේ ඉන්න අයට කිව්වා, ගිහිල්ලා ආපහු ඒක negotiate කර ගන්න කියලා. ඒ වාගේම, අපි බැංකුවට උපදෙස් දුන්නා, වී මිලදී ගන්නා සියලුදෙනාට ඒ අවශ්‍ය පහසුකම් දෙන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර අය කාලයක් තිස්සේම ණය නොගෙවීම නිසා අසාධු ලේඛනගත වෙලා තිබෙන්නේ. ඒ අසාධු ලේඛනගත වෙච්ච අයට ණය ලබා දීම සඳහා වෙච්ච අලුත් ක්‍රමයක් අපට හදන්න වෙනවා. ඒ නිසා අපි ඒ ගැන අවධානය යොමු කරනවා, ඔබතුමා මතු කරපු ඒ සමහර කාරණා පිළිබඳවත් අවධානය යොමු කරමින්.

විශේෂයෙන් සහල් අපේ රටේ අවශ්‍යතාවට නිෂ්පාදනය කරනවා ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ නිසා තමයි අපට විවිධ අවස්ථාවල විවිධ තීරණ ගන්න සිදු වෙන්නේ. ආනයනය සඳහා තීරණ ගන්න වෙන්නේ වෙළෙඳ පොළ තුළට ප්‍රමාණවත් ලෙස සහල් සැපයුම සිදු කරන්නේ නැති නිසා. දැනුත් කීරි සම්බාවල ප්‍රශ්නයක් තිබෙනවා. මෙට්‍රික්ටොන් 80,000කට වැඩිය ගබඩාවල තිබෙනවා කියලා අපට වාර්තා වෙනවා. හැබැයි, market එකේ කිලෝව රුපියල් 260යි කියලා රුපියල් 300ට විකුණනවා. හැබැයි, අපි සතොස, supermarketsවල මේ සහල් විකුණනවා. ඒගොල්ලන්ගේ විකිණීම බඳු ගණනය කිරීම සඳහා හෙළිදරව් වෙනවා. ඒගොල්ලන් කීරි සම්බා කිලෝව රුපියල් 260ට විකුණන්නේ. සතොස සහ අනෙකුත් supermarkets විකුණන්නේ කිලෝව රුපියල් 260ට. හැබැයි, එළියේ විකුණන්නේ කිලෝව රුපියල් 300ට. මේකට මෝල් හිමියන් මැදිහත් වෙනවා. ඒ නිසා අපි මේ පිළිබඳව පාරිභෝගික සේවා අධිකාරියත් මැදිහත් කරමින්, පරීක්ෂා කරමින් සහල් වෙළෙඳපොළ පාලනය කිරීම සඳහා ඔබතුමන්ලා ඉදිරිපත් කළ අදහසත් අවධානයට ගනිමින් කටයුතු කරනවා කියන කාරණයත් මම මේ වෙලාවේ දැනුවත් කරනවා.

බොහොම ස්තුතියි.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
கோதாகொட குணரதன நாஹிமி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
KODHAGODA GUNARATHANA NAHIMI FOUNDATION (INCORPORATION) BILL

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය"

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Rural Development, Social Security and Community Empowerment for report.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Notice of Motions and Orders of the Day.

Item No. 1, Companies (Amendement) Bill, to be moved by the Hon. Wasantha Samarasinghe. You have 20 minutes.

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත
கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம்
COMPANIES (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 11.29]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සමාගම් පනතට අදාළව සිදු කරන සංශෝධනය පිළිබඳව මීට පෙරත් පාර්ලිමේන්තුවට මේ කරුණු ඉදිරිපත් කළා. අද දෙවැනිවර කියවීමේ විවාදය අපි ආරම්භ කරනවා. විවිධ අවස්ථාවල සමාගම් පනතට සංශෝධන සිදු කරන්නේ අපේ රටේ සමාගම් හරහා සිදුවෙන විවිධ වංචා සහ දූෂණ පිළිබඳ කථා අපට අහන්න ලැබෙන නිසායි.

ගෙවල්වල වැඩට හිටපු අයගේ නමට, නැත්නම් රියදුරු මහත්වරුන්ගේ නමට කොම්පැනි ගත්ත ඉතිහාසයක් අපේ රටේ තිබෙනවා. ඒ සමහර ප්‍රශ්න දැනුත් තිබෙනවා. ඒ නිසා මේ සංශෝධනය කරන්න බලපෑ මූලික කරුණු කිහිපය මම මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මූල්‍ය කාර්ය සාධක බලකාය, - FATF - 1989 වාගේ කාලයේ G7 රටවල් සම්බන්ධ කරගෙන ආරම්භ වන සංවිධානයක්. මේක දියුණු රටවල් සාමාජිකත්වය දරන සංවිධානයක්. මේ සංවිධානය ලෝකය පුරා සිදුවෙන ගනුදෙනු පිළිබඳව, මුදල් හුමවාරු පිළිබඳව, ත්‍රස්තවාදයට අවි සහ මුදල් සැපයීම පිළිබඳව අවධානය යොමු කරනවා. මේ සංවිධානය money laundering පිළිබඳ කරුණු 40ක් ලෝකයට ඉදිරිපත් කරනවා - ඒ කරුණු අනුගමනය කරන්න කියන කාරණයත් එක්ක. ඒ වාගේම, ත්‍රස්තවාදයට මුදල් යෙදවීම - terrorism financing - සහ අවි ආයුධ සැපයීම සම්බන්ධයෙන් තවත් කරුණු නවයක් ඔවුන් ඉදිරිපත් කරනවා. මේ 1989දී. ඒ අය 1989දී ඉදිරිපත් කරන මේ කරුණු 2012දී revise කරලා, කරුණු 40ක් Recommendations ලෙස ලෝකයේ රටවලට ඉදිරිපත් කරනවා.

මේ මූල්‍ය කාර්ය සාධන බලකායේ කලාපීය සංවිධාන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාව මූල්‍ය කාර්ය සාධන බලකායේ Asia-Pacific Region Group එකේ member කෙනෙක්. ඒ කියන්නේ අපි මූල්‍ය කාර්ය සාධන බලකායේ ආසියානු පැසිපික් කලාපීය සංවිධානයේ සාමාජිකයෙක්. අපි මෙහි සාමාජිකයකු බවට පත් වෙන්නේ 1997 වාගේ කාලයේ ඉඳලා ඉඳන්. 2012දී ලබා දී තිබෙන Recommendations 40 ගත්තාම, අපේ සමාගම් පනත තුළ සමූල ඝාතන අවි සඳහා මූල්‍යනය, එහෙම නැත්නම් සමූල ඝාතන අවි වෙනුවෙන් ලෝකයේ කවුරු හෝ මුදල් යොදවනවා නම් ඒ පිළිබඳ සොයා බලන්න, ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ සොයා බලන්න, මුදල් විශුද්ධිකරණය ගැන සොයා බලන්න - අර සොයාගත්ත විධිය කියන්න බැරි වුණාම ගෙදර ඉන්න ආච්චි ගැන කියපු කථාවක් තිබෙනවා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අර ඩේසි ආච්චිගේ කථාව. ඒ ඩේසි ආච්චිටත් වුණේ ඔන්න ඔය වාගේ දෙයක් තමයි. මුදල් හෝ දේපළ රැස්කර ගත්ත මාර්ග කියන්න බැරි වුණාම අහක ඉන්න මිනිහෙක් ඒකට අල්ලනවා. ඒකෙන් බේරෙන උපකරණයක් ලෙස පුද්ගලයන් පාවිච්චි කරනවා. බදු ගෙවීම වළක්වා ගැනීමට, කළු සල්ලි සුදු කිරීමට ආදායම් මාර්ග කිසිවක් නැති මිනිසුන්ගේ නම්වලට, තමන්ට පාලනය කළ හැකි පුද්ගලයන්ගේ නම්වලට, තමන්ට control කරගන්න පුළුවන් අයගේ නම්වලට දේපළ සහ සමාගම්වල කොටස් පවරනවා. ඒ නිසා මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම, සමූල ඝාතන අවි සඳහා මූල්‍යනය කියන සිදුවීම් වැළැක්වීම වෙනුවෙන් Recommendations 40ක් මේ මූල්‍ය කාර්ය සාධන බලකාය ලෝකයට ඉදිරිපත් කළා.

Asia-Pacific Region Group එකේ අපිත් member කෙනෙක්; අපි ඒකේ ආරම්භක සාමාජිකයෙක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා අපට පැවරිලා තිබෙන කරුණු 40න්, මේ Recommendations 40න්, 39ක්ම අපි ඉටු කරලා තිබෙනවා. ඒකේ 24වෙනි Recommendation එක තමයි "Beneficial Ownership" කියන එක. අවසාන ප්‍රතිලාභියා පිළිබඳ කාරණය අපේ සමාගම් පනතට ඇතුළත් කරලා නැහැ.

2017 ඉඳන් නිලධාරින් විවිධ අවස්ථාවල මේ සඳහා උත්සාහ අරගෙන තිබෙනවා. ඔබතුමාත් දන්නා විධියට, 2017 ඉඳන් උත්සාහ ගත්තා නම්, ඒක කෙරෙන්නේ නැති වෙන්න මූලිකම කරුණ තමයි, අද අධිකරණවල ඇහෙන නඩුත් මේවාට හේතු වන

එක. මොකද, විවිධ පුද්ගලයන්ගේ ගිණුම්වල, විවිධ නම්වලින් තිබෙන accountsවල සල්ලි තිබෙනවා වාගේම, කොටස් තියාගෙන ඉන්නවා. සමහර තැන්වල ආයෝජනය කරලාත් තිබෙනවා. ඒ තමයි කළු සල්ලි සුදු කරන්න පාවිච්චි කළ ක්‍රම. අපට මේ පිළිබඳව කථා කරන්න සිද්ධ වෙන්නේ මේ නිසායි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මූල්‍ය කාර්ය සාධන බලකාය විසින් ඉදිරිපත් කළ මේ Recommendations පිළිගන්නේ නැති රටවල් ඒ අය blacklist කරනවා, එහෙම නැත්නම් ඒ අය grey list එකට දානවා. මූල්‍ය කාර්ය සාධන බලකාය ඉදිරිපත් කළ Recommendations 40න් ඉතුරු වුණු 24වෙනි Recommendation එක අපේ සමාගම් පනතට සංශෝධනයක් ලෙස එකතු කිරීම තමයි අද සංශෝධනයේ අරමුණ බවට පත් වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වෙනුවෙන් සමාගම් පනතේ වගන්ති ගණනාවක් තිබෙනවා සංශෝධනය කරන්න. ඒ වගන්ති සංශෝධනය කරලා, ඉදිරියේදී අවසාන ප්‍රතිලාභියා හෙළිදරවු කර ගැනීම දක්වා වූ ක්‍රියාවලියට තොරතුරු රැස් කරලා තියා ගැනීමේ අයිතිය "සමාගම් මැඳුරට" ලබා ගැනීම තමයි අපි මේ කරන්න හදන්නේ.

මේ ක්‍රියාවලිය ගැන කියද්දී විශේෂයෙන් කියන්න ඕනෑ, ලෝකයේ රටවල් ගණනාවක් වාගේම අපිත් යම් කාලයක ලංකාව හැටියට Asia-Pacific Region Group එකේ reviewsවලට, evaluationවලට ලක්වෙලා තිබෙන බව. අපි ඒ අගය කිරීම්වලට ලක් වෙනවා. අපේ පළමුවෙනි අගය කිරීම කළේ 2006දී. දෙවෙනි අගය කිරීම, නැත්නම් evaluation එක එන්නේ 2014දී. තුන්වෙනි එක එනවා 2026දී. ලෝකයේ තිබෙනවා grey list එකක්. ඒ grey list එකේ අපි 2010 - 2011දී ඉඳලා තිබෙනවා. ලෝකයේ රටවල් 2ක් black list එකේ ඉන්නවා. ඒ North Korea සහ ඉරානය. Dark grey list එකේ ඉන්නවා, මියන්මාරය. Grey list එකේ ඉන්නවා රටවල් 40ක්. අපිත් හිටියා. අපි හිටියේ කොයි කාලෙද කියලා බැලුවාම ඒවා හරි පැහැදිලියි. අපි හිටියා, 2010-2011 කාලයේ. ඊළඟට අපි හිටියා, 2017-2019 කාලයේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ත්‍රස්තවාදයට අවි සැපයීම වළක්වනවා. ඒ වාගේම මුදල් විශුද්ධිකරණය වළක්වනවා. සමූල ඝාතන අවිවලට මුදල් සැපයීම වෙනුවෙන් කිසිදු පහසුකමක් සපයන්නේ නැති, ඒ වෙනුවෙන් ඉඩ හදන්නේ නැති රටක් හැටියට අපි ලෝකයේ අනෙකුත් රටවල් එක්ක ගනුදෙනු කරද්දී, මූල්‍ය ආයතන එක්ක ගනුදෙනු කරද්දී අපට ඉස්සරහට යන්න බාධා ඇති වෙනවා නම්, ඒවා වළක්වා ගැනීමත් මේ සංශෝධනයේ අරමුණක්. ඒ නිසා සමාගම් පනතේ වගන්තිවලට ඉතා විශාල සංශෝධනයන් ප්‍රමාණයක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. වගන්ති ගණනාවක් සංශෝධනය කරලා අලුතෙන් වගන්ති කිහිපයක් එකතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එහෙම කරගෙන, විශේෂයෙන්ම මේ මූල්‍ය කාර්යසාධන බලකායේ Recommendation එක මත අවසාන අරමුණ ඉටු කරගන්න අපි කටයුතු කරනවා. ඒ මොකක්ද කියන කාරණය තමයි පැහැදිලි වෙන්න ඕනෑ. ස්වාභාවික පුද්ගලයා හඳුනා ගැනීමේ නීතිමය අවශ්‍යතාව තමයි අපි මේ ඉටු කරගන්න හදන්නේ. ඒ කියන්නේ, කෙනෙකුගේ, නැත්නම් සමාගමක කොටස් තව සමාගමකට ගන්න පුළුවන්. ඒ සමාගමේ අයිතිකරුවන් ඉන්න පුළුවන්. ඒ අයිතිකරුවන් මෙහෙයවන්නේ තව කෙනෙක් වෙන්න පුළුවන්. හැබැයි, එහෙම බැහැ. ඒ නිසා මේ සංශෝධන සිදු කළාට පසුව ඉදිරි මාස හයක් තුළ සමාගම් පනතේ ලියාපදිංචි වෙලා තිබෙන සියලු සමාගම්වලට අපි දැනුම් දෙනවා, ඔයගොල්ලන්ගේ beneficial ownersලා කවුද කියන එක අපි ළඟ record කරන්න කියලා. ඒ කියන්නේ, සමාගම් පනතේ ලියාපදිංචි සියලු සමාගම්වලට -කොටස් වෙළඳපොළේ තිබෙන, පෞද්ගලික සමාගම් හැටියට තිබෙන, අක්වෙරළ සමාගම් හැටියට තිබෙන සියලු සමාගම්වලට- ඒගොල්ලන්ගේ ස්වාභාවික පුද්ගලයන් කවුද කියන එක ඉදිරි මාස හයක් තුළ අපි ළඟ record කරන්න කියලා අපි දැනුම් දෙනවා. අපි ඔවුන් හඳුනා ගන්න ඕනෑ.

කොම්පැනියක් නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගත්තත් ඒ කොම්පැනියේ අයිතිය තිබෙන්නේ කාටද, කොම්පැනිය මෙහෙයවන්නේ -හසුරුවන්නේ- කවුද, එහි ප්‍රතිලාභියා බවට පත් වෙන්නේ කවුද කියන එක අපට report කරන්න ඕනෑ. ඕනෑම කෙනෙක් නීතිමය අවශ්‍යතාවක් මත ඒ තොරතුරු ඉල්ලුවොත්, ඒවා සපයන්න අපි ළඟ ඒ තොරතුරු ගබඩා කරගන්න ඕනෑ. ඒ නීතිමය අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම තමයි මේ පනත් සංශෝධනයෙන් අපි සිදු කරන්නේ. ඒ තුළින් ඉදිරියේදී යම් යම් දේවල් වැළැකෙනවා. වත්කම් සඟවන පුද්ගලයන්ගේ වත්කම් හෙළිදරව් කර ගැනීමට නීතිමය ඉඩ හම්බ වෙනවා. ඒ වාගේම සමාගම්වලට හැකියාව ලැබෙන්නේ නැහැ, කළු සල්ලි සුදු සල්ලි කරගන්න. සමාගම්වලට බැහැ, සොයා ගත්තේ නැති මුදල් ගෙනැල්ලා එකවර කොටස් වෙළඳපොළේ ආයෝජනය කරන්න. මොකද, මේ සංශෝධන තුළින් ඒ තොරතුරු හෙළිදරව් වෙනවා. යම් කෙනෙක් යම් සමාගමක සියයට 5ක්, 10ක් කොටස් මිලදී ගන්නවා නම්, ඔහු ඒ කොටස් මිලදී ගත්තාට පසුව කියන්න ඕනෑ, ඔහු ඒ සල්ලි ගෙනාවේ කොහෙන්ද කියලා. ඔහු ඒ සල්ලි හොයපු ක්‍රමය කියන්න ඕනෑ. ඒ සල්ලිවලට tax ගෙවලාද කියලා කියන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය කරන තොරතුරු රැස් කර ගැනීම, අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කර ගැනීම තමයි මේ සංශෝධන තුළින් සිදු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි ප්‍රධාන ප්‍රඥප්තියේ 4, 11, 51, 52 කියන වගන්තිවල සංශෝධන සිද්ධ වෙනවා. ඒ වාගේම අලුත් Chapter එකක් එකතු වෙනවා, "Beneficial Ownership" කියලා. 130අ. සිට ඊ. දක්වා අලුත් වගන්ති අපි එකතු කරනවා. ඒකට සම්බන්ධ පරණ වගන්ති ගණනාවක් වෙනස් වෙනවා. ප්‍රධාන ප්‍රඥප්තියේ 206, 211, 270, 272, 341, 424, 471, 472, 484, 487, 508, 513, 529 කියන වගන්ති මේ යටතේ සංශෝධනය වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේක නීතිමය අවශ්‍යතාවක් වගේම රටක් හැටියට,-

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු ඇමතිතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, do you agree to be interrupted? -*[Interruption.]* Okay. The Hon. Kabir Hashim.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු ඒ එකින් එක සංශෝධන ගැන මට හරියට පැහැදිලි නැහැ. හැබැයි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කිව්වා, සමහර ඒවා Financial Action Task Force එකේ definition එක හා ප්‍රමාණවත්ව සංශෝධනය කරලා නැහැ, ඒවා ඇතුළත් කරන්න ඕනෑය කියලා. ඒ වාගේම Central Bank එකෙන් හඳුන්වා දීපු Financial Intelligence Unit - FIU - compliance එකට මේ පනත් කෙටුම්පත හරියට නැහැ කියලා කිව්වා. ශ්‍රේෂ්ඨාධිකරණය සහ Attorney-General කියපු ආකාරයට ඒ ටික මේ සංශෝධනවලට ඇතුළත් වෙලා තිබෙනවාද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයට මේ පිළිබඳව පැමිණිල්ලක් ඉදිරිපත් වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඒ පැමිණිල්ල ඉදිරිපත් කරලා පෙන්වා දීපු කරුණු අනුව තමයි මේ සංශෝධනය කරලා තිබෙන්නේ. ඒ වාගේම, අපි ළඟ තිබෙන

[ගරු වසන්ත සමරසිංහ මහතා]

සමහර තොරතුරු සමාගම් මැදුරට - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට- ගන්න පෞද්ගලික දත්ත ආරක්ෂාව පිළිබඳ පනතට අදාළව තිබෙන වගන්ති ගැන නොසිතා මේ තොරතුරු හෙළිදරව් කරන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය අය ඉල්ලුවා. ඒ පනතෙන් පුද්ගලයන්ගේ දත්ත ආරක්ෂාව පිළිබඳ තහවුරු කරලා තිබෙන නිසා අපි ඒක නිශ්චිතවම මහාධිකරණයට වාර්තා කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, RTI form එකක් දාලා ඉල්ලුවාම ඒ තොරතුරු ටික ගන්න පුළුවන් කියලා මේ පනතේම කොටසක් තිබෙනවා. එතකොට තොරතුරු නිලධාරියෙක් හරහා අපි ඒ තොරතුරු දෙනවා. ඊට අදාළව අධිකරණය විසින් පෙන්වා දුන් ඒ අනෙකුත් සංශෝධන සහ මහපෙන්වීම්වලට යටත්ව තමයි සියලු සංශෝධන කරලා තිබෙන්නේ.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

නැහැ. මම අහන්නේ RTI form එක දානවාට වඩා වෙනම platform එකක්, -

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

බැහැ. ඒකට වෙනම පනතක් තිබෙනවා නේ. පුද්ගලයන්ගේ තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා වූ පනතෙන් ආරක්ෂා වෙලා තිබෙන කොටසක් අපිට මේකෙන් violate කරන්න බැහැ.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මේ beneficial ownership කියන එකට විතරක් අදාළ කරගන්න පුළුවන් නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

Beneficial ownership එකට අදාළ කරගන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, අවශ්‍ය නම් කෙනෙකුට ඒ තොරතුරුත් ගන්න පුළුවන් කියලා මේ පනතේම තිබෙනවා. සමාගම් මැදුරට RTI form එකක් දැම්මා නම් අපි ඒක දෙනවා. අපි ඒක දෙන්නේ අර පනත ආවරණය කරලායි. පුද්ගලයන්ගේ දත්ත ආරක්ෂාව පිළිබඳව තිබෙන පනතට යටත්ව තමයි අපි එතකොට ඒක දෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ පනතට ඒක දාන්න බැහැ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, you have been allotted 21 minutes to speak during this Debate.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මෙතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම් පොඩ්ඩක් කථා කරන්න කියලා කියන්න. අපි උත්තර දෙනවා. මෙතුමා අහන ප්‍රශ්නයටත් මම උත්තරයක් කියන්නයි හැදුවේ. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, British Virgin Islandsවල කොම්පැනි දාපු අපේ රටේ අය ඉන්නවා. ඔවුන් ලංකාවේ සල්ලි අරන් ගිහිල්ලා British Virgin Islandsවල කොම්පැනි දාලා තිබෙනවා, US Virgin Islandsවල කොම්පැනි දාලා තිබෙනවා. ඒවාත් ඉස්සරහට ආරක්ෂා වෙනවා; හෙළිදරව් වෙනවා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ඒ සල්ලි ගේනවා කියලා කිව්වා නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ඉන්න, ඉන්න. බයවෙන්න එපා. ඒවා ගේනවා. දැන් ඒවාට නඩු යනවා නේ. නඩු යනවා. ඒවා ගෙන්වනවා. කබීර් හෂීම් මන්ත්‍රීතුමා බයවෙලා. ඔබතුමා බයවෙන්න එපා. *[බාධා කිරීමක්]* No. ඔබතුමා බයවෙන්න එපා. ඒවාට අදාළව පරීක්ෂණ යනවා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ British Virgin Islandsවලට ගිහිල්ලා කොම්පැනියක් දැම්මා. ඒ කොම්පැනියේ නමට "රෙඩ්" කියන කොටසකුත් තිබෙනවා. ඔබතුමාට ඒක මතක ඇති. ඒක ඩොලර් මිලියන 20ක් තිබුණු කොම්පැනියක්. පරීක්ෂණයට ඒ ගැන තොරතුරු අරන් ආවා. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලය මොකද කළේ? ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලය එතැනින් පස්සේ පරීක්ෂණ අරගෙන ගියේ නැහැ.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

නැහැ, නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

නැහැ, නැහැ නොවෙයි. ඊළඟ දවසේ ඕනෑ නම් ඒකට අදාළ තොරතුරුත් එක්ක මම කියන්නම්.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

එහෙම කරලා නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

නැහැ, නැහැ. - *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Members, do not interrupt. You will have time to speak during the Debate.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවාත් ඔක්කෝම ඉස්සරහට හෙළිදරව් වෙනවා. මොකද, විදේශීය සමාගමක් ඇවිල්ලා ලංකාවේ ආයෝජනය කරන්න කොම්පැනියක්

ලියාපදිංචි කරන්න ඕනෑ. ඒ කොම්පැනිය ලියාපදිංචි කරද්දි ඔහුත් මේ නීතිමය ප්‍රතිපාදනවලට යටත්ව තොරතුරු submit කරන්න ඕනෑ. එහෙම නැතුව ඒගොල්ලන්ටත් නිකම් යන්න බැහැ. එතකොට ඔවුන් තොරතුරු අරන් ආවාම - ඉන්දියාවේ හෝ චීනයේ හෝ ඇමෙරිකාවේ හෝ ලෝකයේ ඕනෑම කොම්පැනියක්, ඕනෑම ආයතනයක්;, ඕනෑම ආයෝජනයක් ලංකාවට ඇවිල්ලා ආයෝජනය කළාට පස්සේ ඒ ආයෝජනයට අදාළව මෙහේ සමාගම් මැදුරේ ලියාපදිංචියක් තිබෙනවා. මොකද, මෙහේ ලියාපදිංචි වෙලා නේ, කොම්පැනියක් හැටියට. ඒ යටතට ආවාම ඔවුනුත් ඒ අදාළ සමාගමේ ආයෝජකයෝ කවුද, අයිතිකාරයෝ කවුද කියලා කියන්න ඕනෑ. ඒක ඔවුන්ගේ වගකීම. මොකද, අපේ සමාගම් පනතට අදාළව එහෙම කරන්න ඕනෑ කියලා සඳහන්ව තිබෙනවා. මොකද, අපේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ රටවල් මූල්‍ය කාර්යසාධන බලකායේ මේ Recommendations 40 පිළිගෙන තිබෙනවා. Asia-Pacific Regional Group එකේ founder member කෙනෙක් හැටියට ලංකාව ඒ Recommendations අනුගමනය කරන්න පිළිගෙන තිබෙනවා. ඒ අනුව Asia Pacific Region එකේ අනෙක් රටවලුත් මේක කරලා තිබෙනවා. අපිට ආසන්නව තිබෙන ඉන්දියාවත් මේ කටයුත්ත කරලා තිබෙනවා. මේ beneficial ownership එක පිළිබඳව මෙතෙක් කල් අපේ රටේ තිබුණේ, - 2017 ඉඳන් මේ සංශෝධනය ගෙනෙන්න බැරි වුණේ නිකම් නොවෙයි. තමන් හෙළිදරවු වෙනවා කියලා දන්න නිසා මේ සංශෝධනය ගෙනාවේ නැහැ. හැබැයි මීට පස්සේ ඩේසි ආච්චිලාගේ මැණික් මලු කියලා මාරු වෙන්න බැහැ, "මේක මම දන්නේ නැහැ" කියලා මාරුවෙන්න බැහැ. ගෙවල් හදලා අයිතිකාරයෝ නැහැ කියලා මාරු වෙන්න බැහැ. ඒවාට වග කියන්න පුළුවන් විධියට මේ ක්‍රියාවලිය සිද්ධ වෙන්න ඕනෑ. මෑත කාලීනව සමහර අය මේ ක්‍රියාවලිය ඇතුළේ සමාගම්වල කොටස්වල ආයෝජනය කරනවා. එසේ ආයෝජනය කළාට ඒ ආයෝජනයේ වටිනාකමට අඩුම තරමේ තමන්ගේ ව්‍යාපාරවල බිස්නස් එකවත් නැහැ. ලාභ නොවෙයි, බිස්නස් එකවත් නැහැ. හැබැයි එහෙම තියෙද්දි ඒ අය විශාල ලෙස කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරනවා, අපි දකිනවා. හැබැයි, මේ අයට මේ වත්කම් ලැබුණේ කොහෙන්ද, මේ මුදල් ලැබුණේ කොහොමද කියන කාරණය හෙළිදරව් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have three more minutes.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

මේ සංශෝධනය හරහා ලංකාව තුළ මුදල් විශුද්ධිකරණය වළක්වන්න අවශ්‍ය රැකවරණත්, ඒ වාගේම ත්‍රස්තවාදයට අවි සහ මුදල් සැපයීම වළක්වන්නත්, සමූල ඝාතක අවි සඳහා මුදල් සැපයීම වළක්වන්නත් අපි නීත්‍යනුකූලව කටයුතු කරනවා.

මූල්‍ය කාර්ය සාධක බලකායේ Recommendationsවලට යටත්ව අපි Asia-Pacific Group එකේ ආරම්භක සාමාජිකයෙකු ලෙස, සමාගම් පනත තුළ වත්කම් සඟවන එක, කොටස් සඟවන එක, කළු සල්ලි සුදු කරන්න හදන එක නවත්වන්න තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවේදී සම්මත කරන්නේ. ඒ සඳහා සහාය දෙන්න කියලා සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමින්, මගේ මූලික අදහස් දැක්වීම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sajith Premadasa. You have an allocation of 10 minutes.

[පූ.භා. 11.47]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
සමාගම්වල කටයුතු වගකීමට සහ වගවීමට ලක්වන යෝජනා ඉදිරිපත් වන මේ අවස්ථාවේ ඒ ඉදිරිපත් කරන යෝජනාවලට සහයෝගය ලබා දෙමින්, හැබැයි සමාගම් හරහා සිදුවන අකටයුතුකම් දෙකක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම මම මේ කාරණය මතක් කරන්නට කැමැතියි. ත්‍රිකුණාමල නගර සහ කඩවත් ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ තහරවෙට්ටුවාන්, මත්තියවැලි, මුත්තුනගර් කියන ගම් තුනේ පවුල් 1,000ක් 1972 වසරේ සිට මේ දක්වා -වසර 53ක් මුළුල්ලේ- අක්කර 800ක වී, බඩඉරිඟු, එළවලු වර්ග, රටඉඳි, කොමඩු වැනි වගාවන් සිදු කරනවා. ඇත්තවශයෙන්ම මේ තොරතුරු අනාවරණය වුණේ අපි ක්‍රියාත්මක කරන "පුරවැසි හඬ" වැඩසටහන යටතේ. එය විපක්ෂ නායක කාර්යාලයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වෙන්නේ. හැබැයි, 2023 වසරේ ඉඳලා ඒ වගා කරන අයට නොයෙකුත් බාධා ඇවිල්ලා තිබෙනවා. 2024 අගෝස්තු මාසයේ ඉඳලා නඩු දාලා, 2025 පෙබරවාරි සිට අධිකරණ නියෝග හරහා මේ ගොවීන් වසර 53ක් භුක්ති විඳපු ඉඩම්වලින් බලහත්කාරයෙන් ඉවත් කරන වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා.

ඒ වසර 53ක කාලයක් තුළ ඔවුන් මේ ඉඩම් සඳහා ඔප්පු ඉල්ලා තිබෙනවා, බලපත්‍ර ඉල්ලා තිබෙනවා, අවසර පත්‍ර ඉල්ලා තිබෙනවා. ඒ එකකටවත් කිසිම අවසරයක් ලබා දීලා නැහැ. හැබැයි, වගා කරන ගොවි බිම්වලින් ගොවියාව ඉවත් කරලා අක්කර 200ක සූර්ය බලශක්ති බලාගාර ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ නිසාම වසර 53ක් මේ වගා කටයුතු කරපු ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව අන්ත අසරණභාවයට පත් වෙලා තිබෙනවා. ඇත්තවශයෙන්ම ඒ ඉඩම්වල භුක්තිය තිබෙන්නේ ගොවීන්ට. අපි කිසිසේත්ම විරුද්ධ නැහැ, සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය කරනවාට. ඇත්තවශයෙන්ම මේ රජය ක්‍රියාවෙන්ම ඔප්පු කරලා තිබෙනවා, සූර්ය බලශක්තිය, පුනර්ජනනීය බලශක්තිය මැඩපවත්වන්නට, ප්‍රවර්ධනය නොවන්නට, ඒ ගෙවිය යුතු tariffs ප්‍රමාණයත් රුපියල් 38 ඉඳලා රුපියල් 20 දක්වා අඩු කරලා. අපි පක්ෂයි, පුනර්ජනනීය බලශක්තියට. සූර්ය බලාගාර පිහිටුවීමට, ඒ solar panels සවි කිරීමට අපි පක්ෂයි. නමුත් 1972 ඉඳලා වසර 53ක් දිගින් දිගටම වගා කරපු බිම්වලින් ඒ අයව ඉවත් කිරීම ඇත්තවශයෙන්ම අසාධාරණයි. ඒක පවුල් 1,000කට බලපාන ප්‍රශ්නයක්. ඔවුන්ට පොහොර සහනාධාරත් දීලා තිබෙනවා, වගා ණයත් දීලා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

තිබෙනවා. ඒ වාගේම දැන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කරන රජයේ මන්ත්‍රීවරුනුත් පසුගිය මැතිවරණ කාලයේ ඒ ප්‍රදේශයට ගිහිල්ලා බොහොම පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා, මේ වගා බිම් ආරක්ෂා කරනවා කියලා. හැබැයි, ඒක ප්‍රකාශ කරලා තිබෙන්නේ මැතිවරණ සමයේදීයි. වැව් 4කින් මේ වගා බිම් පෝෂණය වෙනවා. තහරවෙට්ටුවාන්කුලම්, කඩලන්විකුලම්, සින්නතානාකුලම්, මුත්තුනගර්කුලම් කියන මේ වැව් 4 ගොඩනඟන්නටත් රාජ්‍ය අරමුදල් යොදවා තිබෙනවා. හැබැයි, ඒ වැව් 4න් මුත්තුනගර්කුලම් කියන වැව දැන් flat කරලා තිබෙන්නේ; ඒක ඉවරයි. අපි අහන්නේ මෙයයි. කොහොමද, වසර 53ක් වගා කටයුතු කරපු පවුල් 1,000ක්, අක්කර 800කින් එක පැන් පහරින් වාගේ ඉවත් කරලා මේ සූර්ය බලාගාර ස්ථාපනය කිරීමේ, solar panels ස්ථාපනය කිරීමේ ව්‍යාපාර දෙකකට මේ ඉඩම් අත්තනෝමතිකව දෙන්නේ? මොකද, අපි දන්නා ආකාරයට නිසි ක්‍රමවේදයක් අනුගමනය කරමින් නොවෙයි මේ ඉඩම් ලබා දීලා තිබෙන්නේ. දැන් ඒ ව්‍යාපාරිකයින් මොනවාද කරන්නේ? නඩු දාලා, මේ මිනිසුන්ව පොලීසියට ගෙනිහිල්ලා, රිමාන්ඩ් කරවලා, බිය වද්දලා මේ පවුල් 1,000 අසරණභාවයට පත් කරලා තිබෙනවා. ඉදිරි මාසය තුළ වගා කන්නය ආරම්භ වෙනවා. මේ ප්‍රදේශයේ සිටින ගොවි පවුල් 1,000ක් අසරණයි. අපි පැහැදිලිවම කියනවා, වගා බිම් අහිමි වුණු අයට වන්දි ලබා දෙන්න කියලා. ඒ වාගේම ඒ ඉතිරි ඉඩම්වලට අවශ්‍ය අවසරය හෝ බලපත්‍ර ලබා දෙන්න. අඩුම ගානේ වාරි පෝෂිත විකල්ප ඉඩම් හෝ ලබා දෙන්න. වහාම ක්‍රියාත්මක වන පරිදි, මේ ගොවි බිම් උදුරා ගැනීම නතර කරන්න. අද දවසේ සමාගම්වලට සීමා පනවන සාකච්ඡාවේදී මෙන්න එක උදාහරණයක්. සමාගම් තමන්ගේ මුදල් බලය, මැර බලය ඇතුළු හැම බලයක්ම උපයෝගී කරගෙන මේ ආකාරයට කටයුතු කරමින් සිටිනවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ආණ්ඩු පක්ෂයේ සිටින සියලුදෙනාගෙන්ම මම ඉල්ලීමක් කරනවා, ඉතාම පැහැදිලිව මේ ගොවි බිම් ආරක්ෂා කරන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා. *[බාධා කිරීමක්]* ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, මම ඔබතුමාට බාධා කළේ නැහැ. විනාඩියක් ඉන්න, ගරු ඇමතිතුමා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු විපක්ෂ නායකතුමනි, මේවා දුන්නේ කොයි කාලයේද කියලා ඔබතුමාට කියන්න පුළුවන් ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇත්තවශයෙන්ම මට ලැබී තිබෙන තොරතුරුවලට අනුව, ඒ ගොවි ජනතාව ඉදිරිපත් කර තිබෙන කරුණුවලට අනුව මේ අය මේ ඉඩම්වල 1972 සිට වගා කටයුතු කරනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු විපක්ෂ නායකතුමනි, මේ කොම්පැනිවලට මේ ඉඩම් දුන්නේ කොයි කාලයේද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒක ගැන ඇත්තවශයෙන්ම මට අවබෝධයක් නැහැ. 2023 වසරේ තමයි මේ ගොවිබිම්වලට මේ හානිකර තත්ත්වය ඇති වුණේ. මෙහෙම නේ, කවුරු දුන්නා ද, නැද්ද කියන කථාව නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මේ ගැටලුවට විසඳුමක් ලබා දෙන්න. "පුරවැසි හඬ" වැඩසටහන හරහා ඉදිරිපත් වුණු ප්‍රශ්නයක් තමයි අපි මේ ඉදිරිපත් කරන්නේ. ඒකට විසඳුම් ලබා දෙන්න; උත්තර සපයන්න. ඒ සම්බන්ධයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මම බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම ගොවි පවුල් 1,000ක් ඉන්න තහරවෙට්ටුවාන්, මත්තියවැලි, මුත්තුනගර් කියන ගම්මාන තුන නියෝජනය කරන ජනතාව වෙනුවෙනුයි මම මේ ඉල්ලීම කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ඉඩම් හා සම්බන්ධ පත්‍රිකා සහ තවත් ලේඛන කිහිපයක් **සභාගත*** කරනවා.

මෙතැන මේ ඉඩම්වල ඡායාරූපත් තිබෙනවා. ඇත්තවශයෙන්ම අස්වැන්න නෙළන කාලයේදී රජය නියෝජනය කරන දේශපාලන අධිකාරිය, මන්ත්‍රීවරුන් සහ Additional GA මේ ගොවි බිම්වලට ගිහිල්ලා ආශීර්වාද කරලා තිබුණා. ඒ කියන්නේ, රජය නියෝජනය කරන මන්ත්‍රීවරුනුත් මේ ගොවි බිම් අනුමත කර තිබෙනවා, මේ ගොවි බිම් ආරක්ෂා කරන බව කියා තිබෙනවා. නමුත්, අද වෙනකොට මේ ගොවි බිම් ටික අහිමි වන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. සමාගම්වලට සීමා පනවන මේ පනත් කෙටුම්පත සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේදී එක ප්‍රශ්නයක් මම ඔබතුමන්ලාට ඉදිරිපත් කරන්න කැමැතියි. ඔබතුමන්ලා කරුණාකරලා ගොවීන්ගේ පැත්තෙන් හිතලා සාධාරණත්වය ඉෂ්ට කරන්න. කිසිසේත්ම මේක අර්ථ කථනය කරන්නට එපා, පුනර්ජනනීය බලශක්තියට, සූර්ය බලශක්තියට විරුද්ධව කරන ක්‍රියාවක් කියලා. නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු විපක්ෂ නායකතුමනි, දැන් ඔබතුමා මේ ප්‍රශ්නය ආණ්ඩුවට යොමු කළා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. මෙතුමාත් මේ ඇත්ත කියන්නේ නැතිවයි වටේ දුවන්නේ. ඇත්තත් කියන්නකෝ. මේක දුන්නේ කවුද? පසුගිය ආණ්ඩුව. දැන් නඩු තීරණයක් ලැබුණා. අපිත් try කරන්නේ ඒ සමහර ඒවා බේරන්න. ඒ ගොවියෝ කාලයක් ගොවිතැන් කරමින් හිටියා. අනවසර ඉඩම්වල හිටියාට ඒ ගොවීන්ට ඉඩම් දීලා නැහැ. හැබැයි, ඒ සමාගම්වලට ඒ ඉඩම් දෙනකොට ඔබතුමන්ලා දීලා තිබෙන්නේ විපක්ෂ නායකතුමා, map එකෙන් මැනලා. එහෙමයි දීලා තිබෙන්නේ. රනිල් වික්‍රමසිංහලා ඒවා දීලා තිබෙන්නේ map එකෙන් මැනලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අඩුම ගණනේ භූමියට ගිහිල්ලා බලලා නැහැ, මිනිස්සු ඉන්නවාද කියලා. දැන් අධිකරණ තීරණයක් මත තමයි ඒ ක්‍රියාවලිය සිදු වෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ රජය මේ තීන්දු තීරණ ගන්නකොට අපි ඒවායේ පාර්ශ්වකරුවන් නොවෙයි. අපි විපක්ෂය. ඒ කරුණත් පොඩ්ඩක් අවබෝධ කර ගන්න. ඒ නිසා මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී,- *[බාධා කිරීම්]* ප්‍රශ්නය ඉදිරිපත් කරනකොට ඒකට කලබල වෙන්න එපා. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

එතකොටත් ඔබතුමා පාර්ලිමේන්තුවේ හිටියා නේ.

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කලබල වෙන්න එපා, මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනකොට. *[බාධා කිරීම්]* මේ ප්‍රශ්නයට සවන් දීලා විසඳුමක් ලබා දෙන්න. *[බාධා කිරීම්]* උත්තරයක් ලබා දෙන්න. *[බාධා කිරීම්]* මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මේ කාරණය කියන්න ඕනෑ. *[බාධා කිරීම්]* මොකද, මේ ප්‍රශ්නයට මෙච්චර කෑ කෝ ගහන්නේ?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, නැහැ, විපක්ෂ නායකතුමා,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ ප්‍රශ්නයට සවන් දීලා ඔබතුමන්ලා විසඳුම් ලබා දෙන්න. ඔච්චර ආවේගශීලී වෙන්න එපා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
රනිල් දුන්නාය කියලා අපට විසඳන්න කියන්න. ඔබතුමා රනිල් දුන්නා කියන්නේ නැහැ, තවමත් රනිල්ට භයේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
රනිල්ගේ නමවත් කියන්නේ නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔව්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පුදුම විධියට නේ කලබල වෙලා කෑ කෝ ගහන්නේ. ඇයි මෙච්චර භය? *[බාධා කිරීම්]* පවුල් 1,000ක ජනතාවක් මුහුණ දෙන ප්‍රශ්නයක් මේ ඉදිරිපත් කරන්නේ. මම ඔබතුමන්ලා අපහසුතාවට පත් කරනවා නොවෙයි නේ. අපි ඉල්ලන්නේ විසඳුමක්.

දෙවැනි කාරණාව මම වසන්ත සමරසිංහ ඇමතිතුමාට සෘජුවම ඉදිරිපත් කරන කාරණාවක්. පසුගිය දවසක අපට තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයට යන්න පුළුවන්කම ලැබුණා. මොකද, ඒ ආර්ථික මධ්‍යස්ථානයට සම්බන්ධ වෙළෙඳ ව්‍යාපාරිකයන්ගේ ලොකු මැසිවිල්ලක් තිබුණා. අපි ඒ අයට සවන් දෙන්න, කරුණු කාරණා හොයා බලන්නට ගියා. ඔබතුමාත් දන්නවා, අපේ රටේ ආර්ථික මධ්‍යස්ථාන මම හිතන විධියට 18ක් තිබෙනවා. එයින් 13ක් හෝ 14ක් සක්‍රියව ක්‍රියාත්මක වෙනවා. ඒ වෙළෙඳ සංගමයෙන් ඉදිරිපත් කරපු කරුණු කාරණා මම ඔබතුමාට අද ඉදිරිපත් කරනවා. එතැනදීත් අපි බලාපොරොත්තු වෙන්නේ,- *[බාධා කිරීම්]* ගරු ඇමතිතුමනි, කලබල වෙන්න එපා. *[බාධා කිරීමක්]* කලබල වෙන්න එපා. එතැනදීත් අපි බලාපොරොත්තු වෙන්නේ විසඳුමක්. ඔබතුමා දන්නවා, මේ ආර්ථික මධ්‍යස්ථාන ඇත්තවශයෙන්ම කළමනාකරණය වන්නේ දැනට භාරයක් හරහා කියන එක. මම හිතන විධියට දිසාපති, ප්‍රාදේශීය ලේකම් වාගේම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඇතුළු වෙනමම පරිපාලන ව්‍යුහයක් තිබෙනවා. දැන් ලොකු කලබලයක්, ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, ඒ ආර්ථික මධ්‍යස්ථාන සියල්ලකගේම වෙළෙඳ ව්‍යාපාරිකයන්ගේ, ඒ පරිපාලන ව්‍යුහයේ වෙනසක් ඇති කරලා ඒක පෞද්ගලික සමාගමකට, කළමනාකාරිත්වයකට පවරන්නට යන කාරණාව සම්බන්ධව. ඇත්තවශයෙන්ම ඒ සක්‍රිය ආර්ථික මධ්‍යස්ථානවල රුපියල් කෝටි 600ක පමණ,- *[බාධා කිරීමක්]* විනාඩියක් ඉන්න. කලබල වෙන්න එපා. මම මේ කාරණය ඉදිරිපත් කරලා ඉවර වුණාට පස්සේ ඔබතුමා උත්තර දෙන්න, ඇමතිතුමනි. කලබල වෙන්න එපා ඔච්චර.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගමේ වැඩේ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, would you please continue?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා, මේකේ අඩුපාඩුවක් තිබෙනවා නම් ඔබතුමා උත්තර දෙන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් අපේ වගකීම, ජනතාව කියන දේ, ඔවුන් ඉදිරිපත් කරන ගැටලු මේ සභාවට ඉදිරිපත් කරලා ඒ ගැටලුවලට විසඳුම් ලබා ගැනීම. ඒක වරදක් නොවෙයි නේ. ඒ නිසා ඔබතුමා කරුණාකරලා කලබල වෙන්න එපා.

සක්‍රිය ආර්ථික මධ්‍යස්ථාන 13ක හෝ 14ක රුපියල් කෝටි 600ක පමණ වත්කම් තිබෙනවා කියලා අපට දැනගන්නට ලැබී තිබෙනවා, ඒ වෙළෙඳ ප්‍රජාව මාර්ගයෙන්; ගොවීන් මාර්ගයෙන්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ආර්ථික මධ්‍යස්ථාන 14ක.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද දන්නවාද, ඒ ගොවීන්ගේ මැසිවිල්ල? පෞද්ගලික සමාගමකට ඒ දේපළ සහ ඉඩම් අත්තනෝමතිකව පැවරීම. ඒ අය, අවුරුදු 22ක් පුරාවටම ගොඩනභා ගත්ත දේපළ තිබෙනවා. මම මේ කථා කරන්නේ, තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය ගැන.

ඒක අවුරුදු 33ක බදු ගිවිසුමකට ලක් කරලා, ඒ බදු ගිවිසුම හරහා තවත් පාර්ශ්වවලට මෙය පැවරීමේ හැකියාව තිබෙනවා. ඔබතුමාම දන්නවා, කෘෂි නිෂ්පාදන අළෙවි ජාලය පිළිබඳව. බීජ පැකට් එකේ ඉඳලා, පොහොරවල ඉඳලා, කෘෂි රසායන ද්‍රව්‍යවල ඉඳලා මේ ජාලය පටන් ගන්නේ ගොවි ජනතාවට තෙල් පොහොරවලින් සාත්තු සප්පායම් කරලා. ඇත්තවශයෙන්ම රජයට බරක් නැහැ. ගොවි ජනතාවට තිබෙන මැසිවිල්ල තමයි, විධිමත් සාකච්ඡාවකින් තොරව, ඒ සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කරන්නේ නැතුව මේ වාගේ කැබිනට් පත්‍රිකාවක් ඔබතුමන්ලා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඉදිරිපත් කරලා ඒකට අනුමැතිය ලබාගෙන තිබෙනන එක. මේ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කරලා ලිඛිත උත්තරයක්, ලිඛිත වගකීමක් ඔබතුමන්ලා ලබා දෙයි කියලා ඒ අය බලාපොරොත්තු වනවා. මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා, ඔබතුමාගෙන් නිසි පිළිතුරක් ලැබීම තුළ මේක හැන්සාඩ්ගත වෙනවා. ඒ අයට විශ්වාසයක් ඇති කරන්න, ඔවුන්ගේ අදහස පිළිබඳව. ඔබතුමන්ලා හිනා වුණාට මේක වෙළෙඳුන්ගේ අදහස, වෙළෙඳ ව්‍යාපාරිකයන්ගේ අදහස. ඒ නිසා විශේෂයෙන්ම මේ ප්‍රශ්නයට ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

විශේෂයෙන්ම මම දැනගන්න කැමැතියි, විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන -සක්‍රිය මධ්‍යස්ථාන- මොනවාද, එම මධ්‍යස්ථානවල සමස්ත වත්කම්වල වටිනාකම කීයද කියලා. ඒ පිළිබඳව වාර්තාවක් ඔබතුමා මේ සභාවට ඉදිරිපත් කරන්න. ඒ වාගේම මේ මධ්‍යස්ථානවල වාර්ෂික ආදායම් සහ වියදම් පිළිබඳ වාර්තාවක් මේ සභාවට ඉදිරිපත් කරන්න. එම ආදායම් සහ වියදම් වාර්තා මඟින් ආර්ථික මධ්‍යස්ථානවල මෙතෙක් පැවතෙන කළමනාකරණය පිළිබඳව ඔබතුමාට නිගමනයකට එන්න පුළුවන්. මේ වෙනස ඇති කරන්නේ මේවා අසාර්ථක වුණු නිසාද? මේ කරුණු කාරණා පිළිබඳව ඔබතුමා උත්තරයක් ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එහෙම නැත්නම් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම පිණිස වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීමට අනුමැතිය, ඒ කැබිනට් සන්දේශය ලබා දීමේ යෝජනාව රජය ඉදිරිපත් කරන්නේ කුමන අරමුණක් හිතේ තියාගෙනද? මේකට පාදක වුණු කරුණු කාරණා මොනවාද? ඒ වාගේම මේ යෝජනාව පිටුපස ව්‍යාපාර සැලැස්මක් තිබෙනවාද? එමෙන්ම මේ යෝජනාව පරිදි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පැවරීමට මේ වනවිට පෞද්ගලික සමාගමක් තෝරාගෙන තිබෙනවාද? එම සමාගමේ නම, ලියාපදිංචි අංකය සහ ලියාපදිංචි වූ දිනය මොකක්ද? එකී සමාගම තෝරා ගත් ක්‍රමවේදය කුමක්ද? ඒ සඳහා විවෘත ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද? එසේ නම්, එම ටෙන්ඩරය සඳහා අයදුම් පත් ඉදිරිපත් කළ පුද්ගලයන් පිළිබඳ විස්තරයක් මෙම සභාවට දන්වන්නේද? යම් හෙයකින් පවරනු ලබන පෞද්ගලික සමාගම ව්‍යාපාරික වශයෙන් අසාර්ථක වූ විට එම රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම සඳහා පවතින නීතිමය ආරක්ෂාව කුමක්ද? මේ විශේෂ ආර්ථික මධ්‍යස්ථාන 14ක් -ඔබතුමා කිව්වා, 14ක් කියලා- පෞද්ගලික සමාගමකට පැවරීම පිළිබඳව ගොවි සංවිධාන, වෙළෙඳ සංගම්, ජනතා නියෝජිතයන් -ඒ පාර්ශ්වකරුවන්- සමඟ ඔබතුමා විධිමත් සාකච්ඡාවක් කරනවාද?

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, දැන් මේ ප්‍රශ්න,- *[බාධා කිරීමක්]* කලබල වෙන්න එපා. තව විනාඩියක් දෙන්න, මේ කාරණය කියා අවසන් කරන්න. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, පොඩ්ඩක් ඉන්නකෝ. ඒ සාකච්ඡාවේදී මේ ප්‍රශ්න නැඟුවේ ඔබතුමා ජීවත් වන බලප්‍රදේශයේ ගොවි ජනතාව, ව්‍යාපාරික ප්‍රජාව සහ විවිධ කණ්ඩායම්. ඒ නිසා ඔබතුමාගේ වගකීම තමයි, ඒ කණ්ඩායම් සියල්ලක්ම ගෙනැල්ලා විවෘතව සාකච්ඡා කරලා, මේ කරන වැඩ පිළිවෙළ කුමක්ද කියන එක පැහැදිලි කරලා, ඒ වැඩ පිළිවෙළ තුළින් ඒ ජනතාවට අත්පත් වන ඉරණම කුමක්ද, ඒක ධනාත්මක ද, ඍණාත්මක ද කියන එක ගැන විධිමත්ව කරුණු එළිදැක්වීම. ඒ නිසා ඔබතුමා මේකට කලබල වෙන්න එපා. මේක සද්භාවයෙන් ක්‍රියාත්මක වන වැඩසටහනක් හැටියට ඒ ව්‍යාපාරික ගොවි ජනතාවගේ -ඒ සියලුදෙනාගේම- හිත දිනා ගන්න ඔබතුමාට පුළුවන් නම් එතකොට එතැනින් මේ ප්‍රශ්නය ඉවරයි. නමුත්, ඔවුන්ට තිබෙන හැඟීම තමයි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සහමුලින්ම පෞද්ගලික සමාගමකට ලබා දෙනවා කියන කාරණාව. ඒකට හේතුව, විධිමත් සාකච්ඡාවකින් තොරව, පාර්ශ්වකරුවන් සමඟ සංවාදයක් ඇති කර ගන්නේ නැතුව මේ කාරණාව ක්‍රියාත්මක කිරීම. ඔබතුමා ඒක පිළිගන්නට ඕනෑ. ඇත්තවශයෙන්ම මේ සමාගම්වලට සීමා පනවන අවස්ථාවේදී මම මුත්තුනගර් බලප්‍රදේශයේ පවතින ප්‍රශ්නයත්, තඹුත්තේගම බලප්‍රදේශයේ පවතින ප්‍රශ්නයත් පිළිබඳව සද්භාවයෙන් කරුණු ඉදිරිපත් කළේ ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තුවෙන්; ඒ ජනතාව වෙනුවෙන් විසඳුමක් බලාපොරොත්තුවෙන්. මම ප්‍රාර්ථනා කරනවා, මේ ගැටලු දෙකටම ජනතාවාදී, ජන හිතකාමී විසඳුමක් ලබා දෙන්න ඔබතුමාට හැකියාව ලැබේවා, ප්‍රඥාව පහළ වේවා කියලා.

ස්තුතියි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතනවා, අපේ රටේ විපක්ෂ නායකවරයාගේ වගකීම කියන කාරණය පිළිබඳව අපි තවත් සැලකිලිමත් වෙන්න ඕනෑ කියලා. මොකද, මේ පාර්ලිමේන්තුවේ කාලය අරගෙන, ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා විපක්ෂ නායකවරයා හැටියට තමන්ට හිතෙන ඔක්කොම බොරු ටික කියනවා. පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා හැටියට එතුමා දන්නවා දැන් Cabinet Paper එකක් සම්මත වෙලා තිබෙනවා කියලා. අඩුම තරමින් මේ ප්‍රශ්නය අහන්න කලින් එතුමාට පුළුවන් Cabinet Paper එකේ එහෙම තිබෙනවාද කියලා බලන්න. ඒක කර ගන්නවත් විපක්ෂ නායකට වගකීමක් නැත්නම්, විපක්ෂ නායක ධුරයේ වගකීම පිළිබඳ ප්‍රශ්නයක් දැන් අපේ රටේ මේ තිබෙන්නේ. විපක්ෂයක් ඉන්නේ ආණ්ඩුවට කරුණු කියන්න, මඟ පෙන්වන්න, වැරැදිවලට විවේචන කරන්න නේ. අඩුම තරමින් තමන් මේ කියන්න යන කරුණට අදාළව ඉදිරිපත් වුණු Cabinet Paper එකේ මෙහෙම ඒවා තිබෙනවාද කියලා බලන්න එපායැ. අප්පා! මෙහෙම බොරු කියන්න පුළුවන්ද? ලියාගෙන ඇවිල්ලා කියනවා, කියනවා. ඔක්කොම බොරු ටික කියනවා නේ. එතුමාට හිතෙන ඔක්කොම ටික එතුමා කියනවා.

ආර්ථික මධ්‍යස්ථාන 18ක් තිබෙනවා. ඒ 18න් 14ක් ක්‍රියාත්මක වෙනවා. ඒ 14නුත් සමහර ඒවා ක්‍රියාත්මක වෙන්නේ ආර්ථික මධ්‍යස්ථාන හැටියට නොවෙයි. සමහර ඒවා දැන් සිල්ලර කඩ හැටියට ක්‍රියාත්මක වෙන්නේ. දඹුල්ල, තඹුත්තේගම, කැප්පෙටිපොළ, නුවරඑළිය වාගේ ආර්ථික මධ්‍යස්ථාන හැරුණාම, බොහොමයක් ඒවා අනෙක් ඒවායින් යැපෙන්නේ. දඹුල්ලෙන් බඩු ගෙනැල්ලා තමයි මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයට දමන්නේ. මීගොඩින් බඩු ගෙනැල්ලා තමයි, රත්මලාන හා නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානවලට දමන්නේ. ඒ නිසා මේ ක්‍රියාවලිය පිළිබඳව අවිධිමත් බවක් තිබෙනවා. අමාත්‍යාංශ හතරකට අයත්ව තිබුණා. මේවා හදපු අය ව්‍යාපාරිකයන්ගෙන් සල්ලි අරගෙන තිබෙනවා. ඒ ගත්ත සල්ලි කොහේද කියලා නැහැ. ඒවාට මේගොල්ලන් වග කියන්නේත් නැහැ. පසුගිය ආණ්ඩු දෙකම තිබුණු කාලයේ මේ සිද්ධි වෙලා තිබෙනවා. ඒ කියන්නේ මේ ව්‍යාපාරිකයන්ට කඩ දීමේදී සල්ලි අරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේ ප්‍රශ්න තිබෙනවා.

ඒ වාගේම, කඩහිමියන්ට බදු ගිවිසුමක් නැහැ. සමහරු අපිට කිව්වේ, "අපි දැන් ඉන්නේ එළිපත්තේ. අපි කොයි වෙලාවේ එළියට වැටෙයිද කියලා දන්නේ නැහැ" කියලා. ඒ නිසා ඒ සියලුදෙනාට රැකවරණය සලසන්න හදපු කැබිනට් පත්‍රිකාව බැලුවා නම්, ගරු විපක්ෂ නායකතුමාට ඔය ප්‍රශ්න එකක්වත් අද අහන්න වෙන්නේ නැහැ. එතුමා ඒක බලන්නේ නැතුව ඇවිල්ලා මේ ප්‍රශ්න අහනවා. මම ඒ තැන්වලට ගියාට පස්සේ තමයි එතුමා යන්නේ. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. එතුමා හිතනවා, මේක

කිව්වාට පස්සේ හරි යයි කියලා. නැහැ, මේක සම්පූර්ණ රාජ්‍ය සමාගමක් කියන එක කැබිනට් පත්‍රිකාවේ තිබෙනවා. භාණ්ඩාගාර ලේකම්ට තමයි අයිති. මීට පෙර හදපු සාංගමික ව්‍යවස්ථාවක් තිබෙනවා, හිටපු ඇමතිවරයෙක් කොම්පැනියක් හදන්න ගිහිල්ලා. ඒකත් මේ ව්‍යාපාරිකයෝ ළඟ තබා ගෙන ඉන්නවා. ඒගොල්ලන් ගෙන්වලා ගිය සඳුදාත් සාකච්ඡා කළා. දඹුල්ලේ අය ආවා, ඊට කලින් තඹුත්තේගම අය හමු වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්න කලින් නාරාහේන්පිට, වැලිසර, තඹුත්තේගම, දඹුල්ල යන ආර්ථික මධ්‍යස්ථානවල අය හමු වුණා. දඹුල්ලෙන් කණ්ඩායම් දෙකක් ආවා.

ඒ විතරක් නොවෙයි, අපි ජූනි මාසයේ -ගිය මාසයේ- 9වැනි දා අමාත්‍යාංශ ලේකම්වරයාත්, මමත්, මේ අදාළ ආයතනවල නිලධාරිනුත් මේ ආර්ථික මධ්‍යස්ථාන දහඅටේම අය හමු වුණා. උතුරු පළාතේ යාපනයේ සිට මෙහාට වවුනියාව දක්වා හතරක් විවෘත කරලා නැහැ. ඒ හතරට වග කියන රාජ්‍ය නිලධාරින් එක්ක සියලුදෙනා ගෙනැල්ලා කරන්නේ මොකක්ද කියලා අපි නිශ්චිතව කිව්වා. මේ පටලගත්ත සමහර ඒවා පැටලිලා තිබෙන්නේ කොහොමද කියලා ඊයේ පෙරේදා මම YouTube එකට විනාඩි දහයක voice-cut එකක් දීලා ඒක මාධ්‍යවල ගියා. මම විපක්ෂ නායකතුමාටත් ඒක එවනවා. මේක එතුමා බලලා ඇති, එහෙම නැත්නම් බලලා නැතුව ඇති. අපි මොකක්ද කරන්නේ කියන කාරණය පිළිබඳව පැහැදිලිව කියලා තිබෙනවා. ඒ නිසා මේ පෞද්ගලික සමාගම් දැම්මාද, ටෙන්ඩර් දැම්මාද අහන්නේ, මොකක්ද අප්පා! විපක්ෂ නායකතුමනි, ඔබතුමා ඔය ප්‍රශ්න ටික අහන්න කලින් අඩුම තරමින් Cabinet Paper එක බලන්න එපායැ. මේ පාර්ලිමේන්තුවේ අදාළ පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්න තිබෙන කාලය නේ මේ යන්නේ. සමාගම්වලට සීමා පනවන්න නොවෙයි මේක ගේන්නේ. මේ beneficiary ownership එක ගේන්නේ හොරකම් කරන, කළු සල්ලිවලට සීමා පනවන්න, වෙනත් අයගේ දේපළ අත්පත් කරගෙන තිබෙන ඒවාට සීමා පනවන්න. ඒවාට තමයි ගේන්නේ. අතුරු බදු දීලා තිබෙන ඒවා පවරා ගන්නවාට සීමා පනවන්න මේක ගේන්නේ. මේ සංවාදය ඇතුළේ එතුමා කියන්න උත්සාහ කළා, මේ ආර්ථික මධ්‍යස්ථාන පෞද්ගලික සමාගම්වලට දෙනවා කියලා. නැහැ, sorry කියලා එතුමාට කියන්න ඕනෑ. අඩුම තරමින් ඉස්සෙල්ලා Cabinet Paper එක බලන්න, ඒක කියන්න කලින්. Cabinet Paper එකේ නිශ්චිතව කරුණු ටික තිබෙනවා.

දෙවැනි කාරණාව තමයි, ත්‍රිකුණාමලයේ ගමක සිද්ධියක් ගැන එතුමා ප්‍රශ්නයක් යොමු කළා. ඒ සිද්ධිය මතු වෙන්නේ අද ඊයේ නොවෙයි. එතුමන්ලා හිටපු ආණ්ඩුවේ අර්ජුන රණතුංග ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයේ තමයි, ඒක පටන් ගන්නේ. දැන් නිකම් ඇඟ බේරා ගන්න හදනවා. ඒ කාලයේ මේක පටන් ගන්නේ. ඒ කාලයේ තමයි මේ සිද්ධියේ ආරම්භය තිබෙන්නේ. එදා ඉඳන් ඇදෙනවා. තවත් කොච්චර හයද කියනවා නම්, අඩුම තරමින් විපක්ෂ නායකතුමා රනිල් වික්‍රමසිංහගේ නම කිව්වේ නැහැ. රනිල් වික්‍රමසිංහ තමයි මේක දෙන්නේ. දැන් උසාවිවල නඩු තිබෙනවා. කොම්පැනිය වරායට නඩු දාලා තිබෙනවා. වරාය ගොවීන්ට නඩු දාලා තිබෙනවා. ගොවියෝ වරායට නඩු දාලා තිබෙනවා. දැන් නඩු ගොඩයි. නඩු ගොඩක්. ඒ නිසා මේ ටික බේරන්න ඕනෑ. ඒ පරම්පරාවට, එහෙම නැත්නම් අවුරුදු 40ක්, 50ක් ජීවත් වෙච්ච ගොවි ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් අපේ රජය වග කියනවා. මෙතුමන්ලා වාගේ ඔහේ අල්ලට කොල්ලට දාලා, මේ කොම්පැනිවලට දීලා මඟහැරලා ඉන්නේ නැහැ. ඒ ගොවි ජනතාවට අසාධාරණයක් වෙනවා, ඒකට වන්දියක් ගෙවනවා නම්, වන්දියක් ගෙවන්න අවශ්‍ය මැදිහත්වීම කරනවා.

පාර්ලිමේන්තුවේ කාලය වෙන් කරලා, අපි වැදගත් විවාදයක් මේ කරන්නේ. මම නිශ්චිතව කියන්න ඕනෑ, මේ සමාගම්වලට සීමා පනවන්නේ නැහැ කියලා. හොරකමට, වංචාවට, කළු සල්ලිවලට, විශුද්ධිකරණයට සීමා පනවන්න තමයි Companies Act එකට අදාළව beneficiary ownership එකේ changes කරන්නේ. ඒක නිශ්චිතවම අපි පැහැදිලි කරලා තිබෙනවා. එතුමාට ප්‍රශ්නයක් අහන්න ඕනෑ නිසා ඇහුවාට කමක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, මම එතුමාට ආරාධනා කරනවා Cabinet Paper එක කියවලා එන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sarath Kumara. You have 10 minutes.

[අ.භා. 12.11]

ගරු නීතිඥ සරත් කුමාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2007 අංක 07 දරන සමාගම් පනතට ඉතා වැදගත් සංශෝධන කිහිපයක් එකතු කරන මේ වෙලාවේ මේ විවාදයට එක් වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. ලංකාවේ සමාගම් පාලනය කරන්න දැනට ක්‍රියාත්මක වන නීතිය තමයි 2007 අංක 07 දරන සමාගම් පනත. මේ පනත විශේෂයෙන්ම නවසීලන්ත සහ කැනඩා සමාගම් නීති ඇසුරු කරගෙන සංවර්ධනය වෙච්ච නීතියක්. මේ පනත අපේ රටේ ක්‍රියාත්මක වෙන්නට පෙර අපේ රටේ සමාගම් පාලනය කරන්න ක්‍රියාත්මක වුණු නීතිය තමයි 1982 අංක 17 දරන සමාගම් පනත. කොහොම වුණත් මේ වනවිට අපට අපේ රටේ සමාගම් නීතියේ වර්ධනයක් දකින්න පුළුවන්කමක් තිබෙනවා. අපේ රටේ සමාගම් නීතියේ ඒ වර්ධනය තවදුරටත් පුළුල් කරමින් තමයි මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ.

මේ සංශෝධනය ඉදිරිපත් කිරීමේදී, විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ගෝලීය වශයෙන් ත්‍රස්තවාදය වැළැක්වීම සඳහාත්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහාත් ලෝකයේ නිර්දේශ ලබා දෙන ආයතනයක් තිබෙනවා. ඒ තමයි FATF එක. FATF එක විසින් මේ වෙනකොට ලෝකයේ රටවලට නිර්දේශ 40ක් පමණ ලබා දීලා තිබෙනවා. ඒ නිර්දේශ 40න් අපි මේ වනකොට නිර්දේශ 39ක් ක්‍රියාත්මක කරන්න සමත් වෙලා තිබෙනවා. හැබැයි, 24වැනි නිර්දේශය ක්‍රියාත්මක කරන්න අපි පියවර ගත්තේ නැහැ. ඇයි, අපි ඒ පියවර ගත්තේ නැත්තේ? ඔබතුමන්ලා අපි කවුරුත් දන්නවා, අපේ රට පාලනය කරපු ආණ්ඩු වෙඳර වළල්ලකට සම්බන්ධ වෙලා තිබුණු බව. අන්න ඒ වෙඳර වළල්ලට, වෙඳර ආණ්ඩුවලට මේ නීතිවලින් පැනලා යන්න ඕනෑකම තිබුණා. ඒ අයගේ ආධාරකරුවන්, හිතවතුන් මේ නීතියෙන් ආරක්ෂා කරන්න, ඔවුන්ට රැකවරණය දෙන්න ඒ අයට වුවමනාව තිබුණා. ඒ නිසා තමයි මේ 24වැනි නිර්දේශය ක්‍රියාත්මක කරන්න ඒ අය පියවර නොගත්තේ. හැබැයි අද අපි මේ රටේ ජනතාවට පොරොන්දුවක් දීලායි මේ රටේ අලුත් ආණ්ඩුව හදලා තිබෙන්නේ. අපි නීතියේ පාලනයට යටත් රටක් හදනවා කියන ප්‍රතිඥාව රටට දීලා තිබෙනවා. ඒ ප්‍රතිඥාවට අනුව තමයි අපි නීතියේ පාලනයට යටත් රටක් හදන කාර්යය මේ රටේ ආරම්භ කරලා තිබෙන්නේ. ඒ නිසා අපි විපක්ෂයේ ඔබතුමන්ලාට විශේෂයෙන් කාරණයක් කියනවා. ඔබතුමන්ලාගේ බලාපොරොත්තු දැන් බිඳිලා තිබෙන බව අපි දන්නවා. බලාපොරොත්තු බිඳෙනකොට හිත් රිදෙන බව අපි දන්නවා. හිත් රිදෙනකොට එක එක විධියේ කෙඳිරිලි මතු වෙන බව අපි දන්නවා. හැබැයි, ඒ කෙඳිරිලි කුමකටවත් අපේ ගමන නවත්වන්න බැහැ කියන පණිවුඩය මේ වෙලාවේ විශේෂයෙන්ම ලබා දෙන්න කැමැතියි.

FATF එක අපට දීලා තිබෙන 24වැනි නිර්දේශයට අනුව අපි අපේ සමාගම් නීතියට සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සංශෝධන අනුව අපේ සමාගම්වල අර්ථලාභී හිමිකරුවන්, එහෙම

[ගරු සරත් කුමාර මහතා]

නැත්නම් අවසන් ප්‍රතිලාභී හිමිකරුවන් හෙළිදරව් කිරීම මින් ඉදිරියට කරන්න ඕනෑ. අන්න ඒ වෙනුවෙන් තමයි විශේෂයෙන්ම අපි මේ අලුත් නීති සංශෝධනය ඉදිරිපත් කරලා තිබෙන්නේ. පසුගිය කාලයේ අපේ රටේ ත්‍රස්තවාදය විශාල ගැටලුවක් වෙලා තිබුණු බව අපි දන්නවා. අපේ රටේ ත්‍රස්තවාදයට විවිධ ආකාරවලින් මුදල් සැපයීම බහුලව සිදු වුණා. හැබැයි, ඒ වෙලාවේ අපට ඒක නවත්වා ගන්න බැරි වුණා. ඇයි? මීට පෙර තමුන්නාසේලාගේ ආණ්ඩුවලට, තමුන්නාන්සේලාගේ පූර්වගාමීන් නියෝජනය කරපු ආණ්ඩුවලට එහෙම වුවමනාවක් තිබුණේ නැහැ. හැබැයි, FATF එකේ ඒ නිර්දේශය ක්‍රියාත්මක කරලා තිබුණා නම් අපට ඒවා වළක්වා ගන්න පුළුවන්කම තිබුණා. හැබැයි අපි අද පියවරක් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා.

ඒ වාගේම තමයි මුදල් විශුද්ධිකරණය. මුදල් විශුද්ධිකරණය අද අපට, අපේ ගමනට අභියෝගයක් බවට පත් වෙලා තිබෙනවා. එහෙ නම් අපි රටක් හැටියට ඒ අභියෝගය දිනන්න ඕනෑ. රටක් හැටියට අභියෝග දිනන ඒ ගමනට බාධක වෙන ඒ පරණ නීති වෙනස් කරලා, ඒවා සංශෝධනය කරලා අලුත් නීති හඳුන්වා දෙන්න දවසින් දවස, අදියරයෙන් අදියර අපි කටයුතු කරමින් ඉන්නවා කියන පණිවිඩයත් මම ඔබතුමන්ලාට ලබා දෙන්න කැමැතියි.

ඒ වාගේම මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, මේ නීතිය හරහා පසුගිය කාලයේ බොහෝ අය ඒ සමාගම්වල මුදල් ආයෝජනය කරලා තිබුණු බව. හැබැයි, ඒ ආයෝජකයෝ කවුද කියන එක සමාජයට හඳුනා ගන්න විධියක් නැහැ. විනිවිදභාවයක් නැහැ. විශේෂයෙන් ගත්තොත්, මේ සංශෝධන හරහා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් යෙදවීම වළක්වනවා වාගේම මුදල් විශුද්ධිකරණය වළක්වනවා වාගේම යම් විනිවිදභාවයකුත් රටේ ජනතාවට ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා.

විශේෂයෙන් ගත්තොත්, මෙම සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පතේ 130වැනි වගන්තියේ ඒ සම්බන්ධ ප්‍රතිපාදන තිබෙනවා. එතකොට, අවසන් ප්‍රතිලාභි හිමිකරුවන් කවුද කියන එක සමාජයෙන් සඟවා තබන්න මින් ඉදිරියට බැරි වෙනවා. ඒ වාගේම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, මෙම පනත් කෙටුම්පත තුළ යම් සීමා කිරීමක් සඳහන් වෙලා තිබුණොත්, තොරතුරු දැන ගැනීමේ පනත හරහා අපට නැවත අවස්ථාවක් ලැබෙනවා, සමාගම් තුළ සැඟවී සිටින අර්ථලාභී හිමිකරුවන් කවුද කියන එක නැවත තහවුරු කර ගන්න. ඒ සඳහා අපට අවස්ථාවක් ලැබෙනවා. ඒ නිසා මේ සංශෝධනත් එක්ක මින් ඉදිරියට මේ රටේ සමාගම් ක්ෂේත්‍රය ඇතුළේ තවදුරටත් වෛර අරමුණුවලින් මුදල් ආයෝජනය කරමින් ඉස්සරහට යන්න තිබෙන ඉඩ කඩ අපි අහුරලා තිබෙනවාය කියන කාරණය විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම තවත් කාරණයක් සඳහන් කරන්න ඕනෑ. මේ සංශෝධන පනත් කෙටුම්පත ක්‍රියාත්මක වීම ආරම්භ කරලා මාස දෙකක කාලයක් ඇතුළත සමාගම් ලේකම්වරයාට වගකීමක් තිබෙනවා, ඒ කරුණු තහවුරු කර ගන්න. ඒ කියන්නේ අවසන් ප්‍රතිලාභී හිමිකරුවන් කවුද කියන එක තහවුරු කර ගැනීමේ වගකීම තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මාස 6ක් තුළ සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට මේ සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේ වගකීමත් සමාගම් ලේකම්වරයාට පැවරිලා තිබෙනවා. එම නිසා, අපේ රටේ සමාගම්වලට අදාළ නීති අවිධිමත් ආකාරයට ක්‍රියාත්මක වීම, අසම්පූර්ණ ආකාරයෙන් ඒවා ක්‍රියාත්මක කිරීම තවදුරටත් සිද්ධ වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ කියන කාරණය මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ නීති සංශෝධනය කරන ගමන්, වෛර ව්‍යාපාරිකයන්ට ඒ තුළ සැඟවෙන්න තිබෙන අවස්ථාව අහිමි කරමින් අපි ඉදිරියට යනවාය කියන පණිවුඩය ලබා දෙන්න කැමැතියි.

විශේෂයෙන් කියන්න ඕනෑ තවත් කාරණාවක් තිබෙනවා. පසුගිය කාලයේ අපි මේ පාර්ලිමේන්තුවට ආපු අවස්ථාවල, විශේෂයෙන් අපි ඡන්ද කාලයේ දුන් සමහර පොරොන්දු ගැන පාර්ලිමේන්තුව ඇතුළේදී සමහර මන්ත්‍රීවරු අපෙන් ඇහුවා, ඒවා ඉෂ්ට වෙනවාද කියලා. රටේ ජනතාව නොවෙයි, මේ පාර්ලිමේන්තුවට ඇවිත් ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරු තමයි ඒවා අහන්න පටන් ගත්තේ. විපක්ෂයේ මන්ත්‍රීවරු අපෙන් අහන්න පටන් ගත්තා, "කෝ, හොරු ඇල්ලුවාද?" කියලා. හැබැයි දැන් අපට පෙනෙනවා, මේ දවස්වල මාධ්‍ය හරහා රටටම පෙනෙන්න පටන් අරගෙන තිබෙන්නේ, රටේ විවිධ අපරාධ වැරදිවල නිරතවෙලා හිටපු අය පෝලිමේ බන්ධනාගාරවලට යන්න පටන් අරගෙන තිබෙන බව. කලින් ඒවා ගැන අහපු කවුරුවත් දැන් "මීක්" සද්දයක් නැහැ. දැන් ඒ ඔක්කෝම අය ඇඳන් යටට ගිහිල්ලා ඉන්නේ. මේකත් එහෙම තමයි. දැන් තිබෙන කෙදිරිලි තව ටික දවසකින් නතර වෙනවා. මේ නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් ගත්ත ගමන් ඒගොල්ලන්ගේ සෙවණේ හැදුණු වැඩුණු වෛර ව්‍යාපාරිකයන්ට තිබෙන අවස්ථාව අපි අහිමි කරනවා. ඒගොල්ලන්ට තව දුරටත් ඒ තුළ සැඟවෙන්න අපි ඉඩක් දෙන්නේ නැහැයි කියන පණිවුඩය මම විශේෂයෙන් ලබා දෙන්න ඕනෑ. මට මතකයි, ගරු ජනාධිපතිතුමා විපක්ෂයේ වාඩිවෙලා ඉන්නකොට කිව්වා, "මට බලයක් තිබෙනවා නම් මේ ඉදිරි පෙළේ සිටින සියලුදෙනා මෙතැන ඉන්නේ නැහැ, ඉන්නේ හිර ගෙවල්වල" කියලා. අද ඒක යථාර්ථයක් බවට පත්වෙලා තිබෙනවා. එතුමා කරපු ඒ ප්‍රකාශය තමයි අද ඇත්ත වෙලා තිබෙන්නේ. විපක්ෂයේ අතළොස්සක් තමයි අද මෙතැන ඉන්නේ. විශේෂයෙන් ගත්තොත්, මේ රටේ අපරාධවලට වගකියන්න ඕනෑ ඒ වෛර පාලනයේ හවුල්කරුවෝ දැන් මෙතැන නියෝජනය වෙන්නේ නැහැ. ඒ ගැන මම කනගාටු වෙනවා. අපි කියන දේවල් අහගන්න, ඒගොල්ලන්ගේ ඉරණම මොකක්ද කියලා දැන ගන්න ඒගොල්ලෝ මෙතැන සිටියා නම් හොඳයි. නීතියේ සිදුරුවල සැඟවිලා තමන්ගේ වෛර ව්‍යාපාර පවත්වාගෙන ගිය අයට තව දුරටත් ඉඩක් දෙන්න අපි සූදානම් නැහැයි කියන කාරණය මම විශේෂයෙන් කියන්න ඕනෑ.

විපක්ෂ නායකතුමා මේ විවාදයට සම්බන්ධ වෙලා දීර්ඝ විස්තරයක් කළා. එතුමා කරපු ඒ දීර්ඝ විස්තරයේ කිසිදු තැනක අද විවාදයට අදාළ සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව කිසිවක් සඳහන් වෙලා තිබුණේ නැහැයි කියන කාරණයත් විශේෂයෙන් විපක්ෂයේ හැම කෙනෙකුගේම අවධානය පිණිස මම මේ වෙලාවේ සඳහන් කරන්නට කැමැතියි. අපි මේ විවාදය සඳහා වේලාව වෙන් කර ගන්නේ, විශේෂයෙන් රටට වැදගත් නීතියක් සම්පාදනය කර ගන්නයි. අපේ කාර්යභාරය වෙලා තිබෙන්නේ ඒක. ව්‍යවස්ථාදායක කටයුතු වෙනුවෙන් තමයි අපි මේ පාර්ලිමේන්තුවට එන්නේ. හැබැයි, මේ විපක්ෂය ඒ කාර්යභාරය මඟහැරලා යන ආකාරයක් අපට පෙනෙනවා. හැබැයි, ඇතැම් මන්ත්‍රීවරු ඉතාම සාධනීය ආකාරයෙන් කථාව තුළින් විවාදයට ප්‍රවේශ වෙන බව අපට පෙනෙනවා. විශේෂයෙන් ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා විවාදය තුළ බොහොම සාධනීය ආකාරයෙන් එතුමාගේ අදහස් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් අපේ ඇගැයීමක් තිබෙන බවත් මම මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි. විවේචන අවශ්‍ය තැනට විවේචනයත්, ඇගැයීම අවශ්‍ය තැනට ඇගැයීමත් ලබා දෙන්න අපි නිහතමානී වන බවත් විශේෂයෙන් මම මේ වෙලාවේ සඳහන් කරන්නට කැමැතියි.

විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ තවත් කරුණු කිහිපයක් තිබෙනවා. අපි මේ හැම ක්‍රියාවලියක් ඔස්සේම උත්සාහ කරන්නේ නීතියේ පාලනයට යටත් රටක් හදන්නයි. ඒ නිසා මේ රටේ ඉදිරි

ගමන ගැන බලාපොරොත්තුවක් තිබෙන, අපිත් එක්ක අත්වැල් බැඳගන්න පුළුවන් කියලා හිතන විපක්ෂයේ සිටින පිරිසට මම විශේෂයෙන් ආරාධනා කරනවා, නීතියේ පාලනය සහිත රටක් නිර්මාණය කරන්න අපිත් එක්ක අත්වැල් බැඳගන්න කියලා. ඒ ආරාධනාව කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම විවාදයට සූදානම් වීමට මම සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙබ් අඩවිය පරීක්ෂා කරලා බැලුවා. එය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පසුව මම සොයා බැලූ විට, සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙබ් අඩවිය දින 10ක් තිස්සේ නිසි ලෙස ක්‍රියාත්මක නොවන බවත්, ඒ නිසා මේ රටේ නීතිඥ වෘත්තිකයන් ඇතුළු දහස් ගණනකට රාජකාරි කර ගැනීමට නොහැකි තත්ත්වයක් මතු වී ඇති බවත් පෙනුණා. අපට තොරකතුරු ලබා ගැනීමට තිබෙන ප්‍රශ්නය එකක්. ඒ වාගේම සමාගම් ලියාපදිංචි කිරීම සම්බන්ධ කටයුතු දවස් 10ක් තිස්සේ මේ වෙබ් අඩවිය තුළ අඩාළ වෙලා තිබෙනවා. මොකද, වෙබ් අඩවිය හරහා තමයි ඒ කටයුතු සිද්ධ වෙන්නේ. ඒක ඉතාම බරපතළ තත්ත්වයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක පැත්තකින්, ඒක අපේ වරප්‍රසාද ප්‍රශ්නයක්. අපට තොරතුරු ලබා ගන්න බැහැ. අනෙක් අතට, නීතිඥ ප්‍රජාව තුළ ලොකු ගැටලුවක් මතු වෙලාත් තිබෙනවා. ඒ කාරණය ගැන ඔබතුමාගේත්, ගරු සභාවේත් අවධානය මා යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chanaka Madugoda, please. You have eight minutes.

[අ.භා. 12.22]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතියි.

අද සමාගම් පනතට සංශෝධන එකතු කරන මේ වෙලාවේ, පක්ෂයක් විධියට අපි ඒ සංශෝධනවලට අපේ පක්ෂයේ එකඟතාව පළ කරමින් අදහස් දක්වන්න කැමැතියි. මීට පෙර කථා කරපු කථික මහත්මයා, හීන් කෙඳිරිලි ගැන කථා කළා, වෛර වළල්ලක් ගැන කථා කළා, හොරකම සහ දූෂණය ගැන කථා කළා. ඇත්තටම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද එතුමන්ලා ආණ්ඩුවේ ඉන්න බව අමතක කරලා විපක්ෂයේ භූමිකාවත් නිරූපණය කරනවා. අදටත් වෛර වළල්ල සහ හොරකම, වංචාව හා දූෂණය කියන දේවල් විකුණමින් තමයි පාර්ලිමේන්තුව තුළ එතුමන්ලා කටයුතු කරන්න උත්සාහ ගන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවා කථා කරන්න ඕනෑ කියලා මා විශ්වාස කරනවා. හැබැයි, මේ ගරු සභාව ගත්තාම, හැම කථික මහත්මයෙක්ම තමන්ගේ කථාව ආරම්භයේ ඉඳන් අවසානය දක්වා කථා කරන්නේ හොරකම, වංචාව හා දූෂණය ගැන. අපි ඒවා අල්ලනවා, අපි ඒවා කළ අයට දඬුවම් දෙනවා කියන එකයි කියන්නේ. එහෙම වෙනවා නම් විපක්ෂයක් විධියට අපි කැමැතියි. විපක්ෂයේ ඉන්න මේ හැම මන්ත්‍රීවරයෙක්ම හොරකමට, දූෂණයට විරුද්ධයි. ඒවා අල්ලලා නීතියට ඉදිරිපත් කරනවාට කැමැතියි. හැබැයි, ඒවා මාධ්‍ය සංදර්ශන විධියට පමණක් පාර්ලිමේන්තුව තුළ හැම දාම කථා කිරීම එලක් නැහැ. ඒවාට උත්තරයි ජනතාව බලාපොරොත්තු වෙන්නේ කියන කාරණයත් මම සිහිපත් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පතට අපේ එකඟතාව යළිත් පළ කරමින්, මේ මොහොතේ සමාජය හමුවේ තිබෙන ගැටලු කිහිපයක් ගරු සභාව හමුවේ තබන්න මම කැමැතියි.

බස්නාහිර පළාත තුළ ත්‍රිරෝද රථ රැකියාවේ යෙදෙන ත්‍රිරෝද රථ රියැදුරු මහත්වරු අද විශාල ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. පසුගිය දවස්වල පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවෙන් අනුකමිටුවක් පත් කරලා, ත්‍රිරෝද රථ සංගම් එකතු කරගෙන ඔවුන් වෙනුවෙන් ඒ හදන වැඩ පිළිවෙළ පිළිබඳව සාකච්ඡාවක් තිබුණා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියන්න කනගාටුයි. ඒ සාකච්ඡාවට බස්නාහිර පළාත තුළ වැඩිම ප්‍රාදේශීය සංගම් ගණනාවක නියෝජනය තිබෙන ජාතික ඒකාබද්ධ ත්‍රිරෝද රථ සංගමයේ රියැදුරු මහත්වරුන්ගේ සංගමයට අවස්ථාවක් දීලා නැහැ. ත්‍රිරෝද රථ රියැදුරු මහත්වරු කියන්නේ මේ රටට බරක් නැතුව වෘත්තීය කරන ඉතා ගෞරවනීය කොටසක්. හැබැයි, අද ඒ කොටස බෙදලා, බස්නාහිර පළාතේ තමන්ට හිතවත් ත්‍රිරෝද රථ සංගම් පමණක් ගෙනැල්ලා ඔවුන්ගේ ප්‍රශ්න, ගැටලු විසඳන්න හදනවා නම් එය සාර්ථක නොවන බවයි මගේ අදහස. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ අද රට තුළම තිබෙන ත්‍රිරෝද රථ ලියාපදිංචි කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න උත්සාහ ගන්නවා. හැබැයි, ඒ තුළින් බස්නාහිර පළාත තුළ සිටින ත්‍රිරෝද රථ රියැදුරන්ට, ඔවුන්ගේ වෘත්තියට අගතියක් වනවා. ප්‍රවාහන විෂය භාර ඇමතිතුමා මේ මොහොතේ ගරු සභාව තුළ නොසිටියත්, ඒ ගැටලුව පිළිබඳව අවධානය යොමු කරලා, ඒ ත්‍රිරෝද රථ සංගම්වලට තිබෙන ගැටලුව විසඳන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර දවසක මම පාර්ලිමේන්තුවේ කථා කළාට පස්සේ ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ගරු සභාවට නොහොබිනා ආකාරයෙන් කථා කරමින් අපට චෝදනා එල්ල කළා. මේ මොහොතේ එතුමා ගරු සභාවේ පෙනෙන්න නොසිටියත් මා මේ කාරණය කිව යුතුයි. අද යෞවන සමාජ ක්ෂේත්‍රය පිළිබඳව සමාජයේ විශාල කතිකාවක් ගොඩනැඟිලා තිබෙනවා. යෞවන සමාජ ක්ෂේත්‍රය අද තමන්ගේ දේශපාලන භූමිකාව බවට පරිවර්තනය කරන්න හදන එක ගැන මට කියන්න කනගාටුයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම දරුවන් පිළිබඳ මේ සභාවේ කථා කරන්න කැමැති නැහැ. ඕනෑම දරුවෙක් තමන්ගේ ඉලක්ක කරා යා යුතුයි. තාත්තා දේශපාලනඥයෙක් වුණාට, දරුවන්ට ඔවුන්ගේ ඉලක්ක කරා යන්න තිබෙන ඉඩකඩ අපි අහුරන්නේ නැහැ. නමුත්, ඇල්පිටිය යෞවන සමාජ සම්මේලනය පිහිටුවනකොට, එම යෞවන සමාජ සම්මේලනයේ නිලතලවලට ඉදිරිපත් නොවුණු තරුණයෙක් එම බල මණ්ඩලයේ සභාපතිවරයා බවට පත් වෙලා තිබෙනවා. ඒ, ඔහුගේ තාත්තාගේ

[ගරු චානක මාදුගොඩ මහතා]

දේශපාලන බලය හින්දා වෙන්න පුළුවන්. අද ඒ ප්‍රාදේශීය බල මණ්ඩලයේ සභාපතිවරයා බවට ඒ තරුණයා අනීතිකව පත් වෙලා තිබෙනවා. යෞවන සමාජ ව්‍යාපාරය අද මේ තැනට පත් වෙලා තිබෙන්නේ. යෞවන සමාජ ව්‍යාපාරයේ එදා තිබුණා කොන්දේසියක්. ඒ කොන්දේසිය අනුව, යෞවන සමාජයට එකතු වුණු තරුණයෙකුට වසරක කාලයකට පසුව තමයි ප්‍රාදේශීය බල මණ්ඩලයේ තනතුරක් ගන්න පුළුවන්කම ලැබුණේ. නමුත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ඉඩකඩ අහුරලා, අද අලුතින් යෞවන සමාජයට එකතු වෙච්ච තරුණයාට පළමු දවසේම ප්‍රාදේශීය බල මණ්ඩලයේ නිලයක් ගන්න තැනට මේ ආණ්ඩුව ඒ නීති වෙනස් කර තිබෙනවා. ඒ තුළින් ඔබතුමන්ලා උත්සාහ ගනිමින් තිබෙන්නේ මේ යෞවන සමාජ ව්‍යාපාරය තුළ කාලයක් තිස්සේ වැඩකටයුතු කරපු, ඒ වෙනුවෙන් විශාල මෙහෙවරක් කරපු, ඒ යෞවන සමාජ ව්‍යාපාරය පිළිබඳ දැනුමක් තිබෙන තරුණයන් පැත්තකට දමලා, අද ඔබතුමන්ලාගේ තරුණ ව්‍යාපාරයක් බවට මේක ගොඩනගන්නයි. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඉල්ලීමක් කරනවා. මම මීට පෙරදීත් කිව්වා වාගේ තරුණයන් සමඟ කරන ගනුදෙනුව පරිස්සමින් කරන්න ඕනෑ. ඔවුන් සමඟ දේශපාලන මුහුණුවරින් ගනුදෙනු කරන්න බැහැ. ඒක මේ ආණ්ඩුව අවබෝධ කරගන්න ඕනෑ කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාදැල් ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන් මේ මොහොතේ විශාල ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. මාදැල් ධීවරයන් කියන්නේ පාරම්පරික වෘත්තියක නියැළෙන ජනතාවක්. පසුගිය ආණ්ඩුවලින් winches යොදාගෙන මාදැල් ඇදීමේ කටයුතු කරන්න ඔවුන්ට තාවකාලික බලපත්‍ර ලබා දීලා තිබුණා. මේ අවස්ථාවේදී ධීවර ඇමතිතුමා මේ සභාවේ නොසිටියත් අපි ඉල්ලීමක් කරනවා. මාදැල් ධීවර කර්මාන්තය නවීකරණය විය යුතුයි. ඒක පාරම්පරික ධීවර කර්මාන්තයක් වුණත්, අද ඒ කර්මාන්තය ඉදිරියට ගෙනයන්න නම් මාදැල් ඇදීමේ කටයුතු සඳහා යම් කොන්දේසි පනවා හෝ මේ winches යොදා ගැනීම සඳහා ස්ථිර අවසරයක් ඔවුන්ට ලබා දීමට ආණ්ඩුව විසින් මැදිහත්වීමක් කරනවා නම් වටිනවාය කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම, මේ කාරණය විපක්ෂයේ ඉන්න අපි හැමදෙනාටම බලපාන කාරණයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෑම වර්ෂයකම විමධ්‍යගත ප්‍රතිපාදන මේ පාර්ලිමේන්තුවේ හැම මන්ත්‍රීවරයෙකුටම හිමි වුණා. නමුත්, මේ අවස්ථාව වෙනකොට ඒක කප්පාදු කරලා, අපට වැඩ කරන්න තිබෙන අවස්ථාව, අපට ගමේ ජනතාවට, ප්‍රදේශයේ ජනතාවට යමක් කරන්න තිබෙන අවස්ථාව අද නැති කරලා තිබෙනවා. අපි එදා ක්‍රීඩා සමාජවලට ක්‍රීඩා බඩු දුන්නා. අපි එදා යෞවන සමාජවලට උදවු කළා; පන්සලට උදවු කළා; දහම් පාසලට උදවු කළා; ගොවි සමිතියට උදවු කළා; ස්වේච්ඡා සමිතිවලට උදවු කළා; පාරවල් හැදුවා; ලයිට් දුන්නා. ඒ සඳහා අපි විමධ්‍යගත ප්‍රතිපාදන භාවිත කළා. නමුත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුවෙන් අද අපට ඒ විමධ්‍යගත ප්‍රතිපාදන ලබා නොදෙන තැනට පත් වෙලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, විමධ්‍යගත ප්‍රතිපාදන කියන්නේ මන්ත්‍රීවරයෙකුගේ අයිතියක් කියලා. ඒක මන්ත්‍රීවරයෙකුට ලබා දෙන්න ඕනෑ. විමධ්‍යගත ප්‍රතිපාදන ලබා නොදීම තුළින් අපේ ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් කරන්නට තිබෙන වැඩකටයුතු, ඔවුන්ට දෙන්න පුළුවන් සහාය, ශක්තිය ලබා දෙන්න අද අපට බැරිවෙලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒ විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දීමේ කටයුත්තට යම් මැදිහත්වීමක් වෙන්න කියන ගෞරවනීය ඉල්ලීම මම ඔබතුමාට ඉදිරිපත් කරනවා.

ඒ වාගේම, විශේෂයෙන්ම මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ අපි හැමෝටම වැදගත් කාරණයක් වන පාර්ලිමේන්තුවේ රථගාල පිළිබඳව. ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ස්ථානයට යන්න කියලා. දවසකට ළමුන් 1,000කට අධික පිරිසක් අපේ පාර්ලිමේන්තුව නරඹන්න එනවා. අද ඒ රථගාලේ තිබෙන පහසුකම්, වැසිකිළිවල තත්ත්වය ගත්තාම, අද ඒ වැසිකිළියකට යන්න බැහැ. කුඩා දරුවන්ට අද ඒ පහසුකම ලැබී නැහැ. මේ ගැලරියට එන අපේ ආදරණීය දරුවන්ට, මේ ගැලරිය පාවිච්චි කරන ජනතාවට, පාර්ලිමේන්තුවේ රථගාල තුළ තිබෙන පහසුකම් වැඩිදියුණු කර දෙන්න කියලාත්, ඒ සඳහා ඔබතුමාගේ මැදිහත් වීම ලබාදෙන්න කියලාත් පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරයකු විධියට මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා.

අද විශේෂයෙන් මේ සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන වෙලාවේ, ඒ සමාගම්වල අභිවෘද්ධිය වෙනුවෙන් එකතු කරන මේ සංශෝධනවලට අපි කැමැති වෙනවා වාගේම, ඒ කටයුතු කිරීමේදී බාධාවක් නැතිව ඒ සමාගම්වලට ඉදිරියට යන්න පුළුවන් ක්‍රමයකුත් සකස් කරනවා නම් වටිනවාය කියන කාරණයත් සිහිපත් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දින දෙවැනිවර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත ඉතාම කාලීන සහ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් ලෙස සඳහන් කළ යුතුයි. නමුත්, විපක්ෂය

නියෝජනය කරන එක්කෙනෙක්, දෙදෙනෙක් හැරෙන්නට අවාසනාවන්ත විධියට මේ මොහොතේ මේ සභාව තුළ විපක්ෂයේ අනෙක් මන්ත්‍රීවරුන් නොමැතිවීම ගැන මම කනගාටු වෙනවා. එක අතකින් බැලුවාම ඒකට යම් කිසි සාධාරණ හේතුවකුත් තිබෙනවා. මොකද, පසුගිය කාලයේ සිද්ධ වුණු බොහෝ දේවල් සම්බන්ධව අපි අද වනවිට කථා කරනවා. එතකොට එතුමන්ලාගේ හිත් රිදෙන්නත් පුළුවන්.

මගේ කථාව පටන් ගන්න ප්‍රථමයෙන් මා සඳහන් කරන්න කැමැතියි, අද ඉතාම වැදගත් දිනයක් බව. 1983දී එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පැවැති කාලයේ බලපොරය වෙනුවෙන් යම් කිසි ආකාරයක ජාතිවාදී කැරැල්ලක් ඇති වුණා. එය ඉතා අවාසනාවන්ත සිදුවීමක්. එවකට තිබුණු ජාතික ගැටලුවට - ප්‍රශ්නයට - යම් විසඳුමක් ලබා දෙන්න 1983ට කලින් යම් අවස්ථාවක්; ඉඩකඩක් තිබුණා වුණත්, ඒ අවස්ථාව; ඒ ඉඩකඩ සමස්තයක් විධියට බිඳ වැටුණු, උල්ලංඝනය වුණු, අහිමි වුණු සිදුවීමක් විධියට තමයි අපි දකින්නේ. නමුත් අපිට ආණ්ඩුවක් විධියට ජාතික සමගිය ඇති කිරීමේ වගකීම සහ අර වාගේ සිදුවීම් මින් මතුවට සිදු නොවීමට වගබලා ගැනීමේ වගකීම තිබෙනවා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට අනිවාර්යයෙන්ම අපි ඒ සඳහා බැඳී ඉන්නවා.

මම අද පාර්ලිමේන්තුවට එන්න කලින් විපක්ෂ නායකතුමාගේ කථාව ඇහුවා. විශේෂයෙන්ම අද සිදු කරන මෙම සංශෝධනයටත් ගළපා එතුමා යම් කාරණයක් ඒ අවස්ථාවේදී සඳහන් කළා. ඒ නිසා ඒකටත් උත්තරයක් ලබා දිය යුතුයි කියා මා හිතනවා. විශේෂයෙන්ම ත්‍රිකුණාමලයේ මුත්තුනගර් ප්‍රදේශයේ පවතින ඉඩම් ප්‍රශ්නයක් ගැන සඳහන් කරමින්, ඊට අදාළ සමාගමක් සම්බන්ධව සඳහන් කරමින් එතුමා එම ප්‍රශ්නය මෙතැනට ගළපා තිබුණා. නමුත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති විධියට මා එයට උත්තරයක් ලබා දිය යුතු වෙනවා. ඒ වාගේම අපි සාමූහිකව මේ සම්බන්ධයෙන් උත්තර හොයන්න ඕනෑ කියන අවංක බලාපොරොත්තුවත්, චේතනාවත් මට තිබෙනවා.

මුත්තුනගර් කියන්නේ කප්පල්තුරෙයි ප්‍රදේශය ආශ්‍රිතව පවතින ප්‍රදේශයක්. ඒ වාගේම මුත්තුනගර් විතරක් නොවෙයි, මේ ප්‍රශ්නයට මුහුණ දෙන ග්‍රාම නිලධාරි වසම් 13ක් තිබෙනවා. මක්කුව මහාමායාපුර සිට සිංහපුර, කප්පල්තුරෙයි, කාවට්ටිකුඩා, චීනවරාය, මුත්තුනගර්, සුමේධංකරපුර, ලිංගනගර් වාගේ ග්‍රාම නිලධාරි වසම් 13ක් මේ ප්‍රශ්නයට මුහුණ පා තිබෙනවා. එම වසම් 13හිම ඉඩම් 1984 වර්ෂයේ දී විපක්ෂ නායකතුමාගේ තාත්තා අගමැති වෙලා සිටියදී තමයි වරාය අධිකාරියට පවරා ගෙන තිබෙන්නේ. ජනතාව ඒ තැන්වල පදිංචි වෙලා සිටියදී තමයි ඒ කාලයේ වරාය අධිකාරියට එම ප්‍රදේශ පවරා ගෙන තිබෙන්නේ. මේ ප්‍රශ්න උග්‍ර වුණේ යහපාලන ආණ්ඩුව පැවැති කාලයේ. එවකට වරාය ඇමතිවරයා විධියට හිටපු අර්ජුන රණතුංග මැතිතුමාගේ කාලයේ තමයි ඔය ප්‍රශ්න උග්‍ර වෙන්න පටන් ගත්තේ.

ඇත්තටම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රශ්න සම්බන්ධයෙන් කථා කරද්දී මමත් වැඩිපුරම කථා කර තිබෙන්නේ වරාය අධිකාරියට පවරා ගත් මේ ඉඩම් සම්බන්ධවයි. ඒ කාලයේ සිටම අපි මේ කාරණය සම්බන්ධයෙන් වැඩ පටන් ගත් නිසා මට මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. අපි සෑහෙන ඉල්ලීම් කළා. අපි විසඳුම් හෙව්වා. නමුත් වත්මන් විපක්ෂ නායකතුමා කැබිනට් අමාත්‍යවරයකු වශයෙන් සිටි එවකට පැවැති ඒ ආණ්ඩුව කිසිසේත්ම මෙම කාරණයට සවන් දුන්නේ නැහැ.

අද දින සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ මෙම විවාදය ඒ කාරණය දිහාවට ගෙනගිය නිසා, මේ කාරණයත් මා සඳහන් කරන්න කැමැතියි. අර්ජුන රණතුංග මැතිතුමාත් පසුගිය කාලයේ එම සෝලා සමාගම් එක්ක එක එක රැස්වීම්වලට ගිහිල්ලා ඒවාට මැදිහත් වෙලා තිබුණා. ඒ අනුව මේ ඉඩම් ටික එම සෝලා සමාගම්වලට දෙන එක පිටුපස ඒ කාලයේ අර්ජුන රණතුංග මැතිතුමාත් හිටියාද කියන කාරණය ගැනත් අපට දැන් සොයන්න වෙනවා. මම හිතන විධියට අද මේ කරන කටයුත්ත ඒ සඳහා හොඳ ආරම්භයක් ලබා දෙනවා. විශේෂයෙන්ම මේ සංශෝධන හරහා අපට බොහෝ දේවල් වෙනස් කරගන්න පුළුවන්. 2007දී සම්මත කළ පනතට වඩා මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත වෙනස්. විශේෂයෙන් ගත්තොත්, ඒ පනතට ඇතුළු නොවුණු බොහෝ කාරණා මෙතැන ඇතුළු වෙනවා. විශේෂයෙන් විනිවිදභාවය තවත් තහවුරු කරපු ආකාරයක් තමයි මේ සංශෝධන දිහා බැලුවාම අපි දකින්නේ. විශේෂයෙන් "shell companies" කියලා කියනවා. මේ shell companies කියන්නේ ව්‍යාජ සමාගම්. අපි දැක්කා, පසුගිය කාලවකවානු තුළ විවිධ ටෙන්ඩර්වලට විවිධ ව්‍යාජ කොම්පැනි, ව්‍යාජ ආයතන ඇතුළු වෙලා හිටපු බව. අපි දන්නවා, පසුගිය කාලයේ අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල කඩා වැටීමක් තිබුණා කියන එක. ඉතාම අමාරුවෙන් දැන් අපි මේවා ගොඩ නඟන්නේ. හිටපු සෞඛ්‍ය ඇමතිවරයා ප්‍රමුඛ එම කණ්ඩායම් කරපු දේවල් ගැන මා විශේෂයෙන් මේ සභාවට කියන්නට ඕනෑ කියලා මම හිතන්නේ නැහැ. ඒ කාලයේ එහෙම විවිධ දේවල් සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන් ඔය human immunoglobulin කියන බෙහෙත ගෙන්වන එක පිටුපසත් ව්‍යාජ සමාගම් තමයි ඉඳලා තිබෙන්නේ. ඇත්තටම අර ටෙන්ඩරය ගත්තෙත් ව්‍යාජ සමාගමක්. ඉන්දියාවේ යම්කිසි සමාගමක නමින් තමයි එය අරගෙන තිබෙන්නේ. ඉතින් ඒ දේවල් පසුගිය කාලයේම හෙළිදරවු වෙලා තිබුණා නම්, මීට වඩා දේවල් කරන්න තිබුණා කියලා මම හිතනවා. ඒ වාගේම ලංකා ඉතිහාසය දිහා බැලුවොත්, බොහෝ අවස්ථාවලදී බොහෝ දේවල් සම්බන්ධයෙන් මේ වාගේ විනිවිදභාවයක් නැති නිසා අපේ ජනතාව විවිධ ප්‍රශ්න, ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා.

පසුගිය කාලයේ අපි හැමෝම දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දීලා හිටියා. ජනතාව තෙල් පෝලිම්වල හිටියා. දැවැන්ත සමාජ අර්බුදයක් මේ සමාජයේ ඇති වුණා. සමාජ බිඳ වැටීමක් සිද්ධ වුණා. ඒ සියලු දේටම වග කියන්න ඕනෑ මේ දේශපාලන සංස්කෘතිය. හැබැයි, දැන් මේ දේශපාලන සංස්කෘතියේ යම්කිසි පරිවර්තනයක් සිද්ධ වෙනකොට ඒකට ගල් ගහන එක ගැන කිව්වොත්, ඇත්තටම තමන්ටත් මේකෙන් හානියක් සිද්ධ වෙයි ද කියලා යම්කිසි බයක් ඇති වෙන එක නම් ඉතාම සාධාරණ දෙයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි ඒකට බය වෙන්නට ඕනෑ නැහැ. අපි මේ වාගේ සංශෝධන ඉතාම වේගයෙන් ගෙනෙන්න ඕනෑ. FATF කියන ඒ සම්මුතිය ගත්තොත්, ඇත්තටම මීට කලින්ම අපට මේ දේවල්, මේ සංශෝධන ගෙනෙන්න තිබුණා කියන මතය තිබුණා. විශේෂයෙන් පසුගිය 2023 IMF වැඩ පිළිවෙළට අපි එකතුවීමත් එක්ක තමයි මේ කටයුතු කඩිනම් වෙන්න ගත්තේ. අපිත් පසුගිය කාලවකවානු තුළ IMF එක සම්බන්ධව විවිධ විවේචන ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් මේ වාගේ ප්‍රගතිශීලී දේවල් ඒ හරහා වුණත් අපට කර ගන්න අවස්ථාව ලැබිච්ච එක ගැන නම් මම සතුටු වෙනවා. පසුගිය කාලවකවානු තුළ ඒ ආණ්ඩු 16 වතාවක් IMF සහනාධාර වැඩ පිළිවෙළට ඇතුළු වෙලා තිබුණා කියා යම්කිසි චෝදනාවක් තිබුණා. ඒ කිසිම ආණ්ඩුවකට එම IMF වැඩ පිළිවෙළ සම්පූර්ණ කරන්න බැරි වුණා. හේතුව තමයි මෙවන් ප්‍රගතිශීලී පනත් ඒ ආණ්ඩුවලට සම්මත කරන්න බැරි වීම. ඒ නිසා තමයි සමස්තයක් විධියට ඒගොල්ලන්ට ඒක සම්පූර්ණ කරන්න බැරි වෙලා තිබුණේ. නමුත් අපට එහෙම බයක් නැහැ. අපට එහෙම කිසිම ප්‍රශ්නයක් නැහැ. විශේෂයෙන් මේ රටේ දූෂණ, වංචා, නාස්තිය, අක්‍රමිකතා, වැරදි දේශපාලන සංස්කෘතිය ඇතුළු මේ දේවල් වෙනස් කරන්නට තමයි අපි මේ ආණ්ඩුව භාර

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

ගත්තේ. විශේෂයෙන් කෙහෙළිය රඹුක්වැල්ල හිටපු අමාත්‍යවරයාගේ සිදුවීම වෙන්න පුළුවන්, ඒ වාගේම සජින් වාස් ගුණවර්ධනගේ ගුවන් යානා ගනුදෙනු වෙන්න පුළුවන්. ඒ සම්බන්ධවත් පරීක්ෂණ පවත්වනවා. ඔය shell companies කියන උපක්‍රමය පාවිච්චි කරලා තමයි ටෙන්ඩර් පටිපාටි අවභාවිත කර තිබෙන්නේ. ඉතින් ඒකත් යම්කිසි ආකාරයට වෙනස් වෙන්න පටන් ගෙන තිබෙනවා. විශේෂයෙන් මේ පනත් සංශෝධන හරහා අපට එවන් දේවල් වළක්වන්න පුළුවන්. විනිවිදභාවයක් ඇති කරන්නත් පුළුවන්.

පසුගිය කාලයේ තවත් සමාගම් පුණ්‍ය ආයතන පිටිපස්සේ හැංගිලා තමන්ගේ ඒ කළු ජාවාරම්, ඒගොල්ලන්ගේ කළු සල්ලි විශුද්ධි - launder - කරන්න යම්කිසි ආකාරයකට ඒවා පාවිච්චි කරනවා අපි දැක්කා. නමුත් දැන් මේකෙන් ඒකත් වෙනස් වෙනවා. විශේෂයෙන් පසුගිය කාලයේ අපි දැක්කා,"සිරිලිය" ගිණුම වෙන්න පුළුවන්, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
හොඳයි.

"සිරිලිය" ගිණුම ගැන කියනකොට අපට මතක් වෙනවා, "222222222 V" කියන ජාතික හැඳුනුම්පත් අංකය තමයි ඒකට පාවිච්චි කළේ කියලා. නමුත් මේ සංශෝධන කෙටුම්පත හරහා මේ පනත සංශෝධනය වුණාට පස්සේ, එවන් අක්‍රමිකතාවන්ට ඉඩ ලැබෙන්නේ නැහැ. ඒ වාගේම අපි දැක්කා, "පුෂ්පා රාජපක්ෂ පදනම" කියලා තව පදනමක් තිබුණා. මුදල් අවභාවිතාව සම්බන්ධව යම්කිසි චෝදනාවන්ට ලක් වෙච්ච සමාගම් පවා ඒ පුෂ්පා රාජපක්ෂ පදනමට සල්ලි පරිත්‍යාග කරලා තිබුණා. ඉතින් ඒ වාගේ අවස්ථා බොහෝ තිබුණා; ඒ වාගේ බොහෝ ඉඩකඩ තිබුණා. ඒ වාගේම කාල්ටන් ගැන ගත්තත්, කාල්ටනුත් මෙතැන විශේෂ එකක්. එක්තරා කාලයක අපි දැක්කා, මේ කාල්ටන් සමාගමට නැති බිස්නස් එකක් නැහැ. පෙර පාසල් වෙන්න පුළුවන්, ක්‍රීඩා චැනල් වෙන්න පුළුවන්, ඒ වාගේ විවිධ දේවල් තිබුණා. ඒ වාගේ දේවල් පවා ඇත්තටම මෙතැනින් අපට දැන් සම්පූර්ණයෙන්ම නැති කරන්න පුළුවන්. ඒ වාගේම මේක ජාත්‍යන්තර වශයෙන් වැදගත් වෙන්නේ කොහොමද කියන එකත් කියලා මම කථාව අවසන් කරන්නම්.

විශේෂයෙන් ගත්තොත්, මෙහිදී HSBC බැංකුවට විරුද්ධවත් යම් කිසි නඩු තීන්දුවක් දීලා තිබුණා. විෂ මත් ද්‍රව්‍ය ජාවාරමට අදාළ සංවිධානාත්මක අපරාධකරුවන් - drug cartels - සම්බන්ධ වෙච්ච යම් කිසි ගිණුම් ඔවුන්ගේ බැංකුවත් එක්ක, බැංකු පද්ධතියත් එක්ක සම්බන්ධ වෙලා තිබුණා කියලා එක්සත් ජනපදය විසින් ඔවුන්ට විරුද්ධව ඩොලර් බිලියන 1.9ක විතර දඩයක් ගහලා තිබුණා. මේ වාගේ දේවල් පවා සිදු වෙනවා. විශේෂයෙන් අපේ රටේ සංවිධානාත්මක අපරාධකරුවන්ගේ සල්ලි විවිධ තැන්වල තිබෙනවා. ඒ සල්ලි විවිධ සමාගම් විධියට තිබෙනවා, විවිධ හෝටල් විධියට තිබෙනවා. මේ සියලු දේවල් අපට මේ පනත් සංශෝධනය හරහා observe කරන්න පුළුවන්, control කරන්න පුළුවන්. ඒ වාගේම අපේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයාටත් මේ සම්බන්ධව බලය පැවරෙනවා. ඒ වාගේම ගත්තොත්, දූෂණ, වංචාවලට එරෙහිව විමර්ශන කරන CIABOC එකටත් මේ තුළින් යම් කිසි ආකාරයකට බලය ලැබෙනවා. ඒ වාගේම FIU එක ඇතුළු දූෂණ, වංචා සම්බන්ධව පරීක්ෂා කරන, විමර්ශන කරන ආයතනවලටත් මේ තුළින් බලය ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අපි විශ්වාස කරනවා, මේක විප්ලවීය පරිණාමයක් කියලා. ඒ නිසා අපි සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, මේ පනත් සංශෝධනයට සහයෝගය දක්වන්න කියලා. ඇත්තටම මේ රටේ දැවැන්ත වෙනසක් ඇති කරන්න ඕනෑ නම් මේ විනිවිදභාවය ඇති කළ යුතුයි. ඒ සඳහා සියලුදෙනාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා පතමින්, ඒ සඳහා සියලුදෙනා එකතු වෙමු කියන පණිවුඩය ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රුවන් රණසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.11]

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සමාගම් පනතට සංශෝධන ගෙනෙන මේ අවස්ථාවේ ඒ පනත් කෙටුම්පත සම්බන්ධව අදහස් දැක්වීමට ලැබීම පිළිබඳව මම සතුටු වනවා. විශේෂයෙන්ම මේ පිළිබඳව මගේ අදහස් දැක්වීම ආරම්භ කරන්න කලින් මම යම් කරුණක් ගැනත් කියන්න කැමැතියි. විපක්ෂ නායකවරයා එතුමාගේ අවස්ථාව ලබාගෙන උත්සාහ කළා, පුනර්ජනනීය බලශක්තිය පිළිබඳව ආණ්ඩුව අනුගමනය කරන ක්‍රියා කලාපය තුළින් විශේෂයෙන්ම ඒ සඳහා දායක වන ව්‍යාපාරිකයින්ට ලබා දෙන tariff එක සියයට 37 ඉඳලා සියයට 20 දක්වා අඩු කර ඇති බව කියන්න. විපක්ෂ නායකතුමාට අමතක වෙලා තිබෙනවා, tariff එක සියයට 37ට තියෙද්දි ගත්ත unit එකට ආපහු මේ රටේ ජනතාව ගෙවන්න ඕනෑය කියලා, ඒ වාගේම ව්‍යාපාරික ප්‍රජාවටත් ඒ unit එකකට ඒ මිල ගෙවන්න වෙනවා කියලා. ඒ අනුව තමයි රජය තීරණයක් අරගෙන තිබුණේ මේ සියයට 37 tariff එකත්, පුනර්ජනනීය බලශක්තියට - විශේෂයෙන්ම solarවලට- කරන ආයෝජනය ආදී මේ සියලු කාරණා පිළිබඳවත්, සියලු පාර්ශ්ව පිළිබඳවත් සලකා බලා ඒ tariff එක සියයට 37 ඉඳලා 20ට ගෙනෙන්න. එහෙම නැතිව ඒ ව්‍යාපාරික ප්‍රජාව අමාරුවේ දමන කාරණයක් නොවෙයි මෙය.

විපක්ෂ නායකවරයා පෙනී සිටින්නේ ඒ ව්‍යාපාරික කණ්ඩායම වෙනුවෙන් පමණක් නම් ඒ කාරණය සාධාරණ ඇති. නමුත්, අපේ විදුලි පාරිභෝගිකයන්, අනෙකුත් ව්‍යාපාරික ප්‍රජාව, ඒ වාගේම මේ පුනර්ජනනීය විදුලි බලය උත්පාදනයට දායක වන ව්‍යාපාරික ප්‍රජාව කියන මේ සියලු කණ්ඩායම් නියෝජනය කරලා තමයි අපි රජයක් විධියට එවැනි තීන්දුවක් අරගෙන තිබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පාසල් දරුවනුත් විශාල පිරිසක් මේ වෙලාවේ සභා ගර්භයේ ඉන්නවා. විශේෂයෙන්ම මම මේ විවාදයට කරුණු එකතු කරන වෙලාවේ AI tool එකක type කළා, "Why Sri Lanka is a less-developed country?" කියලා. ඒ කියන්නේ, " ශ්‍රී ලංකාව තවමත් ඌන සංවර්ධිත රටක් වෙන්නේ ඇයි?" කියලා. ඒකට එන කෙටිම උත්තරය තමයි, දේශපාලන අස්ථාවර බව - political instability - සහ දූෂණය - corruption - කියන කාරණා දෙක. මම හිතනවා, මේ සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් රජයක් විධියට ඒ ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් ඉතාම හොඳ ප්‍රවේශයක් අපි අරගෙන තිබෙනවා කියලා. ඒ මොකද, ඊට අවශ්‍ය දේශපාලන ස්ථාවරත්වය අපි දැන් ගොඩනඟලා තිබෙනවා. පසුගිය මැතිවරණවලින් පසුව අපි ස්ථාවර රජයක් බිහි කරන්න සමත් වෙලා තිබෙනවා. වෙනදා තිබුණු තත්ත්වය මෙහෙම නොවෙයි. අපි දන්නවා, මෙතැන උදේට කෑ ගහලා යන අය එක දවසක මෙතැන ඉන්නවා, තවත් දවසක තවත් තැනකට පනින බව. එහෙම තමයි එදා වුණේ. දේශපාලන ස්ථාවරත්වයක් තිබුණේ නැහැ. මේවා ඇතුළේ තිබුණේත් ගනුදෙනු තමයි. ඒ අය නිකම් එහෙට මෙහෙට පනිනවා නොවෙයි නේ. දැවැන්ත මූල්‍ය ගනුදෙනුත් එක්ක තමයි ඒ අය එහෙට මෙහෙට පනින්නේ. මෙන්න මේ කාරණයට විසඳුමක් ගෙනෙමින් ජාතික ජන බලවේගය විධියට අපි ඉතාම හොඳ ස්ථාවර රජයක් බිහි කරන්න සමත් වෙලා තිබෙනවා.

දෙවනුව අපට සලකා බැලීමට තිබෙන කාරණය තමයි, දූෂණය කියන එක. මේ දූෂණය කියන කාරණය ගත්තොත්, FATF කියන ආයතනය Recommendations 40ක් ලෝකයේ රටවලට පිළිපදින්න කියලා නිර්දේශ කරලා තිබෙනවා, විශේෂයෙන්ම ත්‍රස්තවාදයට මුදල් යෙදවීම සහ මුදල් විශුද්ධිකරණය කියන කාරණාවලින් රටවල් ආරක්ෂා කරගැනීම සඳහා. ශ්‍රී ලංකාවේ දැන් අපි පාවිච්චි කරන සමාගම් පනත 2007 වර්ෂයේදී හදලා පාර්ලිමේන්තුවේ සම්මත කරගත්තා. අපට ඉදිරිපත් කර තිබෙන Recommendationsවලින් 24වෙනි Recommendation එකේ තිබෙන්නේ විනිවිදභාවය සහ නෛතික පුද්ගලයන්, ප්‍රතිලාභ හිමිකාරිත්වය කියන එක. අපේ සමාගම් පනතට මේ කොටස ඇතුළත් කරන්න තිබුණා නේ. දැන් බොහොම පිරිසිදුයි කියලා කෑගහන මන්ත්‍රීවරුන්, ඔවුන්ගේ තාත්තලා ඇතුළු ඔවුන්ගේ පවුල්වල උදවිය නේ ඒ කාලයේ මේ පාර්ලිමේන්තුවේ හිටියේ. ඒ අය නේ ඒ කාලයේ රජය නියෝජනය කළේ. එහෙම නම් ඔවුන්ට මේක කරන්න තිබුණා නේ. නමුත්, ඔවුන් purposely මේක කළේ නැහැ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා, සාමාන්‍යයෙන් ලෝක නිෂ්පාදිතයෙන් සියයට 2ත්, 5ත් අතර ප්‍රමාණයක් තිබෙන්නේ කළු මුදල් කියලා. මම හිතනවා, ශ්‍රී ලංකාවේ ඒ ප්‍රතිශතය මීට වඩා විශාල වශයෙන් වැඩියි කියලා. මා ළඟ තොරතුරු කිහිපයක් තිබෙනවා. ලෝකයේ තිබෙන රටවල් 164ක් මුදල් විශුද්ධිකරණයට අදාළව බින්දුවේ සිට දහය දක්වා rank කරනවා. බින්දුව කියන්නේ ඉතාම හොඳයි කියන එකයි. යම් රටක මේ අගය බින්දුව නම් කිසිම මුදල් විශුද්ධිකරණයක් සිද්ධ වෙන්නේ නැහැ. හැබැයි, ඒ අගය 10 නම් සම්පූර්ණයෙන්ම මුදල් විශුද්ධිකරණ ආර්ථිකයක් තිබෙන්නේ. එහෙම ගත්තොත්, high risk එකක් ඇවිත් තිබෙන්නේ හයිටි කියන රටට. මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් ඔවුන්ට ලැබිලා තිබෙන scale එකේ අගය 8.25යි. අඩුම අගයක් තිබෙන්නේ Icelandවල. එය 2.87යි. ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් වූ අගය 5.28යි. ඒ කියන්නේ අපි ඉහළ තැනක ඉන්නේ. ලෝකයේ රටවල් 164කින් අපි 80වැනි ස්ථානයේ ඉන්නේ, මුදල් විශුද්ධිකරණය පැත්තෙන් ගත්තාම. අපට ඕනෑ තරම් උදාහරණ තිබෙනවා, මෙවැනි කටයුතු, මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන්.

අපි දකිනවා, හිටපු ගමන් කොත්තු කඩයක් මතු වෙනවා, එහෙම කොත්තු කඩ දාලා කෝටි ප්‍රකෝටිපතියෝ බිහි වෙනවා. මේ වාගේ කඩ කරන අය ඕනෑ තරම් ඉන්නවා. හැබැයි, ඒ අය එහෙම කෝටිපතියෝ වෙලා නැහැ. වඩේ විකුණන අය ඉන්නවා. ඔවුනුත් මහා කෝටිපතියන් වෙලා ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මේ කියමින් ඉන්නේ මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන්. ඒ කියන්නේ පැහැදිලිව ඉදිරිපත් කළ නොහැකි ක්‍රමවලින් උපයාගත් කළු මුදල් -විවිධ අයථා ගනුදෙනු, එහෙම නැත්නම් ත්‍රස්තවාදී කටයුතු- වෙනත් ක්‍රමවේද හරහා, විශේෂයෙන් ව්‍යාපාරවලට යොදවා එම ව්‍යාපාර හරහා සුදු කරන්න, එහෙම නැත්නම් නීත්‍යනුකූල මුදල් බවට පත් කරන්න ඔවුන් මේ අණ පනත් පාවිච්චි කරලා තිබුණා. මේ පාර්ලිමේන්තුවේදී අත උස්සලා ඒවා සම්මත කරලා ඔවුන්ට ඒවා නවත්වන්න තිබුණා. නමුත් එහෙම වෙලා නැහැ. අන්න ඒක නවත්වන්න තමයි රජයක් විධියට අපි සමාගම් පනතට මෙවැනි සංශෝධන අරගෙන එන්නේ.

මම මුලිනුත් කිව්වා වාගේ අපේ රටේ ආර්ථිකයේ විශාල පංගුවක් තිබෙන්නේ කළු මුදල්. ඒ නිසා අපේ රටට මූලිකව අවශ්‍ය වන ඖෂධවලට ගෙවන්න, එහෙම නැත්නම් ඉන්ධනවලට ගෙවන්න අපට මුදල් නැති වෙනකොට දැවැන්ත කළු ව්‍යාපාරික ජාලයක් බිහි වෙලා තිබෙනවා. හැබැයි ඒවා නීත්‍යනුකූල ගනුදෙනු නොවෙයි. එහෙම දැවැන්ත ව්‍යාපාර ජාලයක් තිබුණා නම්, කෝටි ප්‍රකෝටිපතියන් හිටියා නම්, ඔවුන්ගේ ව්‍යාපාරවලින් රජයට බදු අය විය යුතු වෙනවා නේ. එහෙම බදු අය වුණා නම් ඒ මුදල් රජයේ ගනුදෙනු පියවාගන්න අපට පාවිච්චි කළ හැකිව තිබුණා. නමුත් එහෙම වෙන්නේ නැහැ. එහෙම නොවන්නේ මෙන්න මේ ගනුදෙනු සිද්ධ වෙන්නේ කළු ව්‍යාපාරික ජාලයක් හරහා වීම නිසායි. අන්න ඒක වළක්වන්න රජයක් විධියට අපට වගකීමක් තිබෙනවා කියලා මම හිතනවා. මම මුලින් කියපු දූෂණය කියන කාරණය අපි මැඩ පැවැත්විය යුතුව තිබෙනවා, මේ රටේ ආර්ථිකය යහපත් දිශාවකට යොමු කරනකොට.

ඒ වාගේම money laundering කියන කාරණයේදී මේ කියන සමාගම්වල නෛතික අයිතිය ප්‍රසිද්ධ නොකරන බව අපි දන්නවා. ඒ තොරතුරු ලබා දෙන්නේ නැහැ. එහෙම ලබා දිය යුතුයි කියලා නීතියකුත් නැහැ. මම ඉස්සෙල්ලාත් කිව්වා වාගේ මේවා කරන්නේ හේතු ඇතිව, හිතාමතාම තමයි. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ මේ සම්බන්ධව Recommendations 40ක් නිර්දේශ කර තිබෙනවා. ඒ Recommendations 40න්, 39ක් ක්‍රියාත්මක කරනවා. හැබැයි, 24වැනි Recommendation එක විතරක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඇයි, ඒ? ඔවුන්ට අවශ්‍යයි, ඒ සමාගම්වල කවුද ඉන්නේ, ඒ සමාගම්වල අන්තිම අර්ථලාභීන් කවුද, මේ ආර්ථික වාසිය අවසානයේ කාටද යන්නේ කියන එක සඟවා තියා ගන්න. මෙන්න මේ සැඟවීම කරන්න තමයි ඒ අය මෙවැනි වගන්ති අත්හැරලා සමාගම් පනත සම්මත කරලා තිබෙන්නේ.

මම මුලින් කිව්වා වාගේ, අපට රජයක් විධියට වගකීමක් තිබෙනවා, නැවතත් දේශපාලන ස්ථාවරත්වයක් ඇති කර ගත්ත මේ රටේ ආර්ථික ස්ථාවරත්වයක් ඇති කරන්න වාගේම මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් යෙදවීම කියන කාරණා අවම කර ගනිමින් යහපත් ආර්ථිකයක්, එහෙමත් නැත්නම් කළු

[ගරු රුවන් රණසිංහ මහතා]

ආර්ථිකයක් වෙනුවට නීත්‍යනුකූල ගනුදෙනු, ව්‍යාපාර සිද්ධ වෙන ආර්ථිකයක් ඇති කරන්න. අපි දන්නවා, කළු ආර්ථිකය තුළ කළු ව්‍යාපාර ගනුදෙනු කළාට ඒවාට නීතිමය පසුබිම ලබා දෙන්න සුදු ඇඳ ගත්ත මුදලාලිලා ටිකක් ඉන්නවාය කියන එක. ඒගොල්ලන් තමයි උදේට ඇවිල්ලා කෑ ගහලා යන්නේ. අන්න ඒ සුදු ඇඳ ගත්ත මුදලාලිලාගේ කළු පැත්ත එළි කර ගන්න තමයි අපි මෙන්න මේ වාගේ නව අණපනත් සම්මත කරන්නේ. ඒ නිසා තමයි විශේෂයෙන් 2007 අංක 7 දරන සමාගම් පනතට මුදල් විශුද්ධිකරණය සහ අවසාන අර්ථලාභය පිළිබඳව ඇතුළත් කරලා, අලුත් පනත් කෙටුම්පතක් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන් මේ අවස්ථාවේදී නැවත වතාවක් විපක්ෂයට මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. විපක්ෂ නායකතුමා මේ පනත් කෙටුම්පත ගැන කථා කරනවාය කියලා"කොහේද යන්නේ, මල්ලේ පොල්" වාගේ කථාවක් කියලා ගියා. හැබැයි, කාලාන්තරයක් තිස්සේ තාත්තලා, පුතාලා ඔක්කෝම එකතු වෙලා පාලනය කරපු රටේ 1990දී සම්මත කළ යුතුව තිබුණු පනතකට එකතු කිරීමක් තමයි අද අපි මේ කරන්නේ. ඒ නිසා මම විපක්ෂයට ආරාධනා කරනවා, මේ වාගේ ඉතා වැදගත් සහ අපේ රටට අවශ්‍ය අණපනත්වලට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා. රජයක් විධියට අපට වගකීමක් පැවරී තිබෙනවා, හොඳ, පිරිසිදු, විශේෂයෙන්ම විනිවිදභාවයෙන් යුතු ආර්ථිකයක් බිහි කරන්න වාගේම මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් යෙදවීම වාගේ කටයුතු අඩාළ වෙන විධියට මේ නීති සම්පාදනය කිරීමට. එම කාරණය නැවත වතාවක් සිහිපත් කරමින් විශේෂයෙන් අපි රජයක් විධියට දේශපාලන ස්ථාවරත්වය ගොඩනැඟුවා වාගේම දූෂණයෙන් තොර රටක් බිහි කිරීමට ඇප කැප වන බවත්, ඒ සඳහා අවශ්‍ය නීති රීති සම්පාදනය කරන බවත් සභාව හමුවේ තබමින් මගේ කථාව අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.22]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதம் நடைபெற்றாலும், அதற்கு அப்பாற் சென்று சில விடயங்களைக் கூற விரும்புகின்றேன்.

இன்றைய நாள் இலங்கையின் வரலாற்றில் மிக முக்கியத்துவம் பெறுகின்ற ஒரு நாளாகும். இந்த நாட்டில் கறுப்பு யூலை இனப் படுகொலை நடந்து இன்று 42 வருடங்களாகின்றன. UNP அரசாங்கம் முதன்முதல் பதவியேற்ற காலகட்டத்தில் ஜே.ஆர். ஜயவர்தன அவர்களின் தலைமையின்கீழ் லலித் அத்துலத்முதலி, காமினி திசாநாயக்க போன்றவர்களுடைய வழிகாட்டலில், இந்த நாட்டில் மிக மோசமானதோர் இனப் படுகொலை நடைபெற்றது. அது தமிழர்கள்மீது மேற்கொள்ளப்பட்டது. வெலிக்கடைச் சிறையில் இருந்த குட்டிமணி, தங்கத்துரை, ஜெகன் உட்பட பலர் அதன்போது படுகொலை செய்யப்பட்டார்கள். இந்த நாட்டில் பிறக்கப்போகின்ற தமிழீழத்தைப் பார்க்கப் போகிறீர்களா? எனக் கேட்டு, அவர்களுடைய கண்களைத் தோண்டி எடுத்த வரலாற்றைக் கொண்டதாக இந்த நாள் அமைந்திருக்கின்றது. யூலை 23ஆம் திகதியான இன்றைய நாள் தமிழர்களுடைய வரலாற்றில் ஒரு கறுப்பு நாளாகும். இந்தச் சம்பவம் நடந்து 42 வருடங்கள் கடந்தும், இது தொடர்பில் எந்தவிதப் பொறுப்புக் கூறலோ, நீதி விசாரணையோ இல்லாமல் இருக்கின்ற இந்த நேரத்தில் நான் சில விடயங்களை இங்கு பதிவுசெய்ய விரும்புகின்றேன்.

தமிழீழ விடுதலை இயக்கத்தின் தலைவராக இருந்த தங்கத்துரையிடம் நீதிமன்றத்தில் வைத்து நீதிவான் அவர்கள் உங்களுடைய இறுதி ஆசை என்னவெனக் கேட்டபோது, "நாங்கள் ஆயுதங்கள்மீது காதல்கொண்ட வன்முறையாளர்கள் அல்லர்; ஆயுதங்கள் எங்கள்மீது திணிக்கப்பட்டது" என அவர் சொல்லியிருந்தார். "மலரப்போகும் தமிழீழத்தை நான் என்னுடைய கண்களால் பார்க்க வேண்டும்" என குட்டிமணி அவர்கள் சொன்னார். இதற்காகவே அவருடைய கண்கள் தோண்டி எடுக்கப்பட்டு, கொடூரமாகக் கொலை செய்யப் பட்டார். எந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தாலும், இந்த நிகழ்வுக்கு நீதியான முறையில் மன்னிப்பையோ அல்லது பரிகாரத்தையோ தேட முற்படவில்லை என்பதுதான் துரதிருஷ்டவசமானது. அப்போது 30 வயது நிரம்பிய தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தின் தலைவரான பிரபாகரன் அவர்கள், இந்தியாவில் வெளிவந்த 11-17/03/1984ஆம் "Sunday Magazine" என்ற ஆங்கிலச் சஞ்சிகைக்கு வழங்கிய செவ்வியில், "ஜயவர்தன உண்மையான பௌத்தராக இருப்பாராயின், நான் ஆயுதம் ஏந்தியிருக்க நேர்ந்திராது" என்று சொல்லியிருந்தார். இதனை அவர் அதன் ஆசிரியர் அனிதா பிரதாப் அவர்களிடம் சொல்லியிருந்தார். இன்று காலம் இவ்வளவு தூரம் கடந்திருக்கிறது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய மக்களுக்கு நீதி கிடைக்கவில்லை. நாங்கள் தொடர்ந்தும் நீதிக்காகப் போராடிக்கொண்டு இருக்கின்ற ஓர் இனம் என்பதை இந்த இடத்தில் பதிவுசெய்ய விரும்புகின்றேன்.

மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள், மண் குடிசையில் இருந்து இந்த நாட்டின் சனாதிபதியாகி சனாதிபதி மாளிகை வரை வந்தவர். ஆபிரகாம் லிங்கன் அவர்கள் அமெரிக்காவில் சாதாரண குடும்பத்திலிருந்து வந்து எவ்வாறு வெள்ளை மாளிகையை அலங்கரித்தாரோ, அதே வரலாற்றையே அநுர குமார திஸாநாயக்க அவர்களும் கொண்டிருக்கிறாரென தற்போது ஆய்வாளர்கள் சொல்கின் றார்கள். அதாவது, 'அரவிந்த' என்ற நாமத்தோடு இந்த நாட்டில் JVP என்ற ஒரு புரட்சிகர இயக்கத்தில் இருந்த அநுர குமார திஸாநாயக்க அவர்கள், தன்னுடைய அம்மா சுட்டுக்கொடுத்த பலகாரங்களை புகையிரதத்தில் விற்று சாதாரண பிரஜையாக வாழ்ந்தவர். இன்று அவர் இந்த நாட்டின் சனாதிபதியாக இருக்கிறார். இந்த நாட்டில் அடையாளமுள்ள ஒரு தேசிய இனம் எவ்வளவு தூரம் பாதிக்கப்பட்டு இருக்கிறது என்பதை ஓர் ஏழைத் தாயின் மகனான அவர், உளப்பூர்வமாகச் சிந்திக்கக்கூடிய ஒரு ஜனரஞ்சக தலைவராக இருப்பாரென நான் கருதுகின்றேன். வியர்வையும் இரத்தமும் சிந்திய நீங்கள் 56 ஆண்டுகளுக்குப் பிறகு ஆட்சியைப் பிடித்திருக்கிறீர்கள் என்பதை நான் அடிக்கடி சொல்வதுண்டு. வரலாறு யாரையும் காத்திருக்க வைப்பதில்லை. அதேபோல, தமிழர்கள் சிந்திய இரத்தத்துக்கும் கண்ணீருக்கும் வரலாறு அவர்களுக்கு ஒரு வாய்ப்பைக் கொடுக்கும். அந்த வாய்ப்பைப் புரட்சிவாத பெயரைக்கொண்ட 'அரவிந்த' என்னும் அநுர குமார திஸாநாயக்க அவர்கள் எவ்வாறு கையாளப்போகின்றார் என்பதை நாங்கள் பார்க்கப் போகின்றோம்.

இந்த நாட்டில் எங்கு தோண்டினாலும் எலும்புக் கூடுகள்தான் கிடைக்கின்றன என்பது உங்களுக்குத் தெரியும். அது சம்பூராக இருக்கலாம், திருகோணமலையாக இருக்கலாம், செம்மணியாக இருக்கலாம், கொக்குத்தொடுவாயாக இருக்கலாம்! மனிதப் படுகொலைகள் நடைபெற்ற, மனிதப் புதைகுழிகள் உள்ள நாடாக இலங்கை இருக்கிறது. நேற்றுவரை செம்மணியில் 80 மனித எலும்புக்கூடுகள் எடுக்கப்பட்டுள்ளன. ஆனால், இதுவரை அது தொடர்பில் நீதி விசாரணை மேற்கொள்வதற்கான கதவுகள் திறக்கப்பட்டதாகத் தெரியவில்லை. யாழ்ப்பாண மண்ணில் 2000 - 2002ஆம் ஆண்டு காலப்பகுதியில் இடம்பெற்ற காணாமலாக்கப்பட்ட சம்பவங்கள் தொடர்பில் கலாநிதி தேவநேசன் நேசையா அவர்கள் தலைமையிலான நான்கு பேரைக்கொண்ட குழு இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவின் ஆதரவோடு ஓர் அறிக்கையைச் சமர்ப்பித்து இருந்தது. திரு. எம்.சி.எம். இக்பால் அவர்களைச் செயலாளராகவும், Mr. K.M. Camillus Fernando, Ms. Jezima Ismail ஆகியோரை உறுப்பினர்களாகவும் கொண்ட அக்குழுவின் அந்த அறிக்கைகூட, இந்த நாட்டில் கவனத்தில் எடுக்கப்படாமல் கிடப்பிலே போடப்பட்டு இருக்கிறது. அவர்கள் கொடுத்த அறிக்கையிலுள்ள விபரங்கள்கூட இதுவரை வெளிவரவில்லை. அவர்கள் அந்த அறிக்கையை 2003ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் 28ஆம் திகதி இந்த நாட்டின் தலைவரிடம் கொடுத்திருந்தார்கள். ஆனால், எந்தத் தீர்வும் யாருக்கும் கிடைக்கவில்லை. கற்றுக்கொண்ட பாடங்கள் மற்றும் நல்லிணக்க ஆணைக்குழுவின் அறிக்கையும் கிடப்பில் போடப்பட்டுள்ளது. அதேபோல, அது சம்பந்தமான சனாதிபதி ஆணைக்குழுவின் அறிக்கையும் கிடப்பில் போடப்பட்டுள்ளது. நாட்டில் ஒரு தீர்வைப் பற்றி யாருமே சிந்தித்ததாக நான் இதுவரை அறியவில்லை.

இலங்கை - இந்திய ஒப்பந்தம் கைச்சாத்திடப்பட்டது. ஜே.ஆர். ஜயவர்தன அவர்களுடைய சூழ்ச்சியால் அந்த ஒப்பந்தம் நீதியான ஒரு தீர்வை இந்த நாட்டில் கொண்டுவருவதற்கான பாதையைத் திறக்கவில்லை. 2010ஆம் ஆண்டு மஹிந்த ராஜபக்ஷ அவர்கள் இந்த நாட்டின் சனாதிபதியாக இருந்தார். யுத்தம் முடிந்த பிறகு, அவர் இந்நாட்டின் மன்னன்போல் பார்க்கப்பட்டார். அதாவது, யுத்தத்தை முடித்தவராகப் பார்க்கப்பட்டார். அப்போது, அவருக்கு ஓர் அருமையான வாய்ப்பு கிடைத்தது. இலங்கையில் யாருக்கும் கிடைக்காத அந்த வாய்ப்பை அவர் தன்னுடைய இயலாமை காரணமாக அல்லது தன்னிடமிருந்த இனவாதம் காரணமாகச் சரியாகப் பயன்படுத்தவில்லை. அதனால் இன்று அவரும் காணாமல் போய்க்கொண்டு இருக்கிறார்.

இந்த நாட்டின் தலைவர்களுக்கு அரிய வாய்ப்புகள் கிடைப்பதுண்டு. இப்பொழுதுகூட, அவ்வாறானதொரு வாய்ப்பு சனாதிபதி அநுர குமார திஸாநாயக்கவுக்குக் கிடைத்திருக்கிறது. அவரது கட்சி பாராளுமன்றத்தில் 159 உறுப்பினர்களைக் கொண்டிருக்கிறது. 2005ஆம் ஆண்டு யூன் மாதம் 15ஆம் திகதிக்கு முதல் சுனாமிக்குப் பின்னரான செயற்பாட்டு முகாமைத்துவக் கட்டமைப்பிலிருந்து சந்திரிக்கா அம்மையார் விலக வேண்டுமென அப்போதிருந்த சோமவங்ச தலைமையிலான JVP கேட்டிருந்தது. அதிலிருந்து அவர் விலகாத காரணத்தால், 2005ஆம் ஆண்டு யூன் மாதம் 16ஆம் திகதி சந்திரிக்காவின் அரசாங்கத்திலிருந்து JVP வெளியேறியது. 2005இல் 39 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டிருந்த JVP ஐந்து காரணங்களை முன்னிறுத்தி, இலங்கையில் விடுதலைப் புலிகளுக்கும் அரசாங்கத்துக்கும் இடையில் கொண்டுவரப்பட்ட P-TOMS என்ற Post-Tsunami Operational Management Structureஐ - சுனாமிக்குப் பின்னரான செயற்பாட்டு முகாமைத்துவக் கட்டமைப்பை உடைத் தெறிந்தது. நீதிமன்றத்தில் அதற்கு இடைக்காலத் தடை உத்தரவையும் பெற்றது. இவ்வாறெல்லாம் கடந்த காலங்களில் நீங்கள் விட்ட தவறுகள் நிறையவே உண்டு. அந்தத் தவறுகளில் இருந்து மீண்டுவர வேண்டுமென நாங்கள் விரும்புகிறோம். இப்பொழுது நீங்கள் சகோதரத்துவம் பற்றி பேசுகின்றீர்கள்; சகோதர நாட்டின் ஒற்றுமை பற்றி பேசுகின்றீர்கள். அதை நாங்கள் வரவேற்கிறோம். நல்ல விஷயம்! இன்றுகூட தென்பகுதியில் இருந்து சில இளைஞர்கள் வட பகுதிக்குப் புகையிரதத்தில் செல்கிறார்கள். இது எங்கே செய்யப்பட வேண்டும்? குற்றம் செய்தவர் குற்றத்தை உணரும்பொழுதுதான் அந்த இடத்துக்கு வர முடியும். ஆனால், அதனைச் செய்வதற்கு இந்த நாட்டில் யாரும் முன்வருவதாக எனக்குத் தெரியவில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இங்கு இருக்கின்ற JVP தோழர்கள் போராளிகள்! அவர்கள் இந்த நாட்டில் அரசுக்கெதிராகப் போராடிய போராளிகள்! வரலாறு உங்களை 50 வருடங்களுக்குப் பிறகு ஆட்சியில் அமர்த்தி இருக்கிறது. இதேமாதிரி, தமிழ் மக்கள் வாழுகின்ற பிரதேசங்களில் அம்மக்களுடைய விடுதலைக்காகப் போராடிய போராளிகள் துயிலும் இல்லங்களில் மாவீரர்களாக உறங்கிக் கொண்டு இருக்கிறார்கள். அந்தத் துயிலும் இல்லங்களுக்கு மேல் இராணுவம் முகாம் அமைத்து, சப்பாத்துக் கால்களோடு நடந்து திரிகிறது. அதுமாத்திரமன்றி, அவர்கள் அந்தத் துயிலும் இல்லங்களுக்கு மேல் உதைபந்தாட்டம் விளையாடுகிறார்கள். இப்படி நடந்துகொண்டால், எப்படி சகோதரத்துவம் ஏற்படும்? எவ்வாறு உங்களுக்கும் எங்களுக்கும் இடையில் உறவு நீடிக்கும்? எவ்வாறு நீங்களும் நாங்களும் இந்த நாட்டின் பிரஜைகளாக ஒன்றாகக் கைகோர்க்க முடியும்? எனவே, தயவுசெய்து சிந்தியுங்கள்! நாங்கள் எதற்கும் புறம்பானவர்கள் அல்லர்; யாரையும் தள்ளிவைத்துப் பார்ப்பவர்களும் அல்லர். நாங்கள் ஒற்றுமையை விரும்புகின்றவர்கள். தமிழர்கள் ஒரு தேசிய இனமாக, எங்களுக்கே உரித்தான இறையாண்மையின் அடிப்படையில் நாங்கள் வாழ்ந்த வடக்கு, கிழக்கு பூர்வீக மண்ணில் - எங்களுடைய வரலாற்று வழி வந்த மண்ணில் - வாழ்வதற்கான உத்தரவாதத்தைத்தான் கேட்கிறோம். அந்த உத்தரவாதம் இல்லாமல், எப்படி இந்த நாட்டின் தேசியப் பிரச்சினைக்குத் தீர்வு கிடைக்கும்? எப்படி இந்த நாட்டில் ஒற்றுமை ஏற்படும்? சற்று சிந்தித்துப் பாருங்கள்!

பிள்ளையான் எனப்படுகின்ற சிவநேசதுரை சந்திரகாந்தனை கைதுசெய்து சிறையில் அடைத்து வைத்திருக்கிறார்கள். அவர் செய்த குற்றங்களுக்குத் தண்டனை அனுபவிக்க வேண்டும். அதற்கு நாங்கள் எதிரானவர்கள் அல்லர். ஆனால், 'ஈஸ்டர்' தாக்குதலை மையமாக வைத்தே அவர் விசாரிக்கப்படுகிறார். 'ஈஸ்டர்' தாக்குதல் நடந்தது 2019 ஏப்பிரல் 21ஆம் திகதி! 'ஈஸ்டர்' தாக்குதல் நடந்த அதே ஏப்பிரல் மாதம் 27ஆம் திகதி, இந்த நாட்டில் பாதுகாப்பு அமைச்சின் செயலாளராக இருந்த கோட்டாபய ராஜபக்ஷ அவர்கள் Reuters செய்தி நிறுவனத்துக்குச் சொல்கின்றார், "Tackle the threat from radical Islam" என்று. அதாவது, இஸ்லாம் மதத்தால் எவ்வாறு இந்த மண்ணில் தீமை நடைபெறப்போகிறது, இஸ்லாம் எவ்வாறு இந்த நாட்டை அழிக்கப்போகிறது என்று சொல்கின்றார். இந்தத் தாக்குதலுக்குப் பின்னால் யார் இருந்தார்கள் என்பதை கோட்டாபய ராஜபக்ஷ அவர்கள் சொல்கிறார். எனவே, பிள்ளையான் ஒரு கருவி மட்டுமே! கருத்தாக்களான கோட்டாபய ராஜபக்ஷ போன்றவர்கள் ஏன் இன்னும் இந்த நாட்டில் விசாரிக்கப்படவில்லை? கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2019ஆம் ஆண்டு

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

ஏப்பிரல் 27ஆம் திகதி Reuters செய்தி நிறுவனத்துக்கு கோட்டாபய ராஜபக்ஷ சொன்ன விடயம் தொடர்பில் வெளிவந்த செய்தி அறிக்கையின் பிரதியை நான் சபாபீடத்துக்குச் *சமர்ப்பிக்கின்றேன்.

நாங்கள் இந்த நாட்டின் பிரஜைகளாக ஒன்றாகக் கைகோர்த்து வாழ விரும்புகிறோம். இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம் நாட்டின் அபிவிருத்திக்கு முக்கியமானது என்பதை நாங்கள் உணர்கிறோம். அந்த அபிவிருத்திக்காக நாங்கள் உங்களோடு கைகோர்த்துச் செயற்படுவதற்குத் தயாராக இருக்கின்றோம். வடக்கு, கிழக்கு என்பது தமிழர்களுடைய அபிவிருத்திக்கான பிரதேசம்! இன்றைக்கு மலேசியாவின் பினாங்கு மாநிலம் அதிகமாகத் தமிழர்கள் வாழுகின்ற ஒரு மாநிலமாகக் காணப்படுகின்றது. மலேசிய அரசு உற்பத்தியாளர்களையும் முதலீட்டாளர்களையும் பினாங்கு மாநிலத்துக்கு வரவழைத்து, அவர்களுக்கான உரிமைகளைக் கொடுத்தது. நிதி அதிகாரத்தைக் கொடுத்தது; உற்பத்தி செய்வதற்கான அதிகாரத்தைக் கொடுத்தது. இன்று பினாங்கு மாநிலம் உலகில் உயர்ந்த நிலையில் இருக்கின்றது; மலேசியா வளர்ந்திருக்கிறது.

காங்கேசன்துறை துறைமுகம், பலாலி விமான நிலையம், மட்டக்களப்பு விமான நிலையம் போன்ற வடக்கு, கிழக்கில் இருக்கின்ற பல இடங்கள் இன்றும் அபிவிருத்தி செய்யப்படாமல் இருக்கின்றன. திருகோணமலையில் நடைபெறுகின்ற அபிவிருத்தி நடவடிக்கைகள் தமிழ் மக்களுக்குப் பயனுள்ளதாக அமையவில்லை. வடக்கிலும் கிழக்கிலும் இருக்கின்ற அபிவிருத்தி நிலைகளைச் சரியான முறையில் கொண்டுசெல்வதற்கு நீங்கள் முதலில் செய்ய வேண்டிய பல விடயங்கள் இருக்கின்றன. தலைமன்னாருக்கும் இராமேஸ்வரத்துக்கும் இடையிலுள்ள தூரம் வெறும் 23 கிலோமீற்றர்தான். பன்னிரண்டு வருடங்களில் பாலம் அமைக்க முடியுமென இந்தியா சொல்கிறது. காங்கேசன்துறை துறைமுகத்தைப் புனரமைப்பதற்கு இந்தியா 52 மில்லியன் அமெரிக்க டொலரை இனாமாகத் தருவதற்குத் தயாராக இருக்கிறது. அதற்கான திட்டங்கள் வரையப்பட்டு இருக்கின்றன. ஏன், நீங்கள் அதைச் செய்யத் தயங்குகிறீர்கள்? தமிழர்கள் அபிவிருத்தியில் முன்னிலைக்கு வந்துவிடுவார்கள் என நீங்கள் பயப்படுகிறீர்களா? இன்றைக்கு 42 வருடங்களுக்கு முன்னர், இந்த நாட்டில் தமிழர்களுக்கு எதிராக நடந்த சம்பவத்துக்கான காரணத்தைச் சொல்கிறேன்.

அன்று இலங்கையின் கொழும்பில் வியாபாரத்துறையில் ஆதிக்கத்தைச் செலுத்தியிருந்தவர்கள் தமிழர்கள்! தமிழர்கள் வர்த்தகத் துறையில் மேலோங்கி இருந்தார்கள். அதை இல்லாமல் செய்வதற்கு ஜே.ஆர். ஜயவர்தன கையாண்ட யுக்திதான் தமிழர்கள் மீதான இன வன்முறை! அந்த இன வன்முறையால் தமிழர்களுடைய பொருளாதாரம் அழிக்கப்பட்டது. இந்த நாட்டில் நாங்கள் நாங்களாக எங்களுடைய இயலுமைகளைப் பயன்படுத்தி வாழ்வதற்கான ஒரு வழியை ஏற்படுத்தித் தருமாறு நாங்கள் மீண்டும் கேட்கிறோம். இந்தியாவின் உதவியைப் பெற்றுக்கொள்வதன் மூலம் காங்கேசன்துறை துறைமுகத்தை ஏன் புனரமைப்புச் செய்துதர முடியாது? இந்த நாட்டில் இருக்கின்றவர்களிடம் நல்லெண்ணங்களை நான் இன்னும் காணவில்லை. நாங்கள் தொடர்ந்து பேசிக்கொண்டு இருக்கிறோம். மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்த நாட்டின் சனாதிபதியாகப் பதவியேற்று இன்று 304 நாட்கள் கடந்திருக்கின்றன. அரசியல் ரீதியாகப் புரையோடிப் போயிருக்கின்ற தமிழ் மக்களின் பிரச்சினைக்கான தீர்வு என்ன என்பதை முன்வைப்பதற்கான தயார்நிலையில் இன்னும் இந்த அராசங்கம் இல்லை. அது பற்றி பேசுவதற்கான வாய்ப்பு இன்னும் இந்த அரசாங்கத்தால் உருவாக்கப்படவில்லை.

இவ்வாறெனில், எவ்வாறு இந்த நாட்டில் முன்னேற்றம் ஏற்படும்? யாழ்ப்பாணத்தின் வலிகாமம் வடக்கில் இன்றைக்கும் கிட்டத்தட்ட 2,700 ஏக்கர் காணி விடுவிக்கப்படாமல் இருக்கின்றது. அந்த மக்கள் போராட்டம் நடத்துகிறார்கள்; உறவினர், நண்பர் வீடுகளில் இருக்கிறார்கள்; உள்நாட்டில் இடம்பெயர்ந்து முகாம்களில் இருக்கிறார்கள். இந்நிலையில், தென் பகுதியிலிருந்து வட பகுதிக்கான சகோதரத்துவ நிகழ்வை சிலர் முன்னெடுக்கிறார்கள். நாங்கள் சகோதரத்துவமாக வாழ வேண்டும். அது தேவை! அதற்காக நாங்கள் உங்களோடு கைகோர்க்கத் தயாராக இருக்கின்றோம். அந்தக் கைகோர்ப்பானது, நீங்கள் நீங்களாகவும் நாங்கள் நாங்களாகவும் வாழுகின்ற நிலையாக இருக்க வேண்டும். சிங்களத் தேசிய இனத்துக்குரிய மொழி, பண்பாடு, அடையாளம், நிலம் என்பவற்றை நாங்கள் ஏற்றுக்கொள்வதுபோல, நீங்களும் தமிழ்த் தேசிய இனத்தின் மொழி, பண்பாடு, அடையாளம் என்பவற்றை ஏற்றுக்கொள்ள வேண்டும்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
எனக்கு இன்னும் இரண்டு நிமிடம் தாருங்கள்!

அவ்வாறு நீங்கள் ஏற்றுக்கொண்டால், நீங்களும் நாங்களும் இந்த இலங்கையைக் கட்டிவளர்ப்பதில் எவ்வளவே தூரம் செல்ல முடியுமென நான் நினைக்கின்றேன். இப்பொழுது இருக்கின்ற அரசாங்கம்கூட, சமாதானம் பற்றி பேசுவதற்கு வெகுதூரம் செல்லவேண்டி இருக்கின்றது. அது பற்றிய சிந்தனை இன்னும் அவர்களிடத்தில் இல்லை என்றுதான் எனக்குத் தோன்றுகின்றது. மஹிந்த ராஜபக்ஷவிட்ட அதே தவறை, ஜே.ஆர். ஜயவர்தன விட்ட அதே தவறை, அநுர குமார திஸாநாயக்க அவர்களும் விடக்கூடாது. தனக்குக் கிடைத்திருக்கின்ற வாய்ப்பை அவர் தவற விடக்கூடாது. இன்றிருக்கின்ற பலத்தைப் பயன்படுத்த அவர் தவறினால், நாடு தான் விரும்பும் திசையில் செல்லும். அது தமிழர்களுக்கான ஒரு தீர்வு நோக்கிப் பயணிக்கும். தமிழர்களுக்கான அந்தத் தீர்வு, அவர்களுடைய சொந்தத் தீர்வாக, சுயநிர்ணயத் தீர்வாக அமையும். தயவுசெய்து, நாங்களும் நீங்களும் சேர்ந்து வாழ்வதற்கான ஒரு தீர்வுக்கு நீங்கள் முதலில் முன்வாருங்கள் எனக் கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[අ.භා. 1.37]

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද උදෑසනම මේ පාර්ලිමේන්තුවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා කථා කළා ඉතිහාසය ගැන සහ ඉතිහාසයේ සිද්ධ වෙලා තිබෙන දේවල් නිසා වර්තමානයේ රටටත්, ජනතාවටත් මුහුණ දෙන්න වෙලා තිබෙන තත්ත්වය ගැන. මම හිතන්නේ අද ඓතිහාසික දවසක්. අද ශ්‍රී ලාංකිකයන් විසින් කථා කළ යුතු දිනයක්. අනාගතය වෙනුවෙන් සහ වර්තමානය වෙනුවෙන් විශාල වැඩ කටයුතු ප්‍රමාණයක් සිදු කිරීම සඳහා ඉවහල් වන සිදු වීම් රාශියක් සිදු වුණු දවසක තමයි විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ඉතිහාසය ගැන කථා කළේ.

අද ජූලි 23වැනි දා. 1983 ජූලි 23 කියන්නේ, හුදෙක් තනි දවසක් නොවෙයි. මේ රටේ දේශපාලන ව්‍යාපාරයක් -බලයේ තිබුණු ආණ්ඩුවක්- විසින් මැර බලය යොදා ගෙන මේ රට අදටත් වේදනා විඳින තත්ත්වයකට පත් කරපු, අදටත් විසඳා ගත නොහැකි ප්‍රශ්නවලට ඇද දමපු දිනයක් තමයි 1983 ජූලි 23 කියන්නේ. ඒ වාගේම, ජාත්‍යන්තර වශයෙනුත් ශ්‍රී ලාංකිකයන් වන අප ඉතාම අපවාදයකට ලක් කරපු දවසක්. මේකට වගකියන්න ඕනෑ ඒ කාලයේ තිබුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. ජාතිවාදය ඇතිවුණා නොවේ. ජාතිවාදය ඇති වුණා කියනවා, ජාතිවාදය ඇති වෙලා තිබෙනවා කියනවා. ඔවුන් ඉතා සැලසුම්සහගත ලෙස ජාතිවාදය ඇති කළා. මේ රට අද තිබෙන තත්ත්වයට පත් කරන්න ආණ්ඩු බලය විශාල වශයෙන් යොදා ගෙන ඔවුන් ඒ කාලයේ වැඩ කර තිබෙනවා. ඒ නිසා 1983 අවුරුද්දේ සිදුවුණු සිදුවීම් ඒ අවුරුද්දට අදාළ සිදුවීම් විතරක් නොවෙයි.

1977 ඉඳලා - එක්සත් ජාතික පක්ෂය බලයට ආපු දවසේ ඉඳලා- සංවිධානාත්මක ලෙස විවිධ කණ්ඩායම් මර්දනය කරමින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව, නීතියට පටහැනිව ක්‍රියාත්මක වෙලා තිබෙනවා. එදා ඉඳන් අද දක්වාම මේ රටේ සාමය, සංහිඳියාව, සමගිය වෙනුවෙන් සැබෑ අරමුණක් තිබෙන ආණ්ඩුවක් පත් වෙනකම්ම - අද මේ පවතින ජාතික ජන බලවේග මහජන ආණ්ඩුව පත් වෙනකම්ම - විවිධ දේශපාලන ව්‍යාපාර මේ රටේ බලයට ඇවිල්ලා තිබෙනවා; ආණ්ඩු කරලා තිබෙනවා. හැබැයි අපි දන්නවා, ඒ අය එක්කෝ දමිළ දේශපාලන ව්‍යාපාර, මුස්ලිම් දේශපාලන ව්‍යාපාර, සිංහල ජනතාව විතරක් නියෝජනය කරන දේශපාලන ව්‍යාපාර බව. ඒගොල්ලන් ඒ ඒ ජන කණ්ඩායම්වල සහාය අරගෙන පාර්ලිමේන්තුව නියෝජනය කරන්න කටයුතු කළා. එහෙම නැත්නම් දේශපාලනය කිරීම සඳහා ම මේ ජාතිවාදය පාවිච්චි කරලා තිබෙනවා. අද ඒක වෙනස් වෙලා තිබෙනවා. මේ රටේ ජනතාව එකතු වෙලා සැබෑ ලෙසම ශ්‍රී ලංකාවේ සංහිඳියාව ඇති කරන්න, සාමය ඇති කරන්න, ඒ වෙනුවෙන් වැඩ කටයුතු කරන්න සමත් වෙලා තිබෙනවා.

මට මතකයි, අපේ සමාජවාදී තරුණ සංගමය -අපේ දේශපාලන ව්‍යාපාරයේ තරුණ සංගමය- අපට ආණ්ඩු බලය නැති ඉතාම අසීරු කාලයක -2008- සහෝදරත්වයේ දිනය සැමරුවා. අද අපි ආණ්ඩුවක් කරනවා. අද අපට තරුණ කටයුතු අමාත්‍යාංශයක් තිබෙනවා. ඒ නිසා නවීන තරුණයෙක්, නූතන ලෝකයට ගැළපෙන තරුණයෙක්, සාමය, සංහිඳියාව තිබෙන පුරවැසියෙක් නිර්මාණය කරන්න අපි වැඩ කටයුතු කරමින් සිටිනවා. අන්න එතකොට විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු කියනවා, අපි ඒවා දේශපාලනීකරණය කරලා ලු. ඉතිහාසයේ කවදාවත් නැති විධියට විවිධ සභාවල සභාපතිවරුන්ගේ ඉඳලා, මන්ත්‍රීවරුන්ගේ ඉඳලා, පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු දක්වාම පවුල් සම්බන්ධතා නැතුව අද මේ රටේ පුරවැසියන් දේශපාලන අධිකාරිය නියෝජනය කරනවා. එහෙම දේශපාලන ව්‍යාපාරයක් තමයි අපට තිබෙන්නේ.

මීට කලින් කථා කරපු මන්ත්‍රීවරුත් ඉතිහාසය පුරාවට තරුණ කටයුතු අමාත්‍යාංශය, තරුණ සේවා සභාව, යෞවන සමාජ කරගෙන ආවා නේ. ඒවායින් බිහි වෙලා තිබෙන ඒවා අපට කියන්නකෝ. ඒගොල්ලන්ගේ පවුල් පසුබිම්වලින් පිට, එළියේ සිටින තරුණයන්ට -පොදුවේ තරුණයන්ට- අවස්ථාවක් ලැබුණද? ඒ නිසා මේ රටේ තරුණයන්ගේ ඉඳලා මේ රටේ සමස්ත ජනතාවම පීඩාවට පත් කරපු ඉතිහාසයක්, ජාතිවාදය පාවිච්චි කරගත්ත ඉතිහාසයක් තමයි අපේ රටේ බලයේ හිටපු බොහෝ දේශපාලන ව්‍යාපාරවලට තිබෙන්නේ.

1981දී ප්‍රජාතන්ත්‍රවිරෝධී ලෙස යාපනයේ -උතුරේ- සංවර්ධන සභා ඡන්දය කොල්ල කෑවා. ශ්‍රීතරන් මන්ත්‍රීවරයා කිව්වා වාගේ අද අපේ තරුණ කණ්ඩායම් සහෝදරත්වයේ දිනය සමරන්න, සාමයේ, ළෙන්ගතු බවේ, ආදරයේ සංකේතය සහිතව ආදරණීය යාල්දේවි දුම්රියෙන් යාපනයට යනවා. එදා පුරවලා යැව්වේ මොනවාද? ඒගොල්ලන් ඡන්ද කොල්ල කන්න 1981දී මැරයෝ පුරවලා යැව්වේ. අන්න එහෙම ඉතිහාසයක් තිබෙන්නේ. එහෙම ඉතිහාසයක් තියාගෙන අද උදේ ම පාර්ලිමේන්තුවේදී කිව්වා, ඉතිහාසය විසින් වර්තමානයේ තත්ත්වය ඇති කර තිබෙනවා ලු. ඔව්, මේ රට පාලනය කරපු අය ඒවාට වගකියන්න ඕනෑ තමයි. ඒක වෙනස් කරන එක ලේසි වෙන්නේ නැහැ, සරල වෙන්නේ නැහැ කියලා අපි දන්නවා. ඒක වෙනස් කරන්න කියන ඉල්ලීම දීර්ඝ වශයෙන් තිබෙනවා. එහෙම නම් කොහොමද අපි මේක වෙනස් කළ යුත්තේ?

ඉතිහාසය ගැන අපි ඇති තරම් කථා කරලා ඇති. මේ පාර්ලිමේන්තුව තුළත්, පාර්ලිමේන්තුවෙන් එළියේත්, විදේශ රටවලත්, 1983 කළු ජූලිය පිළිබඳව, ජූලි 23වැනි දා වෙච්ච සිදුවීම් හා ඒ ආශ්‍රිත සිදුවීම් පිළිබඳව ඇති තරම් කථා කරලා ඇති. ඒ නිසා වර්තමානයෙන් අනාගතයට යන්න අපි සැලසුම් කරන්නේ කෙහොමද? අපි කොහොමද, වර්තමානයෙන් අනාගතයට යන්නේ? ඒ සඳහා අපේ ජාතික ජන බලවේගය දේශපාලන ව්‍යාපාරයක් විධියට, ආණ්ඩුවක් විධියට අද අපේ රටට ස්ථාවර දේශපාලනයක් ගෙනැල්ලා තිබෙනවා, ශක්තිමත් දේශපාලන පදනමක් ගෙනැල්ලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අද ජාතික දේශපාලන ව්‍යාපාරයක් ආණ්ඩුවක් නිර්මාණය කරලා තිබෙනවා, උතුරේත්, දකුණෙත්, නැඟෙනහිරත්, කඳුකරයෙත් සියලු ජනතාවගේ ආශිර්වාදය සහ සහයෝගය සහිතව. ඒ නිසා මේ ජාතික ජන බලවේග ආණ්ඩුව කියන්නේ එහෙම සරල, සිල්ලර, තනි තනි ප්‍රශ්නවලට විසඳුම් හොයන ආණ්ඩුවක් නොවෙයි. මේ ආණ්ඩුව මේ රටේ ජාතික ගැටලුවටත් විසඳුම් හොයමින්, සකස් කරමින් මේ සංකීර්ණ ගැටලු විසඳීම සඳහා මේ රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, ජාතිය වෙනුවෙන් වැඩ කරන දේශපාලන ව්‍යාපාරයක් සහ ආණ්ඩුවක්. අපේ දේශපාලන දර්ශනයේ, දේශපාලන දැක්මේ සහ අපේ දේශපාලනය හසුරුවන්නේ කුමන කාරණා සඳහාද කියන එක තුළ - පැරණි ආණ්ඩු කළේ, ජාතිවාදය පාවිච්චි කරමින් ආණ්ඩු කිරීමයි - නමුත් අද අපි දේශපාලනය හසුරුවන්නේ සමගිය වෙනුවෙන් සැබෑ වුවමනාවක් තිබෙන ආණ්ඩුවක් විධියට. ඒ වෙනුවෙන් අපි අද රටේ දේශපාලන අර්බුද, දේශපාලන අස්ථාවරභාවය නිමා කරලා තිබෙනවා.

විවිධ විපක්ෂ කණ්ඩායම්වලට වුවමනා ඇති, නැවත දේශපාලනය අස්ථාවර කරලා වාසි ගන්න. හැබැයි අපි මේ රටේ ජනතාවත් එක්ක ඉන්න ජනතාවාදී ආණ්ඩුවක් විධියට ඒකට ඉඩදෙන්න ලෑස්ති නැහැ. හැබැයි එතැනින් එහාට ගිහිල්ලා කොහොමද මේ ප්‍රශ්නවලට විසඳුම ගෙනෙන්නේ? දේශපාලනය

[ගරු තනූර දිසානායක මහතා]

එක්කම තිබෙනවා ආර්ථිකයත්. මේ දේශපාලන ස්ථාවරය ආර්ථික සංවර්ධනයට සම්බන්ධ කරන්න ඕනෑ. ආර්ථිකය පුළුල් කරන්නේ නැතුව, උතුරට, දකුණට, නැඟෙනහිරට, මධ්‍යම කඳුකරයට ආර්ථිකය පුළුල් කරන්නේ නැතුව අපට සංහිඳියාව, සාමය සහිත පොහොසත් රටක් ලස්සන ජීවිතයක් හදන්න හම්බ වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු තනූර දිසානායක මහතා
(மாண்புமிகு தனூர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මට තව පොඩි වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඒ නිසා අපි ශ්‍රී ලාංකිකයන් විධියට, ජාතික ජන බලවේග ආණ්ඩුව විධියට ජාතික සමඟිය වෙනුවෙන් සහ මේ ආර්ථික ක්‍රියාවලිය වෙනුවෙන් උතුරට ආර්ථිකය ව්‍යාප්ත කරලා තිබෙනවා. අද උතුරේ රුපියල් බිලියන 5ක සංවර්ධන කටයුතු සිදු කෙරෙනවා. පාලම් හදනවා, වසර 15ක් තිස්සේ වහලා තිබුණු පාරවල් විවෘත කරලා තිබෙනවා. ඉදිරියටත් අපි මේ වාගේ ප්‍රගතිශීලී කටයුතු කරන්න සූදානම් වෙලා ඉන්නවා. ඒ වාගේම තමයි, සමාජයීය වශයෙන් අපි ඉදිරියේදී ශ්‍රී ලාංකික දිනය සමරන්න ලැහැස්ති වෙනවා. ඒ නිසා ශ්‍රී ලාංකිකයන් විධියට මේ සියලු පළාත්වල ජීවත් වෙන ගෞරවනීය ශ්‍රී ලාංකිකයන්ගෙන් අපි ඉල්ලා සිටින්න කැමැතියි, ජූලි 23 වාගේ දවසක් ඒ සඳහා යොමු ගනිමු කියලා. අපි අතීතයෙන් පාඩම් ඉගෙන ගනිමු. දැන් ජනතාව වෙනුවෙන් ආණ්ඩුවක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ රටේ තාරුණ්‍ය සහ ප්‍රගතිශීලී කොටස් ඒ වෙනුවෙන් එකතු වෙලා ඉන්නවා. අපි දේශපාලන, ආර්ථික සහ සමාජයීය වශයෙන් මේ රට ගොඩනඟමු. ඒ වෙනුවෙන් උතුරෙත්, දකුණෙත්, නැඟෙනහිරත්, මධ්‍යම කඳුකරයේත් සියලුදෙනා අත්වැල් බැඳ ගනිමු, ඒ සඳහා අපේ පාර්ලිමේන්තුවේ කාර්යභාරය සහ දේශපාලනය කැප කරමු කියලා ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.45]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා මට අවස්ථාව ලබා දීම වෙනුවෙන්.

මෙය 2007 අංක 07 දරන සමාගම් පනතට කරපු සංශෝධන පිළිබඳ විවාදයට ලක්වෙන මොහොත. විශේෂයෙන්ම මේක මේ රටට අත්‍යවශ්‍ය වෙලා තිබිච්ච යුගයක තමයි ගිය මාසයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ඊට පස්සේ මා සභාපතිත්වය දරන ආංශික අධීක්ෂණ කාරක සභාවට තමයි මේක ආවේ. මේ සංශෝධන පිළිබඳ එකින් එක, එකින් එක කරුණු නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ මහත්වරු සහ අදාළ අමාත්‍යාංශයේ කණ්ඩායම් සමඟත්, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කණ්ඩායම් සමඟත් අපි සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවලදී විශේෂයෙන්ම මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් ලබා දීම ගැන සහ මේ සමාගම් හෝ කණ්ඩායම් ලියාපදිංචි වීමේදී ඒ ලියාපදිංචි වෙලා තිබිච්ච ආකාරය ගැන කථා කළා. සමහර වෙලාවට ඊට පිටුපස්සෙන් ඉඳගෙන මුදල් විශුද්ධිකරණය හෝ වෙනත් ව්‍යාපාර සහ ජාවාරම් කරපු කණ්ඩායම් ඉන්නවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටත් - IMF එකටත් - අවශ්‍ය වෙලා තිබුණා, මේ කණ්ඩායම් සියල්ලම නැති කිරීම සඳහා මේ වෙනස කරන්න. ඒ වෙනස තමයි මේ සංශෝධන මඟින් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. මම හිතන්නේ ඒ සංශෝධනවලදී කරුණු 22ක් සංශෝධනය වුණා. ඒ සංශෝධනය වෙච්ච කරුණුවලදී මේ රටට ඉතාම වැදගත් කරුණක් තිබුණා. ඒ අනුව, සමාගමක් ලියාපදිංචි කරලා සහ ඒ ලියාපදිංචියෙන් ඉදිරියට යද්දී, ඒ ලියාපදිංචියේ තිබෙන විනිවිදභාවය වෙනුවෙන් සමාගමේ අයිතිය තිබෙන සියලුදෙනාම මින් පස්සේ අනිවාර්යයෙන්ම සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි විය යුතුයි. එහෙම නැත්නම් ඒ නම් හෙළිදරවු විය යුතුයි. ඒ කාටවත් හැංගිලා පිටුපස්සෙන් ඉන්න බැහැ.

ඊළඟ කාරණය තමයි, මේ මුදල් බෙදී යන ආකාරය. ඒවා කොයි ආකාරයෙන්ද බෙදී යන්නේ, කොහොමද මේවායේ කොටස් බෙදී යන්නේ, ඒ කොටස්වල ලාභාංශ ගන්න ක්‍රමය මොක්කද කියන සියල්ලම මේකට ඇතුළත් වෙනවා. විශේෂයෙන් මෙතැනදී සමාගමක් ලියාපදිංචි වුණාට පස්සේ, වෙන දාට වඩා ඒ තොරතුරු පිටතට ලබා ගැනීමට වැඩි අවස්ථාවක් දීලා තිබෙනවා. හැබැයි එතැනදී එක කාරණාවක් කියන්න ඕනෑ. සමාගමක් ලියාපදිංචි කර නියාමනය කිරීමේදී මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් දීමට තිබෙන අවස්ථා ටික අහුරනවා වාගේම, ලියාපදිංචි කරන සමාගමේ ක්‍රියාදාමය සහ ඒ ව්‍යාපාර කටයුතුවලට මොනවාද රජයෙන් ලබා දෙන සහයෝගයන්? ඒක ඉතාම වැදගත්. අද රටේ තිබෙන ආරක්ෂක තත්ත්වය දිහා බලපුවාම ඒ තොරතුරු හෙළිදරවු කිරීමේදී යම් විධියක ආරක්ෂණ වැඩ පිළිවෙළකුත් සකස් කළ යුතුයි. මොකද, සමාගමක් ලියාපදිංචි කරද්දී තිබෙන නීති රීති හා සමානවම, ඒ සමාගම කරන අයට යම් විධියක තහවුරුවක්, ආරක්ෂාවක්, රජයෙන් සහයෝගයක් ලබා දෙන්න ඕනෑ. අද මේ රජයට ඒ පිළිබඳ ප්‍රතිපත්තියක් නැහැ. මේ රටේ කර්මාන්තකරුවෝ, ව්‍යාපාරිකයෝ එහෙම නැත්නම් සමාගමක් හරහා මේ රටේ ව්‍යාපාර කරන කණ්ඩායම් ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් හෝ ඒ අයට යම් විධියක රජයෙන් සහයෝගයක් දෙන වැඩ පිළිවෙළක් අපි දකින්නේ නැහැ. ඒ අයගේ ආරක්ෂාව පිළිබඳ තහවුරුවක් අපි දකින්නේ නැහැ.

අද මිනිස්සු රුපියල් ලක්ෂ ගාණක් වියදම් කරලා, සමහර අය කෝටි ගාණක් වියදම් කරලා රත්රන් අරගන්නවා. රත්තන් ගන්නේ ලස්සනට පළඳින්න. හැබැයි, අද ඒවා කොහේද තිබෙන්නේ? අද රත්රන් තිබෙන්නේ පෙට්ටගම අස්සේ හංගලා. රට තුළ ඒවා දාගෙන යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඒවා දාගෙන යන්න අද රටේ ආරක්ෂාවක් නැහැ. එහෙම නැත්නම් ඒවා බැංකුවේ තියෙන්නේ. ඒ ඇයි? ඒවා එළියට අරගෙන පැළඳගෙන යන්න බැහැ. මේ පාර්ලිමේන්තුවේ ලස්සන කාන්තාවෝ ඉන්නවා. ඒ අය රත්රන් පළඳින්න හරිම ආසාවෙන් ඉන්නවා. හැබැයි, ඒ ගොල්ලන්ට පළඳින්න බැහැ. ඒ අය ඒවා පැළඳගෙන එන්න බයයි. ඒවා පැළඳගෙන ඇවිල්ලා ඒ අයට ආරක්ෂිතව ගෙදර යන්න බැහැ. ඒකයි රටේ තත්ත්වය. මේ රටේ තිබෙන ඒ තත්ත්වය අපි වෙනස්

කරන්නත් ඕනෑ. මේ සමාගම් සම්බන්ධව තිබෙන ඒ වැඩසටහන් වාගේම, රටේ ආරක්ෂාව සම්බන්ධවත් අපි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. රත්රන් කෝටි ගණන් දීලා ලස්සනට පළඳින්න ගත්තාට ලස්සනට පැළඳලා එළියට යන්න බැරි රටක්, මේක. ඒක නිසා රටේ ආරක්ෂාව කොහේද තිබෙන්නේ?

පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධ ප්‍රශ්නයේදී මුදල් විශුද්ධිකරණයට අදාළව ඒ අයට මුදල් ලැබුණු ආකාරය ගැන බරපතළ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. වර්තමානය වනකොට හෙළිදරවු වෙන්න ඕනෑ දේවල් හෙළිදරවු වෙන්නේ නැතුව, හෙළිදරවු වෙන්නේ නැති දේවල් හෙළිදරවු කරගෙන නිකම් නාඩගම් නටන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක නිසා මේවා වෙනස් විය යුතුයි. මේ ක්‍රියාදාමය තුළ රට වෙනස් වන ආකාරය ගැන අපි විශේෂයෙන් බලන්න ඕනෑ.

ඒ වාගේම මෙතැනදී හොඳ අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. 2007 වර්ෂයේදී සංශෝධනය කරපු අවස්ථාවේදී සියලු සමාගම් අවලංගු කරලා තිබෙනවා, අලුතින් ලියාපදිංචි වෙන්න කියලා. ඒ අවස්ථාවේ ලියාපදිංචි වුණේ නැති සමහර සමාගම් තිබුණා. තමන්ගේ අඩුපාඩුවක් හෝ මොකක් හෝ කාරණයක් නිසා ලියාපදිංචි වුණේ නැති සමාගම්වල දේපළ රජයට පැවරිලා තිබෙනවා. හැබැයි, මේ සංශෝධනයත් එක්ක අවස්ථාව දීලා තිබෙනවා, ඒ අයට නැවත වතාවක් අධිකරණයට ගිහිල්ලා, එදා වත්කම්වල යම්කිසි ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා නම් ඒක නිරාකරණය කරගන්න. අධිකරණයෙන් නියෝගයක් අරගෙන නැවත වතාවක් ලියාපදිංචි වෙන්න අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. මේකෙන් ඒකත් සිදු වෙනවා.

මම විශේෂයෙන් ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ රජයක් හැටියට මේ රටේ වැඩ කටයුතු කරද්දී මේ සම්බන්ධව ගන්න පියවර හොඳට හිතලා මතලා ඉදිරි කාලයේදී ගන්න කියලායි. අපි අරගෙන බලමු, මේ රටේ ව්‍යාපාර කණ්ඩායම්. මොන සමාගම් ලියාපදිංචි කළත්, අපි නියාමනයක් දැම්මත් ඒ අය ලියාපදිංචි විය යුතුයි, සියලු දේ පෙන්විය යුතුයි කියලා -ඒ සියලු කාරණා කළාට- මොකක්ද රටේ සමාගම්වලට දීලා තිබෙන සහන? ඒවාට බදු සහනයක් දීලා තිබෙනවාද? එහෙම නැත්නම් අමුද්‍රව්‍ය ගෙනෙන්න අවශ්‍ය සහනයක් ලබා දීලා තිබෙනවාද? ප්‍රවාහනය සම්බන්ධව හෝ අඩු ගණනේ electricity bill එක සම්බන්ධව හෝ සහනයක් ලබා දීලා තිබෙනවාද? ප්‍රවාහනය සම්බන්ධව, ඉන්ධන සම්බන්ධව සහනයක් ලබා දීලා තිබෙනවාද? විශේෂයෙන් කම්කරුවාගේ වැටුපේ ඉඳලා ඒ වැඩ පිළිවෙළට අවශ්‍ය සහයෝගයක් ලබා දීලා තිබෙනවාද? විශේෂයෙන්ම ඒ අය යම්කිසි ක්‍රියාමාර්ගයකට යොදවන්න පුළුවන් දැනුම ඒකරාශි කරගත් වැඩපිළිවෙළක් අපි සකස් කරලා දීලා තිබෙනවාද? අපි රටේ මේ කිසි එකක් සකස් කරලා දීලා නැහැ. එහෙම සකස් කරලා දෙන්නේ නැතුව ව්‍යාපාරිකයෙක් එහෙම නැත්නම් සමාගමක් ලියාපදිංචි කරනකොට නීති-රීති දාලා, හිරකරලා, ජාත්‍යන්තර සම්මුති එක්ක සම්බන්ධ වෙලා ඒ අයට ඕනෑ විධියට රටේ සියල්ල වෙනස් කරනවා වෙනුවට, මේ රටේ ප්‍රායෝගිකව වැඩ කරන මිනිස්සු, මේ රටේ නිෂ්පාදනය කරන, මේ රටේ ආර්ථිකයට ශක්තිය ලබා දෙන මිනිස්සු ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් සඳහා රජය ක්‍රියාත්මක විය යුතුයි. ඒ නිසා මේ සංශෝධන කරනවාත් එක්කම අපි ඉදිරිපත් කරන්න ඕනෑ, රටේ ඊළඟ ක්‍රියාදාමය ලෙස මොනවාද ඒ අය වෙනුවෙන් කරන්නේ කියන එක.

ආර්ථික වශයෙන් රට ඉස්සරහට යන්නේ නැහැ. 2028 වෙද්දි අපි ණය ගෙවන්න ඕනෑ. හැබැයි, අපි ණය ගෙවන්න සූදානම්ද? අපි ඒකට ශක්තිමත්ද? ඒකට අපේ සංචිත ශක්තිමත්ද? ඒ ණය ගෙවනකොට රටේ ඉදිරි වැඩකටයුතු වෙන්නේ කොහොමද? අපට මුදල් තිබෙනවාද, රටට අත්‍යවශ්‍ය බඩු ටික පිට රටින් ගෙන්වන්න? එහෙම තිබෙනවා නම් අපි සූදානම් කියන්න පුළුවන්. දැන් 2025 අවුරුද්ද. තව අවුරුද්දයි තිබෙන්නේ, අපට ඒ වැඩ පිළිවෙළට එකතු වෙන්න. නමුත් කෝ, ඒ ශක්තිය අපි ලබා ගෙන තිබෙනවාද? හැබැයි, අපි මෙතැන මරා ගන්නවා; ගහ ගන්නවා; එක එක විධියට මඩ ගහගන්නවා. කෝ ප්‍රතිඵල? රටට ප්‍රායෝගික ප්‍රතිඵල එන්න ඕනෑ. මම විශේෂයෙන්ම ඒ කාරණය මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මතක් කළ යුතු විශේෂ කාරණයක් තිබෙනවා. අපි දන්නවා, කෙහෙළිය රඹුක්වැල්ල ප්‍රමුඛ කණ්ඩායම සෞඛ්‍ය ප්‍රශ්නය නිසා කොහේද ඉන්නේ කියලා. එදා හොර බෙහෙත් කිව්වා, වතුර බෙහෙත් කිව්වා. අපි ඒ ගැන හොඳටම සටන් කළා. අපි එදා නිලධාරින් වෙනුවෙන් සටන් කළා. අපි සටන් කරලා ඒ ගොල්ලන් වෙනුවෙන් කථා කෙරුවා. ඒ නඩු දාලා තිබෙන්නේ, අපේ කාලයේ. ඒ නඩු දාලා අද වෙනකොට ඒ අය වැරැදිකාරයන් වෙලා තිබෙනවා. අද ඊට වඩා ප්‍රශ්නයක් තිබෙනවා, සෞඛ්‍ය අංශයේ. බෙහෙත් සහ විශේෂයෙන් සෞඛ්‍ය උපකරණ සම්බන්ධ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේ බලන්න, 2025 ජුලි 22 දින "ඩේලි මිරර්" පත්තරේ මොනවාද තිබෙන්නේ කියලා. එහි මෙසේ සඳහන් වෙනවා:

"Medicines in short supply hit patients hard"

මොකක්ද ඒකෙන් කියන්නේ? රෝගීන්ට මොකක්ද වෙලා තිබෙන්නේ? බෙහෙත් හිඟය නිසා අද රෝගීන්ට මොකක්ද වෙලා තිබෙන්නේ? මේකේ විස්තරාත්මකව ඒ තොරතුරු දාලා තිබෙනවා, මොනවාද හිඟ බෙහෙත් ටික, ඒ හිඟ බෙහෙත් නිසා මොකක්ද රටේ සිදු වන්නේ කියන එක. එතකොට අපි මේ දේවල් කොතැනකදී හරි ගණනය කරලා තිබෙනවා ද? දැන් බෙහෙත් නැතිව, සෞඛ්‍ය වෛද්‍ය උපකරණ ලබා ගන්න බැරිව මැරෙන සංඛ්‍යාව අපි කවදා හරි ලකුණු කරලා තිබෙනවා ද? එතකොට දැන් මේක අපරාධයක්, මිනී මැරුමක් වෙන්නේ නැද්ද? අපි සෞඛ්‍ය ඇමතිතුමාට විශේෂයෙන්ම මීට පෙරත් මේ කාරණාව කිව්වා. NMRA එකේ සභාපතිවරයා ඇතුළු කණ්ඩායම අද වෙනකොටත් මේ රටේ දේශීයව නිෂ්පාදනය කරන නිෂ්පාදන ටික මේ රට ඇතුළේ පාවිච්චි කරන්නත්, විදේශ රටවලට අපනයනය කරන්නත් අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලා, ඒ ලියා පදිංචි කරන වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ නැහැ, මේ කියන විධියට සමාගම් ලියා පදිංචි කරනවා කිව්වත්. ඒකවත් කරන්නේ නැහැ. අද බෙහෙත් හිඟයක් ඇති වෙලා තිබෙන්නේ ඇයි? බෙහෙත් හිඟය සහ වෛද්‍ය උපකරණ හිඟය ඇති වෙලා තිබෙන්නේ මෙන්න මේ ප්‍රශ්න නිසා. ඒ නිසා NMRA එකේ සභාපතිවරයා සුදුසුකම් ලත් කෙනෙක් ද, එයාගේ දේශපාලන වාතාවරණය කුමක්ද, එයා කොයි ආකාරයෙන් වැඩ කරන කෙනෙක් ද කියන එක විමර්ශනය කරන එක ඉතාම වැදගත්.

ඒ නිසා අපි සෞඛ්‍ය ඇමතිතුමාට මේ අභියෝගය බාර දෙනවා. මතක තියා ගන්න, මේ අඩු පාඩු නිසා මේ රටේ මිය යන්නේ අහිංසක මිනිස්සු. අහිංසක රෝගීන් තමයි මිය යන්නේ. ලෙඩට දුකට ඕනෑ කරන බෙහෙත් ටික ගන්න බැරි නම් කොහොමද ඒ මිනිස්සු ජීවත් වෙන්නේ? ඒ නිසා අපේ රටේ රෝගියෙකුට අවශ්‍ය බෙහෙත් ටික මිලදී ගන්න බැරි අවස්ථාවක් ඇති කරන්නේ කවුද? ඒක කරන්නේ නිලධාරින්. මේ තැන්වල හොඳ නිලධාරින් ඉන්නවා. එම නිසා මේ තැන්වලට ඒ දක්ෂ නිලධාරින් දාලා මේවා ක්‍රියාත්මක කළ යුතුයි. එහෙම ක්‍රියාත්මක නොවීමේ වරද නිසා මතක තියා ගන්න, මේ රටේ මිය යන්නේ අහිංසක මිනිස්සු; දුප්පත් මිනිස්සු. ඒ අය තමයි මුදල් නැතිව, රටින්වත් බෙහෙත් ගෙන්වා ගන්න බැරිව අසරණ වෙන්නේ. ඒ නිසා මේ ගැනත් සොයා බලන්න කියලාත් විශේෂයෙන්ම අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට කාලය ලබාදීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුනිල් කුමාර ගමගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.56]

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද අපි මේ සාකච්ඡා කරමින් සිටින්නේ 2007 අංක 7 දරන සමාගම් පනතට සංශෝධනයක් විධියට කරන අර්ථලාභී අයිතිය - beneficial ownership - සම්බන්ධ පනත් කෙටුම්පත පිළිබඳවයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම මේ සමාගම් පනතට මේ කරන වෙනස, මේ එකතු කිරීම හරහා අපි බලාපොරොත්තු වෙන්නේ මෙයයි. මේ සමාගම්වල ඉන්න අධ්‍යක්ෂවරු, ඒ වාගේම මේ කටයුතුවලට සම්බන්ධ වන කොටස් හිමියන් සහ අනෙකුත් පාර්ශ්ව, වෙනත් අයිතිවාසිකම් තිබෙන පාර්ශ්ව සම්බන්ධ තොරතුරු එකතු කරලා, මේ කටයුතු නිසි පිළිවෙළකට, නිසි ක්‍රියාවලියකට ගේන්න තමයි අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. අපි විශ්වාස කරනවා, අපි පිළිගන්නවා, අපේ රටේ ව්‍යාපාරිකයන් ආයෝජනය කරනවා නම්, ව්‍යාපාර ආරම්භ කරනවා නම්, සමාගම් ලෙස ලියා පදිංචි වෙනවා නම්, ආයතන ව්‍යුහයට ඇතුළත් වෙනවා නම් ඒක ඉතාම හොඳයි කියලා. ඒක හොඳ ලක්ෂණයක්. එතකොට අපි මේ කරන්නේ ඒ ආයතන ක්‍රියාවලියට ඇතුළත් වන අය, එහෙම නැත්නම් ඒ ආයෝජකයන් අධෛර්යවත් කිරීමක් නොවෙයි. ඒකයි අපි මේකෙන් හරියටම තේරුම් ගන්න ඕනෑ. අපි මේ කරන්නේ මොකක්ද? ඒ අය හරියටම නිවැරදි ව්‍යාපාරිකයෝ ද, ඒ අය ඇත්ත ව්‍යාපාරිකයෝ ද, ඒ අයගේ තොරතුරු මොනවාද කියලා හරියටම තොරතුරු එකතු කරගන්න වැඩේට තමයි මේ සංශෝධනය අපි ගෙනැල්ලා තිබෙන්නේ.

ඇයි අපි මේ පනත් කෙටුම්පත ගේන්නේ? අපේ සමාගම් පනතට මේ වාගේ සංශෝධනයක් අවශ්‍ය වෙන්නේ ඇයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? අපේ රට කාලයක් තිස්සේ - දශක ගණනක් තිස්සේ - වංචාකාරයන්ගේ, හොරුන්ගේ, නීති විරෝධී ව්‍යාපාරිකයන්ගේ තිප්පොළක්, ගුබ්බෑයමක් බවට පත් වෙලා තිබුණු බව අපි දන්නවා. ඒ වාගේම, කළු සල්ලි උපයන අය, ටෙන්ඩර් මගඩිවලින් මුදල් උපයන අය, රාජ්‍ය දේපළ කොල්ල කන අය වාගේ විශාල පිරිසක් අපේ රටේ හිටියා. ඒක නිසා අපේ මේ ආයතන පද්ධතිය යම්කිසි දූෂණයකට, විනාශයකට, පරිහානියකට ලක් වෙලා තිබෙනවා. ඒක ඇතුළේ තමයි මේ සමාගම් කියන ඒවාත් ඒ තැනට පත්වෙලා තිබෙන්නේ.

ඉතින්, ඒවා යම් කිසි නීත්‍යනුකූල ක්‍රියාවලියකට යොමු කරන්න තමයි අපි මේ උත්සාහ ගන්නේ. නීති විරෝධී දේවල් සිදු නොවන විධියට හරියට නීති හදලා, අපේ රට ඉස්සරහට ගෙන යන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් තමයි සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ, කොටස් හිමියන්ගේ, එහෙම නැත්නම් අර්ථලාභීන්ගේ අයිතිය ප්‍රකාශ කිරීම සහ හෙළිදරව් කිරීම කියන කාරණය සම්බන්ධයෙන් අපි මේ පනත සංශෝධනය කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාර්යය අපට වැදගත් වෙන්නේ ඇයි? අපේ ආණ්ඩුව පටන් ගන්නකොටම අපි සංකල්පයක් ගෙනාවා; ඒ තමයි, Clean Sri Lanka කියන concept එක. එතකොට අපි මොනවාද clean කරන්නේ? මේ Clean Sri Lanka ව්‍යාපෘතියේත් ඇතුළත් එක කොටසක් තමයි මෙන්න මේ වාගේ සමාගම් ඇතුළේ මේ නීත්‍යනුකූලභාවයන් තුළ තිබෙන නිවැරදිභාවය සහ පිරිසිදුභාවය ආරක්ෂා කරන එක. එතකොට මේක ඒ ව්‍යාපෘතියේ කොටසක් විධියටත් අපට ගන්න පුළුවන්. මොකද, අපි ඒක ඇතුළේ කථා කරනවා, ethics ගැන, විනිවිදභාවය ගැන, ආයතනවල නීත්‍යනුකූලභාවය ගැන. මෙන්න මේ කාරණා ටික අපි දැන් ටිකෙන් ටික, ටිකෙන් ටික අපේ නීතිමය අණ පනත්වලට ඇතුළු කරනවා. අපේ රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රය, සමාගම් ක්ෂේත්‍රය හොඳ විනිවිදභාවයක් තිබෙන, හොඳ clean businesses බවට පත් කරන ව්‍යාපෘතියේ එක කොටසක් විධියට තමයි මෙන්න මේ සමාගම් පනතට අපි මේ සංශෝධන ඇතුළත් කරන්නේ. අපේ රටට clean businesses ඕනෑ, clean ව්‍යාපාරිකයෝ ඕනෑ. අපේ රට clean වෙන්නේ එතකොට. ඒ නිසා අපි මේකට කලබල වෙන්න ඕනෑ නැහැ කියලා මම හිතනවා. මේ වාගේ සංශෝධන ගෙනාවාම කවුරුවත් කලබල වෙන්න ඕනෑ නැහැ. මොකද, clean කරනකොට කවුරු හරි කලබල වෙනවා කියන්නේම පොඩි කැල්ලක් ඒක අස්සේ තිබෙනවා කියන එක, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ නිසා, මේ පනතට සංශෝධන ගෙනාවාම, අර අපි කථා කරන clean කිරීමේ කාර්යය කරන්න පුළුවන්. ආයතන, සමාගම් සුද්ධ කරලා, clean කරලා, "මරු", "ටොප්" සමාගම් කියන තැනට ගෙනෙන්න පුළුවන්. ඒවායේ හොරු නැහැ, හැංගිච්ච මිනිස්සු නැහැ, කුඩු විකුණා සල්ලි හොයාගෙන invest කරපු shareholdersලා නැහැ කියලා තහවුරු කර ගන්න පුළුවන්, මේ පනතට මෙන්න මේ වාගේ සංශෝධන ගෙනාවාම. ඒ නිසා විපක්ෂයේ මහත්වරු වුණත් මේ ගැන එච්චර කලබල වෙන්න ඕනෑ නැහැ කියලායි මම කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අර්ථලාභීන්, ඒ වාගේම අධ්‍යක්ෂවරු, කොටස් හිමියන් තමන්ගේ ප්‍රාග්ධනය උපයා ගත් ආකාරය පවා මේ පනත හරහා හෙළිදරව් වෙනකොට, කිසි ප්‍රශ්නයක් නැහැ. මේ නිසා ආයෝජකයන් අධෛර්යවත් වෙනවා, සමාගම්වල ආයෝජනය කිරීමේ නීති තද කරලා තිබෙනවා, ඒ නීති තද කරනකොට මිනිස්සු ආයෝජනය කරන්න පෙලඹෙන එක අඩු වෙනවා කියලා කවුරු හරි තර්ක කරන්න පුළුවන්. නීති තද කරනකොට ආයෝජනය කරන්න පෙලඹෙන්නේ නැති අය කවුද? ආයෝජනය කරන්න පෙලඹෙන්නේ නැත්තේ තමන් මුදල් උපයා ගත්ත ආකාරය අනාවරණ කරන්න බැරි මිනිස්සු, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. තමන් මුදල් උපයා ගත්ත ආකාරය අනාවරණ කරන්න පුළුවන් නම්, ඒ මුදල් උපයා ගැනීම රාජ්‍යය ඇතුළේ නීත්‍යනුකූල නම්, ඒ උපයා ගත්ත මුදල්වලට ඒගොල්ලන් බදු ගෙවලා තිබෙනවා නම්, ඒ උපයා ගත්ත ධනය සම්බන්ධයෙන් කාටවත් ප්‍රශ්නයක් එන්න විධියක් නැහැ. ප්‍රශ්නය එන්නේ කාටද? ප්‍රශ්නය එන්නේ, අර අපේ රටේ දශක ගණනක් හිටපු මැති ඇමතිවරු ඇතුළු චෞර කල්ලියට සහ ඒගොල්ලන්ගේ වක්ගෝලයන්ට, හිතවතුන්ට, නෑයන්ට. මේ වාගේ කටයුත්තකදීත් සමහර අය කලබල වෙනකොට, අන්න ඒක තමයි අපට දැන් මේ දකින්න හම්බ වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඕනෑම නීති විරෝධී වැඩක් කරලා, - මත්ද්‍රව්‍ය විකුණලා, එහෙම නැත්නම් හොරකම් කරලා - උපයා ගන්නා මුදල් clean කර ගන්න අපි අවස්ථාවක් දෙන්නේ නැහැ. අපේ භාෂාවෙන් කිව්වොත්, කළු සල්ලි උපයන්න අවස්ථාව දීලා ඒවා clean කරගන්න අපි අවස්ථාව දෙන්නේ නැහැ. මොකද, අනෙක් පැත්තට ගත්තාම ඒක එවැනි ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමට, එවැනි හොරකම්, එවැනි නීති විරෝධී කටයුතු තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට උදව්වක් වෙනවා, ඒ උපයන මුදල් - කළු සල්ලි - නීත්‍යනුකූල මුදල් බවට පත් කරන්න අපි කටයුතු

සැලසුවොත්. ඒ නිසා අපි කිසිම වෙලාවක නීති විරෝධීව උපයන මුදල් නීත්‍යානුකූලභාවයට හරවන්න අවශ්‍ය කරන ලිහිල් සංශෝධන ගෙනෙන්නේ නැහැ. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. මොකද, එහෙම කළොත් අපි එවැනි ව්‍යාපාර promote කරනවා කියන එක තමයි අනෙක් පැත්තෙන් කියැවෙන්නේ. අපේ ප්‍රතිපත්තිය ඒක නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දන්නා රාජ්‍ය නිලධාරින් ඉන්නවා. ඒගොල්ලන් බිලියනපතියෝ වෙලා ඉන්නවා. ඒගොල්ලන් ආයතනයක වැඩ කරපු එක විතරයි කරලා තිබෙන්නේ. ඒගොල්ලන් රුපියල් ලක්ෂයක, දෙකක වැටුපක් අරගෙන බිලියනපතියන් වෙන්නේ කොහොමද? ඒ වාගේ අය මේ සමාගම්වල ආයෝජනය කර තිබෙන්නේ, ලොකු ව්‍යාපාරිකයෝ වෙලා තිබෙන්නේ කොහොමද? ඒවාත් මේ වාගේ කාරණා ඇතුළේ අපි හොයා ගන්න ඕනෑ. අපේ රටට වුණු සමස්ත විනාශයේ කොටස හොයා ගන්න ඕනෑ. මේ වාගේ පනතක් සංශෝධනය කිරීම ඇතුළේ එවැනි දේවල් පවා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ලෝකයේ සමහර රටවල ව්‍යාපාර ආරම්භ කරන්න හරි පහසුයි. නිවැරදි ක්‍රමවේද තිබෙනවා. නිශ්චිතයි. නමුත්, අපේ රටේ මේක පොඩ්ඩක් ගැටලු සහගත තත්ත්වයට පත් වෙලා තිබෙනවා. නමුත්, අපි ඉදිරි කාලයේදී මේ වාගේ සංශෝධන සහ අලුත් පනත් හරහා අපේ රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රයත් clean කර ගන්න ප්‍රබල උත්සාහයක යෙදෙනවා. අපි එහෙම කරන්නේ ඇයි? අපි දන්නවා, "B-READY" කියන index එක ලෝකයේ තිබෙන බව. ඒක තමයි ලෝකයේ සමහර ව්‍යාපාර ආයතන ආර්ථිකයේ මිනුම් දණ්ඩක් විධියට පාවිච්චි කරන්නේ. නමුත්, මේ B-READY Index එකට අපි තවම ඇතුළත් වෙලා නැහැ. රටවල් 50ක් විතරයි මූලික වටයේ ඒකට ඇතුළත් වෙලා තිබෙන්නේ. මේ අවුරුද්දේ අපිව ඒකට review කරමින් ඉන්නවා. සමහර විට මේ අවුරුද්දේ අපිව ඇතුළත් වෙන්න පුළුවන්. එහෙම බැරි වුණොත් ඊළඟ අවුරුද්දේ හරි අපි මේකට ඇතුළත් වෙන්න ඉඩ තිබෙනවා. ඒගොල්ලන්ගේ නිර්දේශයක් තිබෙනවා. ඒගොල්ලන් කියනවා, B-READY Index එකට රටක් ඇතුළත් වෙන්න ඒ රට කොටස් තුනක් ඉෂ්ට කරන්න ඕනෑ කියලා; ඒවා three pillars වශයෙන් ඒගොල්ලන් සඳහන් කරනවා. ඒකේ එකක් තමයි, Regulatory Framework කියන එක. මේ Regulatory Framework කියන්නේ, B-READY Index එක ඇතුළේ ඒගොල්ලන් බලාපොරොත්තු වනවා, quality of business law and rules කියන එක. ඒ කියන්නේ, රටකට තිබෙන්න ඕනෑ quality business law එකක්, quality business rules. ඒවා අද ජාත්‍යන්තරය බලාපොරොත්තු වන දේවල්. මේ regulatory frameworks ශක්තිමත් කරනකොට, ඒවායේ විනිවිදභාවය වැඩි වනකොට, ලෝකයේ පිළිගැනීම වාගේම අපි බලාපොරොත්තු වන ජාත්‍යන්තර සංවිධානවල පිළිගැනීමටත් අප ළක් වෙනවා. ඒ වාගේම B-READY Index එකේ තිබෙනවා, Public Services කියන pillar එක. අපි public services දියුණු කරන්නේ කොහොමද? ඒ වාගේම ඒගොල්ලන් බලාපොරොත්තු වනවා, Operational Efficiency කියන එක. අපට මේවා තහවුරු කරන්න පුළුවන් වෙන්නේ මේ වාගේ පනත් කෙටුම්පත් හරහා විතරයි. ඒ නිසා, මේක අපේ රට ඉදිරියට ගෙන යන්න අපි ගන්නා පියවරයන්හි එක අවස්ථාවක් කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි ව්‍යාපාරිකයන්ට දීලා තිබෙන සහන මොනවාද කියලා අපේ මන්ත්‍රීවරයකු ප්‍රශ්න කළා. මට ඊයේ මුණ ගැහුණා, ලංකාවේ ප්‍රධාන පෙළේ ක්‍රීඩා උපකරණ අලෙවි කරන ව්‍යාපාරික මහතෙක්. එතුමා කියනවා, "ඇමතිතුමා, හරි සන්තෝෂයි, අපි දැන් නිදහසේ බිස්නස් කරනවා, කවුරුවත් අපෙන් දැන් කප්පම් ඉල්ලන්නේ නැහැ" කියලා. අපේ රටේ ව්‍යාපාරිකයන්ට අපි දීපු ඒ සහනයම ඇති කියලා මම හිතනවා. ඒක තමයි අපි දීපු සහනය. අපි කිව්වේ, "ඔයගොල්ලන් ව්‍යාපාර කරන්න, අපි ආණ්ඩුව කරන්නම්, ඔයාලාගෙන් අපට රුපියලක්වත් එපා, ඔයාලා අපේ ආර්ථිකය හදන්න, අපේ රට හදන්න" කියලා. ඒ මිනිස්සු දැන් ඒකට සතුටු වනවා. හැබැයි මේගොල්ලන් අහනවා, ව්‍යාපාරිකයන්ට අපි මොනවාද කළේ කියලා. ඒ වාගේම එම මන්ත්‍රීවරයා සඳහන් කළා, අපේ රට ආර්ථික වශයෙන් ඉස්සරහට යන්නේ නැහැ කියලා. මම එතුමාට යෝජනා කරනවා, රූපවාහිනී සංවාදයකට එන්න කියලා. අපේ රටේ ආර්ථිකය ඉස්සරහට ගිහිල්ලා තිබෙනවාද, නැද්ද කියලා අපි සාකච්ඡා කරමු. එතකොට අපි කථා කරමු. මේ රටේ මිනිස්සු දන්නවා, දැන් අපේ රටේ ආර්ථිකය ඉස්සරහට යන බව. අපේ සංචාරක ව්‍යාපාරය වර්ධනය වනවා, අපනයන වර්ධනය වනවා, අපේ විදේශ ප්‍රේෂණ වැඩි වෙනවා. නමුත්, එතුමා කියනවා, අපේ රට ඉස්සරහට යන්නේ නැහැ කියලා. අපි ඒ ගැන එළියේදී කථා කරමු. මොකද, මේ, ඒකට අවස්ථාව නොවන නිසා. ඒ වාගේම, -

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා වෙන වෙලාවක කථා කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙන්නේ, ඔබතුමා කථා කරන්න.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
අනෙක් කාරණය තමයි, අපි කථා කරන operational efficiency කියන එක. මේ ආයතනවල නිලධාරින් වැඩ කරන සමහර ක්‍රමවේද පරණ විධියටම තමයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි ඒවාත් වෙනස් කරගෙන, ඒ අයගේ ඔළුත් හදාගෙන යන්න ඕනෑ. මොකද මේ ආයතනවල සමහර නිලධාරින් ඉන්නවා, ඔවුන් සමඟ කථා කරන්න බැහැ, දුරකථන ඇමතුමක් answer කරන්නේ නැහැ, අපේ ප්‍රශ්නයකට යොමු වෙන්නේ නැහැ. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරින්ගේ ගැටලු ගැන මට අදත් කිහිපදෙනෙක් කිව්වා. ඒවා ගැනත් අපි මේ එක්කම සාකච්ඡා කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මම අද හරි ආශාවෙන් ගරු විපක්ෂ නායකතුමාගේ කථාව අහගෙන හිටියා. මම හිතුවා, සමාගම් පනත සම්බන්ධයෙන් එතුමාගෙන් කරුණු ටිකක් ගන්න පුළුවන් වෙයි කියලා. නමුත්,

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

එතුමා හරි දක්ෂ කථිකයෙක් නිසා, සමාගම් පනත ගැන කිසිම දෙයක් කථා කරන්නේ නැතුව මේ සම්බන්ධව එතුමාගේ සාකච්ඡාව කළා. මම හිතන විධියට, ඒකත් එතුමාගේ දක්ෂකම. මාතෘකාව "සමාගම් පනත"; තහනම් වචනයත් "සමාගම් පනත".

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක නොකියා අනික් ඔක්කෝම කිව්වා.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ඔව්. ඒ ගැනත් සතුටු වෙමින්, මෙවැනි පනත් කෙටුම්පත් ඉදිරියටත් ගෙන ඒමට අපේ රජයට අවස්ථාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිමල් පලිහේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.11]

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දින අපි සාකච්ඡාවට භාජන කරන්නේ, 2007 අංක 7 දරන සමාගම් පනතට අදාළව සංශෝධන ගෙන ඒම පිළිබඳවයි. මෙම සංශෝධන තුළින් අපේක්ෂා කරන්නේ, අපි ආණ්ඩුව භාරගෙන මේ රට යම් ආකාරයකට ක්‍රමවත් විධියට පවත්වාගෙන යන්න අවශ්‍ය මූලික පහසුකම් සම්පාදනය කරමින්, නෛතික වශයෙන් යම් ආකාරයක දෝෂයක්, ඌනතාවක්, අඩුපාඩුවක් සිද්ධ වෙච්ච තැනක් තිබෙනවා නම් ඒවා නිවැරදි කර ගනිමින්, අපේ රට ඉදිරියට ගෙන යන්න අවස්ථාව සැලසීමයි. අප වාගේ රටකට ජාත්‍යන්තරය තුළින් හුදෙකලා වෙලා කොහොමටවත් කටයුතු කරන්න බැහැ.

1989 වර්ෂයේ සිට අපේක්ෂාවක් වෙච්ච, එහෙම නැත්නම් මෙම සංශෝධන හඳුන්වා දිය යුතුයි කියලා යෝජනා වුණාට, අවුරුදු 36ක් තිස්සේ එවැනි සංශෝධනයන්ට යන්නේ නැතුව ආණ්ඩු කිහිපයක්ම පසු කරගෙන ඇවිත්, අද විපක්ෂයේ ඉඳගෙන අපට උපදෙස් දෙන බොහෝ අයට මෙන්න මේ කාරණාව අමතක වෙලා තිබුණා වාගේම ඒක අමතක කරලා තිබුණා. ප්‍රධාන වශයෙන්ම මෙහිදී සාකච්ඡාවට භාජන වෙන්නේ, සමාගමක නෛතික පුද්ගලභාවය ඇතුළේ අවසාන වශයෙන් අර්ථලාභීන් හඳුනා ගැනීම කියන කාරණාවයි. සමාගමක් නීතිය ඉදිරියේ පුද්ගලයෙකු විධියට සලකන විට එම සමාගමේ අයිතිය තිබෙන්නේ කාටද කියන එක පිළිබඳව සොයා බැලීමක් කොහේවත් සිද්ධ වෙන්නේ නැහැ. නමුත්, සියලු සමාගම් ලියාපදිංචි කරන්න සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත බලය පවරා තිබෙනවා. ඒ වාගේම ඒ සමාගමේ කොටස්කරුවන්ගේ නාමයන්, එහෙම නැත්නම් ඔවුන් කවුද යන වග පිළිබඳව ලැයිස්තුගත කරමින් ලේඛන පවත්වා ගෙන යෑමත් ඔවුන්ගේ කාර්යභාරයක් වෙනවා. අද මේ ගෙන එන සංශෝධනවලට අනුව, ඒ තොරතුරු ලබා ගැනීම සහ පවත්වා ගෙන යෑම සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉතා ඉහළ බලයක් පැවරෙනවා. ඒ වාගේම පුරවැසියන්ට මේ තොරතුරු ලබා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා නම්, එය ඉල්ලා ලබා ගැනීමේ හැකියාවත් අද ගෙන එන සංශෝධන තුළින් ලැබෙනවා කියන කාරණාවත් මම මතක් කරන්න කැමැතියි.

ඇත්තටම අපි දන්නවා, ව්‍යාපාර ලෝකයේ රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා වාගේම පොදු හා පෞද්ගලික සමාගම්, හවුල් ව්‍යාපාර, තනි ව්‍යාපාර තුළ limited liability companies, එහෙම නැත්නම් සීමිත සමාගම් කියන ඒවා නීතිය ඉදිරියේ පුද්ගලයෙකු වශයෙන් සලකන බැවින්, ඒ තුළින් ආයෝජකයාට ලොකු රැකවරණයක් දෙනවා කියන විශ්වාසය සමාජගත වෙලා තිබෙන බව. ඒ තුළින් අදාළ සමාගමට, ව්‍යාපාරයට ප්‍රාග්ධනය රැස්කර ගැනීම, ණය ගැනීම, බදු සහන ලබා ගැනීම වාගේ කරුණු සඳහා අවශ්‍ය ප්‍රවේශ නෛතික පදනමින් සලසා තිබෙන අතරම, අනීතිකව ඒ තත්ත්වය අවභාවිත කිරීමක් මේ රට තුළ සිද්ධ වෙනවා කියන කාරණය තමයි ඉතිහාසය පුරා සොයාගෙන යන විට අපට පැහැදිලි වෙන්නේ. එහෙම නම් අර්ථලාභීන් පිළිබඳව සොයා බැලීම වැදගත් වෙනවා.

විශේෂයෙන්ම අපේ රට වාගේ රටකට විදේශ ආයෝජන ගෙන එන්න සහ විදේශිකයන් අපේ රට තුළ ආයෝජනය කරන්න යම් මැළිකමක් දක්වනවා නම් ඒකට මේකත් එක හේතුවක් වෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර වශයෙන් එකඟතාවට පත් වෙච්ච ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ අංක 24 ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අද දවසේ අපි මේ ගන්නා පියවර ඉදිරියේදී මේ රටේ ආයෝජන තවදුරටත් වැඩි කර ගැනීමට වාගේම ජනතාව තුළ විශ්වාසය තහවුරු කිරීමටත් එක හේතුවක් වෙනවා. ඒක අනිවාර්යයෙන්ම වැදගත් කාරණයක් විධියට මා මේ සභාවට මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අපි යම් විධියකට සලකා බැලුවොත්, "සීමිත" යන වචනය අනිසි ආකාරයට භාවිත කිරීමක් සිදු වනවා කියන කාරණාවත් මේ තුළම ගැබ්වෙලා තිබෙනවා. මෙවැනි සමාගම් ස්ථාපිත කිරීම තුළින් මුදල් විශුද්ධිකරණයත්, ඒ වාගේම ත්‍රස්තවාදී ව්‍යාපාර සඳහා මුදල් යෙදවීම කියන එකත් ඉතිහාසය පුරා සිද්ධ වන බවට සාක්ෂි තිබෙන නිසා තමයි ඒවා වැළැක්වීමට අවශ්‍ය සංශෝධන මේ පනත් කෙටුම්පත තුළින් ගේන්න අපි කටයුතු කරලා තිබෙන්නේ. මොකද අනිසි භාවිතය කියන එක ගත්තොත්, සමාගම "සීමිත" යන වචනය යොදා ගත්තාට, නෛතික පුද්ගලයෙකු වශයෙන් කටයුතු කළාට, මේ සමාගමට ප්‍රාග්ධනය සැපයුවේ කෙසේද, එය කුමන ආකාරයකින් උපයා ගත්තක් ද, අයිතිකරු කවුද යන්න පිළිබඳවත් නිශ්චිත කරුණු නැහැ. ඒ හින්දා එවැනි තත්ත්ව සමාජයට අවදානමක් ඇති කරනවා. ඒ හින්දා අනිවාර්යයෙන්ම මෙවැනි පුද්ගලයන් පිළිබඳව, එහෙම නැත්නම් අවසාන ප්‍රතිලාභීන්, අර්ථලාභීන් කවුද යන්න පිළිබඳ විස්තර මේ පනත් කෙටුම්පතට අනුව, නැත්නම් මේ සංශෝධනවලට අනුව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා දීම හෝ ඒ තොරතුරු සමාගම් ලේකම්වරයා වෙත තබා ගැනීම අනිවාර්ය වෙනවා.

ඒ වාගේම මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න කැමැතියි, මේ කාරණයත්. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය වාගේ එකක් ගත්තාම ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිත සහ විගණන ප්‍රමිතවලට අනුකූලව, අනුගතව ඒ ආකාරයෙන්ම ලංකාවේ ව්‍යාපාරික පරිසරයට, එහෙම නැත්නම් ආර්ථිකයට ගැළපෙන විධියට එවැනි ප්‍රමිතීන් සංශෝධනය කිරීමක්, ස්ථාපිත කිරීමක්, හඳුන්වා දීමක් සිද්ධ වෙනවා. නමුත් අපි දන්නා ඇත්ත කාරණය තමයි, සමාගමක ගිණුම්කරණය, විගණනය නීතියෙන් අනිවාර්ය කළත් අපට ලැබෙන තොරතුරු අනුව එසේ නියමාකාරයෙන්,

කාලානුරූපව විගණනයක් කරන බවක් හෝ ඒ වාර්තා අදාළ විධියට නියමාකාරව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා දීම සිද්ධ නොවන බව. එතකොට අද දවසේ කරන සංශෝධන තුළින් මේ සියලු තොරතුරු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත වාර්තා කිරීම ඔවුන්ට අනිවාර්ය කෙරෙනවා.

නැවතත් අපට කියන්න පුළුවන්, සමාජය තුළ අපි අපේක්ෂා කරන විශ්වාසය ගොඩනඟන්න මේ පනත් සංශෝධනය සෘජුව සහ වක්‍රව කියන දෙයාකාරයෙන්ම යම් ආකාරයකට බලපෑම් ඇති කරන බව. පසුගිය කාලයේ අපට විදේශ ආයෝජනවල ලොකු අඩුපාඩුවක් තිබුණා. මම හිතනවා, පසුගිය වසරේ අපට ලැබුණු විදේශ ආයෝජනවලට සාපේක්ෂව මේ වසරේ අපට ලැබුණු විදේශ ආයෝජන ඉතා ඉහළයි කියලා. මොකද, අද ජාත්‍යන්තරය තුළ මේ රජය පිළිබඳව විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. ජාතික ජන බලවේගයේ අපි මේ ආණ්ඩුව ස්ථාපිත කළාට පස්සේ මේ රටේ දේශපාලන ස්ථාවරත්වයක් ඇති වුණා වාගේම මේ රජය ජාත්‍යන්තර වශයෙන් ඉතා වගකීමෙන් යුක්තව කටයුතු කරන රජයක් බවට සහතික තිබෙන නිසා විදේශ ආයෝජන දිගින් දිගටම වැඩි වෙමින් පවතිනවා. මා විශ්වාස කරනවා, විදේශ ආයෝජන තවදුරටත් පුළුල් වෙන්න, ඉහළ යන්න මේ සංශෝධනත් හේතුවක් වන බව.

ඒ වාගේම වාර්ෂික වාර්තා පිළිබඳව යම් ආකාරයක සැකයක් තිබෙනවා නම්, දැනට තිබෙන තත්ත්වය යටතේ ඒ පිළිබඳව සොයා බලන්න Registrar of Companiesට කිසිම බලයක් නැහැ. මේ තොරතුරු අනාවරණය කර ගැනීම තුළ අද කරන මේ පනත් සංශෝධනයට යටත්ව Registrar of Companiesට ඒ නීති සහන ලබා ගැනීමේ හැකියාව තිබෙනවා, ඒ පිළිබඳව සොයා බලන්න අවශ්‍ය කරන වගකිව යුතු ස්ථානවලට ඒවා යොමු කිරීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මෙතෙක් කාලයක් -අවුරුදු 36ක්- අත්හැර දමා තිබුණු සුවිශේෂී වූ සංශෝධන මේ සමාගම් පනතට එක් කිරීමම අපි යම් ආකාරයකට අත් කරගත් සාධනීය තත්ත්වයක් කියලා. අපි මේ දේවල් තුළින් හුදෙක් බලාපොරොත්තු වෙන්නේ, නීතිය තද කරලා මිනිසුන් පාලනය කිරීම නොවෙයි. මේවා තුළට අවශ්‍ය සංශෝධන ගෙනැල්ලා යහපත් විධියට ව්‍යාපාර කරමින්, මේ රටේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන්න මිනිසුන්ව පෙළඹවීම තමයි මේ තුළින් අපි බලාපොරොත්තු වන්නේ. අපි බලාපොරොත්තු වන යහපත් මිනිසුන් ජීවත් වන මේ දේශය, එහෙම නැත්නම් ඒ සුන්දර රට නිර්මාණය කරන්න නම් මේ නීතියේ ක්‍රියාකාරිත්වය ඒ ආකාරයෙන්ම සිද්ධ වෙන්න අවශ්‍යයි. ඒ සඳහා අද අප සංශෝධනය කරන මේ නීති රීති මඟින් ඉහළ ආකාරයේ බලපෑමක් ඇති කරමින්, ඒ අඩුපාඩුකම් පිරිමසා ගනිමින් පරිපාලනමය වශයෙන් අවශ්‍ය දායකත්වය ලබා දීමට හැකි බවට අපට විශ්වාසයක් තිබෙනවා. ඒ සඳහා සියලුදෙනාම සහයෝගය පළ කරන ලෙස මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ නීති ක්‍රියාත්මක කිරීමේදීත් ඒ සඳහා අවැසි සහයෝගය ලබා දෙන්න කියාත් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.20]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අද දින ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ ප්‍රධාන පරමාර්ථවලින් එකක් තමයි, සමාගම්වලට මුවාවෙලා ත්‍රස්තවාදී කටයුතුවලින් ලබා ගන්නා වත්කම් අනාවරණය කිරීම නැත්නම් නීතියට හසුකර ගැනීමේ ප්‍රතිපාදන ලබා දීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ත්‍රස්තවාදය පිළිබඳව කථා කරනකොට අපට මතක් වන ප්‍රධානම ත්‍රස්තවාදී ක්‍රියාව තමයි, මෑතකදී සිදු වුණු පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය. පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය පිළිබඳව මේ ආණ්ඩුව පත් වූ අවස්ථාවේදී හෙළි නොකළ කරුණු සම්බන්ධයෙන් පළමුවන වතාවට තොරතුරු පළ වූයේ කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක බී 35882/24 යටතේ ඉදිරිපත් කරන ලද "බී" වාර්තාවෙනුයි. ඒක ඉදිරිපත් කළේ පසුගිය අවුරුද්දේ නොවැම්බර් 11වැනි දා. මේකේ මුල්ම වාර්තාව හැටියට තිබුණේ "Channel 4" නාළිකාවෙන් විකාශනය කළ අසාද් මවුලානාගේ හෙළිදරව්ව. ඊට පස්සේ, සිරිල් ගාමිණී පියතුමා විසින් තමන්ට ලැබුණු වට්ස්ඇප් පණිවුඩය සම්බන්ධයෙන් කරන හෙළිදරව්ව. ඒකත් තිබුණේ අසාද් මවුලානා ජිනීවා මානව හිමිකම් කවුන්සලයට ලබා දීපු සාක්ෂි මත. මේ සාක්ෂි මත සැකකරුවන් දෙදෙනෙකු හඳුනාගෙන තිබුණා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්. මේ දෙදෙනා විදේශගතවීම වැළැක්වීම සඳහා ඒ දෙදෙනාට විරුද්ධව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් නියෝගයකුත් අරගෙන තිබුණා. ඒ වෙන කවුරුවත් නොවෙයි, සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන් සහ සුරේෂ් සලේ. නමුත් අද දක්වා ඔවුන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමට හෝ ඔවුන් මෙම නඩුවේ සැකකරුවන් හැටියට අත්අඩංගුවට ගැනීමට හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියා කරලා නැහැ. ඉන් පසුව සාරා නමැති තැනැත්තිය මිය ගිය බවට පෙන්වන්නට උත්සාහ කළ අසාර්ථක ප්‍රයත්නය පිළිබඳවත් ඒකේ වාර්තා කරලා තිබුණා.

හැබැයි, වැදගත්ම ඉදිරිපත් කිරීම තමයි, වවුනතිව් ප්‍රදේශයේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරින් දෙදෙනා කෲර ලෙස ඝාතනය කර ඔවුන්ගෙන් අවි පැහැරගෙන යෑම. එම අවි පසුව සහරාන්ගේ කල්ලිය විසින් භාවිත කළ බවට පැහැදිලි සාක්ෂියක් තිබෙන බව එම "B" වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ සම්බන්ධයෙන් CID එකෙන් හොඳ වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම එහි සඳහන් නම් ටික කියන්න කැමති නැහැ. ඒකේ මෙහෙමයි කියන්නේ. මම එය උද්ධෘතය ඇතුළේ කියන්නම්. "මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කරමින් ශ්‍රී ලංකා යුද හමුදාවේ තුන්වන සන්නද්ධ බුද්ධි බලකායේ එවකට අණ දෙන නිලධාරි ලෙසින් කටයුතු කළ කර්නල් -මම නම කියන්න කැමති නැහැ- මඩකලපුව බුද්ධි අංශයේ ආරක්ෂක සමූහ නායකයා ලෙස කටයුතු කළ මේජර්, බුද්ධි නිලධාරි කපිතාන්, ..." අපේ විශ්‍රාමික මේජර් ජනරාල්, වීරවික්‍රම, විභූෂණ අරුණ ජයසේකර මහතා මේ වෙලාවේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. මේ ගැන පොඩ්ඩක් එතුමාත් දැනගෙන ඇති. ඒකේ ලස්සන කථාවක් කියනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. "විමර්ශනයට අදාළව ශ්‍රී ලංකා යුද හමුදාවේ බුද්ධි අංශ මණ්ඩලය භාරයේ ඇති -ඔත්තුකරුවෙකුගේ නමක් තිබෙනවා- විසින් ලබා දුන් තොරතුරු ඇතුළත් තොරතුරු ගොනුවේ පිටපතක් ගෙන්වා පරීක්ෂා කිරීමේදී එම පිටපතේ ගොනුවට අනුව 2015 වර්ෂයේදී මේ තොරතුරු ශ්‍රී ලංකා යුද හමුදාවේ තුන්වන සන්නද්ධ බුද්ධි බලකාය වෙත ලබා දී ඇති බව අනාවරණය වෙයි." ඒ අනුව එම ඔත්තුකරුගේ නම කියලා තිබෙනවා. "මේ ඔත්තුකරුවා සහරාන් හෂීම් ඇතුළු ඉස්ලාම් අන්තවාදීන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තුන්වන සන්නද්ධ බුද්ධි බලකාය වෙත ඉතා වැදගත් තොරතුරු ලබා දුන්නා යැයි සඳහන් කරමින්, ඒ බුද්ධි බලකායේ අණ දෙන නිලධාරි, බුද්ධි නිලධාරි, අනෙකුත් නිලයන්, සෙසු නිලයන් එම තොරතුර සම්බන්ධයෙන් නිසි පියවර ගෙන නොමැත. ඒ අනුව

[ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා]

ක්‍රියාත්මක වුණා නම් පාස්කු ප්‍රහාරය වැළැක්වීමට ඉඩ තිබිණි" කියලා එහි සඳහන් වෙනවා. කවුද මේ කියන්නේ? CID එකෙන්. ඒ කියන්නේ, අර ඔත්තුකරුගේ ප්‍රකාශය සත්‍ය බව ඔවුන් කියලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒක එතැනින් ඉවර වෙන්නේ නැහැ. එතැන තව කාරණයක් තිබෙනවා. ඒ අනුව, ඒ පස්දෙනාට විරුද්ධව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නියෝගයක් දීලා තිබෙනවා, "මෙහෙන් පැනලා යයි. ඒගොල්ලන්ගේ passports ටික impound කරන්න" කියලා. ඒක වෙන්නේ 2025 අප්‍රේල් මාසයේ. නමුත්, අද දක්වා ඒ බුද්ධි නිලධාරීන් එක්කෙනෙක්වත් අත්අඩංගුවට අරගෙනත් නැහැ, අධිකරණයට ඉදිරිපත් කරලාත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 115වන වගන්තිය යටතේ යම්කිසි පුද්ගලයෙකුගේ ප්‍රකාශයක් ලබා ගත් විට ඒ පිළිබඳව මහෙස්ත්‍රාත්තුමාට හෝ මහෙස්ත්‍රාත්තුමියට වාර්තා කරන්න ඕනෑ. නමුත් එහෙම කිසිම වාර්තා කිරීමක් සිදු කරලා නැහැ. ඒ විතරක් නොවෙයි. අන්තිමට මොනවාද වුණේ? වවුනතිව් ප්‍රදේශයේ උප පොලිස් පරීක්ෂක විජේනායක මහතාට දෙමළ භාෂාව පරිවර්තනය කිරීම සඳහා ගිය සාමාන්‍ය, අහිංසක සාජන් කෙනෙක්ව තමයි අල්ලලා ඉදිරිපත් කළේ. ඒක හරියට, "කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව" වාගේ වැඩක්. හමුදා බුද්ධි අංශයේ ප්‍රධානීන්, බුද්ධි අංශයේ අනෙකුත් කපිතාන්ලා, අණදෙන නිලධාරියා එළියේ. හැබැයි, ඒ අවස්ථාවේ නැඟෙනහිර පළාතේ SFHQsහි - Security Forces Headquartersහි - අණදෙන නිලධාරියා පාර්ලිමේන්තුව ඇතුළේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අනෙක් කට්ටිය ඔක්කෝම එළියේ. අර අහිංසක පරිවර්තකයා දැන් ඇතුළේ. ඒක හරියට, මම වැරදි කථාවක් කියනවා, මගේ කථාව interpret කරනවා, Interpretersලා ඇතුළේ ඉඳන්, ඔවුන්ව අල්ලලා වැරදිකාරයා කරලා වාගේයි. ඒ විධිය තමයි, කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුත්.

ඊට පස්සේ තව ලස්සන වැඩක් වුණා. ඒ පිළිබඳව ප්‍රශ්න කළාම මම හිතන්නේ ජනවාරි 07වැනි දා අපේ ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශයේදී එතුමා කියලා තිබෙනවා, "අපි බලයට පත් වුණාට පස්සේ ඒ විමර්ශනය නව අදියරයකින් ආරම්භ කර තිබෙනවා. එම විමර්ශනය තමයි, පසුගිය 2024 නොවැම්බර් 11වන දින කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 35882/24. ඒක තමයි, "B" වාර්තාව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
හොඳයි. තව කාලය ඕනෑ වුණොත් මම ඉල්ලා ගන්නම්. *[බාධා කිරීමක්]* තව මිනිත්තු දෙකක් මට විපක්ෂයෙන් ලැබෙනවා. ඒ අනුව මට තව මිනිත්තු හතරක් තිබෙනවා.

මේ වාර්තාව මෙච්චර කල් සේප්පුවේ හංගලා තිබුණේ. හැබැයි, අපට ලැබුණා. ඒකේ කියනවා, "දැනට විමර්ශන සිදු කරගෙන යනවා. මේ දක්වා කරන ලද විමර්ශන අනුව සිවිල් සාක්ෂිකරුවන් 12දෙනෙක්, හමුදා සාමාජිකයන් 7දෙනෙක්, පොලිස් නිලධාරීන් 26දෙනෙක්, බන්ධනාගාර නිලධාරීන් 3දෙනෙක් ඇතුළු 48දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කරගෙන තිබෙනවා" කියලා. අද අධිකරණ ඇමතිතුමාත් ගරු සභාවේ නැහැ. එතුමා හිටියා නම් මට ඒ ගැන අහන්න තිබුණා. ඒ 48දෙනාගෙන් එක්කෙනෙකුගේවත් සාක්ෂියක් මේ වාර්තාවේ නැහැ. කවුද මේවා නවත්වන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? මේ විමර්ශනයේදී විශේෂයෙන් නැඟෙනහිර පළාතේ බුද්ධි අංශයේ හමුදා නිලධාරින්ගෙන්, අණදෙන නිලධාරින්ගෙන්, කපිතාන්ලාගෙන් කටඋත්තර නොගන්නේ කවුද? ඒගොල්ලන්ව ඉදිරිපත් නොකරන්නේ කවුද? මේවා පිටුපස ඉන්නේ කවුද? ඒ අයව අධිකරණය ඉදිරියට ගෙනැවිත් සාධාරණ යුක්තිය ඉෂ්ට කර ගැනීම සඳහා කටයුතු කිරීම වළක්වන්නේ කවුද? Who is the big boss? யார் இந்த big boss? இந்தக் கள்வர்களை, இப்பயங்கரவாதத்தைத் திட்டமிட்டவர்களை, பயங்கரவாத விடயங்கள் சம்பந்தமாக இராணுவத்தினுடைய அதிகாரத்தை முழுமையாகப் பயன்படுத்தி, முஸ்லிமான சஹ்ரானின் பெயரைப் பாவித்துக்கொண்டு தங்களுக்குத் தேவையான அரசியல் நாடகங்களைச் செய்வதற்காக இந்த வேலைகளைச் செய்யும் அந்த big boss யார்? Big boss என்றால், அவர் ஒழிந்திருந்து வேலைகளைச் செய்வார். Big bossஐக் கண்டுபிடிப்பதற்கு நல்லதோர் உதாரணம் சொல்கின்றேன். I will give the method of finding this big boss; මම ඒ ගැන කියන්නම්.

2018 ඔක්තෝබර් 26වැනි දා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාව ධුරයෙන් පහ කරනවා. 2018 නොවැම්බර් 09වැනි දා එවකට මේජර් ජනරාල්, වීරවික්‍රම විභූෂණ අරුණ ජයසේකර නැඟෙනහිර පළාතේ හමුදා ඒකකයේ අණදෙන නිලධාරි හැටියට පත් වනවා. සති දෙකක්වත් නැහැ. ඉන් අනතුරුව තව සති තුනකින්, ඒ කියන්නේ 2018 නොවැම්බර් 30වැනි දා වවුනතිව් පොලීසියේ දෙදෙනෙක් මැරෙනවා. ඒ දෙදෙනා මැරුණාට පස්සේ එල්ටීටීඊ එකේ හිටපු අර අහිංසක අජන්තන් කියන පුද්ගලයා ඒක කළා කියලා පෙන්වන්න ලොකු නාඩගමක් කරනවා.

ඒ නාඩගම - ඒ drama එක - හැදුවේ හමුදා බුද්ධි අංශයයි, කොට්ඨාස බුද්ධි අංශයයි. ඒක තිබෙනවා මේ වාර්තාවේ. මම නිකම් කියන්නේ නැහැ. එහි තිබෙනවා, අර කොට්ඨාස බුද්ධි අංශයේ පොලිස් පරීක්ෂක සමන්ත අත්අඩංගුවට අරගෙන කියලා. හැබැයි, හමුදාවේ කවුරුත් අත්අඩංගුවට අරගෙන නැහැ. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

මම අවසාන වශයෙන් එක් කාරණයක් අහන්නම්. මට විශේෂයෙන් මේ JVP නායකයන්ගෙන් මේ කාරණය දැනගන්න ඕනෑ. අර වීර වික්‍රම විභූෂණ අරුණ ජයසේකර මහතා 1988-89 වකවානුවේ JVP එකට විරුද්ධව ඉතාම දැඩි ලෙස හමුදාව සමඟ එකතු වෙලා counter-insurgency operationsවල වැඩ කළා. ඒකටත් ප්‍රධාන පදක්කමක් තිබෙනවා. ඒ, 1988-89 කාලයේ. ඊට පස්සේ මහින්ද රාජපක්ෂ අගමැති වශයෙන් සිටි කාලයේ ඔහු නැඟෙනහිර හමුදා ආඥාපති වෙනවා. ඒකටත් සාක්ෂි තිබෙනවා. ඊට පස්සේ ඔහු විශ්‍රාම ගන්නවා 2019 නොවැම්බර් මාසයේ. ඊට පසු ඔහු ගැන තොරතුරක් නැහැ. ඔන්න, 2023 ඔබලා ආණ්ඩුවට එන බවට බුද්ධි අංශය දැනගන්නවා නේ ඔයගොල්ලන්ට ඉස්සරවෙලා. එකපාරටම මොහු හමුදාවේ විශ්‍රාමික නිලධාරින්ගේ සංවිධානයක් NPP එකේ හදාගෙන ඒකේ නායකයා වෙනවා, ඡන්ද අහන්නෙත් නැහැ, ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට එනවා. කෙළින්ම ජාතික ආරක්ෂාව භාරව ආරක්ෂක නියෝජ්‍ය ඇමති හැටියට පත් වෙනවා. ඔබතුමන්ලා පොඩ්ඩක් හොයලා බලන්න, කොහොමද මොහු එවැනි තනතුරක් අරගෙන මේ

පාර්ලිමේන්තුවට ගෙනාවේ කියලා. මේවා මෙහෙයවන big boss කවුද කියලා සොයාගන්න. කරුණාවෙන් සවන් දීලා මේ පිළිබඳව අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.31]

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ උගත් ගරු මන්ත්‍රීතුමාට පොඩි මතක් කිරීමක් කරන්න ඕනෑ. අපි අද විවාද කරන්නේ 2007 අංක 7 දරන සමාගම් පනත සංශෝධනය කිරීම පිළිබඳවයි. පසුගිය 09වැනි දා අපි පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන දවසක්ම විවාද කළා. හැබැයි, මෙකේ වාක්‍යයක් එනවා නේ, "ත්‍රස්තවාදයට මුදල් සැපයීම..." කියලා. ඔන්න ඔය වාක්‍යය අරගෙන අද පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන විවාදයක් අපට අහන්න ලැබුණා. හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විදේශිකයින් අපේ රට සූරා කෑවා. ඒ වාගේම තමයි නිදහසින් පසු අපේ රටේ ප්‍රධාන පාලක පක්ෂ වශයෙන් එකම පන්තියේ පක්ෂ දෙකක් තිබුණා. ඒ පක්ෂ දෙකේ පාලනය අපි දැක්කා. ඒ පක්ෂ දෙකේ පාලනය ගැන අපි දන්නවා. සමහර පනත් තිබෙනවා කාලයෙන් කාලයට සංශෝධනය වෙන්න ඕනෑ. දියුණුවත් එක්ක, නැත්නම් අඩු පාඩු හදන්න ඒ පනත් සංශෝධනය වෙන්න ඕනෑ. ඒ වාගේ පනතක් තමයි අද සංශෝධනය වෙන්නේ. කවදා හෝ සංශෝධනය කරන්න තිබුණු පනතක්, අපි ජනතාවට දීපු පොරොන්දුවත් එක්ක අපේ කාලය තුළ සංශෝධනය කරන්න අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, හොරකම් කරන සමහර අය ඉන්නවා, කෙළින්ම ගහලා, මරලා හොරකම් කරනවා. සමහර අය ඉන්නවා නීතිය පාවිච්චි කරලා, නීතියේ තිබෙන සිදුරු සොයාගෙන ඒ සිදුරු අස්සෙන් ගිහින් හම්බ කරනවා. ඒ වාගේම තමයි, සමහර සමාගම්වල කොටස් තිබෙනවා, ඒවා තමන්ගේ සේවකයින්ගේ නමින්, නැත්නම් පවුලේ ඥාතින්ගේ නමින් තමයි පවත්වාගෙන යන්නේ. මොකද, බදු ගෙවීම පැහැර හරින්න. ඉතින්, මේ පනත හරහා අපි ඒ අවස්ථාව ඉතාම අවම කරනවා. ඒ සඳහා තමයි අද මේ පනත සංශෝධනය වෙන්නේ.

இன்றைய கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம் பற்றிய விவாதத்தில் ஓரிரு வார்த்தைகள் கூற விரும்புகின்றேன். 2007ஆம் ஆண்டின் 7ஆம் இலக்க, கம்பெனிகள் சட்டத்தில் சில திருத்தங்களை நாங்கள் மேற்கொள்ள இருக்கின்றோம். அதாவது, இந்தச் சட்டமூலத்தினூடாக நாட்டு மக்களுக்குப் பொருத்தமான சில திருத்தங்களை நாங்கள் மேற்கொள்ள இருக்கின்றோம். ஏனென்றால், எமது நாட்டினுடைய பொருளாதாரம் மற்றும் சொத்துக்களை நாங்கள் பாதுகாக்க வேண்டும். இச்சட்டமூலம் சம்பந்தமாக எமது தரப்பின் சகோதர உறுப்பினர்கள் அதிகமானோர் வாதிட்டார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று முக்கியமான ஒரு நாளாகும். இதேபோன்ற ஒரு தினத்தில், அதாவது 1983ஆம் ஆண்டு யூலை மாதம் 23ஆம் திகதி நடந்த இனக் கலவரம் சம்பந்தமாப் பேசவேண்டிய சில விடயங்கள் உள்ளன. "Sri Lanka: The Holocaust and After" என்கின்ற புத்தகம் எல். பியதாச என்பவரால் வெளியிடப்பட்டது. இந்தப் புத்தகம் 1984ஆம் ஆண்டு தயாரிக்கப்பட்டது. இதில் எமது நாட்டில் 1983ஆம் ஆண்டில் நடைபெற்ற இனக் கலவரம் பற்றி அழகான ஒரு விளக்கத்தை அவர் குறிப்பிடுகின்றார். எங்களுடைய நாட்டில் 1983ஆம் ஆண்டு நடந்த கலவரத்தின் பிரதான நோக்கத்தை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும்.

கொழும்பு மாநகர சபையின் மேயராக இருந்தவரும் அன்றைய காலத்தில் ஐக்கிய தேசியக் கட்சியின் பொருளாளராக இருந்தவருமான கே. கணேசலிங்கம் என்பவர் ஊடகவியலாளர் விக்டர் ஐவன் அவர்களுடன் பேசும்போது சொன்ன ஒரு கூற்று ஞாபகத்துக்கு வருகின்றது. அதாவது, மக்கள் அரசாங்கத்துக்கு எதிராகத் திரும்ப முற்பட்டபோது, 1983ஆம் ஆண்டு யூலை மாதம் 23ஆம் திகதி கலவரத்தைப் பயன்படுத்தி மக்களைத் திசை திருப்பியதாக அவர் சொல்லியிருந்தார். அதேபோன்று, 'ஈஸ்டர்' தாக்குதல் நடைபெற்றபோதும் நடந்தது. அத்தாக்குதலை யாரும் தடுக்கவில்லை. அரசாங்கத்துக்கு எதிராக வரவேண்டிய எதிர்ப்பை முஸ்லிம் மக்கள்மீது திசை திருப்பினார்கள். அதாவது, அன்றைய அரசாங்கத்துக்கு எதிராகக் கிளம்பிய எதிர்ப்பை முஸ்லிம் மக்கள்மீது திசை திருப்பி பேரழிவைச் செய்தார்கள். தான் கூறிய அக்கருத்தை பத்திரிகையில் வெளியிட வேண்டாம் என்று கொழும்பு நகர சபையின் மேயராக இருந்த கணேசலிங்கம் அவர்கள் அன்றைய நாளில் விக்டர் ஐவன் அவர்களிடம் கேட்டுக்கொண்டாலும், "කළු ජූලියේ සැඟවුණු දූමාරය" என்ற articleஇல் 1993ஆம் ஆண்டு விக்டர் ஐவன் என்பவர் இது பற்றி தெளிவாகக் குறிப்பிடுகின்றார்.

ஐக்கிய தேசிய கட்சி மற்றும் பொதுஜன ஐக்கிய முன்னணி ஆகியன ஏனைய கட்சிகளோடு இணைந்து இந்த நாட்டில் ஆட்சி செய்தது நம் அனைவருக்கும் தெரிந்த விடயம். இனவாதத்தை மையமாகக் கொண்டதாகத்தான் அவர்களுடைய ஆட்சிக்காலம் முழுவதும் காணப்பட்டது. சிரேஷ்ட ஊடகவியலாளர் தர்மசிறி காரியவசம் அவர்களின் கூற்றுப்படி, கறுப்பு யூலை சம்பவத்தில் தமிழ் மக்கள் கிட்டத்தட்ட 4,000 பேர் கொலை செய்யப்பட்டார்கள். இலங்கையில் மக்களின் உரிமைகள் பற்றி பேசிய முக்கியமான 3 கட்சிகள் அக்கலவரத்தைத் தொடர்ந்து தடை செய்யப் பட்டன. குறிப்பாக, கம்யூனிஸ்ட் கட்சி, නව සම සමාජ கட்சி, ஜே.வி.பி என்பன தடை செய்யப்பட்டன.

அன்புக்குரிய தமிழ் மக்களுக்கு நான் ஒன்றைக் கூறுவதற்கு விரும்புகின்றேன். நீங்கள் இந்த நாட்டின் சொத்துக்கள்! நாங்கள் அனைவரும் நாட்டை ஒரேமாதிரியாக நேசிக்க வேண்டும்! தமிழ் மக்களைப் பாதுகாக்கவேண்டிய அரசாங்கமே அன்று தமிழ் மக்களுக்கு எதிராகக் கலவரத்தைக் கட்டவிழ்த்துவிட்டதன் விளைவாக நடைபெற்ற ஓர் இன அழிப்புத்தான் யூலை கலவரம். அந்தக் கலவரத்தின்போது தெற்குப் பகுதியில் வாழ்ந்த அநேக சிங்கள சகோதரர்கள் தமிழ் மக்களைப் பாதுகாத்தார்கள். ஜே.வி.பி. உடைய அங்கத்தவர்கள் தமிழ் மக்களைப் பாதுகாப்பதில் மிக முக்கிய பங்களிப்பைச் செய்தார்கள். ஒவ்வொரு மாவட்டத்திலும் மக்களைப் பாதுகாக்கும் நடவடிக்கைகள் அப்போது மேற்கொள்ளப்பட்டன. கொழும்பில் நடைபெற்ற அட்டூழியச் சம்பவங்கள் சில அரசியல் தலைவர்கள் ஊடாகத்தான் மேற்கொள்ளப்பட்டன என்பது மிகத் தெளிவாக அந்தப் புத்தகத்தில் குறிப்பிடப்பட்டுள்ளது. அதில் தெஹிவளை - கல்கிஸை மாநகர சபை உறுப்பினர் ஒருவரும் அடங்குவார். மேலும், புறக்கோட்டைப் பகுதியில் ஆர். பிரேமதாசவின்

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

நண்பர் அலோசியஸ் முதலாளியின் மகன் ஊடாக 442 கடைகளை எரித்தார்கள். களனிப் பகுதியில் இன்னொருவர் செயற்பட்டார். இவ்வாறு அரசியல் தலைமையின் ஊடாகத்தான் அந்த இன அழிப்பு நடைபெற்றது.

நான் குருநாகல் மாவட்ட, தொடங்கஸ்லந்த தேர்தல் தொகுதியைச் சேர்ந்தவன். அன்றைய கலவரத்தின்போது எமது குருநாகல் மாவட்டத்திலும் பல கடைகள் தீக்கிரையாக்கப் பட்டன. எமது பிரதேசத்திலுள்ள பல்லேஹொரம்புவ எனும் தோட்டத்தில் 40 குடும்பங்கள் இருந்தன. அக்குடும்பத்தவர் களைத் தன்னுடைய வீட்டில் வைத்துப் பாதுகாத்து, அவர்களுக்கு உணவு மற்றும் தேவையான வசதிகளையும் செய்து கொடுத்தது மட்டுமல்லாமல், அவர்களைப் பாதுகாப்பான ஓர் இடத்துக்கும் அனுப்பி வைத்தார் எமது அரசியல் தலைவரான ஏ.டி. சுமணதாச அவர்கள். 53 வருட காலமாக மக்கள் விடுதலை முன்னணி எனும் அரசியல் கட்சிக்குப் பாரிய பங்களிப்பைச் செய்துகொண்டிருக்கும் ஒரு சகோதரர் அவர். இன்று அவர் நிதிகம பிரதேச சபையின் தவிசாளராகவும் இருக்கின்றார். இவ்வாறு தமிழ் மக்களுடைய பாதுகாவலராக அன்று நாம் இருந்தோம். வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு என அனைத்து மக்களுடைய ஆசீர்வாதத்துடன் இன்று நாங்கள் அரசாங்கத்தைக் கொண்டு நடத்துகின்றோம்.

வளர்ச்சியடைந்த நாடுகளைப் பாருங்கள்! ஒரு நாளும் அவர்கள் தங்களுடைய இனத்தைச் சொல்லி முன்னேற வில்லை. எடுத்துக்காட்டாக, இந்தியனாக அல்லது அவுஸ்திரேலியனாகத்தான் அவர்கள் முன்னேறினார்கள். எனவே, 'முஸ்லிம்கள்' என்றோ, 'தமிழர்கள்' என்றோ, 'சிங்களவர்கள்' என்றோ எங்களால் முன்னேற முடியாது. 'இலங்கையர்' என்ற சிந்தனை எம்மிடம் இருந்தால் எங்களாலும் முன்னேற முடியும். நாங்கள் வேறுபட்டு எமது பிரச்சினைக்குத் தீர்வைத் தேடுவதற்கு முயற்சிப்போமானால், எப்போதுமே இதே நிலையில்தான் இருக்கவேண்டி வரும். நாங்கள் ஒருபோதும் இனவாதத்தைக் கட்டவிழ்க்கமாட்டோம் என்பதை தமிழ் சகோதரர்களுக்குக் கூறுகின்றோம். தமிழ் மக்களும், முஸ்லிம் மக்களும், சிங்கள மக்களும் இந்த நாட்டினுடைய மிகப்பெரிய சொத்து! அவர்களை நாங்கள் மதிக்கின்றோம். அவர்கள் அன்புக்குரியவர்கள்! அவர்களுடன் நாங்கள் ஒன்றாகக் கைகோர்க்கின்றோம்! 2025 யூலை 23ஆம் திகதியாகிய இன்றைய தினத்தில் நாங்கள் உங்களுக்கு ஒன்றைக் கூறிக்கொள்கின்றோம். உங்களுடைய பாதுகாவலனாக தேசிய மக்கள் சக்தி அரசாங்கம் திகழும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.41]

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද අපි 2007 අංක 7 දරන සමාගම් පනතට ගෙනෙන සංශෝධනවලට අදාළ විවාදයයි කරන්නේ. සමාගම් ලියාපදිංචි කිරීමත් අපේ අමාත්‍යාංශය මඟින් තමයි කරන්නේ. සමාගමක් ලියාපදිංචි කරන්න කලින් ඒ සමාගම පිළිබඳව සොයන එක, බලන එක, ඒ සම්බන්ධ තොරතුරු එකතු කරන එක සහ ඒ තොරතුරු සහිතව විධිමත් විධියට සමාගමක් ලියාපදිංචි කිරීමට කටයුතු කරන එක අපේ අමාත්‍යාංශයේ වගකීමක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටේ විතරක් නොවෙයි, මුළු ලෝකයේම අද වනවිට විවිධ නීති රීති, අණ පනත් සම්මත කරනවා. එහෙම සම්මත කරන්න ප්‍රධානතම හේතුව තමයි, ලෝකයේ දැන් ඇති වෙලා තිබෙන අලුත් ප්‍රවණතාවක් වන වංචාව, දූෂණය, නාස්තිය කියන දේවල් ඉහ වහා ගිහින් තිබීම, ඒ පැත්තට වැඩිපුර නැඹුරු වී තිබීම. එවැනි විවිධ මාර්ගවලින්, අයථා මාර්ගවලින් හොරකම්, වංචා, දූෂණ කරන අය වාගේම, ඒවාට උදවු කිරීම මඟින් ධනය හම්බ කරන පිරිසක් ඉන්නවා. හැබැයි, ඒ ධනය සොයා ගත්තේ කොහොමද කියලා කියන්නේ නැහැ. එහෙම සොයා ගන්නා ධනය සඟවා තබා ගන්න අමාරුයි. ඒ ධනය සඟවා තබා ගන්න බැරි වෙනකොට ඒවා සුදු සල්ලි බවට පත් කරන්න තිබෙන, එහෙම නැත්නම් ප්‍රායෝගිකව සමාජගත කරන්න තිබෙන එක ක්‍රමයක් තමයි මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය.

ඒ සඳහා තිබෙන දෙවැනි ක්‍රමය මොකක්ද? මෑත කාලයේ ඇතැම් අය ධනය උපයා ගැනීමේ මාර්ගයක් විධියටත් ත්‍රස්තවාදයට උදවු කරනවා, එසේ උපයා ගත් ධනය නැවත වතාවක් ත්‍රස්තවාදී ක්‍රියා සඳහා යෙදවීමත් කරනවා. රටක් සංවර්ධනය කිරීමේදී, රටක් ඉස්සරහට යැමේදී මේ ක්‍රම දෙක තුළින්ම බරපතළ ප්‍රශ්නයක්, ගැටලුවක් ඇති වෙනවා. මම හිතන විධියට සමාගම් පිළිබඳව, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී කටයුතු සඳහා මුදල් යෙදවීම කියන කාරණා පිළිබඳව ලෝකය නැවත නැවතත් සංවාද කරන්නේ, සාකච්ඡා කරන්නේ එවැනි කටයුතු නිසා ඇතිවන ගැටලුත් එක්කයි.

මේවා පිළිබඳව ලෝකය තුළ සාකච්ඡා කරන්නේ නිකම්ම නොවෙයි. මේවා පිළිබඳව රටවල් හිතන විධියක්, කල්පනා කරන විධියක් තිබෙනවා. යම් රටක් පාලනය කරන අය තම රට ගැන, තම රට තුළ ජීවත් වන මිනිස්සු ගැන කල්පනා කරන විධියක් තිබෙනවා. ඒ නිසා තමයි රටවල් ගණනාවක් එකතු වෙලා සංවිධානයක් හදාගෙන ඒ අනුව තීන්දු, තීරණ ගෙන තිබෙන්නේ සහ ලෝකයේ රටවල් පිළිපැදිය යුතුයි කියලා සම්මත ගණනාවක් ප්‍රකාශයට පත් කරන්නේ. ඒ අනුව, ප්‍රධානම සම්මත 40ක් නිකුත් කර තිබෙනවා. ඒ නිකුත් කළ සම්මත 40න්, 39ක් දැනට ලංකා ආණ්ඩුව ක්‍රියාවට නඟමින් තිබෙනවා. හැබැයි, එක සම්මතයක් අපි කාලයක් තිස්සේ අත්හැර තිබෙන්නේ. කාලයක් තිස්සේ අත්හැර තිබෙන්නේ 24වන උපදේශයයි. ඒ 24වන උපදේශය අත් හරින්න හේතුව මොකක්ද කියලා අපට හොයන්න බැහැ. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ 24වන උපදේශය තිබෙන්නේ මම මුලින් කියපු ප්‍රධාන කාරණා 2ට අදාළව කටයුතු කිරීම සඳහායි. 1989 වසරේදී ලංකාව තුළ ඒ ගැන සාකච්ඡා වෙලා තිබෙනවා. සාකච්ඡා කළාට, 1989 වසරේ සිට අද වනවිට අවුරුදු 36කට ආසන්න කාලයක් ඒක ක්‍රියාවට නඟන්නේ නැතිව අත්හැරලා තිබෙනවා. අවුරුදු 36කට ආසන්න කාලයක් තිස්සේ මේක අත් හැරියේ ඇයිද කියලා අපි සොයා බලන්න ඕනෑකම තිබෙනවා.

අපේ රට තුළ විවෘත ආර්ථික ක්‍රියාවලිය ආරම්භ වුණේ 1977 වසරේදී. අපි දන්නවා, 1989 වෙනකොට, මේ රට ඇතුළේ අයථා විධියට මුදල් හොයන මාර්ග සියල්ල විවෘත වුණු කාලයක් තමයි තිබුණේ කියලා. මේ විවෘත වෙච්ච කාලසීමාව තුළ අයථා ලෙස මුදල් උපයා ගත්ත අය නැවත වතාවක් මේ මුදල් ආයෝජනය

කරන්න තැන් සොයනවා. අයථා විධියට උපයා ගත්ත ධනය කොහොමද එළියට ගන්නේ, කොහොමද ඒක සමාජගත කරන්නේ, කොහොමද ඒවා නීත්‍යානුකූල තමන්ගේ මුදල් බවට පත් කර ගන්නේ කියලා හොයනවා. අන්න එවැනි අවස්ථාවලදී අපි දැක්කා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ලෝකය පුරාත්, අපේ රට ඇතුළේත් විවිධ වර්ගයේ ව්‍යාපාර අලුතෙන් ආරම්භ කරන බව. අලුතින් ව්‍යාපාර ආරම්භ කරනවා, ඒ ආරම්භ කරන ලද ව්‍යාපාර නීත්‍යානුකූල සමාගමක් බවට පත් කරලා නැත්නම් නීත්‍යානුකූල ආයතනයක් බවට පත් කරලා රට ඇතුළේ නීත්‍යානුකූල ලෙස ලියාපදිංචිය කරනවා. ඒ නීත්‍යානුකූල ලියාපදිංචිය කළාට පස්සේ ඒකට පිළිගැනීමක් එනවා. ඒ පිළිගැනීම ආවාට පස්සේ ඒ පිළිගැනීමත් එක්ක පදනම් කරගෙන තමයි ඒ ව්‍යාපාරය සමහ බාහිර පාර්ශ්ව ගනුදෙනු කිරීම ආරම්භ කරන්නේ. බාහිර පාර්ශ්ව ඒ ගනුදෙනු කරන්න ආරම්භ කරනවාත් එක්කම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒගොල්ලන්ට පුළුවන්කම ලැබෙනවා මේ සමාගමට ප්‍රාග්ධනය එකතු කරන්න, නව ගනුදෙනු කරන්න සහ සමාජයට වෙන වෙන දේවල් නිකුත් කරන්න. ඒ හැමදේම නිර්මාණය වෙනවා, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වුණාට පස්සේ ඒකට ලැබෙන නීත්‍යානුකූල බලය මත. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ නීත්‍යානුකූල බලයක් හැදුවාට, ඒක ඇතුළේ සිදුවන සමහර ගනුදෙනු, නීත්‍යානුකූල නොවන ගනුදෙනු. ඒ නීත්‍යානුකූල නොවන ගනුදෙනු කෙරෙනකොට අපි දන්නවා වෙන්න පුළුවන් දේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නීත්‍යානුකූලව තමන්ගේ මුදල් ටික තැන්පත් කර ගන්න බැරි අය ඒ මුදල් ගෙනැල්ලා මෙන්න මේ සමාගම්වල දානවා. හැබැයි, ඒවා කිසි තැනක, කිසි විධියකින් තොරතුරු පද්ධතියක් තුළින් සනාථ වෙන්නේ නැහැ. ඒ නිසා මේ පනත සංශෝධනය කිරීමෙන් අපි අපේක්ෂා කරන්නේ මොකක්ද? මේ සමාගම් පනත සංශෝධනය කිරීම හරහා අපි බලාපොරොත්තු වන ප්‍රධානම දේ තමයි, සමාගමක් ලියාපදිංචි වෙනවා නම්, ඒ ලියාපදිංචිය නීත්‍යානුකූලව ලංකාව ඇතුළේ සිද්ධ වෙනවා නම්, ඒ ලියාපදිංචි සමාගමේ අයිතිකරු කවුද, කවුද ඒකේ ප්‍රතිලාභින්, කවුද ඒකේ ආයෝජකයෝ, කවුද බාහිර පාර්ශ්ව විධියට ඒකට දායක වෙන්නේ කියන මේ සියල්ල ඉහළ සිට පහළට අවසාන කෙළවරක් දක්වා වන තොරතුරු සනාථ කර ගැනීමයි. ඒක තමයි අපේ බලාපොරොත්තුව.

ඒක බලාපොරොත්තු වෙනකොට සමහර අදහස් එනවා, යෝජනා එනවා, මෙහෙම වුණාට පස්සේ සමහර විට බාහිරින්, නැත්නම් වෙනත් සමාගම්, ආයෝජකයෝ ලංකාවට එන්නේ නැති වෙයි කියලා. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ලෝකයේ නව ප්‍රවණතාව, නව සංවාදය තමයි, රටක ස්ථාවරභාවය දේශපාලනිකව විතරක් නොවෙයි, නීති රීතිවල, සම්ප්‍රදායන්ගේ ස්ථාවරභාවය, විනිවිදභාවය කියන කාරණා අනුව ලෝකයම පිළිගන්නා එක. ආයෝජකයෝ රටකට එනකොට, ආයෝජනය කරන්න එනකොට, සමාගම් ආරම්භ කරනකොට, ව්‍යාපාර පටන් ගන්නකොට ලෝකය ඒ කරුණු බලනවා. එහෙම නම් අපි විශ්වාස කරනවා, මේ පනත සංශෝධනය කිරීම හරහා කිසි ලෙසකින්වත් ආයෝජන ලංකාවට එන්නේ නැති සිද්ධියක් වෙන්නේ නැහැ කියලා. මෙය ආයෝජනය තව තවත් දිරි ගන්වන මාර්ගයක් බවට පත් වෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ රට තුළ සමාගමක් පිහිටෙව්වාට පස්සේ ඒ පිහිටුවන සමාගම කොටස් නිකුත් කරනවා; ප්‍රාග්ධනය එකතු කර ගැනීම සඳහා කොටස් නිකුත් කරනවා. එහෙම කොටස් නිකුත් කරනකොට ඒ කොටස්වල ආයෝජනය කරන්න කැමති අය රට පුරා ඉන්නවා. තම තමන්ට පුළුවන් ප්‍රමාණයෙන්, තම තමන්ට හැකි ප්‍රමාණයෙන් ඒ කොටස්වල ආයෝජනය කරනවා. එහෙම ආයෝජනය කරනකොට ඒ සමාගමේ විනිවිදභාවය, නීත්‍යානුකූලභාවය, ස්ථාවරභාවය පිළිබඳ නිවැරදිව සොයලා තමයි ආයෝජනය කරන්නේ. මෙන්න මේ තත්ත්වය තුළ මේ කාර්යය, මේ සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන ඒම ඉතා වැදගත් එකක් විධියට සලකනවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අද ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා අදහසක් ඉදිරිපත් කළා, අපේ ROC එකේ වෙබ් අඩවිය පසුගිය දවස් 10ක විතර කාලයක් අක්‍රිය වෙලා තිබුණා කියලා. අපි දන්නවා, ඒක. අපට ඒ ගැන අවබෝධයක් තිබුණා. ඒ සේවාව කලින් සමාගමක් මඟින් කරගෙන ගියා. නැවත ඒක අපේ අමාත්‍යාංශයට පවරා ගන්න ලෑස්ති වෙන වෙලාවේ ඇති වෙච්ච ගැටලුවක් ඒක. අපට තවම හිතා ගන්න බැහැ, ඒ හිටපු සමාගම විසින් සැලසුම් කරපු ක්‍රියාවලියක් ඇතුළේද, එහෙම නැත්නම් අපි පවරා ගැනීමේදී ඇති වෙච්ච යම් දෝෂයක් නිසා ද ඒ තත්ත්වය පැන නැගුනේ කියලා. ඒ දින 10ක කාලසීමාව තුළ අක්‍රිය වෙලා තිබුණත් අපි ඒක දැන් නිවැරදි කරලා තිබෙනවා. නමුත් ඒ කාලසීමාව තුළදී යම් ගැටලුවක් පැන නැඟුණු බව අපි දන්නවා. ඒ පිළිබඳව අපි තවමත් සොයමින් සිටිනවා, මොකක්ද සිදු වුණේ කියලා.

ඒ විතරක් නොවෙයි, මේ නීතිය සම්මත වෙනකොට සැලකිය යුතු පිරිසක් භීතියට පත් වෙන එක වළක්වන්න බැහැ. මොකද, අයථා ලෙස ධනය සොයාගත්ත ලංකාවේ සැලකිය යුතු පිරිසක් විවිධ නම්වලින් සමාගම් හදලා, -සමහර සමාගම් අලුතින් හදලා තිබෙනවා- ඒ හදපු සමාගම්වල එම ධනය ආයෝජනය කරලා තිබෙන බව අපි දන්නවා. එවැනි සැලකිය යුතු පිරිසක් ඉන්නවා. ඒ නිසා ඒ පිරිස භීතියට පත් වෙනවා. ඒකට අපි කවුරුවත් කලබල වෙන්න ඕනෑ නැහැ. රටට ඉතාම වැදගත් මොහොතක, සංශෝධනය කළ යුතු වෙලාවක තමයි අපි -වත්මන් ආණ්ඩුව- මේ පනත සංශෝධනය කරන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. අද ඉදිරිපත් කරන ලද සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පතට සියලුදෙනාගේ සහාය ලැබිලා, අනාගතයේදී එය ක්‍රියාවට නඟලා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අයථා විධියට, කළු සල්ලි විධියට උපයාගත්ත ධනය සුදු කරන්න කවුරු හෝ බලාගෙන ඉන්නවා නම්, ඒවා සුදු කරන්න යොදා ගන්නා ක්‍රමය සමාගම්වල ආයෝජනය කිරීම නම්, එහෙම ආයෝජනය කරන්න බලාපොරොත්තුවෙන් ඉන්න අයට ඒ අවස්ථාව නැති කරන එක, ත්‍රස්තවාදයට උදවු කරන එක වැළැක්වීම වෙනුවෙන් මේ සංශෝධන ක්‍රියාත්මක කරන්න අපි සතුටින් දායකත්වය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[2.52 p.m.]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Deputy Chairperson of Committees, today is the 23rd of July. Since 1983, we, the Tamils in particular, have been commemorating this day as the "Black July" day. The Tamil people outside the North and the East,

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

particularly in Colombo, were systematically hunted down; they were hunted down by the lists in the electoral registers. The police and the military helped Government-backed thugs in hunting down Tamil families, burning them alive. The carnage and the heinous loss of life, to some extent, was reduced because of the good ordinary Sinhalese people who were trying to hide their few Tamil friends that they could afford to hide from that Government-backed, military-backed, police-backed campaign of mass murder. So, that day is today, a day that we, Tamils, commemorate without fail.

Madam, this Government that has now come into power makes it a matter of point at every possible opportunity to say that they are not racist like the past governments, especially like the Government in 1983, which did that heinous crime. They say that they do not distinguish on the basis of Sinhala, Tamil, Muslim, Christian and Burgher. Those are the famous phrases that they use.

This Government's own youth wing is organizing youths to go to Jaffna today, a day when Tamils in the North, the East and the South commemorate this Black July day, to completely change the traumatic commemoration of that event; to completely change that idea, they are sending trainloads and busloads of so-called youth to Jaffna to commemorate a day of comradery. This is not a day to commemorate comradery. If you all are actually not racist, if you all actually do not have racist intentions, this is a day where it is a duty upon especially you all - the JVP was accused by the then J.R. Jayewardene Government of being the party which actually carried out those riots - to put the record straight and actually make today officially a black day which must be commemorated by everyone, not to try and hide and obfuscate that history. But, what you all are doing is the complete opposite: you all are trying to hide that history; you all are trying to change history and you are trying to change the meaning of today completely. And, Madam, those are not the actions of a government which has intentions of putting the record straight, doing the right thing, facing up to the reality of the past and making sure that the past is not repeated. So, I condemn this Government's youth wing going to Jaffna today and trying to change the nature of the commemorations that are taking place right throughout the North, the East and even in the South by the Tamil people who are still traumatized, and still, we do not have an official apology; still, we do not have it. That is what we face today.

Madam, today, we are debating Amendments to the Companies Act. I was listening to many speakers. Amendments to the Companies Act are being brought in to ensure prevention of money laundering, prevention of black money and with all of those intentions. I think 20 odd Sections of the Act are being amended and those are things that we welcome. But, I noticed everybody else except the Minister repeatedly concentrating on the notion of preventing terrorism financing and how important these Amendments are towards that.

I mentioned how, in 1983, innocent civilians were massacred. No justice, nothing whatsoever! This Government also refuses to bring those who were responsible for those heinous crimes before court and convict them. Then, what do you expect the people who have been victims of such heinous crimes to do? What did the JVP do? When the JVP, as youth, felt that the State is working against their interests, that it is a cabal who controls the State and acting for the interest of a very few elites and felt that the country must be brought back to the people, what did they do? Ultimately, they decided that they need to take up arms. I will never call that terrorism because those are legitimate reasons that have to be addressed. But, you all are doing the complete opposite! You yourselves say that all the previous governments, for the last 70 odd years, were racist. Then, if you say that, that means there are aggrieved people amongst the Tamil people. Then, when they are so bitter, if they are forced to take up arms like what happened in 1983 because they feel that that is the only way they can have some sort of security, you, of all people, calling that terrorism and refusing to look at the whole conflict in its proper context to find answers, are not going to find solutions. No, you all are pandering to the same past.

Last week, people from Valikamam North, particularly from a village called Myliddy, came down to Colombo and protested in front of the Presidential Secretariat and some of them went inside and met with, I think, one of the Secretaries or the Private Secretary to the President. They were protesting, Madam, because in 2013, 6,317 acres were gazetted under the Land Acquisition Act for military purposes, for High Security Zones. Then, eventually, because of international pressure and protests of the Tamil people, almost 3,000 acres were released and now, there are 3,000 acres that are still not released. The Secretary to the Ministry of Agriculture, Livestock, Land and Irrigation, we have found out, is thinking in terms of gazetting those remaining 3,000 acres as a High Security Zone permanently, refusing to allow them to be released. That is against your own policy; that is against the promises you gave! Today, out of these 3,000 acres, Madam, almost 75 per cent is not used for military purposes; it is used for farming by the Army, the Navy and the Air Force, for you all to bring vegetables to the local market and undercut the local farmer. Surely, is it not something that your Government should be against? You should be on the side of the ordinary people. Over 75 per cent of the lands are used for non-military purposes, Madam.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am finishing up, Madam.

Six temples and churches within those 3,000 acres, within this so-called High Security Zone have disappeared. They were there in 2009. People, the

villagers, used to get special permission, go to those temples and pray there. Those six temples and churches have disappeared today! That was not a war zone; there was no heavy fighting inside those High Security Zones. So, how did they disappear? That is a UNESCO crime! So, these are things that you have to look into. If you do not look into this, Hon. Minister, the Companies Act being amended to prevent so-called terrorism is all rubbish. Nothing you do would ever prevent people from resisting this sort of absolutely unacceptable conduct by the State. So, I appeal to you, Hon. Minister, as a JVPer, not as an NPPer, who knows why you took up arms to find solutions to the core issues, to look into these matters and also tell you that if you do not do that, no amount of legislations - you had legislations for the last 30 years which did not prevent anybody from taking up arms - could actually prevent conflict.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

[අ.භා. 3.03]

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින ලංකා ඉතිහාසයේ ඉතාම සුවිශේෂී නඩු තීන්දු කිහිපයක් ප්‍රකාශයට පත් වෙනවා. 2022 ජූලි මස 17වෙනි දින අරගළකරුවන් පාලනය කිරීම උදෙසා හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් මහජන ආරක්ෂක පනත උපයෝගී කරගෙන හදිසි නීති රෙගුලාසි පැනවීම තුළින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නඩු කිහිපයක තීන්දු ලබා දී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින අපි කථා කරන්නේ 2007 අංක 7 දරන සමාගම් පනතේ සංශෝධන සම්බන්ධයෙන්. මෙම සංශෝධන සම්බන්ධයෙන් කථා කරද්දී ඒ කථාවට ප්‍රවේශයක් විධියට සමාජ, ආර්ථික සහ දේශපාලනික වශයෙන් රටක් නියමාකාරයෙන් පවත්වාගෙන යාම සඳහා පවතින නීතිවල යම් යම් වෙනස්කම් කිරීම, සංශෝධන කිරීම, සමහර නීති ඉවත් කිරීම වැදගත් බව මම විශේෂයෙන් සඳහන් කළ යුතුයි. එය නීතියේ ප්‍රගමනයට වාගේම සමාජ, ආර්ථික සහ දේශපාලන පරිවර්තනයක් කරමින් රටක් ඉදිරියට යාමට අත්‍යවශ්‍ය කාරණයක්. කිසිම ක්ෂේත්‍රයක සාදා නිම කළ නීති තිබෙන්නට බැහැ. සාදා නිම කළ නීති තුළ මිනිස්සු බලාපොරොත්තු වෙන මානව අයිතිවාසිකම්, මූලික අයිතිවාසිකම් සහ ප්‍රගමනය උදෙසා අවශ්‍ය වන කාරණා ඉෂ්ට වෙන්නේ නැහැ. ඒ නිසා කලබල විය යුතු නැහැ, කලබල වීම අවශ්‍ය නැහැ. මේ නීති පවතින්නේ මිනිසුන්ගේ සුබසාධනය උදෙසා මිස, මිනිසුන්ගේ යහ පැවැත්ම උදෙසා මිස, පාරිසරික වශයෙන් මේ රට ආරක්ෂා කර ගැනීම උදෙසා මිස අපරාධකරුවන්ගේ, වරදකරුවන්ගේ වාහකයක් ලෙස යොදා ගන්නට නොවෙයි. ඒ නිසා කොයිම අවස්ථාවකදීවත් සාදා නිම කළ නීති අවශ්‍ය වෙන්නේ නැහැ.

අපි ඉතිහාස පුරා අධිකරණවලදී විශේෂයෙන් දැකපු කාරණා තිබෙනවා. නීතිය අවභාවිත කිරීම්, ඒ කියන්නේ නීතියේ තිබෙන අඩු ලුහුඩුකම් තුළින් ඇතුළට ගිහින්; නීතියේ ප්‍රතිපාදන නැති තැන්වලින් ඇතුළට ගිහිල්ලා නීතිය අවභාවිත කළ අවස්ථා ඉස්මතු මතු වෙලා තිබෙනවා. එහෙම තැන් අපි වෙනස් කරන්න ඕනෑ. එහෙම තැන් වෙනස් කරන්න තමයි මිනිස්සු අපට බලය දුන්නේ. එහෙම තැන්වලට සංශෝධන ගෙනෙන්න තමයි මිනිස්සු අපට බලය දීලා තිබෙන්නේ. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ දෙයක් තමයි ඇතැම් සංවිධාන, ඇතැම් පුණ්‍ය ආයතන පදනම් හදාගෙන, - විශේෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ - ගස්, ගල්වලට අයිතිවාසිකම් කියාගෙන ඉන්නවා; පදනම් හදාගෙන, ස්වාභාවික පරිසරයට අයිති කඳු මුදුන්වලට අයිතිවාසිකම් කියාගෙන ඉන්නවා . මුදල් විශුද්ධිකරණය කරලා තිබෙනවා. කළු සල්ලි සුදු කරන්න පදනම් අටවාගෙන හිටපු අවස්ථා අපි ඉතිහාසයේ දැකලා තිබෙනවා. ඒ නිසා හොඳට මතක තියාගන්න ඕනෑ, ජාතික ජන බලවේගයේ අපි මුදල් විශුද්ධිකරණයට රාජ්‍යයේ නීතිය, නීතියේ පිළිසරණ දෙන්නේ නැහැ කියන එක. අපි ඒක එදත් කිව්වා, අදත් කියනවා, අපි ඒක හෙටත් කරනවා. අපරාධකරුවන්ට වාහකයෙක් වෙන්න ජාතික ජන බලවේගයේ අපි ලැහැස්ති නැහැ. ඒක හොඳට මතක තියා ගන්න ඕනෑ. බොහොම කලබලකාරී තත්ත්වයක් තමයි අපි දැක්කේ. මේ පනත් කෙටුම්පතේ මහ ලොකු සංශෝධන කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට විරුද්ධව ලෝක මට්ටමින් ප්‍රමිතින් ක්‍රියාත්මක වෙනවා. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම කියන එක ලෝකයේ මූල්‍ය පද්ධතියට කරදරයක්; ජාතික ආරක්ෂාවට කරදරයක්; ආර්ථිකයේ ස්ථාවරභාවයට කරදරයක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන විධියට ලෝක නිෂ්පාදනයේ මූල්‍ය වටිනාකමින් සියයට 2-5 අතර ප්‍රමාණයක් විශුද්ධිකරණයට ලක්වෙච්ච මුදල් තමයි තිබෙන්නේ. එම නිසා සමාගම් පනතට සිදුකරන සංශෝධන තුළින් අපි බලාපොරොත්තු වන්නේ, ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු අර්ථලාභී අයිතිය, යම් කිසි සමාගමක් පාලනය කරන හෝ සමාගමෙන් ප්‍රතිලාභ ලබන පුද්ගලයන් සම්බන්ධ තොරතුරු මහජනතාවට ලබා ගැනීමේ හැකියාව ලබා දීම පමණයි. ඇත්තටම මේ නීති සංශෝධනයේ බය විය යුතු කාරණාවක් නැහැ. මොකද, නීති විරෝධී ව්‍යාපාරයක් නොවෙයි නම් පටන් ගන්නේ, කළු සල්ලි සුදු කරන්න නොවෙයි

[ගරු අනුෂ්කා තිලකරත්න මහත්මිය]

නම් ව්‍යාපාරය පටන් ගන්නේ, ත්‍රස්තවාදයට උඩ ගෙඩි දෙන්න නොවෙයි නම් මේ ව්‍යාපාරය පටන් ගන්නේ බය වෙන්න කිසිම කාරණයක් මේක ඇතුළේ නැහැ. තමන්ට තිබෙන තොරතුරු ටික ලබා දෙන්න තිබෙන්නේ. මහ ජනතාවට ඕනෑ වෙලාවට ඒ තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම තහවුරු කරලා තිබෙනවා. මේ තුළින් විනිවිදභාවය, පාරිශුද්ධභාවය ආරක්ෂා වෙනවා. ඒ නිසා කලබල වෙන්න අවශ්‍ය නැහැ.

මෑත කාලයේ බදු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන්, බදු ගෙවීම සම්බන්ධයෙන් අපි හොඳ ප්‍රවණතාවක් දැක්කා. රටක මිනිසුන්ට ආණ්ඩුව සම්බන්ධයෙන් විශ්වාසයක් තිබෙනවා නම්, ආණ්ඩුවේ පාලනය ගෙන යන මහජන නියෝජිතයන් හොරකම් කරන්නේ නැහැ කියලා මිනිසුන්ට තේරෙනවා නම්, මිනිස්සු නීතියට අමුතු විධියට බය වෙන්නේ නැහැ. හැබැයි, බය වෙන පිරිසක් ඉන්නවා. තමන් හොරකමෙන්, වංචාවෙන්, අල්ලසින්, දූෂණයෙන් මුදල් හම්බ කරලා තිබෙනවා නම් තමයි ඒ බය වෙන්නේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට නියමිත කාලය අවසන්.

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මේ කාරණය විතරක් කියලා මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපේ ආණ්ඩුව ආවාට පස්සේ විවිධ බදු වර්ග සඳහා ලියාපදිංචි වීම් සිද්ධ වෙලා තිබෙනවා. 2023.12.31 සිට 2024.12.31 දක්වා කාලයට අදාළ වාර්තාව මම ඉදිරිපත් කරන්නම්. 2023.12.31 වෙද්දී සංස්ථාපිත වාසික සමාගම් සහ නිර්වාසික සමාගම් 82,437ක් බදු සඳහා ලියාපදිංචි වෙලා තිබෙනවා. 2024.12.31 වෙද්දී 100,409ක් ලියාපදිංචි වෙලා තිබෙනවා. 2023.12.31 වෙද්දී තනි පුද්ගල ව්‍යාපාර 539,862ක් ලියාපදිංචි වෙලා තිබෙනවා. 2024.12.31 වෙද්දී 976,498ක් ලියාපදිංචි වෙලා තිබෙනවා. මේ තමයි විශ්වසනීයභාවය. අපි මිනිස්සුන්ට පොරොන්දු වුණා, ඔවුන් හම්බ කරන එකම රුපියලක්වත්, ඔවුන් මේ රටට බදු වශයෙන් ගෙවන එකම රුපියලක්වත් වංචා කරන්නේ නැහැ කියලා. මිනිස්සුන්ට දැන් ඒ විශ්වාසය ඇති වෙලා තිබෙනවා. අපි වගකියන්නේ මිනිස්සුන්ට විතරයි. අපි වග වෙලා ඉන්නේ මිනිස්සුන්ට -මේ රටේ පුරවැසියන්ට- විතරයි. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කවුරු කෑ ගැහුවත් මීන් ඉදිරියටත් අපි -ජාතික ජන බලවේගය- මිනිස්සුන්ට ප්‍රතිලාභ ලැබෙන ඕනෑම පනතක් සංශෝධනය කරන්න, ඕනෑම නීතියක් ගෙනෙන්න මැදිහත් වෙනවාය කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.12]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම බොහොම සතුටු වෙනවා, ඔබතුමිය මූලාසනයේ ඉන්න අවස්ථාවේදී කථා කරන්න අවස්ථාව ලැබීම ගැන. මට මිනිත්තු 20ක් දුන්නාට මිනිත්තු 45ක් විතර කථා කරන්න ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. මගේ කථාව පටන් ගන්නේ සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පතට සම්බන්ධ කරුණුවලින්. අද ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා විසින් මේ පනත් කෙටුම්පත දෙවන වර කියවීම කළා. මේ පනත් කෙටුම්පත තුළින් සංශෝධන ගණනාවක් ගෙනෙන්න කටයුතු කර තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉස්සෙල්ලාම අහන්නේ, Department of the Registrar of Companiesහි මේ software එක වැඩ නොකරන්නේ ඇයි කියලායි. ජූනි මාසයේ 30වැනි දා මේ සම්බන්ධයෙන් තිබෙන agreement එක, - *[බාධා කිරීමක්]* ආණ්ඩු පක්ෂයේ වෙලාව අරගෙන උත්තර දුන්නොත් මට කිසි ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීමක්]* 2018 අප්‍රේල් මාසයේ 02වැනි දා තමයි මේ ගමන පටන් ගත්තේ. මේක තමයි ලංකාවේ තිබෙන පළමුවෙනි paperless office එක. ඒකට මේ වාගේ ප්‍රසිද්ධියක් තිබුණත්, මේ කථා කරන මොහොතේත් එහි වැඩ කෙරෙන්නේ ඉතාම හෙමින්. *[බාධා කිරීමක්]* මම අනෙක් අය කියන දේවල් අහන්නේ නැහැ, ඇමතිතුමා. මම online ගිහිල්ලා බැලුවාම තමයි පෙනුණේ, එහි වැඩ කටයුතු ඉතාම හෙමින් තමයි මේ මොහොතේත් කෙරෙන්නේ කියලා. ජූලි මාසයේ 01වැනි දා ඉඳන් මේ software එකෙන් වැඩ කරන්න Sri Lanka Army එකට භාර දී තිබෙනවා. මේවා කරන්න බැරි දේවල්. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, වෙලාවත් එක්ක ඔබතුමා නම්‍යශීලී වුණා නම් මට කිසිම ප්‍රශ්නයක් නැහැ. මම ඒක අගය කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කාරණය ඉක්මනින් ප්‍රකාශ කරන්න, ගරු ඇමතිතුමනි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් වෙන්න විනාඩි 20ක් ගතවනකොට මේ කාරණය යට යනවා. ඒ නිසායි මම දැන් මේ ගැන කියන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රියාවලිය මැයි මාසයේ 30වන දායින් ඉවරයි. KPMG කියන්නේ, අවුරුදු 7ක් අපිත් එක්ක හිටපු ආයතනයක්. අපි ඔවුන්ට කිව්වා, මේ ක්‍රියාවලිය මාස 6ක් දීර්ඝ කරන්න කියලා. මොකද ඊළඟ ටෙන්ඩර් එකට අපි යන්න ඕනෑ. මාස 6ක් බැහැ කිව්වා. ඊට පසුව කිව්වා, අවුරුද්දක් ඕනෑය කියලා. අපට අවුරුද්දක් ඉන්න බැහැ, ඒක ටෙන්ඩර් කරන්න සිද්ධ වෙනවා. ඊට පස්සේ අපි මේ system එක භාර ගැනීමේ ක්‍රියාවලිය පටන් ගත්තා. භාර ගැනීමත් එක්ක මේකට ප්‍රහාර එනවා; system එක වැටෙනවා. ඔවුන් මේක භාරගෙන කටයුතු කරද්දීත් මෙහෙම වුණා. CR දිගටම ආවා. Bugs විතරක් නොවෙයි, මේ system එක ඇතුළේත් ප්‍රශ්න මතු වුණා. ඊට පස්සේ රජය හැටියට අපි මේ සම්බන්ධයෙන් තීරණයක් ගත්තා. Ministry of Digital Economyහි expertsලා, හමුදාවේ අය - හමුදාවේත් IT Division එක - SLCERT ආදී මේ ඔක්කෝම එකතු වෙලා තමයි මේ ක්‍රියාවලිය භාර ගත්තේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ පිළිබඳව මම දන්නවා. දැන් තමයි මගේ මිනිත්තු 20 පටන් ගන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ මෙන්න මේකයි. මේ සමාගම රුපියල් මිලියන 150ක් මාසයකට හොයනවා. වියදමක් වශයෙන් ගෙව්වේ සියයට 1යි. ඒ කියන්නේ, රුපියල් මිලියන 1.5යි. ඉතින් මේ පිළිබඳව මීට වඩා ව්‍යවසායකත්වයෙන් බලන්න තිබුණා කියන එක තමයි මට කියන්න තිබෙන්නේ. *[බාධා කිරීමක්]* මම දන්නේ නැහැ, මොකක්ද හේතුව කියලා. ඒක Department of the Registrar of Companiesහි තිබෙන එකක්. ඒකේ management එක විතරයි ඔවුන්ට තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. ගරු ඇමතිතුමනි, දැන් මේ කටයුතු online මාර්ගයෙන් සිදුවනකොට ease of doing businessවල අපේ තිබෙන තත්ත්වය එකපාරට වැඩි වුණා. දවසක් ඇතුළත company එකක් ලියාපදිංචි කරන්නත් පුළුවන් වුණා. මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමියක් කිව්වා, companies ගණනාවක් තිබෙනවා කියලා. සාමාන්‍යයෙන් දවසකට කොම්පැනි සියයක් විතර ලියාපදිංචි කර තිබෙනවා. අද වනකොට දවසකට ලියාපදිංචි කරන්නේ 20යි, 22යි. දැනට කොම්පැනි 236,000ක් පමණ තිබෙනවා. මම කලින් කිව්වා වාගේ මේක තමයි ලංකාවේ තිබෙන එකම paperless department එක. නමුත් අද මේකේ වැඩ ඉක්මනින් කෙරෙන්නේ නැහැ. ASYCUDA එක වැඩ කරන්නේ නැහැ. Department of the Registrar of Companiesහි මේ පද්ධතිය වැඩ කරන්නේ නැති එක හොඳ නැහැ. ඇමතිවරයෙකු වශයෙන් ඔබතුමා වැඩ කරන්න කැමැත්තක් දක්වන කෙනෙක් නිසා කරුණාකර මේකට නිවැරදි ස්ථාවරයක් හොයා ගන්න. මා දන්නා විධියට KPMG එක කියන්නේ, independent company එකක්. ඉතින් ඒ අයට කියන්න, ආදායම රුපියල් මිලියන 150ක් හම්බ වෙනවා නම් වියදම රුපියල් මිලියන 1.5ක් කියන්නේ මොකක්ද කියලා. කෙසේ වෙතත්, මේ මොහොතේ උසාවියෙන් දෙන නියෝගවත් ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ.

මම ඔබතුමාට කියන්නේ, කරුණාකරලා මේ පද්ධතිය නවීකරණය කරන්න කියලායි. නවීකරණය කරනවා කියන්නේ සුමාන දෙකකින් software එකක් හදනවා කියන එක නොවෙයි. ඒක කරන්න බැහැ. මීට පෙර ඒ ගැන සොයා බලා තමයි ඒ අය මේ පද්ධතිය ක්‍රියාත්මක කර තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඒක ඔබතුමන්ලා කරන්න ඕනෑ දෙයක්. නැත්නම් හිතයි, මම ඒ කොම්පැනි වෙනුවෙන් කථා කරනවා කියලා. Paperless office එකක් කිව්වාම ඒ තත්ත්වය ඉදිරියට යන්න ඕනෑ. අද අපි search එකක් දැම්මාම, ඒක ඉක්මනින් කෙරෙන්නේ නැහැ. ඒ ප්‍රශ්නය තමයි අපට තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මට කියන්න, මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා යමක් ඉදිරිපත් කර තිබෙනවාද කියලා.

ජනාධිපතිතුමා මුදල් ඇමති වශයෙන් ඉදිරිපත් කරනවා, Foreign Exchange Act එකට Amendment එකක්. මේ අවස්ථාවේ මට පෙනෙන්නේ, මේ පාර්ලිමේන්තුවේ වැඩි කැමැත්තක් තිබෙන්නේ රටේ ආර්ථිකය වර්ධනය කරන එකට නොවෙයි කියලායි. උසාවිය තුළින්, පොලීසිය තුළින් තමයි ආර්ථිකයත් ගෙන යන්න උත්සාහ කරන්නේ. එහෙම කරන්න එපා. මම හැම වෙලාවකම කියනවා වාගේ වමට සිග්නල් දාලා දකුණට හරවන්න එපා. ආසයි, බයයි වෙන්න එපා. මම ඉතාම අගය කරනවා, ලාල් කාන්ත ඇමතිතුමාව. එතුමා කලින් හිටියේ එක ස්ථාවරයක. අද ඉන්නේ වෙන ස්ථාවරයක. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, මම දන්නවා, ඔබතුමාත් ඉන්නේ ඒ වාගේ ස්ථාවරයක කියලා. බිමල් රත්නායක ඇමතිතුමාත් එහෙමයි. මම කියන්නේ, අන්න ඒ විධියට හිතන්න කියන එකයි. හරි club එකට එන්න. නිකරුණේ සෝවියට් රුසියාව ගැන හිතාගෙන, චීනය ගැන හිතාගෙන නොවෙයි කටයුතු කරන්න ඕනෑ. ලෝක ආර්ථිකය යන ගමන් මඟ දිහා බලලා, වැල යන පැත්තට මැස්ස ගහන්න.

Foreign Exchange Act එකට ගෙනෙන Amendment එකේ තිබෙනවා, "Suspend making payments through Outward Investment Accounts" කියලා. මෙතෙක්දුරට ආයෝජන ආවේ ඒ තුළින්. ඒක suspend කළාම ප්‍රශ්නයක් ඇති වෙනවා. ඔබතුමන්ලා හිතන විධියට ආයෝජන ගෙනෙනවා කියන්නේ උගන්ඩාවෙන් සල්ලි ගෙනෙන එකයි, ඩුබායිවලින් සල්ලි ගෙනෙන එකයි නොවෙයි. ඔබතුමන්ලා ඒවා ගැන නේ කථා කරන්නේ. ඒවා නොවෙයි, ආයෝජන කියන්නේ. ඩොලර් ට්‍රිලියන ගණනක ප්‍රශ්න තිබෙන රටක මේ දශමයක ප්‍රශ්නයක් පසුපස ගිහිල්ලා ආයෝජන අධෛර්යවත් කළොත් මොකක්ද වෙන්නේ? ආයෝජකයා අධෛර්යවත් කිරීම තමයි අද සිදු වෙලා තිබෙන මූලික ගැටලුව. ඩොලර් 750,000කින් කොම්පැනියක් මොනවා ගන්නද? ඉෂාර නානායක්කාරට කියන්න පුළුවන්ද, Cambodian company එක ගන්න එපා කියලා? US Dollars 750,000කින් මොනවා ගන්නද? ඔබතුමන්ලා කියන්නේ, "Companies incorporated in Sri Lanka listed under Colombo Stock Exchange" කියලා. සාමාන්‍ය කොම්පැනියකට ඩොලර් 750,000යි ගෙවන්න පුළුවන් වන්නේ. අපට තිබෙන සාමාන්‍ය කොම්පැනියකට ඩොලර් ලක්ෂ දෙකයි ගෙවන්න පුළුවන් වන්නේ. ඒ මුදලින් ඩුබායිවල බුලත් කඩයක්වත් ගන්න පුළුවන්ද?

මේ කටයුතු ආණ්ඩුව කරන්න. Central Bank එකට ඒ දේවල් කරන්න දෙන්න එපා. මේ රටේ තිබෙන ප්‍රශ්නයත් ඒකයි. රටට කාර් ගෙනෙන්න ඕනෑ වුණත් අහන්නේ Central Bank එකෙන්. ඔවුන් මොනවාද කරන්නේ? ඔවුන් monetary policy එක සම්බන්ධව කටයුතු කරන එක හරි. නමුත් තීන්දු ගන්න එක ආණ්ඩුව කරන්න. මේකේ වැරැද්ද තිබෙන්නේ එදා ඉඳන්ම මහ බැංකුවට භය වෙලා කටයුතු කරන එකයි. මේ රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන්නේ ඒ නිසායි. ආර්ථිකය කඩා වට්ටන්නේත් ඔය ආයතනයම තමයි. මම ඉතාම ඕනෑකමින් ඉල්ලන්නේ, ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් නැවත සලකා බලන්න කියලායි. අපට ආයෝකයින් ගෙන්වා ගන්න අවශ්‍යයි. මේ අවුරුද්දේ අගවන කොට ඇමරිකානු ඩොලර් බිලියන හතක් ගෙවන්න තිබෙනවා. එන අවුරුද්ද වෙනකොට ඇමරිකානු ඩොලර් බිලියන 8.5ක්, 9ක් ගෙවන්න තිබෙනවා. 2028 වනකොට ඇමරිකානු ඩොලර් බිලියන 13.5ක් ගෙවන්න තිබෙනවා.

අද කොම්පැනි 236,000ක් තිබෙනවා. මේ වාගේ ගියොත් එන අවුරුද්ද වෙනකොට මේ සංඛ්‍යාව අඩු වෙනවා මිසක් වැඩි වෙන්නේ නැහැ. දවසකට කොම්පැනි 40ක්, 50ක් ලියාපදිංචි කරපු එක අද 20කට අඩු වෙනවා කියන එක ඒ තරම් සුබදායී නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. අපි මේවා වෙනස් කරන්න අවශ්‍යයි. ඒ වාගේම මේ කියන Foreign Exchange Act එකට සිදු කළ Amendment එක අනුව මොන විධියකින්වත් අලුත් කොම්පැනි ගෙනෙන්න බැහැ. ඔබතුමන්ලාගේ දැනුවත්කම තුළින් මෙහෙම දේවල් ඉදිරිපත් කරලා තිබෙන්නේ කොහොමද? අපි කියන්නේ, මේ සම්බන්ධයෙන් වෙනසක් ඇති කරන්න කියන එකයි.

මේ Companies (Amendment) Bill එකේ 130B - Details to be furnished - යටතේ information කියලා එකක් තිබෙනවා. ඒ කියන්නේ ආයෝජකයා කවුද කියන එකයි. ඒක නිවැරදි

[ගරු රවී කරුණානායක මහතා]

නැත්නම් 130D එක යටතේ ඔවුන්ට ලියලා ඉල්ලන්න පුළුවන්. Registrar බැහැ කිව්වොත්, Exchange Controllerට ලියන්න පුළුවන්. ඊළඟට, 130F - A claim for beneficial ownership - තිබෙනවා.

මම මේ කාරණයත් කියන්නම්කෝ. ඔබතුමන්ලා ඇමෙරිකාවත් එක්ක කථා කරලා ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ කොම්පැනියක් zero tax කරලා ලංකාවට ගෙනෙනවා. අපේ රටේ "Trump Towers" කියලා එය ලියාපදිංචි කරනවා. එතුමාට ඩුබායිවල කොම්පැනියක 10 per cent තිබෙනවා නම් ට්‍රම්ප්ගෙන් අහන්න පුළුවන්ද, ඩුබායිවල තිබෙන කොම්පැනියේ අයිතිකරු කවුද කියලා? මෙන්න මේ වාගේ විහිළුවක් තමයි මේක. මේ වාගේ එකක් තමයි මෙතැනදීත් අනිවාර්යයෙන්ම අහන්නේ. Adani Group එක ලංකාවට එනවා. අපි කියමු, solar project එකක් පටන් ගන්නයි එන්නේ කියලා. Adani International කියලා එකක් තිබෙනවා, ඒකේ සියයට 80ක කොටස් තිබෙනවා කියලා හිතමු. සියයට 15ක කොටස් තිබෙන බහමාස් කොම්පැනියකුත් මෙහාට එනවා. බහමාස් කොම්පැනියේ සියයට 15ක කොටස් handle කරන්නේ කොහොමද කියන තොරතුරු අපි ඉල්ලන්න හදනවා. කොහොමද ඒක ක්‍රියාත්මක වෙන්නේ?

ඊට වැඩිය භයානක දෙයක් තමයි, Companies (Amendment) Bill එකේ Clause 130Jහි "Beneficial owner" and "effective control" යටතේ තිබෙන්නේ. දැන් මේ සියයට 10ක කොටස් තියාගෙන Board of Directors handle කරන්නේ කොහොමද කියලා මේ Registrar of Companies අහන්න පුළුවන් ලු. අහන්න පුළුවන් කියලා කිව්වාට, ඒක ප්‍රායෝගිකව වෙන්න පුළුවන්ද? මේකේ හිස්තැන් කොම්පැනි තිබෙනවාද? මේ කොම්පැනිය ඇමෙරිකාවේ, ඉන්දියාවේ registerවෙලා තිබෙනවා නම්, ඒ Registrar of Companies පවා පිළිගෙන තිබෙනවා නම්, ලංකාවට ආවාට පස්සේ අපි මොකටද CID වැඩක් කරන්න යන්නේ? මේ කොම්පැනි මෙහෙම කරන්න ගියොත් කවදාවත් ආයෝජකයෝ මේ රටට එන්නේ නැහැ. මේක තමයි ඉතාම භයානක දේ. දැන් මම උදාහරණයක් තමයි ඒ ගත්තේ. අදානිගේ, ට්‍රම්ප්ගේ කොම්පැනි ආවාම ඒවා ගැන හොයන්න ගියොත් කවදාවත් ආයෝජකයෝ මේ රටට එන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මේ තුළින් අපේ රටට කවදාවත් අලුත් කොම්පැනි එන්නේත් නැහැ. Software එකක් ගන්න ඕනෑ නම් දැන් ඩුබායිවලට හරි, අබුඩාබිවලට හරි, UKවලට හරි ගිහිල්ලා රුපියල් ලක්ෂ දෙකකින් ඒක ගන්න අපට පුළුවන්ද? හැම එකම blue-chip company එකක් නොවෙයි නේ. සුද්දෝ මෙහාට ආවාම මේ සම්බන්ධයෙන් ඒගොල්ලන්ට foreign disclosure එකක අවශ්‍යතාවක් නැහැ නේ. ඒගොල්ලන් මෙහාට එන්නේ ලංකාවේ සේවය ලබා ගන්න හරි යම් විධියකින් market share access එකක් ගන්න පුළුවන් කියලා හිතාගෙන. ඒගොල්ලන්ට මේ වාගේ බාධක තිබුණොත් ඒ අය හිතාවි, අපි එන්න ඕනෑ නැහැ කියලා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
They also accept it.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කවුද මේක accept කරන්නේ?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
The USA.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
USA accept කරනවා ද මේ වාගේ දේවල්? ඒගොල්ලන්ගේ openness තිබෙනකොට, ඒගොල්ලන්ට කිසි භයක් නැතුව openly ඔක්කෝම තිබෙනවා. ලංකාවේත් තිබෙන්නේ open market එකක්. සියයට 10ක කොටස් තිබෙන කෙනා කවුද? ඔබතුමන්ලා ඒ සියයට 10ක කොටස් තිබෙන කෙනා පස්සේත් දුවනවා. මේකෙන් අර්ථ කථනය කරන්නේ මේකයි. යම් ප්‍රශ්නයක් තිබෙන කොම්පැනියක් පස්සේ ඕනෑ එකක් දුවන්න කියන එක නොවෙයි මම කියන්නේ. මට අවශ්‍ය වන්නේ සියයට 99ක්,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. හැම එක්කෙනාම genuine කියලා කියන්නේ නැහැ. ඔබතුමන්ලා දැන් ගෙනියන ආර්ථිකය තුළ කවදාවත් ඔය කියන ගෙවීම් ගෙව්වේ නැහැ නේ. නමුත්, ගෙව්වා කියමුකෝ. හැබැයි, දැන් ගෙවන්නේ නැහැ නේ. කෝ, ආයෝජකයෝ? එහෙම තත්ත්වයක් තිබෙනවා නම් ඇයි ආයෝජකයෝ නැත්තේ? දැන් ස්ට්‍රයික් නැහැ; දැන් බෝර්ඩ් ලෑලි අල්ලාගෙන පාරේ ඉන්නේ නැහැ. දැන් ඒ වාගේ දේවල් මුකුත් කරන්නේ නැති වුණාට තවම ආයෝජකයෝ එන්නේත් නැහැ. *[බාධා කිරීමක්]* ඕක තමයි මම කියන්නේ.

මට ඕනෑ වන්නේ ශක්තිමත් ආර්ථිකයක් හදන රටක්. මට රතු ද, කොළ ද, කහ ද කියන එක නොවෙයි වැදගත් වන්නේ. අපි එදා ඉඳන් කථා කරලා හංවඩු ගැහිලා තිබෙන්නේ නිකම් නොවෙයි. අපටත් අවශ්‍ය වන්නේ රටේ ආර්ථිකය හදා ගන්න. මොකද, අපි Public Finance Committee එකේදී වුණත් කථා කරන්නේ රටේ ඌනතාවය නැති කරන්නේ කොහොමද කියන එක ගැනයි. නමුත්, මේ කරන දේවල් නිසා ඒ ඔක්කෝම negative. දැන්, operation was successful, but the patient died වාගේ තත්ත්වයක් තමයි අපට ඇති වන්නේ. මම මන්ත්‍රීවරු සියලුදෙනාගෙනුයි මේ කාරණය අහන්නේ. ඒකයි මම හැම වෙලාවේදීම ලාල් කාන්ත quote කරන්නේ. බොහොම හොඳයි. ස්ට්‍රයික් කරන්න බැහැ. උසාවියේ ගිහින් ඉන්න අයට අද කියලා තිබෙනවා, කිරි හරක් 10ක් අරගෙන ගිහිල්ලා ව්‍යාපාරයක් කරන්න, රජයේ රස්සා ඉල්ලන්න එපා කියලා. ඔන්න නඩුව. මෙන්න මේ වාගේ තමයි වෙන්න අවශ්‍ය වන්නේ. මොකද, කරන්න බැරි දෙයක් ගැන, -*[බාධා කිරීමක්]* ඉතින් එහෙම තමයි කරන්න බැරි,- *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, ඒක මේ සභාවේ ඔබතුමන්ලාගේ පැත්තේ පළමුවැනි පේළියේ ඉන්නා අයට කියන්න. රුපියල් 35කට ලබා දෙන පුනර්ජනනීය විදුලි ඒකකයක මිල අඩු කරනවා. නමුත්, ඉන්ධනවලින් උත්පාදනය කරන විදුලි ඒකකයක් වෙනුවෙන් රුපියල් 110ක් කිසිම ලජ්ජාවක් නැතුව ගෙවනවා. මොකක්ද මේකේ තේරුම?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මේක අඩු කරනවා විතරක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. මේක අඩු කරන්නේ cost එක අඩු කරන්න. ඒකත් අඩු කරනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි ඕවා නොදන්නා දේවල් නොවෙයි නේ. අපි බබ්බුද? අපි මේ කථා කරන්නේ හොඳ හිතින් මිසක් නිකරුණේ ප්‍රශ්නයක් ඇති කරන්න නොවෙයි. පුනර්ජනනීය විදුලි ඒකකයකට රුපියල් 25ක්

ගෙවන්න බැරි ආණ්ඩුව, ඉන්ධනවලින් උත්පාදනය කරන විදුලි ඒකකයකට රුපියල් 110ක් ලජ්ජා නැතුව ගෙවන්න හේතුව මොකක්ද? *[බාධා කිරීමක්]* අර කිව්වා වාගේ යම් විධියකින් මාර්ගයේ දෙපැත්තෙන් කාර් දෙකක් ගියොත් ප්‍රශ්නයක් ඇති වෙනවා. හැබැයි, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය අහස වටේ ගිහිල්ලා මිලියන 50ක් තෙල්වලට වියදම් කළාම ඒක ප්‍රශ්නයක් නොවෙයි. මොකක්ද මේ කියන්නේ? මට අවශ්‍ය වන්නේ මේ රටේ ශක්තිමත් ආර්ථිකයක් හදන්නයි. මම කිව්වා වාගේ යුද්ධයක් ජයග්‍රහණය කරපු අපිට මේ ආර්ථික යුද්ධය දිනන්න බැරි නම් අපෙන් වැඩක් නැහැ. දැන් තිබෙන අවස්ථාව අනුව අපි සියලුදෙනාම එකතු වෙලා මේක තමයි හදා ගන්න තිබෙන්නේ.

මම කලිනුත් Central Bank එක ගැන කිව්වා. කරුණාකරලා ඒගොල්ලන්ට කියන්න, ඒගොල්ලන්ගේ independence එක තියාගෙන එතැන ඉන්න කියලා. මේ අය තමයි මේ රට කන්නේ. මම ඒක ප්‍රසිද්ධියේ කියනවා. මම විතරයි මේ වාගේ ස්ථාවරයක ඉඳන් කථා කරන්නේ. මොකද, මේගොල්ලන් හැම අවස්ථාවේදීම ණය ඇති කරන ක්‍රමයක් මේකේ හදන්න දෙන්නේ නැහැ. ඒගොල්ලන්ගේ credit creation නිසා ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. දැන් යම් විධියකින් fiscal success ඇවිල්ලා ඒගොල්ලන්ගේ inflation එක achieve කරන්න බැරි වුණාම කියනවා, ඔන්න ඕක වෙලා තිබෙන්නේ fiscal එකේ තිබුණු ගතිය නිසා කියලා. ඉතින් මේවා සම්බන්ධයෙන් අපි ස්ථාවරයකට එන්න ඕනෑ. මේගොල්ලන්ගේ ස්වාධීනත්වය මොකක්ද, මේගොල්ලන් කාටද වග කියන්නේ? හැම එකම එහෙමයි. Supreme Court එක වුණත් යම් විධියකින් ජනාධිපතිතුමාට දැනුම් දෙනවා, මෙන්න මෙහෙම තමයි වෙන්නේ කියලා. නමුත් මහ බැංකුව මොකක්ද කරන්නේ? ඒගොල්ලන් Public Finance Committee එකට සහ COPE එකට දෙගමනක් එනවා. එච්චරයි. අපි නිකම් මේවා ගැන කථා කරන්නේ නැහැ. ප්‍රායෝගික දැනුවත්කමක් තුළින් තමයි අපි මේ දේවල් ගැන කථා කරන්නේ.

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, මම මේ කථා කරන මොහොතේ මේ සභාවේ ඉන්න එකම ඇමතිවරයා ඔබතුමා නිසායි මා මේ කාරණය කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බලන්න රජයේ සේවකයා ඇත්තටම වැඩ කරන විධිය. දැන් අපි උදේ ඉඳන් රෑ වෙනකල් කථා කරනවා, USA market access ගැන. මොකද, අපට අපනයනය කරන්න පුළුවන් වන්නේ එහාට. දැන් market access කියලා අපි ඇමෙරිකාව දෙස බලාගෙන ඉන්නවා. මොකද, අපේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 3.2යි. ඒ කියන්නේ, මිලියන 3,200ක්. අපි ඇමෙරිකාවෙන් ආනයනය කරනවා, මිලියන 300ක්.

දැන් මේ කථා කරන මොහොතේ LNG ඕනෑ කියලා බලශක්ති ඇමතිතුමා බලාගෙන ඉන්නවා. ඉන්දියාවත් එක්ක කථා කරපු, Petronet LNG Limited එක ඕනෑ නැහැ කියලා cancel කරනවා. ඉන්දියාව කියන්නේ, අපේ රටට ඉතාම කිට්ටු, අපේ රට බංකොලොත් වුණාම අපට බිලියන 4ක් දුන් රට. නමුත්, ඒක cancel කරනවා. ඊට පස්සේ අපි යනවා, LNG නිෂ්පාදනය කරන්නේ නැති රටකට. Sinopec එක ලංකාවට හොඳයි කියලා අපි එදා කිව්වා. නමුත්, තවම ඒක ආවේ නැහැ. එන්නේ නැහැ. සියයට 10ක් ඕනෑ කියලා දැන් සියයට 20 මට්ටමට දමන්න හදනවා. මෙහෙම කළාම මොකද වෙන්නේ? එහෙම එන්න බැහැ කියන කොම්පැනියට අපි ගිහිල්ලා දැන් LNG එක දෙනවා. LNG නිෂ්පාදනය කරන්නේ නැහැ, Chinaවල. එතකොට අපට පුළුවන්, LNG තුළින් ඇමෙරිකාවට market access එක දෙන්න. New Fortress Energy එක ඇවිල්ලා අහලා තිබෙනවා. කොම්පැනි ගණනාවක් ඉල්ලා තිබෙනවා. ඒ තුළින් හොඳ deal එකක් අරගෙන බින්දුව කරන්න, ඒගොල්ලන්ගේ market access එක. මොකද, මේ කථා කරන මොහොතේ Philippinesවල එය සියයට 19යි කියලා තිබෙනවා. ඒගොල්ලන් කියලා තිබෙනවා, Philippinesවලට සියයට 0ට අපනයනය කරන්න කියලා. ඉන්දුනීසියාව සියයට 19කට; වියට්නාමය සියයට 20කට. මේ කථා කරන මොහොතේ Japan සියයට 15කට එය අඩු කරගෙන තිබෙනවා. එදා සියයට 25 කියලා තිබුණු එක දැන් සියයට 15ට අඩු කරලා තිබෙනවා. මොකද, ඒගොල්ලන් ඇමෙරිකානු ඩොලර් බිලියන 550ක් ඒ රටේ ආයෝජනය කරන්න නියමිතයි. මොකද, අපි බලන්න ඕනෑ, ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ මානසිකත්වය පිළිබඳව. එතුමා ව්‍යාපාරිකයෙක්. එතුමා බලන්නේ කොහොමද අපි trade කරන්න පුළුවන් වන්නේ කියායි. අනුර දිසානායක ජනාධිපතිතුමාගෙන් අපි ඉල්ලන්නේ කරුණාකරලා මේක විවෘත කරන්න කියලායි. අපි එතුමා හම්බ වුණාමත් ඒ ගැන කිව්වා. මේක වහගෙන ඉන්න එකෙන් අන්තිමට වෙන්නේ අපට අපනයනය කරන්න market එකකුත් නැති වන එකයි.

ආනයනය කරන එක වෙන තැනකට ගිහිල්ලා, අපි නිකරුණේ රටවල්වලින් ආනයනය කරනවා. මේ මොහොතේදී ඉන්දියාව ඉතාම සාර්ථකව ඒ කටයුතු කරගෙන යනවා. මම දන්නා විධියට මේගොල්ලන් සියයට 10-25 අතර deal එකක් ගහන්න හදනවා. ඒ deal එක ගැහුවොත් අපේ ඇඟලුම් කර්මාන්තයට මොකද වෙන්නේ? අපේ රබර් කර්මාන්තයට මොකද වෙන්නේ? අපේ ධීවර කර්මාන්තයට මොකද වෙන්නේ? අපේ රටින් යන ඒවා ඉන්දියාවෙන් යන්න පටන් ගන්නවා. මෝදි අගමැතිතුමා 26වැනි දා එංගලන්තයට ගිහිල්ලා Free Trade Agreement එකක්,- මේ, අපි එදා පටන් ගත්ත එක. ඔබතුමා තමයි මේ ආණ්ඩුවේ වෙළෙඳ ඇමති. ඒ නිසා ඔබතුමා කරුණාකරලා වහාම එංගලන්තයට යන්න. මොකද, Commonwealth Association එක ඉතා ආදරයෙන් සලකන රටක් තමයි ලංකාව. ඒගොල්ලන්ට කියන්න, අපට FTA එකක් දෙන්න කියලා. මොකද, Marks & Spencer සහ Unilever වාගේ කොම්පැනි ගණනාවක් තිබෙනවා. ඒගොල්ලන්ට මෙහාට එන්න කියන්න. මොකද, ඉන්දියාව මේ BRICS එක කියලා මේවා කරන්න රජයේ නිලධාරින් කිව්වාට වැඩක් නැහැ. මොකද, ඉන්දියාව anti-West නොවෙයි; pro-West නොවෙයි. නමුත්, ඉන්දියාව කියන්නේ බටහිර ලෝකයට විරුද්ධව කටයුතු කරන්නේ නැති රටක්. ඒ නිසා ඒගොල්ලන් දෙපැත්තම මිත්‍රශීලීව තියාගෙන ඉන්නවා. ඒගොල්ලන්ගේ සංකල්පය තමයි, හැමදෙනා එක්කම මිත්‍රශීලීව, කා එක්කවත් තරහා වෙන්නේ නැතුව ඉන්න එක. ඒ වාගේ විදේශ ප්‍රතිපත්තියක් තමයි ඔවුන් අනුගමනය කරන්නේ. මම ඉතා ඕනෑකමින් කියනවා, මේ අවස්ථාවේදී අපට මේ රට ආක්‍රමණය කරන්න පුළුවන් එකම දේ තමයි අපේ market access එක බින්දුව කරන එක කියලා. අපේ para-tariffs ගණනාවක් තිබෙනවා. ඒ නිසා තමයි ප්‍රශ්න කරන්නේ. රජයේ නිලධාරින් අද යම් විධියක ප්‍රශ්නයක් ඇති කරන්නද දන්නේ නැහැ මේ වාගේ ප්‍රශ්න කරන්නේ. ඇමෙරිකාවට බැහැ කියලා, චීනයට මේ රටේ ආයෝජනය කරන්නේ නැහැ කියලා, අපි ඉන්දියාවත් එක්ක අමනාප වෙලා ආපසු ගිහිල්ලා චීනයට දෙනවා, අපි කොහේටවත් වාසියක් ලබා ගන්නේ නැති තත්ත්වයක් යටතේ.

දැන් පාරවල් හදන්නේ නැහැ. කඩවත ඉඳලා මීරිගම දක්වා අධිවේගී මාර්ගය හදන්න අවුරුදු හතක් ගත වෙලා තිබෙනවා. දවසකට මිලියන 21ක් පාඩු වෙනවා කියලා ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් කියනවා. *[බාධා කිරීමක්]* ඉතින් ඔබතුමන්ලා ආවාට පසුව බිලියන 6ක් නැති වෙලා තිබෙනවා. කවුද ඒකට වග කියන්නේ? එතකොට උත්තර දෙනකොට මේවා අම්හිරියි. මේ අවුරුදු 76ක සාපයද තිබෙන්නේ? නැහැ, 76 plus මාස නවයක් දැන් ඔබතුමන්ලාගේ. ඒ නිසා මම කියන්නේ, මේ රටේ ආර්ථිකය ගෙන යන්න තිබෙන්නේ ආර්ථිකය විධියට කියන එකයි. දේශපාලන අරමුණකින් තොරව එකට වැඩ කරන්න ඕනෑය කියලා අපි එදා ඉඳන්ම කිව්වේ මෙන්න මේ නිසායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තු තුනක් මම ගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ, extra මිනිත්තුවත් එක්ක තමයි මම කිව්වේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලාල් කාන්ත ඇමතිතුමා කිව්වා වාගේ, වසන්ත සමරසිංහ ඇමතිතුමා දැන් කියනවා වාගේ, බිමල් රත්නායක ඇමතිතුමා SriLankan Airlines එක පෞද්ගලීකරණය කරන්න ඕනෑ, ව්‍යවසායකයන් බවට පරිවර්තනය කරන්න ඕනෑය කියනවා වාගේ, විජිත හේරත් ඇමතිතුමා පිට රට ගිහිල්ලා කියන ඒවා වාගේ අන්න ඒ ස්වරූපයේ ඔක්කෝම ඒවා ඉක්මනට ගත්තා නම් මේ ස්ථාවරය නිවැරදි වෙනවා. එතකොට වමට signal දාලා දකුණට හැරෙන්න ඕනෑ නැහැ. මේ කථා කරන මොහොතේදී අපි අපනයනකරුවන්ට යම් තැනක් හදලා දෙන්න බලන්න ඕනෑ.

මම ඔබතුමන්ලාට ඊයේ කිව්වා, අපේ anti-dumping duty සම්බන්ධයෙන්. අපේ anti-dumping duty සම්බන්ධයෙන් තිබෙන ලොකුම ප්‍රශ්නය මේකයි. මේ රටේ පාරිභෝගිකයා අපි ආරක්ෂා කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ සම්බන්ධයෙන් අපි සියයට 36ක් බදු ගෙවාගෙන, බැංකුවට සියයට 15-22 අතර පොලී ප්‍රමාණයක් ගෙවා ගෙන, ලෝකයේ වැඩිම විදුලි බිලක් ගෙවා ගෙන, ජල බිලක් ගෙවා ගෙන තමයි කටයුතු කරන්නේ. ඒ වාගේම ප්‍රවාහන ගාස්තු ඉතාම අධිකයි. ඔබතුමන්ලා පඩි වැඩි කළාට පසුව සියයට 110ක් ගන්නවා. බංග්ලාදේශයේ 80යි; වියට්නාමයේ 90යි; ඉන්දුනීසියාවේ 75යි. අපේ රටේ සියයක් තිබ්බාම තවත් වාර්තාවක් තියනවා. එතකොට SMEsවලට කරන්න පුළුවන් හැම දේම කරලා, අවසානයේ තමන්ගේ තිබෙන එකම ගෙයටත් පරාටේ නීතිය අනුව කටයුතු කෙරෙනවා.

දැන් මේ දේවල් ඔක්කොම කර කර යනකොට ඉඩමක් ගත්තොත් සියයට 18ක් ගෙවන්න ඕනෑ, VAT එකට. සියයට 4ක් ගෙවන්න ඕනෑ, Stamp Dutyවලට. බිල්ඩින් එකක් ගත්තොත්, ඒකට සියයට 18ක් විතරක් නොවෙයි, Capital Gain Tax එකත් ගෙවන්න අවශ්‍යයි. ඉතින් මේවා කථා කරනකොට කොහේද ව්‍යාපාරිකයාට ඉඩක් තිබෙන්නේ? මේ අයට වැඳලා පුදලා කියන්න ඕනෑ, කරුණාකරලා අපට ව්‍යාපාර කරන්න දෙන්න කියලා. ඔබතුමන්ලා ට්‍රිලියන 5ක් හොයන්න ඕනෑ, මේ අවුරුද්දේ වියදම් කරගෙන යන්න. මේ යන්නේ එදා වාගේ අය වැය නොවෙයි. දැන් අලුත් පනත අනුව දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13ක් පාවිච්චි කරන තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපි මේ ගමන වර්ධනයක් ඇති වුණේ නැත්නම් එන අවුරුද්දේ ගෙවන්න බැරි වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තුවක් මම ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

SVAT එක ගැන අද අපි කථා කළාම නියෝජ්‍ය ඇමතිතුමා කිව්වේ, අනිවාර්යයෙන්ම digitalize කරන තාක්කල්, ඒගොල්ලන් සතුටු වන තාක්කල් මේක ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා. දැන් කරලා තිබෙනවා, risk reduction exercise එකක්. එතුමා අද කිව්වාට මේක කරන්නේ fully computerized system එකකින් කියලා, ඒක manual intervention හරහා කරන්නේ කියලා අපට වාර්තා වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් සියයට 10ක්, 12ක් තමයි අපේ අපනයනකරුවන්ට උදවු කරන්නේ. සියයට 18ක් VAT ගෙව්වොත් සියයට 10ක් ලබන ලාභයකින් සියයට 8ක පාඩුවකටද කරන්න යන්නේ? මම ගරු මන්ත්‍රීතුමන්ලා ඔක්කොටම කියනවා, කරුණාකරලා මේවා කථා කරන්න කියලා. රජයේ නිලධාරින් ඇවිල්ලා ඒගොල්ලන්ගේ පුටුව රත් කරන්න කියන කථා තුළින් මේ ආණ්ඩුවේ ව්‍යාපාර කරගෙන යන්න බැහැ. මේ නිසා තමයි සමහර රජයේ සේවකයන්,- මේගොල්ලන් බූලත් කඩයක් කරගෙන ගිහිල්ලා නැහැ. මම ආණ්ඩුව ගැන විතරක් කියනවා නොවෙයි. මේ රජයේ නිලධාරින් බූලත් කඩයක් කරගෙන ගිහිල්ලාවත් නැහැ. මේ අය කියන්න යනවා, ක්‍රියාත්මක කරගෙන ගිය අයට. ක්‍රියාත්මක කරගෙන යනකොට තමයි මේකේ බර දන්නේ, මේකේ අමාරුව දන්නේ. පඩි වැඩි කළ එකට බොහොම සතුටුයි. නමුත්, ඒක bottom line එකට affect වුණාම අපේ තරගකාරී තත්ත්වය අඩු වෙනවා.

අනෙක් පැත්තෙන්, IMF එක කිසිම බදු සහනයක් දෙන්න උත්සාහ කරන්නේ නැහැ. එහෙම සහනයක් දෙන්නේ නැති වුණාම SME sector එක නැති කරනවා, සියයට 63ක් මේ රටේ කොඳු නාරටිය. මේක නැති වෙනකොට අපේ කොම්පැනිවලට මේ වාගේ ඒවා ගෙනෙනකොට භය වෙලා අන්තිමට ව්‍යාපාරය ඩුබායි යන්නේ ඒ නිසායි, බහරේන් යන්නේ ඔය නිසායි, මැලේසියාවට යන්නේ ඔය නිසායි. මේක වෙනස් කරන්න ඇමතිතුමා. මේක කියන්නේ කුහකකමින් නොවෙයි. ඔබතුමන්ලා හිතන ආකාරයෙන් නොවෙයි අපි මේක කියන්නේ. අපට හැඟීමක් තිබෙනවා. මොකද, ප්‍රශ්නයක් ඇති වුණාම ආයෙත් ඕක කැරකිලා මේ පැත්තට එනවා. අපට ආර්ථිකයක් තිබෙන්න ඕනෑ ගෙනියන්න. දැන් ඔබතුමන්ලාට ශක්තිමත් ආර්ථිකයක් ලැබුණේ. මොනවා වුණත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ආර්ථිකය සවිශක්තිමත් කරලා ඒ දුන්නු තල්ලුව,- *[බාධා කිරීමක්]* Supreme Court එක දුන්නා. ඒක වෙනම දෙයක් නේ. නමුත්, ඒ දුන්නු තල්ලුව නිසායි අද මෙහෙම කටයුතු කරගෙන යන්නේ. ඔයගොල්ලන් IMF එකේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනියන්නේ ඒ යන මාර්ගය හරි නිසා නේ. එහෙම නැත්නම් ඔයගොල්ලන්ට ඒක වෙනස් කරන්න තිබුණා නේ. ඔයගොල්ලන් ඒක කරන්නේ නැහැ කියලා ආපු කට්ටිය නේ. *[බාධා කිරීමක්]* නැහැ, ඒ වුණත් ඒ ශක්තිමත් බව තමයි අද ඉදිරියට ගෙනියන්නේ. ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් තිබෙනවා. IMF එකට ගෙදර යන්න පුළුවන් කියලා ඔබතුමන්ලාට වෙනස් කරන්න පුළුවන්. එහෙම වෙනස් කරන්නේ නැත්තේ වෙනත් විකල්පයක් නැති නිසා. ජේ.ආර්. ජයවර්ධනට හෙණ ගහනවා කියනවා, විවෘත ආර්ථිකය ගෙනාවා කියලා. නමුත්, විවෘත ආර්ථිකය වෙනුවට වෙනත්

විකල්පයක් නැහැ කියලා ඔයගොල්ලන් පිළිගන්න නිසා තමයි අනුර දිසානායක ඒ මාර්ගයේ යන්නේ. හරි. ඒක වෙනස් කරන්න එපා. ඒක නිසා තමයි එක්සත් ජාතික පක්ෂය මහවැලිය හැදුවේ, අධ්‍යාපනය හැදුවේ, මහපොළ හැදුවේ. මේ ගරු සභාවේ ඉන්න ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන්ගෙන් සියයට 90ක් මහපොළ අරමුදල හරහා අධ්‍යාපනය ලබලා තමයි මෙතැනට ආවේ. මෙන්න මේ වාගේ ඒවා ආරක්ෂා කරලා ඉදිරියට යන්න. මේවා තුළින් තමයි ආර්ථිකය ශක්තිමත් වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම දන්නවා ඔබතුමිය මට කථාව අවසන් කරන්න කියලා කියන බව.

ඔබත් ඒ 159දෙනාගෙන් එක්කෙනෙක්. ඔබ හොඳට දන්නවා, ව්‍යාපාර සම්බන්ධයෙන්. අඩු ගානේ ඒ ප්‍රායෝගික දැනුමත් එක් කරන්න. ඒ නිසා මම මේ අවස්ථාවේ ඉල්ලන්නේ, SVAT එක online සිදු වෙනකල්, e-filing කරන කල්, Registrar of Companies වැඩ කරනකල්, මේ ASYCUDA එක වැඩ කරන කල්, Sri Lanka Customs එක online වෙනකල් මේවා වුට්ටක් අඩු කරන්න. මේක ආදායම් උපයන එකක් නොවෙයි, system හදන එකක් තමයි මේ කියන්නේ. මම බොහොම අගය කරනවා, ඔබතුමිය ඉතා නම්‍යශීලීව වසන්ත සමරසිංහ මහත්මයා ප්‍රශ්නයට උත්තර දෙන්න ගත්ත වෙලාව හරියාකාරව ගණනය කරලා දුන්න එකට.

අපි එකට එකතු වෙලා මේ රටේ ශක්තිමත් ආර්ථිකයක් හදමු. ඒ හදන කොට මේ රට ඉදිරියට ගෙනියන්න පුළුවන් ශක්තියක් ඇති වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.36]

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා විසින් අද දවසේ ඉදිරිපත් කර තිබෙන 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මධ්‍යාහ්නයේ ඉඳලා විශේෂ සාකච්ඡා, සංවාද අපට අහන්නට ලැබුණා.

විශේෂයෙන් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ගෝලීය ප්‍රතිපත්ති සකස් කරන ප්‍රධාන ආයතනයක් වන මූල්‍ය කාර්යසාධක බළකාය විසින් නිර්දේශ 40ක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිර්දේශ 40න්, 39කට එකඟ වෙලායි අපි ශ්‍රී ලංකාව විධියට මේ කටයුතු කරගෙන යන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ අරමුණ, බලාපොරොත්තුව මොකක්ද කියා අපි දන්නවා. අපේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ බොහෝ රටවල මේ වෙනකොට විවිධ සමාගම්, විවිධ ආයතන හතු පිපෙන්නා වාගේ දවස ගණනේ එළියට එන බව අපි දන්නවා. තනි පුද්ගලයෝ විධියට වෙන්න පුළුවන්, එහෙම නැත්නම් තුන් හතරදෙනාගේ කණ්ඩායම් විධියට වෙන්න පුළුවන්, විවිධ සමාගම් එළියට ඇවිල්ලා තිබෙනවා. ඒවා විවිධ මුහුණුවරින් එනවා. සමහර ඒවා සමුපකාර විධියට එනවා, සමහර ඒවා සංවිධාන විධියට එනවා, සමහර ඒවා ආයතන විධියට එනවා. මේ විවිධ ආයතන විධියට, සංවිධාන විධියට එන සමාගම් පසුගිය කාලය පුරාවටම මේ පනතේ සමහර කාරණා අස්සේ හැංගිලා කළු සල්ලි සුදු කරන්න පාවිච්චි කළා. ඒ වාගේම, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සපයන්න පාවිච්චි කළා. ඒ නිසා අපිට ආණ්ඩුවක් විධියට චූවමනා කරලා තිබෙනවා, ඉතිහාසය පුරාවට මේ වෙච්ච වැරැදීම් ටික නිවැරැදි කරන්න. ඒ නිවැරැදි කිරීම් වෙනුවෙන් තමයි, අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේන්නේ. ඒක නිවැරැදි කරන්න යනකොට, බොහෝදෙනෙකුට රිදීම් ඇති වෙනවා. සමහරුන්ට මේ පනත නිවැරැදි වෙලා ඉදිරියට නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නා විට බොහෝ පීඩනයන්ට ලක් වෙන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට ඕනෑ කරන්නේ, අපේ රට ඇතුළේ ස්ථාපිත කර තිබෙන සමාගම්, ආයතන ඇතුළේ ගම් මට්ටමේ ඉඳලා ආයෝජනය කර තිබෙන පුද්ගලයන් කවුද කියලා හඳුනා ගැනීමයි; ඒ තොරතුරු ඒකරාශී කර ගැනීමයි. ඇයි ඒ? සමහර සමාගම් ස්ථාපිත කර තිබෙනවා, දෙදෙනායි, තුන්දෙනායි ඉන්නේ. ඒ විධියට ස්ථාපිත කරලා, විවිධ විධියට මුදල් ආයෝජනය කරලා, ඒ පවත්වා ගෙන යන සමාගම් සම්බන්ධයෙන් පසුගිය කාලයේ අපි දැක්ක දෙයක් තිබෙනවා. ඒ තමයි, රටේ ජනතාව දිගින් දිගටම සමහර ආයතන ඉස්සරහට ඇවිල්ලා උද්ඝෝෂණය කළා; තමන්ගේ මුදල් ඉල්ලන්න පටන් ගත්තා. තමන්ගේ ඒ මුදල් නැතිවීම නිසා නීතිය ඉස්සරහට ගියා. ඒ නිසා ඉතිහාසයේ වසන් වෙලා තමන්ගේ චූවමනා වෙනුවෙන් ඒ වැඩකටයුතු කරපු, ඒ සමාගම් වෙනුවට මේ රටේ ජනතාවට වග කියන ආයතන වාගේම, ඒවා පිළිබඳ ගම් මට්ටමේ ඉඳලා ඇත්ත තොරතුරු නිරාවරණය කර ගැනීමක් අපට අවශ්‍යයි. ඒ වෙනුවෙන් මේ ගෙනෙන ලද පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවිධ සාකච්ඡා, සංවාද යමින් තිබෙනවා.

මේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කළත්, අපට තිබෙන දුක තමයි, මේ පනත් කෙටුම්පත අද සම්මත වෙලා, නීතියක් බවට පත් වෙලා සමහර කාරණා සොයන්න පටන් ගන්නා විට, සමහර සමාගම්වල, එහෙම නැත්නම් ඉතිහාසයේ හිටපු සමහර අයගේ සමාගම් ලෙස ලියාපදිංචි කරපු ඒවා පිළිබඳ තොරතුරු බොහෝ දේවල් ඉදිරියට එළියට එයි. සමහර විට ඒ අයගේ නෝනා, දරුවා, ගෙදර බල්ලා පවා -මේ ඔක්කොම- මේ සමාගම් ඇතුළේ ඉන්න පුළුවන්. එහෙම ලියාපදිංචි කරපු සමාගම් ගැන බොහෝ තොරතුරු ඉස්සරහට එළියට එන්න පුළුවන්, මේ රටේ ජනතාවගේ මුදල් කොහොමද හොරකම් කෙරුවේ, කොහොමද වංචා කෙරුවේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මතු කරන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. මීට පෙර අදහස් දක්වපු ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා අද මේ ගරු සභාවේදී අපේ තරුණ සංගමය හෙළා දැක්කා. අද -ජූලි 23වැනිදා- ඉතිහාසයේ අපිට කළුළු එකතු කරපු දවසක් කියලා අපි දන්නවා. අභාවාචික අත්දැකීම් එකතු කරපු දවසක්. ඉතිහාසයේදී යාපනය පුස්තකාලය ගිනි තියලා, ඒ අභාවාචික අත්දැකීම් අපට එකතු කළා. ඒ කාරණාවට වග කියන්න ඕනෑ සමහර පාලකයෝත් අද මේ පුටුවල ඉන්නවා.

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

එවන් අවස්ථාවක අපි ජාතික ජන බලවේගය විධියට, තරුණ සංගමය විධියට දෙමළ සහෝදරත්වයත් එක්ක එක්කහු වෙලා රට පුරාම සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව තුළ ජාතික සමඟිය ඒකරාශි කිරීම වෙනුවෙන් අපේ සහෝදරත්වය උතුරට රැගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ සහෝදරත්වය රැගෙන යැමද අද හෙළා දකින්නේ මේ මන්ත්‍රීවරු? ඒ නිසා ජාතික ජන බලවේග අපේ ආණ්ඩුව මේ රටේ ගම් මට්ටමින් අස්සක් මුල්ලක් නැර සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව එකතු කරනවා. අද මේ රටේ ජාතික සමඟිය ඇති කිරීමට අපේ ආණ්ඩුව, අපේ තරුණ සහෝදරත්වය යාපනයට යනකොට, මේ රටේ ඉතිහාසය පුරාවට අසමඟිය හදලා ජනතාව කාකොටා වට්ටලා, ජාතීන් කාකොටා වට්ටලා බලය ඩැහැ ගත්තු පාලකයන්ට ඒක දරා ගන්න බැහැ. උතුරේ දෙමළ සහෝදරත්වයත් එක්කහු වෙනකොට, නැඟෙනහිර ඒ සහෝදරත්වයත් එක්කහු වෙනකොට ඒවා දරාගන්න බැරි සමහරු -සමහර මන්ත්‍රීවරු - ඒක හෙළා දකින තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අවාසනාවක මහත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට පෙර මන්ත්‍රීවරයෙක් කිව්වා, අද කෝටි ගණනක රත්තරන් ගත්තත් වැඩක් නැහැ ලු, ඒවා දාගෙන පාරේ බැහැලා යන්න බැහැ ලු. රත්තරන් කෝටි ගණන් අරගෙන පාරේ බැහැලා යන්න බැරි රටක් නිර්මාණය කරපු පාලකයෝ අද ලජ්ජා නැතිව මේ ඉස්සරහට වෙලා කථා කරනවා, අද රටේ පාරේ බැහැලා යන්න බැහැ කියලා. අද මේ පනත් කෙටුම්පත සම්මත වෙලා නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තාම, කෝටි ගණන් රත්තරන් හම්බ කරපු, හොරකම් කරපු, වංචා කරපු ඔය බොහෝ පාලකයන්ගේ ඇස් රතු වෙන තත්ත්වයක් ඇති වෙනවා.

අද දවසින් දවස අධිකරණය මඟින් ඓතිහාසික තීන්දු ලබා දෙමින් තිබෙනවා. මීට පෙර කථා කරපු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය පැවසුවා, අදත් ඓතිහාසික තීන්දුවක් ලබා දුන් බව. 2022 වර්ෂයේ ඇති වූ අරගළයේ අරගළකරුවන්ට අනීතික ලෙස, තමන්ට වුවමනා ලෙස පහර දීම කරපු රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයාගේ ඒ ක්‍රියාව වැරැදියි කියලා අද අධිකරණය විසින් ඔප්පු කරලා තිබෙනවා. මේ ජාතික ජන බලවේගය අපේ ආණ්ඩුව දවසින් දවස නීති අණපනත් සම්මත කරමින් අපේ රට නිවැරදි ගමනට යොමු කරමින් තිබෙනවා, සංවර්ධනයේ නිවැරදි දිශාවට යොමු කරමින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ගෙවුණු පළමු මාස 6 ඇතුළේ විදේශීය ආයෝජන සියයට 101ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. මේ ගෙවුණු මාස 6 ඇතුළේ දේශීය ආයෝජකයන්ගේ සියයට 13ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. විදේශීය ආයෝජනය සියයට 101කින්, දේශීය ආයෝජනය සියයට 13කින් වර්ධනයක් අත්පත් කර ගෙන රටේ ආර්ථිකය ශක්තිමත් කර ගනිමින් මේ යන ගමනට අද මේ සම්මත කර ගන්න පනත් කෙටුම්පතත් තව තවත් අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහා බොහෝ ඉවහල් වෙයි කියන ප්‍රකාශය කරමින් මම නවතිනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.44]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හිතනවා මේ සමාගම් පනතත් එක්කම අලුත් සමාගම් ඇති වෙනකොට බදු වැඩි වෙනවා. ඒකත් එක්ක සම්බන්ධ වෙන කාරණාවක් තමයි මේ කථා කරන්න යන්නේ.

2025 වසරේ මැයි මාසයේ 27වැනි දා මේ රටට ගෙන්වන ලද වාහන 500ක, 600ක වාගේ ප්‍රමාණයක් ආණ්ඩුව විසින් මේ වෙනකොට මුදා හැරීම නවත්වලා තිබෙනවා. මේ වාහන ඔක්කෝම හම්බන්තොට වරායේ තිබෙනවා. ආණ්ඩුව කියනවා, cross-border ප්‍රශ්නය උඩ මේ වාහන නිදහස් කරගන්න දෙන්නේ නැහැ කියලා. මේ පිළිබඳව වාහන ආනයනකරුවන් එක්ක කථා කළාම ඔවුන් කියනවා, 2013 ඉඳන් මේ ක්‍රමය ක්‍රියාත්මක වුණා කියලා. ඒක ක්‍රියාත්මක වෙලා වාහන ගෙන්වන එක නැවැත්වුවාට පස්සේ, රේගුව විසින් මාර්තු මාසයේ 13වැනි දා නිකුත් වූ ගැසට් අංක 2428/07 යටතේ නැවත වතාවක් වාහන ගෙන්වලා මුදා හරිනවා. නමුත්, මේ cross-border ප්‍රශ්නය කියලා මැයි මාසයේ 27වැනි දා නැවත වතාවක් මේ වාහන මුදා හැරීම නවත්වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කිව්වා වාගේ 2013 ඉඳන් practise කරපු ක්‍රමයක් මේක. මේ cross-border ක්‍රමයට තමයි මේ රටේ තිබෙන brand new වාහන ගෙන්වන ආයතනත් වාහන ගෙන්වන්නේ. නමුත්, ඒ වාහනවලට එළියට ගෙනයන්න දෙනවා. පාවිච්චි කරපු වාහන එළියට ගන්න ගියාම තමයි මේ ප්‍රශ්න තිබෙන්නේ. දැන් ආනයනකරුවෝ කියනවා, "මේ ආණ්ඩුවත් එක්ක වාර කිහිපයක් කථා කළා. නමුත්, උත්තරයක් ලැබෙන්නේ නැහැ" කියලා. දැන් ඒ වාහනවලට ඔක්කෝම මුදල් ගෙවලා ඉවරයි. ඒවාට ඩොලර්ස් ගිහිල්ලා ඉවරයි. දැන් බදු ගෙවලා වරායෙන් එළියට ගන්න විතරයි තිබෙන්නේ. දැන් වාහන 600ක, 700ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා රේගුව භාරයේ තියාගෙන ඉන්නවා, නිදහස් කරන්නේ නැහැ. අපට නොතේරෙන දේ තමයි ඇයි මේක විසඳන්න ආණ්ඩුව ඉදිරියට එන්නේ නැත්තේ? ඇයි මේ පිළිබඳව තීන්දුවක් ගන්න බැරි? මම හිතනවා අපේ-

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
උත්තරයක් දෙන්නද?

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඔව්, මගේ කථාවෙන් පස්සේ උත්තරයක් දෙන්න. මම කථා කරනකොට උත්තරය දීලා වැඩක් නැහැ නේ. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලාට උත්තර මතක් වෙන්නේත් අපි කථා කළාම නේ. නැත්නම් උත්තර මතක් වෙන්නෙත් නැහැ. *[බාධා කිරීමක්]* මොකක්ද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඇමතිතුමා උත්තර දෙයි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඇමතිතුමා උත්තර දෙන්න ඕනෑ මට නොවෙයි, ආනයනකරුවන්ටනේ. ආනයනකරුවන්ට උත්තර දීලා නැහැ නේ. තවම වාහන ටික තිබෙනවානේ වරායේ. Cross-border

ප්‍රශ්නයක් නිසා නිදහස් කර ගන්න විධියක් නැහැ නේ. කලින් ඒ ක්‍රමය තිබුණා නේ. ඒ වුණාට තවම ආනයනකරුවන්ට උත්තරය ලැබිලා නැහැ. ඒගොල්ලෝ හැම දාම මැසිවිලි නඟනවා. නමුත්, උත්තරය ලැබිලා නැහැ. එක්කෝ ඒ වාහන ටික නැවත යවන්න ඕනෑ. එහෙම නැත්නම් වාහන ටික release කරන්න ඕනෑ. නමුත්, දැන් ආනයනකරුවෝ demurrage ගෙවන්න ඕනෑ. Demurrage ගෙව්වාම ඒ සල්ලි ටිකත් යන්නේ චීන්නුන්ට. මොකද, ඒ ඔක්කෝම වාහන ටික හම්බන්තොට වරායේ තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා වහාම මේ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වෙලා විසඳුමක් දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් සමහර වාහනවල මිල බලන්න. දැන් Wagon R රථයක මිල කීයද? තමුන්නාන්සේලා ආවේ Vitz එක ලක්ෂ 18ට දෙන්න. Wagon R එකක් කියන්නේ, මේ රටේ පහළම මධ්‍යම පාන්තිකයන් පාවිච්චි කරන බඩී ජීප් එකට සමාන වාහනයක්. ඒක hybrid petrol වාහනයක් කියලායි තිබෙන්නේ. නමුත්, දැන් මෑතක ඉඳන් ශ්‍රී ලංකා රේගුව hybrid petrol කියලා එන ඒ වාහනයේ HS code එක වෙනස් කරලා පෙට්‍රල් කියලා තමයි duty එක ගහන්නේ. Hybrid petrol කියලා එනකොට වාහනයට ලක්ෂ 35ක් බදු ගෙව්වා. දැන් පෙට්‍රල් කියන නිසා ලක්ෂ 40ක් බදු ගෙවන්න ඕනෑ Wagon R එකකට. ඒ කියන්නේ, Wagon R එකක මිල market එකේ ලක්ෂ 70ක් වනවා. තමුන්නාන්සේලා කථා කළේ ලක්ෂ 18ට Vitz එකක් දෙන්න. දැන් ලක්ෂ 18ට Vitz එකක් තියා Wagon R එකක්වත් ගන්න බැහැ. Wagon R එකකට දැන් ලක්ෂ 40ක් බදු ගෙවන්න ඕනෑ. *[බාධා කිරීමක්]* එතුමා කාමරය වහගෙන ඉන්නේ. හම්බ වෙන්න එන්න දෙන්නෙත් නැහැ. ආනයනකරුවන් දෙපාරක් එතුමා හමු වෙලා තිබෙනවා. එතුමා උත්තරයක් දෙන්නේ නැහැ. දැන් මම මේ ප්‍රශ්නය අහපු නිසා මට උත්තර දීලා වැඩක් නැහැ, ගරු ඇමතිතුමනි. ඒ උත්තරය දෙන්න ඕනෑ ආනයනකරුවන්ට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාරණය කියලා මම කථාව අවසන් කරනවා.

දැන් මේ රටට ගෙන්වනවා BYD කියලා brand new වාහනයක්. ඒ BYD කියන වාහනය ගෙන්වන ආයතනය BYD ATTO 3 කියලා වාහනයක් ගෙන්වනවා. ඒක එන්නේ මෝටර් බලය කිලෝවොට් 100යි කියලා. Brand new ගෙන්වන ඒ වාහනයේ සඳහන් වෙන්නේ, මෝටර් බලය කිලෝවොට් 100යි කියලා. ඒ වාහනයට ලක්ෂ 55ක් බදු ගහනවා. ඊළඟට, BYD ATTO 3 used වාහනය එනවා. ඒ used වාහනයට ලක්ෂ 95ක් බදු ගහනවා. නමුත්, එතැන තිබෙන ප්‍රශ්නය තමයි, ඒ used වාහනයේ මෝටර් බලය කිලෝවොට් 150යි කියලා තමයි ලියාපදිංචි වෙන්නේ. කිලෝවොට් 100 කියලා ලියාපදිංචි වනවා, brand new වාහනය. ඒ brand new වාහනයට ලක්ෂ 55ක් බදු ගැහුවාම, අර used වාහනයට ලක්ෂ 95 -100ක් බදු ගැහුවාම, ලක්ෂ 45ක පරතරයක් තිබෙනවා, බදුවල. මේ රටට ඒ වාහන ගෙන්වන ආයතනය ආණ්ඩුවත් එක්ක මොකක් හෝ සම්බන්ධයක් තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. අර කන්ටේනර්ස් නිදහස් කළා වාගේ අඩුවෙන් බදු ගහලා වාහන නිදහස් කරනවාද දන්නේ නැහැ. මොකද, BYD website එකට ගිහින් බැලුවාම, BYD website එකේ BYD ATTO 3 වාහනයේ මෝටර් බලය තිබෙන්නේ කිලෝවොට් 150යි කියලා. කිලෝවොට් 100ක වාහනයක් නැහැ. නමුත්, වරායෙන් පිට කරනවා brand new වාහනය කිලෝවොට් 100යි කියලා; ලක්ෂ 55ක් බදු ගහනවා. Reconditioned වාහනය කිලෝවොට් 150යි; ලක්ෂ 100ක් බදු ගහනවා. ඉතින්, කොහොමද එහෙම වෙන්නේ? එහෙම වෙන්න විධියක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා ගරු ඇමතිතුමාත් ඉන්න වෙලාවේ මම කියනවා, වාහන 500ක්, 600ක් වරායේ හිර වෙලා තිබෙනවා. ඒ වාහනවලට ඩොලර්ස් ගෙවලා ඉවරයි. ඒ වාහන ටික වහාම නිදහස් කරන්න පියවර ගන්න කියලා ඇමතිතුමාගෙන් සහ රජයෙන් අපි ඒ ඉල්ලීම කරනවා.

බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වාහන තුන් හාරසියයක් වරායේ හිරකර තබාගෙන ඉන්නවා කියන කාරණය ගැන පැහැදිලි කිරීමක් කළ යුතුයි. වරායේ ඒ වාහන තිබෙනවා. නමුත්, ඒ තිබෙන්නේ අපේ තිබෙන අකාර්යක්ෂමතාවක් හෝ වෙනත් ගැටලුවක් නිසා නොවෙයි. ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, ඒ regulations violate වෙලා තිබෙනවා කියලා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වාට ආනයනකරුවන් මා හමු වන්න ආවේ නැහැ කියලා, ආනයනකරුවන් විවිධාකාරයට ආවා. ඔබතුමා ඉදිරිපත් කළ ආකාරයේ විවිධ කරුණු ඉදිරිපත් කළා. ඇත්තටම අතීතයේ විවිධ භාවිත පැවතිලා තිබෙනවා. මේ විධියට regulations violate වුණාම වාහන නිදහස් කරගෙන යන ක්‍රම පැවතිලා තිබෙනවා. අපි ඒ සියලු කාරණා විමසා බැලුවාම, අපි නිකුත් කරපු 2025 ගැසට් නිවේදනයේ ඉතා පැහැදිලිව තිබෙනවා, cross-border LCs යටතේ ආනයනය කිරීම ගැටලුවක් නොවන බව.

මෙතැනදී used vehicles සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව කියා තිබෙනවා, ඒ certification එක, deregistration එක, Certificate of Cancellation of Registration ඕනෑ. ඒක ගන්න බැරිවෙලා තිබෙනවා. ඉතින්, අතීතයේදී වැරැද්දක් වෙලා තිබෙනවා. නමුත්, අපි තව වැරැද්දක් කරන තැනට යන්න ඕනෑ නැහැ. ඒ වාහන ආනයනය කරපු අය දන්නවා, regulationsවල වැරැද්දක් සිද්ධවෙලා තිබෙනවා කියලා. නමුත්, ඒ ගොල්ලෝ යම් උත්තරයක් ලබා ගැනීමට තමයි කල්පනා කළේ. අපි බැලුවා, මොකක්ද සිද්ධවෙලා තිබෙන්නේ කියලා. අපි ඉතාම පැහැදිලිව කියනවා, මෙතැන regulation violation එකක් සිද්ධවෙලා තිබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩියක කාලයක් දෙන්න.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, ඒ registration එක cancel කරපු document එක submit වෙලා නැහැයි කියලා. නමුත්, ඔවුන් ආනයන හා අපනයන Controller General එක්ක කථා කරනකොට ඒක නොවෙයි කියලා තිබෙන්නේ. ආනයන හා අපනයන Controller General කියන්නේ මේ ගැසට් එක වෙනස් වෙන්න ඕනෑ කියලා. එහෙම නැතුව, මේ documentsවල කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා කියනවා. අදාළ documents ඔක්කෝම ඒ ගොල්ලෝ submit කරලා තිබෙන්නේ. නමුත්, ගැසට් එකේ තිබෙන අවුලක් නිසා ඒ වාහන release කරන්න දෙන්න බැහැ කියලා තමයි Controller General කියන්නේ.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අර්ථ නිරූපණය වැරැදියි. මෙතැනදී regulations violate වෙලා තිබෙනවා. ආනයනකරුවෝ කියන්නේ, වාහන ටික ගන්න නම් ගැසට් එක වෙනස් කරන්න කියන එක. ගැසට් එක වෙනස් කරන්න කියන්නේ, අර වැරැදිච්ච එක අපට ආපහු භාර ගන්න කියන එක. ඒ ගොල්ලෝ ආනයනය කරපු අය, ඒ ගැන දන්නා අය. ඒ ක්‍රමවේදය මොකක්ද කියලා මේකේ පැහැදිලිව කියලා තිබෙනවා. නමුත්, යම් හේතු නිසා අතීතයේදී ඒ documents කොහොම ගියාද, නැද්ද කියලා අපි දන්නේ නැහැ. අපි ඒ පිළිබඳවත් පරීක්ෂණ පවත්වනවා. යම් වාහන ප්‍රමාණයක් නිදහස් වෙලා තිබෙනවා. හැබැයි, ඒවා නිදහස්වෙලා ගිහින් තිබෙන්නේ, subject to post-audit. ඒ නිසා අපි අදාළ විගණනය කරන්න නියම කරලා තිබෙනවා. මේ violation එක සිද්ධවෙලා තිබෙන බව දැන් පැහැදිලිව පෙනෙනවා. ඔබතුමා කියන එක හරි. ගැසට් එක වෙනස් කරනවා නම් කරන්න වෙන්නේ, දැනට තිබෙන නීතිය වෙනස් කරලා, නමලා. එහෙම කරලා තමයි ඒ වාහන ටික එළියට දමන්න වෙන්නේ. දැන් ඒක කරන්න පුළුවන් මට්ටමක නොවෙයි තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.52]

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සාමාන්‍යයෙන් කියමනක් තිබෙනවා, "ගුරුන්නාන්සේ හිටගෙන කරන දේ ගෝලයෝ දුව-දුවා කරනවා" කියලා. මම ඒක කියන්නේ මෙන්න මේ නිසායි. අපේ ගරු විපක්ෂ නායකතුමා උදෙන්ම ඇවිල්ලා ලොකු බොරුවක් අතහැරලා යනවා. සම්පූර්ණ විපක්ෂයේම අය නොවුණත්, සමහර මන්ත්‍රීවරු ඒ පාර ඔස්සේම යනවා.

ගරු විපක්ෂ නායකතුමා ප්‍රකාශ කළා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වරාය අධිකාරිය සතු ඉඩම් සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී තිබෙනවා, දීර්ඝ කාලයක් තිස්සේ ගොවීන් වගා කරපු ඉඩම් බලහත්කාරයෙන් මේ කටයුත්ත සඳහා යොදාගෙන තිබෙනවා කියලා. අපි එතුමාගෙන් දිගින් දිගට ඇහුවා, ඒ අනුමැතිය දීලා තිබෙන්නේ මොන අවුරුද්දේද කියලා. හැබැයි එතුමා ඒ අවුරුද්ද හැංගුවා. මම දිස්ත්‍රික් ලේකම්වරයාට කථා කරලා ඒ ව්‍යාපෘති වාර්තාව ගෙන්වා ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2023.07.01වැනි දා තමයි ඒ අනුමැතිය ලබා දීලා තිබෙන්නේ. එම නිසා ඒ අනුමැතිය දුන්නේ කවුද, ඒ වෙලාවේ මහ පුටුවේ සිටියේ කවුද, එයාගේ නම කියන්න තවම හය ඇයි කියලා මම ගරු විපක්ෂ නායකතුමාගෙන් අහන්න කැමැතියි.

ඊට පස්සේ, එතුමාගේ පාරේම යමින් ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා කියනවා, youth clubs පිහිටුවලා, ඒ youth clubs ඇතුළේ ජාතික ජන බලවේගයේ දේශපාලන ව්‍යාපාරය කරන්නට කටයුතු සූදානම් කරමින් ඉන්නවා කියලා. අපි එතුමාට මතක් කරන්නට ඕනෑ, අපේ ගරු නියෝජ්‍ය අමාත්‍ය එරංග ගුණසේකර මැතිතුමා මැදිහත්වෙලා යෞවන සමාජ - youth clubs - 14,033ක් නිර්මාණය කරන්න කටයුතු කරමින් සිටින බව. එය දකුණු ආසියාවේ විශාලම ස්වේච්ඡා සංවිධානය බවට පරිවර්තනය කරමින් ඉන්නවා. "තාරුණ්‍යයට හෙටක්" කියලා එකක් හදලා, තමන්ගේ පුතාලට, තමන්ගේ දරුවන්ට හෙටක් හදපු රටක් තිබුණා. හැබැයි, චානක මාදුගොඩ මන්ත්‍රීතුමාට ඒක අමතක වෙලා තිබුණා. ඒ වාගේම එතුමාට මතක් කරන්නට ඕනෑ, කුලියාපිටියේ පැවැති යූඑන්පී රැලියට ජාතික තරුණ සේවා සභාව පාවිච්චි කරලා, නැටුම් කණ්ඩායම් 6ක් ගෙනැල්ලා, වෑන් 4ක් සහ කැබ් රථයක් ගෙනැල්ලා ජාතික තරුණ සේවා සභාවේ මුදල් අවභාවිත කරපු හැටි. එතුමාට අද ඒක අමතක වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. 2024 පූර්ව ජනාධිපතිවරණ සමයේ මැතිවරණ කොමසාරිස් විසින් නවත්වන්නැයි නියෝග දී තිබියදී ව්‍යාපෘති 6ක් සඳහා රුපියල් මිලියන 308.25ක මුදලක් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබී ඇති අතර, භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් රුපියල් මිලියන 90ක මුදලක් වෙන් වෙලා තිබුණා, ජාතික තරුණ සේවා සභාවට. මේ රුපියල් මිලියන 90ක මුදලින් මිලියන 89.96ක මුදලක් - මම දන්නේ නැහැ, 0.04ක් ඉතිරි කළේ ඇයි කියලා - වියදම්කොට ඇති අතර, රුපියල් මිලියන 308.25ක මුදලින් මේ වන විට රුපියල් මිලියන 191ක් වියදම්කොට ඇති අතර, තවත් මිලියන 54ක මුදලක් ගෙවීමට තිබෙනවා. මෙන්න, ඒගොල්ලන් තරුණයන් යොදාගෙන දේශපාලනය කරපු විධිය. පූර්ව මැතිවරණ සමයේ මැතිවරණ කොමසාරිස්වරයා නතර කරන්න කියලා දැනුම් දී තිබියදී ඒගොල්ලන් එහෙමයි තරුණයන් මැතිවරණ ව්‍යාපාරවලට, තමන්ගේ පටු දේශපාලන වුවමනාවලට පාවිච්චි කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ දසවන පාර්ලිමේන්තුවට ඇවිල්ලා මාස 8කට ආසන්න කාලයක් ගතවෙලා තිබෙනවා. අපි ආපස්සට හැරිලා බලමු මේ මාස 8ක කාල සීමාව තුළ විපක්ෂයේ භූමිකාව සහ අපේ භූමිකාව කෙබඳුද කියලා. විශේෂයෙන්ම අපි මේ රට භාරගන්නකොට පත්ල නොපෙනෙන අඳුරු ආගාධයකට අපේ රට වේගයෙන් ගමන් කරමින් තිබුණා. නීතියක් නැති රටක් බවට පත් වෙලා තිබුණා. ආර්ථිකය සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා නතර වෙච්ච රාජ්‍යයක් බවට පත් වෙලා තිබුණා. ලෝකය ඉස්සරහ කළු රාජ්‍යයක් බවට අපේ රට පරිවර්තනය වෙලා තිබුණා. ඒ නිසා අපි අභියෝග දෙකකට මුහුණ දුන්නා. එකක් තමයි, අපේ රටේ ආර්ථිකය ඉක්මනින් පණගන්වලා ගොඩනඟා ගන්න එක. දෙවනුව, බිඳ වට්ටලා තිබුණු නීති රීති නැවත බලාත්මක කරන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අනුව පසුගිය කාලයේ -මේ මාස 8 ඇතුළත- නීතිය බලාත්මක කරන්නට අවශ්‍ය අණ පනත්, නීති රීති විශාල ප්‍රමාණයක් අපි මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරගෙන තිබෙනවා. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය සඳහා අදාළ පනත් කෙටුම්පත

අපි මේ කෙටි කාල සීමාව තුළ මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත අපි මේ පාර්ලිමේන්තුවේ සම්මත කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. 2025 අංක 7 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනැල්ලා අධිකරණ පද්ධතිය තව තවත් ශක්තිමත් කළා. 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු, අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත ගෙනැල්ලා ජාතික වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් පිළිගන්නා නීතියක් අපේ රටේ නිර්මාණය කර ගත්තා. 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතට සංශෝධන ගෙනැල්ලා තවදුරටත් අපි අධිකරණ පද්ධතිය බලාත්මක කරනු ලැබුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි 2007 අංක 7 දරන සමාගම් පනත සංශෝධනය සඳහා අදාළ වගන්ති කිහිපයක් ඇතුළත් කර තිබෙනවා.

මම දැක්කා, ඩිමෙන්ෂියා රෝගය හැදුණු ආර්ථික ඔස්තාර්ලා ඉන්නවා මේ විපක්ෂයේ. අන්න ඒ අය උපදේශ දෙනවා ජාත්‍යන්තර වශයෙන් පිළිගත්ත මේ පනත්, මේ සංශෝධන කුණු කූඩයට විසි කරන්න කියලා. විපක්ෂයෙන් හොඳ යෝජනාවක් ගෙනාවොත් ඒක ඉතාම සතුටින් භාරගන්නට අපි කැමැතියි. හැබැයි, දැන් මේ පනත් කෙටුම්පත, මේ සංශෝධන සියල්ල අයින් කරන්න හදනවා. ආයෝජකයන් අපේ රටට ඒමේ භීතියක් තිබෙනවා කියනවා. ආයෝජකයන් ආවේ නැත්තේ ඒ ගොල්ලන් මේ රට පාලනය කරනකොට. සංචාරක ව්‍යාපාරය කඩා වැටිලා තිබුණේ, විදෙස්ගත ශ්‍රමිකයන් ප්‍රේෂණ එව්වේ නැත්තේ, විදේශීය ආයෝජන ආවේ නැත්තේ, ඒ ගොල්ලන් මේ රට පාලනය කරද්දී. අපට දැන් ප්‍රශ්නයක් තිබෙනවා, මේ ඩිමෙන්ෂියා රෝගයෙන් පෙළෙන ආර්ථික ඔස්තාර්ලා කියන එකද අපි පිළිගන්න ඕනෑ, එහෙම නැත්නම් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ගෝලීය ප්‍රතිපත්ති සකස් කරන ප්‍රධාන ආයතනය වන මූල්‍ය කාර්ය සාධක බලකාය කියන දෙයද අපි පිළිගන්න ඕනෑ කියලා.

එදා අපි මේ රට භාරගන්නකොට නීතියක් නැති, අඳුරු ආගාධයක ගිලෙමින් තිබුණු රාජ්‍යයක් තිබුණේ. හැබැයි, අද මොකද වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි? ජාතික වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් නීති රීති, අණ පනත් ශක්තිමත් කරමින් අපි ඉදිරි ගමන ප්‍රවර්ධනය කරගෙන තිබෙනවා. ඒ නිසා අද ලෝකයේ සංචාරකයන්ට ඉතාම හොඳින් ආරක්ෂාව සපයන ගමනාන්තයක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා. අපේ විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ වශයෙන් ඉතිහාසයේ පළමු වතාවට වැඩිම ප්‍රමාණයක් -ඩොලර් බිලියන 6 ඉක්මවූ ප්‍රමාණයක්- මේ අවුරුද්දේ නිශ්චිත වශයෙන්ම අපේ රටට ගලාගෙන එනවා. ඒ වාගේම, නතර කර තිබුණු විදේශීය ආයෝජන නැවත පණ ගසා පටන් අරගෙන තිබෙනවා. අලුතින් විදේශීය ආයෝජන ගණනාවක් මේ වසර තුළ අපේ රටට ගලා ඒමට නියමිතව තිබෙනවා. මේ සියල්ල ඇවිල්ලා තිබෙන්නේ මෙන්න මේ නීතිය බලාත්මක කිරීම, ශක්තිමත් කිරීම තුළ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කාලය ලබා දීම වෙනුවෙන් බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.02]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றையதினம் நடைபெறுகின்ற கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு, எதிர்க்கட்சித் தலைவர் கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் முத்துநகர் சம்பந்தமாகப் பேசினார். நேரத்தைக் கருத்திற் கொண்டு அது தொடர்பில் சில விடயங்களைக் கூறலாமென நினைக்கின்றேன்.

திருகோணமலை மாவட்டத்திலுள்ள முத்துநகர் பிரதேசத்தில் காலாகாலமாக விவசாய நடவடிக்கைகளை மேற்கொண்டு வந்த மக்கள் இன்று அநாதைகளாக்கப்பட்டு இருக்கின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. இன்று எங்களுடைய எதிர்க்கட்சித் தலைவர் அவர்கள் பேசும்பொழுது, அந்தப் பிரதேசத்தில் ஏற்பட்டுள்ள நிலைமை சம்பந்தமாகவும் அங்கிருக்கின்ற விவசாய சம்மேளனத் தலைவர்களால் முன்வைக்கப்பட்டுள்ள கோரிக்கைகள் சம்பந்தமாகவும் மிகத் தெளிவாகச் சொன்னார். அந்தப் பிரதேசத்தில் மக்கள் 53 வருடங்களாக விவசாய நடவடிக்கைகளை மேற்கொண்டு வந்திருக்கிறார்கள். குறிப்பாக, 350க்கும் அதிகமானோர் அங்கு விவசாயம் செய்திருக்கிறார்கள். அதுமாத்திரமன்றி, விவசாயக் குடும்பங்களைச் சேர்ந்த 1,000க்கும் மேற்பட்டவர்கள் அந்தப் பிரதேசத்தில் வாழ்ந்திருக்கின்றார்கள். இரண்டு போகங் களிலும் பயிர்ச்செய்கை செய்கின்ற அல்லது விவசாய நடவடிக்கைகளை மேற்கொள்கின்ற கிராமமாக அந்தக் கிராமம் இருந்திருக்கிறது. அக்கிராமத்தில் சோளம், கச்சான், மரக்கறி போன்ற பயிர்ச்செய்கைகளும் நடைபெற்று இருக்கின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அந்தப் பிரதேசத்தில் 1972ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்ட பாடசாலை யொன்றும் இருக்கின்றது. அதேபோன்று, பள்ளிவாசல்கள் இருக்கின்றன; கோவில்கள் இருக்கின்றன. அங்கு மக்கள் வாழ்ந்ததற்கான, விவசாயம் செய்ததற்கான ஆதாரங்களும் இருக்கின்றன. இன்று அந்த இடத்தை அம்மக்களின் விருப்பம் இல்லாமல் சில தனியார் கம்பனிகளுக்கு வழங்கி இருக்கிறார்கள். இது சம்பந்தமாகத்தான் இன்று பேசப்படுகின்றது. எதிர்க்கட்சித் தலைவர் அவர்கள் இந்த விடயம் சம்பந்தமாகப் பேசும்போது, ஆளும் தரப்பினர் கோபமடைந்தார்கள். இது சென்ற அரசாங்க காலத்தில் ஆரம்பிக்கப்பட்ட ஒரு வேலைத்திட்டம் என்றும் அதற் கெதிராகத் தாங்களும் செயற்பட்டதாகவும் கூறினார்கள். அப்படியென்றால், அடிக்கல் நாட்டப்பட்டுள்ள, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கிண்ணியா பிரதேசத்திலுள்ள குறிஞ்சாக்கேணி பாலத்துக்கான நிதி ஒதுக்கீடு எந்த அரசாங்கத்தின் ஆட்சிக் காலத்தில் மேற்கொள்ளப்பட்டதென நான் அவர்களிடம் கேட்கின்றேன்.

நல்ல விடயங்களாக இருந்தால், நீங்கள் அதைப் பற்றி பேச மாட்டீர்கள். பிரச்சினைக்குரிய விடயமாக இருந்தால், அது கடந்த அரசாங்க காலத்தில் முன்னெடுக்கப்பட்ட விடயம் என்றும் அப்போதிருந்த அரச தலைவர்களால் எடுக்கப்பட்ட முடிவு என்றும் சொல்கின்றீர்கள். நாங்கள் இந்த விடயத்தில் உங்களைக் குற்றஞ்சாட்டவில்லை; நீங்கள்தான் இந்த விடயத்துக்குப் பொறுப்பு என்றும் சொல்லவில்லை. இன்று நீங்கள்தான் ஆட்சி அதிகாரத்தில் இருக்கிறீர்கள். அங்கு இருக்கின்ற அமைப்புகளுக்கும் தலைமை வகிக்கிறீர்கள்;

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

ஒருங்கிணைப்புக் குழுக்களுக்கும் தலைமை வகிக்கிறீர்கள். அதனால்தான் நாங்கள் கேட்கிறோம், சென்ற அரசாங்க காலத்தில் மேற்கொள்ளப்பட்ட பிழையான விடயங்களை நிவர்த்தி செய்து, அந்த மக்களுக்கு நியாயத்தை வழங்குங்கள் என்று.

இந்த விடயம் எதிர்க்கட்சித் தலைவர் கௌரவ சஜித் பிரேமதாஸவின் தந்தையின் காலத்தில் gazette பண்ணப்பட்டது என்று சொல்கிறீர்கள். அதற்குப் பின்னர் எத்தனை அரசாங்கம் ஆட்சிக்கு வந்தன? அந்தக் காலத்தில்கூட அந்த மக்கள் அடித்துத் துரத்தப்படவில்லை. ஆனால், இன்று அந்த மக்கள் வீதிக்கு இறங்குகின்ற நிலைப்பாட்டில் இருக்கிறார்கள். இந்த அரசாங்கம்தான் சொன்னது, மக்களை வீதிக்கு இறக்க மாட்டோம் என்று. மக்களுடைய பிரச்சினைகளுக்குத் தீர்வுகளை வழங்குவதாகச் சொன்ன இந்த அரசாங்கம், இன்று நாங்கள் இது சம்பந்தமாகப் பேசும்பொழுது, நீங்கள் கடந்த 76 வருடங்களைப் பற்றி பேசுகின்றீர்கள் அல்லது இது சென்ற அரசாங்க காலத்தில் நடைபெற்ற விடயம் என்று சொல்லி, தப்பிக்கொள்ள முயலுகிறது.

எனவே, இன்று பலம் மிக்கதோர் அரசாங்கமாக இருக்கின்ற உங்களுடைய அரசாங்கம் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற விவசாயிகளுக்கு நீதியையும் நியாயத்தையும் பெற்றுக்கொடுக்க வேண்டும். அதற்கான நடவடிக்கைகளை நீங்கள் முன்னெடுக்க வேண்டும். இன்று காலையில் இச்சபையில் எதிர்க்கட்சித் தலைவர் கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் முத்துநகர் விடயம் பற்றி பேசாமல் இருந்திருந்தால், இந்தப் பிரச்சினை எப்படி பேசப்பட்டிருக்கும் என்பதை நாங்கள் கேட்க விரும்புகின்றோம். இந்தப் பிரச்சினை தொடர்பில் கேட்ட கேள்விகளுக்கான பதில்களை நாங்கள் உங்களிடம் எதிர்பார்க்கின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
හොඳයි. මම කථාව අවසන් කරන්නම්.

எதிர்காலத்தில் எப்படி இந்தப் பிரச்சினையை நிவர்த்தி செய்ய வேண்டும் என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். ஏனென்றால், குறிப்பிட்ட அந்தக் கம்பனியின் வேலைகள் இன்று அங்கு ஆரம்பிக்கப்பட்டு இருக்கின்றன; குளங்கள் மூடப்பட்டிருக்கின்றன; பல பிரதேசங்கள் சூறையாடப்பட்டு இருக்கின்றன. நாங்கள் மின் சக்தி உற்பத்திக்கு எதிரானவர்களோ அல்லது solar power companyக்கு எதிரானவர்களோ அல்லர். அங்கு காலங்காலமாகப் பயிர்ச்செய்கை செய்துவந்த மக்களுக்கு ஒரு தீர்வை நீங்கள் வழங்க வேண்டும் என்பதுதான் எங்களுடைய வேண்டுகோளாகக் காணப்படுகின்றது.

சென்ற கால அரசாங்கத்தினர் எந்த விடயத்தை மேற்கொண்டிருந்தாலும், இப்பொழுது நாங்கள் அந்த விவசாயி களுக்கான தீர்வை வழங்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். அவர்களுக்கு நஷ்டஈடு வழங்குவதா? அல்லது மாற்றுக் காணிகளை வழங்குவதா? அல்லது அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மீதிக் காணிகளை வழங்குவதா? என நீங்கள் தீர்மானிக்க வேண்டும். இந்த அரசாங்கம் பலம் மிக்கதோர் அரசாங்கமாக இருக்கின்ற காரணத்தால் இதற்குரிய தீர்வை வழங்க வேண்டும் என்பதற்காகத்தான் நாங்கள் இந்த இடத்தில் இதனை ஞாபகமூட்டுகின்றோம். உண்மையிலேயே அங்குள்ள மக்கள் பல வேதனைகளை அனுபவித்து இருக்கிறார்கள். நீங்கள் கூறுகின்ற இந்தக் கருத்துகள் எல்லாவற்றையும் தேர்தல் மேடைகளில் கூறுவதற்கு மறந்து விட்டீர்களா? 2015ஆம் ஆண்டு அரசாங்கம் வழங்கிய உறுதிமொழிகளை மறந்துதானா நீங்கள் உங்களுடைய தேர்தல் மேடைகளில் சில உறுதிமொழிகளை வழங்கினீர்கள்? அந்த நேரத்தில் அவை உங்களுக்கு விளங்கவில்லையா? என நாங்கள் கேட்க விரும்புகின்றோம். தயவுசெய்து, இந்தப் பிரச்சினை தொடர்பான எல்லா விடயங்களையும் கருத்திற் கொண்டு, அந்த மக்களுக்கான தீர்வை வழங்குவதற்கு உங்களுடைய முழுமையான ஆதரவை நாங்கள் எதிர்பார்க்கின்றோம் என்று இந்த இடத்தில் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු භාග්‍ය ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 4.09]

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2007 අංක 7 දරන සමාගම් පනතට ගෙනෙන සංශෝධන සම්බන්ධයෙන් තමයි අද දිනයේදී මේ විවාදය පවත්වන්නේ. එම පනතට ගෙනෙන සංශෝධනයක් වන්නේ මූල්‍ය කාර්ය සාධක බලකායේ 24වන නිර්දේශය - Recommendation එක - විධියට තිබෙන ප්‍රතිලාභී හිමිකාරිත්වය, එහෙම නැත්නම් අර්ථලාභී අයිතිය - beneficial ownership එක -

දැනගැනීමට සැලැස්වීමයි. සමාගමක - company එකක - කොටස්වල සත්‍ය අයිතිකරුවන් කවුද කියන එක මහජනතාවටත්, නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලටත් දැනගැනීමට ඉඩ හැරීම තමයි මෙම සංශෝධනය මඟින් සිදු වන්නේ. මෙම නිර්දේශය - Recommendation එක - මෙච්චර කාලයක් අපේ රටේ ක්‍රියාත්මක වුණේ නැහැ. නමුත්, ලෝකයේ බොහෝ රටවල මෙය ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම මූල්‍ය කාර්ය සාධක බලකායේ අනෙක් Recommendations ඔක්කෝම ක්‍රියාත්මක වන අතර, මේ 24වන නිර්දේශය ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙනුත් ගැටලුවක් තිබෙනවා.

මෙම සංශෝධනයට අදාළව ඇමතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා එකඟ වන ගමන් තමයි එතුමාගේ කරුණු දැක්වීම කළේ. විපක්ෂ නායකවරයා විධියට මේ සංශෝධනය සම්බන්ධයෙන් එතුමා විශේෂ විරෝධතාවක් දැක්වූයේ නැහැ. නමුත් ඇතැම් මන්ත්‍රීවරුන් මෙම සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විරෝධතා දක්වමින් යම් යම් කරුණු මතු කිරීමක් සිද්ධ කරනු ලැබුවා.

කෙසේ වෙතත්, අපි දැනගන්න ඕනෑ මේ පනතට කරන සංශෝධන රටක් විධියට අපට කොතරම්දුරට වැදගත්ද කියලා. අපි වෙනත් රටවලට සාපේක්ෂව අපේ රට සම්බන්ධයෙන් තමයි ඔක්කෝටම කලින් සාකච්ඡා කරන්න ඕනෑ. ඒකට හේතුව වන්නේ අපේ රට කාලයක් තිස්සේ දූෂිතයන්ගේ මර්මස්ථානයක් වෙලා තිබීමයි. ලෝකයේ කොහේ හෝ තැනක විශාල ගණයේ දූෂණයක්, වංචාවක්, අක්‍රමිකතාවක් ගැන සාකච්ඡා වුණා නම්, එවැනි කාරණා සම්බන්ධයෙන් අපේ රටත් ඒ හැම අවස්ථාවකම ඉහළින්ම තිබුණා. උදාහරණයක් විධියට ගත්තොත්, Verité Research ආයතනයෙන් සහ මූල්‍ය වංචා සම්බන්ධයෙන් පරීක්ෂණ කරන වෙනත් ආයතනවලින් ලංකාව මොන වාගේ තැනකද තිබුණේ කියන එක පසුගිය කාලය පුරාම බොහෝ අවස්ථාවලදී කියා තිබෙනවා, ඒ සම්බන්ධව පැහැදිලි කර තිබෙනවා. ඒ නිසා අපේ රට සම්බන්ධවත්, අපේ රටේ හිටපු පාලකයන් සම්බන්ධවත්, නිලධාරින් සම්බන්ධවත්, නීතිය සම්බන්ධවත් ලෝකයාට බරපතළ සැකයක් තිබුණා, මේ රට ඇතුළේ මොන වාගේ ව්‍යාපාරද කරන්න පුළුවන්, මොන වාගේ අයටද ඉඩක් තිබෙන්නේ කියලා. ඒ තුළ ලෝකයටම දැනුණේ, මේ රටේ ඉඩ තිබෙන්නේ ජාවාරම්කරුවන්ට කියන කාරණයයි. කාලයක් තිස්සේ අපේ රට ජාවාරම්කරුවන් විසින් තමයි ග්‍රහණය කරගෙන තිබුණේ. නමුත් ඒ සම්බන්ධව දීලා තිබුණු රාජ්‍ය බලය වර්තමානය වන විට නොමැතිවීම නිසාත්, ඒ දූෂිත ගනුදෙනු ඇතුළේ හිටපු දේශපාලකයන්, පාලකයන් පලවා හැරීම නිසාත්, ජාතික ජන බලවේග ආණ්ඩුවේ බලයත් එක්ක අපට ඉතාම පහසුවෙන් මේ පනත සංශෝධනය කර ගැනීමට හැකියාවක් ලැබෙනවා.

මේ පනත් කෙටුම්පත සම්මත වීමෙන් පසුව පාලන බලයේ ඉන්න මේ කිසි කෙනෙකුට හානියක් හෝ කිසි ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා ඉතා පහසුවෙන් මේ පනත සංශෝධනයට ඉදිරිපත් කර තිබෙනවා. මෙහි අවසානයට වෙන්නේ කුමන හෝ සමාගමක් තමන්ගේ සමාගම සතුව පවතින හෝ සමාගමින් පරිබාහිරව පවතින කොටස් සම්බන්ධයෙන් සහ ඒවායේ හිමිකාරිත්වය දරන පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමයි. මීට පෙර විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, මෙය ඉතා සංකීර්ණයි, කොහොමද මේ වාගේ තොරතුරු හෙළි කරන්නේ කියලා. මේක ලෝකය පිළිගත් තත්ත්වයක්. ලෝකයම බලාපොරොත්තු වෙන්නේ ත්‍රස්තවාදයට, මුදල් විශුද්ධිකරණයට ඉඩ නොතබා ඉදිරියට යන්නයි. මොකද, එය ලෝකයටම ප්‍රශ්න ඇති කරන තත්ත්වයක්.

මුදල් විශුද්ධිකරණය පිළිබඳව හොයාගෙන අතීතයට ගියොත්, එක්කෝ ඒ පිටුපස ත්‍රස්තවාදය තිබෙනවා, නැත්නම් මත් ද්‍රව්‍ය ජාවාරම තිබෙනවා, එහෙමත් නැත්නම් සමස්ත සමාජයටම, ලෝකයටම බලපාන කුමක් හෝ කාරණයක් තිබෙනවා. ඒ නිසා එය වළක්වා ගැනීමට ලෝකයටම වුවමනායි. හැබැයි, අපේ රටට එය වුවමනා නැහැ වාගේ එකක් තමයි විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ සමහර වචන වලින් පෙන්නුම් කරන්නේ. මේ සංශෝධන තුළින් ඇත්තටම මේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමත්, ත්‍රස්තවාදී ව්‍යාපාරවලට මුදල් යැවීමත් වැළකෙනවා. නීත්‍යනුකූල නොවන ක්‍රමයකින් එකතු කර ගන්නා ධනය නැවත නැවත පිරිසිදුභාවයට ලක් කරමින්, එහෙම නැත්නම් වෙන මාර්ගයකින් නැවත ධනය උත්පාදනය කිරීම සඳහා භාවිත කිරීම මේ සංශෝධනයෙන් වළකිනවා. මේක ලෝකයටම බලපානවා. ඒ සඳහා තමයි මේ ඉඩ හදලා තිබෙන්නේ. හැබැයි, මෙය සංකීර්ණයි, එහෙම නැත්නම් මෙය කරන්න බැහැ වාගේ කථා අද සමහරුන් කියනවා. නැහැ, මෙය ඉතාම සරලයි. මේ සංශෝධනය අනුව ඕනෑම සමාගමක් තමන්ගේ කොටස් තිබෙන පුද්ගලයින් සම්බන්ධයෙන්, එහෙම නැත්නම් කොටස් මිලදී ගැනීම් සම්බන්ධයෙන් තොරතුරු දක්වන්න ඕනෑ. වෙනත් සමාගම් සම්බන්ධයෙන් ගත්තොත්, ඉතාම පැහැදිලිව දත්ත තිබෙනවා. ඒ නිසා ඒ දත්ත ඉදිරිපත් කිරීම ඉතාම පහසුවෙන් කරන්න පුළුවන්. එහි සංකීර්ණභාවයක් පෙන්නුවාට, ඇත්තටම එහි සංකීර්ණභාවයක් නැහැ.

මේ සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු වෙනවා. පෙත්සමේ සඳහන් වෙන්නේ මෙය අපේ රටේ තිබෙන සමාගම් සම්බන්ධයෙන් පමණක් නොවෙයි, ලෝකයේ අනෙක් සමාගම්වලටත් මේ තත්ත්වය අදාළ වෙන්න ඕනෑය කියලායි. ඒ අනුව වෙනත් සමාගම්වලටත්, විදේශ සමාගම්වලටත් මේ සංශෝධනය අදාළ විය යුතුයි කියන තත්ත්වයක් නිර්මාණය වෙනවා, පෙත්සම ගොනු කිරීමත් සමඟ. ඒ සම්බන්ධයෙනුත් සාකච්ඡාවකින්, එකඟතාවකින් පසුව තමයි මේ සංශෝධනයට එන්නේ. ඒ වාගේම තමයි අවශ්‍ය නම්, ඔය කියන වෙනත් සමාගම්වලට ඉඩ තිබුණා, ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් කරුණු කියන්න, මෙන්න මේ හේතු නිසා අපේ අයිතිවාසිකම් කඩ වෙනවා කියලා. එහෙම කිසිදු අයිතිවාසිකමක් කඩවීමක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු වාර්තා වෙන්නේත් නැහැ, වෙන පැහැදිලි කිරීමක් එන්නේත් නැහැ. ඒ අනුව ඇත්තටම මේ රටේ ආයෝජනය කරන වෙනත් විදේශ සමාගම්වලට හෝ ආයෝජනය කිරීමට බලාපොරොත්තුවෙන් ඉන්න විදේශ සමාගම්වලට හෝ මේ පනතෙන් බලපෑමක් එල්ල වෙන්නේ නැහැ. ඒ වෙනුවට වෙන්නේ රටක් විධියට අපි ලෝකය ඉස්සරහ ස්ථිර වෙනවා, පිරිසිදු ධනය හම්බ කරගත් මිනිසුන්ට අපේ රටේ ආයෝජනය කරන්න පුළුවන්, ඒ සඳහා නීති සකස් වෙනවා කියලා.

මේ සංශෝධනයෙන් තවත් පණිවුඩයක් දෙනවා. ඒ තමයි, මෙච්චර කාලයක් මේ සංශෝධනය නොකෙරුණේ, මේ රටේ මුදල් විශුද්ධිකරණයටත්, එහෙම නැත්නම් ත්‍රස්තවාදයට මුදල් සැපයීමටත්, මේ පනත සංශෝධනය කිරීමට බලය තිබුණු, නමුත් සංශෝධනය නොකළ අයත් සමහර වෙලාවට ඒවාට යටින් හිටියාය කියන කාරණය. හැබැයි, මේ සංශෝධනයත් එක්ක එළියට එන්නේ දැන් මේ රටේ මුදල් විශුද්ධිකරණයට ඉඩක් නැති බවත්, ඒ වාගේම මේ පිටුපස ත්‍රස්තවාදයට මුදල් සැපයීම හෝ වෙනත් ආකාරයේ මුදල් ගනුදෙනුවලට ඉඩක් නැති බවත් කියන කාරණා. ඒ නිසා ඉතාම පැහැදිලියි, මේ සංශෝධනය මඟින් අපේ රටට යම් ප්‍රමාණයක ආර්ථික වාසියක්, ඒ වාගේම රටක් විධියට ගත්තාම අපට තිබෙන කීර්තියටත් මෙය බලපානවා කියන එක.

අද දවස වැදගත්ම දවසක්. මට ඉතිරිව ඇති කාලය ඉතා අඩු නිසා ඒ සම්බන්ධව මම ඉතාම කෙටියෙන් කියනවා. අද ජූලි මාසයේ 23වෙනි දා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය නම් අවසානයි.

ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම ගෞරවයෙන් එක විනාඩියක් මම ඉල්ලනවා.

1981 ජුනි මාසයේ 9වෙනි දා හැන්සාඩ් වාර්තාවේ සඳහන්, යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කළ මන්ත්‍රී වී. යෝගේස්වරන් මැතිතුමා කළ කථාවෙන් ඉතාම කෙටි කොටසක් පරිවර්තනය කිරීමෙන් පසු කියවා සිටීමට මා අවසර ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවේ කොටසකින් පසුව තිබෙනවා, "පොලීසිය යාපනයට ගිනි තියනවා" යනුවෙන්. ඊට පසුව වරහන් ඇතුළේ තිබෙනවා, "සභාව සිනාසෙයි" කියලා. ඊළඟට එතුමාගේ කථාවේ කියනවා, "නියෝජ්‍ය කථානායකතුමනි, මොවුන් සිනාසෙද්දි මුළු ලෝකයක්ම මොවුන්ට සිනාසෙයි. ඔබලා මහා නගරයක කොටසක් ගිනි තිබ්බා. ඔබලා පෙන්වන්නේ උපහාසාත්මක සිනාවක් පමණයි" කියලා. මෙහෙම කියන්නේ එවකට බලයේ හිටපු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට. ඔවුන් තමයි ඒ වෙලාවේ හිනාවෙන්නේ. මීට අවුරුදු 40කට එහාදිත් කියනවා, "ලෝකයත් අපට හිනා වෙයි" කියලා. ඉතින් අපේ රටට මොකක්ද වුණේ? දශක ගණනක් ඇදෙන යුද්ධයක් නිර්මාණය වෙනවා. 1981දී වාගේම, 1983 වාගේ කාලයක වූ සිදුවීම් එදා සිදු නොවුණා නම්, තිස් අවුරුදු යුද්ධයක් ඇති නොවන්න ඉඩ තිබුණා. එහෙම යුද්ධයක් ඇති නොවුණා නම්, දස දහස් සංඛ්‍යාත ජීවිත නැති නොවන්න තිබුණා. එහෙම වුණා නම්, අපේ රටේ මේ කඩා වැටුණු ආර්ථිකයට යම් ප්‍රමාණයකින් හෝ බේරෙන්න තිබුණා. නමුත්, මීට කලින් අදහස් ප්‍රකාශ කරපු මන්ත්‍රීවරයා කියනවා, UNP ආණ්ඩුව තමයි මෙහෙම කළේ කියලා. හැබැයි මෙහි තිබෙනවා, පැය ගණන් කියවන්න ඕනෑ තරම් කරුණු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිත්‍රත්වය අරගෙන, සාමය අරගෙන සිංහල, දෙමළ, මුස්ලිම් බොහෝ පිරිසක් මේ වෙද්දි කිලිනොච්චිය පසුකරගෙන යාපනයට යනවා. ඔවුන්ටත් සුබ පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.19]

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

මම මුලින්ම කැමතියි, මේ රටේ ජනතාව මේ ආණ්ඩුවෙන් අපේක්ෂා කරන ප්‍රධාන කාරණා මොනවාද කියන එක සම්බන්ධයෙන් පොඩ්ඩක් විපක්ෂයට මතක් කරන්න. ජනතාව මේ ආණ්ඩුවෙන් අපේක්ෂා කරන ප්‍රධාන කාරණයක් තමයි, අපේ රටේ කඩා වැටුණු ආර්ථිකය යළි ස්ථාවරත්වයට පත් කරලා, එතැනින් නොනැවතී එය ආර්ථික සංවර්ධනය කරා රැගෙන යන්න ඕනෑ කියන එක. ඒ වාගේම දශක ගණනාවක් තිස්සේ මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ වෙන්න පුළුවන්, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ වෙන්න පුළුවන්, මේ සමාජයම වෙළාගෙන, ඔඩු දුවලා තිබෙන වංචා සහ දූෂණ සියල්ලම නවත්වලා, ඒ වංචා සහ දූෂණ තුළින් උපයා ගත් වත්කම්, දේපළ මොනවා හෝ තිබෙනවා නම් ඒවා නැවත පවරා ගැනීමත්, වංචා සහ දූෂණ කරන්න බැරි වන විධියට වාගේම එවැනි දේවල් කරන පුද්ගලයන්ට ඒවායින් සමාජයේ ආධිපත්‍යය දරන්න බැරි වන වටපිටාවක් නිර්මාණය කරන්නත් ඕනෑය කියන එක තමයි මේ ආණ්ඩුව තුළින් රටේ ජනතාව බලාපොරොත්තු වන තවත් කාරණයක් වන්නේ. මේ ප්‍රධාන කාරණා දෙක ඉටු කර ගැනීම සඳහා මේ ආණ්ඩුවේ කැපවීම මේ රටේ ජනතාව අපේක්ෂා කරනවා. අන්න ඒ නිසා තමයි අපි පසුගිය අප්‍රේල් මාසයේදී ඊට අදාළ විශේෂ පනතක් ගෙනාවේ. ඒක තමයි, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත. තමන්ට කිසියම් දේපළක්, කිසියම් වත්කමක් උපයා ගත්ත ආකාරය හෙළි කරන්න බැහැ, හෙළි කරන්න විධියක් නැහැ, නොහැකියාවක් තිබෙනවා කියන්නේ ඒ දේපළ උපයාගෙන තිබෙන්නේ යම් පාතාල ආර්ථික කටයුත්තකින්, නැත්නම් යම් වංචාවකින් සහ දූෂණයකින්, එහෙම නැත්නම් අයථා ලෙස උපයා ගැනීමකින් කියන එකයි. ඒ අනුව එම දේපළ රජයට පවරා ගැනීමට හැකියාව ලැබෙන පනතක් අපි ගෙනාවා. ඒ පනත ජනතාවගේ ඉල්ලීම්වලට වාගේම ජනතාවගේ බලාපොරොත්තුවලට අනුකූලයි. ඒ වාගේම පනත් සංශෝධනයක් පිළිබඳව තමයි අද දිනයේදී අපි පාර්ලිමේන්තුවේදී විවාද කරන්නේ.

මම විශේෂයෙන් මේ පනත් කෙටුම්පත ගැනත් සඳහන් කරන්න ඕනෑ. ඒක 2007 අංක 7 දරන සමාගම් පනතට කරනු ලබන සංශෝධනයක්. මෙච්චර කාලයක් ලංකාවේ සමාගම් පනතේ යම් හිඩසක් තිබුණා; එහෙම හිඩසක් තිබෙන්න ඉඩ හැරලා තිබුණා. ඇයි, ඒ? වංචා සහ දූෂණ තුළින්, පාතාල ආර්ථික කටයුතුවලින් වාගේම ජාවාරම් තුළින් උපයන දේපළ, උපයන මුදල් නැවත සුදු ආර්ථිකය කරා, ප්‍රධාන ආර්ථික ධාරාව කරා ගෙන එන්න පාරක් ඉතුරු කර ගන්න වුවමනාව තිබුණා. ඒ නිසා සමාගම් පනත යටතේ යම් හිඩැසක් තබා තිබුණා, එවැනි ජාවාරම්කාර ව්‍යාපාර හරහා නීති විරෝධී ආකාරයෙන් උපයා ගන්නා මුදල් ප්‍රධාන ආර්ථිකය තුළට ගේන්න, සමාගම් තුළ ආයෝජනය කරන්න වාගේම එහෙම ආයෝජනය කරලා ඒ කළු සල්ලි සුදු සල්ලි බවට පත් කරන්න; ඒ අවස්ථාව හදලා තිබුණා. අන්න ඒ සඳහා ඉඩ අහුරන එක තමයි අද දිනයේ සමාගම් පනතට ගේන මේ සංශෝධන තුළින් අපි අපේක්ෂා කරන්නේ. කොහොමද ඒක වෙන්නේ? මෙච්චර කාලයක් සමාගම් පනතේ 51වන වගන්තිය යටතේ තිබුණු හිඩැසක් තමයි ප්‍රධාන වශයෙන් අපි මේ පුරවන්නේ. සමාගම්වල සැබෑ අයිතිකරුවන්, සැබෑ අර්ථලාභීන්, සමාගමේ කොටස් අයිතිය තුළින් සැබෑවටම ප්‍රතිලාභ ලබන්නේ කවුද කියන එක හෙළිදරව් කිරීම අත්‍යවශ්‍ය, අනිවාර්ය කටයුත්තක් බවට පත් වෙලා තිබුණේ නැහැ, පැවති පනත යටතේ. මෙච්චර කාලයක් පැවති මේ පනත යටතේ කිසියම් ජාවාරම්කාර පුද්ගලයෙකුට, මහා පරිමාණයෙන් නීති විරෝධී වත්කම් රැස් කළ පුද්ගලයෙකුට තමන්ගේ හිතවතුන්, තමන්ට කීකරු පුද්ගලයින්, තමන්ට පක්ෂපාතී පුද්ගලයින් වාගේම තමන්ගේ සේවකයින් හරහා නීත්‍යනුකූල ව්‍යාපාරවල මුදල් ආයෝජනය කරලා ඒ මුදල් සුදු කරලා, එහි ප්‍රතිලාභය ලබා ගන්න හැකියාවක් තිබුණා. අද ගෙනෙන මේ පනත් සංශෝධනය හරහා ඒ ඉඩ අහුරන්න, වළක්වන්න සහ ශක්තිමත් කරන්න යන්නේ ඒ නීතියයි. ඒ අනුව ජනතාව මේ ආණ්ඩුව තුළින් අපේක්ෂා කරන වංචා සහ දූෂණ කළ අයට දඬුවම් කරනවා වාගේම නැවත වංචා සහ දූෂණ කරන්න ඉඩ නොලැබෙන, එවැනි වංචා සහ දූෂණ කරලා උපයා ගත් මුදල්,

වත්කම් තිබෙන අයට ඒවා සඟවාගෙන නැවත ප්‍රධාන ධාරාවේ ආර්ථිකයට ගේන්න තිබෙන ඉඩ අහුරන පනත් කෙටුම්පතක් තමයි අද මේ ගෙනැල්ලා තිබෙන්නේ. ඒ අනුව ජනතාව බලාපොරොත්තු වුණු වංචා සහ දූෂණ මැඩලීම සඳහා වාගේම ඒවා නතර කිරීම සඳහා ප්‍රධාන පනතට සංශෝධනයක් අද පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. ඒක ආණ්ඩුව දැනට කරගෙන යන දූෂිතයන්ට දඬුවම් කිරීමේ ක්‍රියාවලියේම එක් අදියරක් ලෙස මම හඳුන්වන්න කැමැතියි.

ඊළඟට, ආර්ථිකමය වශයෙන් අපි නිවැරදි මාවතේ ගමන් කරනවාද කියන එක බලාගන්න පුළුවන් යම් කාර්ය සාධන කිහිපයක් මම ඉදිරිපත් කරන්න කැමතියි. මොකද, ජනතාව මේ ආණ්ඩුවෙන් ඒකත් බලාපොරොත්තු වුණා. 2018 අවුරුද්ද කියන්නේ, අවසාන වශයෙන් අපේ ආර්ථිකය peak එකේ තිබිච්ච අවුරුද්ද. 2018 අවුරුද්දේ ආර්ථිකය තිබිච්ච තැනට මේ ආර්ථිකය ළඟා කරගන්න ඕනෑ. එතැනින් එහාට මේ ආර්ථිකය පියවරෙන් පියවර සංවර්ධනයේ මාවතට අපි අරගෙන යයි කියන බලාපොරොත්තුව ජනතාවට තිබෙනවා. ඒ නිසා අවුරුදු ගණනක් පාර්ලිමේන්තුවේ හිටපු, අත්දැකීම් තිබෙන විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අමතක වෙච්ච කාරණා කීපයක් මතක් කරන්නත් මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා.

2022දී ලංකාවේ දරිද්‍රතා රේඛාවට පහළින් සිටි ජනගහනය සියයට 25ක් බවට පත් වුණා. අපේ අපේක්ෂාව වෙන්නේ 2027 අවුරුද්ද වෙනකොට ඒක සියයට 12ට, 14ට ගෙනැල්ලා 2030 අවුරුද්ද වෙනකොට ලංකාවේ දරිද්‍රතාව තුරන් කිරීමේ අරමුණට යන්නයි. පසුගිය මාස පහ තුළ ලංකාවේ රාජ්‍ය ආදායම සියයට 20කින් වර්ධනය වෙලා තිබෙනවා. 2024 අවුරුද්දේ මුල් මාස පහේ රාජ්‍ය ආදායමට වඩා මේ අවුරුද්දේ මුල් මාස පහේ රාජ්‍ය ආදායම සියයට 20කින් වැඩි වෙලා තිබෙනවා. මේ අවුරුද්දේ මුල් මාස පහට විතරක් විදේශ ශ්‍රමිකයන් ලංකාවට එවන ප්‍රේෂණ සියයට 18.9කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම ඩොලර් මිලියන 3,750කට ආසන්න විදේශ විනිමය ප්‍රමාණයක් ලංකාවට ලැබී තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි
.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්න මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළමු මාස හයේදී විතරක් සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය සියයට 101කින් වර්ධනය වෙලා තිබෙනවා. මොන ආර්ථික දර්ශකය දිහා බැලුවත් මේ ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් වෙමින් තිබෙන බව පැහැදිලියි.

ඊයේ තවත් ප්‍රවෘත්තියක් වාර්තා වුණා. Bloomberg website එකේ ආර්ථික කටයුතු අංශය මඟින් සිදු කරපු වාර්තාවක් අනුව 2026 අවුරුද්ද වනවිට අපේ රටේ ආර්ථිකයට 2018 අවුරුද්දේ තිබිච්ච GDP එකේ මට්ටමට නැවත එන්න පුළුවන් කියලා සඳහන් වුණා. ඒ අනුව සියලු සමීක්ෂණවලින්, සියලු කාර්ය සාධනවලින් පෙන්නුම් කරන්නේ 2026 අවුරුද්ද වෙනකොට 2018 අවුරුද්දේ තිබුණු තැනට නැවත යන්න පුළුවන් මට්ටමට දැන් අපි ආර්ථිකය ස්ථාවර කර තිබෙන බවයි. මේ අවුරුද්දේ අපි සියයට 5ක ආර්ථික වර්ධනයක් අපේක්ෂා කරනවා. පළමුවෙනි කාර්තුවේ අපි සියයට 4.8ක ආර්ථික වර්ධනයක් ලබා ගත්තා. මහ බැංකු අධිපතිවරයා අද ප්‍රකාශ කර තිබුණා, ඊළඟ කාර්තුවේදීත් ඊට සමාන ආර්ථික වර්ධනයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. ඒ අනුව මේ අවුරුද්දේ අපේක්ෂා කරනවා, අපේ ඉලක්කය වන සියයට 5ක ආර්ථික වර්ධනයකට ගිහිල්ලා අපි බලාපොරොත්තු වෙන ආර්ථික සංවර්ධිත රටක් කරා යන ගමන 2026 වර්ෂයේදී ආරම්භ කරන්න. ඒ සඳහා අපට කටයුතු කරන්න පුළුවන් කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආරියවංශ බාලසූරිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.26]

ගරු බී. ආරියවංශ මහතා
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙළෙඳ ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමේ විවාදය අද දිනයේදී පැවැත්වෙනවා. මීට ප්‍රථම පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමන්ලා විසින් ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් විස්තර කළා. ආර්ථිකමය වශයෙන් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් අවස්ථා රාශියක් පසුගිය කාලය තුළ අපේ රටට අහිමි වුණා. විශේෂයෙන්ම ගොවි ජනතාවට ආර්ථිකමය වශයෙන් ප්‍රතිලාභ ලබන්න පුළුවන්කම තිබුණු අවස්ථා රාශියක් නැති වෙලා ගියා. උදාහරණයක් හැටියට ගත්තොත්, ඉන්දුනීසියාව වාගේ රටවලින් අපේ රටට කුරුඳු අපනයනය කරලා, අපේ රට හරහා නැවත ඒවා ප්‍රතිඅපනයනයට ගෙනිච්චා. ඒ තුළ අපේ රටේ ගොවියාට විශාල අසාධාරණයක් සිද්ධ වුණා. ඒ වාගේම එක අවස්ථාවකදී වියට්නාමය වාගේ රටවලින් අපේ රටට ගම්මිරිස් ගෙනැල්ලා ප්‍රතිඅපනයනය කරනවා අපි දැක්කා. ඒ තුළින් ගම්මිරිස් ගොවියා අන්තයටම වැටුණා. ඒ තත්ත්වය නැති කරලා අපේ රටේ ඉන්න ගොවියාට සාධාරණයක් ඉටු වන ආකාරයට මේ පනත් කෙටුම්පත සකස් කිරීම පිළිබඳව අපි බොහොම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට අපේ රටට ගම්මිරිස්වලින් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලැබෙන බව අපි දන්නවා. පසුගිය කාලයේදී අපි දැක්කා, ගම්මිරිස් මෙට්‍රික්ටොන් 90,000ක් පමණ අපේ රටෙන් ඉන්දියාව ඇතුළු රටවල් රාශියකට අපනයනය කරලා ආදායම් ලබා ගත් ආකාරය. මේ වර්ෂයේදී ඒ අස්වැන්න සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා. මා දකින විධියට මෙට්‍රික්ටොන් 10,000කට වාගේ අස්වැන්න අඩු වෙලා තිබෙනවා. ගිය වසරේ අස්වැන්න හොඳට තිබුණා. ඊට ඉස්සෙල්ලා වසර දෙකක් පමණ අස්වැන්න තිබුණේම නැහැ. විශේෂයෙන් මා ජීවත්වන රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න, ඇඹිලිපිටිය, ගොඩකවෙල ඇතුළු ඒ ප්‍රදේශවල වාගේම මාතර, මොනරාගල, මහනුවර, මාතලේ ඇතුළු දිස්ත්‍රික්ක රාශියක ගොවීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා, ගම්මිරිස් වගාවෙන් ලැබෙන ආදායමින් ජීවත් වන. පසුගිය කාලය තුළ අස්වැන්න නොමැතිවීම නිසා ඒ අය ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදී වෙළෙඳ කටයුතු ඇමතිතුමාට වාගේම කෘෂිකර්ම ඇමතිතුමාටත් මේ ගැන අපි සඳහන් කරන්න ඕනෑ. මේ ගොවීන් වෙනුවෙන් යම් සහනාධාර වැඩ පිළිවෙළක් දියත් කළොත් හොඳයි. මොකද, වෙනදා කිලෝ දාහ, දෙදාහ, තුන්දාහ කඩන ගම්මිරිස් අස්වැන්න දැන් කිලෝ 50ට බැහැලා තිබෙනවා. කිලෝ 50ක් විකිණීමෙන් අඩුම තරමින් වගාව ශුද්ධ කරලා, පොහොර ටික දාගන්නවත් බැරි තත්ත්වයක් තිබෙන්නේ.

[ගරු බී. ආරියවංශ මහතා]

අපි දන්නවා සුළු අපනයන භෝග සඳහා වෙනමම ආයතන ස්ථාපිත කර තිබෙන බව. ගොවිජන සේවා ආයතන හරහා කටයුතු කරන වෙනම නිලධාරින් ඉන්නවා. ඒ අයට උපදෙස් දීලා ගම්මිරිස් වගාවේ අස්වැන්න වැඩි කරගන්න කටයුතු කරන්න ඕනෑ. නව තාක්ෂණය ඇතුළු කරලා, පොහොර එහෙම නැත්නම් chemicals වර්ග, කෘමිනාශක වර්ග යොදලා වැඩි අස්වැන්නක් ලබා ගන්න වැඩ පිළිවෙළක් සකස් කළොත් අපට මේ තුළින් විශාල වශයෙන් විදේශ විනිමය ලබා ගැනීමේ හැකියාවක් ලැබෙනවා. අපි දන්නවා, වියට්නාමය වාගේ රටවල වැඩි ගම්මිරිස් අස්වැන්නක් ලබා ගන්න විවිධ ක්‍රම උපයෝගී කරගෙන තිබෙන බව. ඒ ක්‍රම අපේ ගොවියාට හඳුන්වා දීලා ගොවියාගේ ගම්මිරිස් ඇස්වැන්න වැඩි කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මා මේ අවස්ථාවේ යෝජනා කරනවා. මොකද, මෙය අපේ රටට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් -ඩොලර් ප්‍රමාණයක්- ලබා ගන්නට හැකි එක් අවස්ථාවක්. නමුත් පසුගිය ආණ්ඩුවලින්වත්, දැනට පවතින ආණ්ඩුව තුළින්වත් ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරනවා අපි දැක්කේ නැහැ. නාමල් කරුණාරත්න මහත්තයා ඒ ප්‍රදේශවලට ගිහිල්ලා ඒ ගොවීන්ට කථා කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු බී. ආරියවංශ මහතා
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
ඒ ගොවීන්ට අසාධාරණයක් සිදුවුණු අවස්ථාවලදීත් එතුමන්ලා ඉදිරිපත් වුණා. අපිත් ඒ දවස්වල ඒ සඳහා ඉදිරිපත් වුණා. මම මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ, මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා ගම්මිරිස් ගොවියා වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් දියත් කරන්න කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.32]

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ 2007 අංක 7 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත. මේ සමාගම් පනත 2007 මැයි මාසයේ 03වන දින සිටයි ක්‍රියාත්මක වෙන්නේ කියලා අපි දන්නවා. එම නිසා මේ පනත සංශෝධනය කිරීමේ කාලීන අවශ්‍යතාව අපි දකිනවා. නෛතික පුද්ගලයෙකුගේ අවසන් ප්‍රතිලාභ හිමිකාරිත්වය හඳුනා ගැනීමත්, මේ රටේ සමාගම්වල හිමිකාරිත්වය වාගේම ඒ මුදල් ආයෝජනය කරන්නේ කවුද කියන එක පිළිබඳව නිසි අවධානයක්, අවබෝධයක් ලබා ගැනීමත් මෙන්ම මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් ඉපැයීම ඇතුළු වෙනත් නීත්‍යනුකූල නොවන ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සඳහා ක්‍රියාත්මක වන දේශීය නීතිය සවිබලගැන්වීමයි මෙම සමාගම් පනත සංශෝධනය කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලවල සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගම් ව්‍යාපෘති සඳහා ඉල්ලපු උදාහරණ අපේ ළඟ දැනටත් තිබෙනවා. ඒවායේදී අපට පෙනෙනවා ඒ පෙන්වන පුද්ගලයා නොවෙයි, ඒ සමාගම්වල අයිතිකරුවා විධියට ඉන්නේ කියන එක. තවදුරටත් හොයාගෙන, හොයාගෙන යනකොට සමාගම් දෙකක අයිතිකාරයෝ දෙදෙනකු වුණාට, ඒ අයිතිකරුවන්ගේ අත්සන් බැලුවාම, ඒ join වෙන සමාගම් දෙකේම එකම ආකාරයේ අත්සන් තමයි තිබෙන්නේ. මේවා තමයි අප වෙනස් කරන්න ඕනෑ ප්‍රධාන කාරණා.

1978දී අපේ රටට විවෘත ආර්ථිකය ගෙනැල්ලා, අපේ රටත් සිංගප්පූරුවක් වාගේ රටක් බවට පත් කරනවා කියලා තමයි, 1982 අංක 17 දරන පැරණි සමාගම් පනත සම්මත කළේ. නමුත්, කාලයක් යනකොට කාලීන අවශ්‍යතාවක් මත 2007දී එය සංශෝධනය කරන්න වෙනවා. ඒ කොහොම වුණත් 1978දී කිව්ව විධියට අපේ රට සිංගප්පූරුවක් බවට නිර්මාණය කරගන්න බැරි වෙනවා. එදා අපේ රටත් සිංගප්පූරුවක් ලෙස නිර්මාණය කරන්න හිතුවාට, අපේ පනත්වල තිබුණු ගැටලු නිසා සහ ආයෝජකයන් මේ රට පිළිබඳව දක්වන ආකල්පය නිසාම එදා සිට පැවති ආණ්ඩුවලට ඒ බලාපොරොත්තුව ඉෂ්ට කර ගන්න බැරි වුණා. ඒ වාගේම තමයි, මේ ආයතනය කාලයක් තිස්සේ මේ පනත්වල අඩු පාඩු සම්බන්ධයෙන් සාකච්ඡා කළාට, සංශෝධන ඉදිරිපත් කළාට, පැවති කිසිම ආණ්ඩුවක් මේ පනත් සංශෝධනය කරන්න ඉදිරිපත් වුණේ නැහැ. ඒ නිසා තමයි අපි ආණ්ඩුවක් හැටියට මේ රටේ සිටින ආයෝජකයන් මෙන්ම මේ රටට පැමිණෙන ආයෝජකයන්ගේත් නිසි ආරක්ෂාව සහතික කිරීම සඳහා, ජාත්‍යන්තර පිළිගැනීම සඳහා මේ පනත් සංශෝධන කරන්න බලාපොරොත්තු වන්නේ. අපට අපේ රට සිංගප්පූරුවක් කරන්න ඕනෑ නැහැ. අපට ඕනෑ අපටම අනන්‍ය වෙච්ච දියුණු ශ්‍රී ලංකාවක් හදන්න. ඒ නිසා අපි අනිවාර්යයෙන්ම ඒ ශ්‍රී ලංකාව හදනවා කියන එක සහතික කරලා කියනවා.

මේ ආණ්ඩුව පත්වෙලා දවස් කිහිපයක් යනකොට අපට මුලින්ම ආපු චෝදනාවක් තමයි, මේ රටේ සහල් නැහැ; සහල් සංචිත නැහැ කියන එක. හැබැයි, අද සහල් මිල අඩුවෙලා තිබෙනවා. අද ඒ ගැන "මීක්" සද්දයක් නැහැ. ඒ වාගේම පසුගිය දවස්වල වෙළෙඳ පොළේ ලුණු නැහැ කියලා අනන්තවත් කෑ ගහලා, කෑ ගහලා ලුණු පිළිබඳව කථා කළා. ලුණු කැටයක් දියවෙන්නටත් කලින් ඔවුන්ගේ ඒ මතය දැන් දියවෙලා තිබෙනවා.

ඊළඟට, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා වාහන පිළිබඳව කථා කළා. අපේ රටට වාහන ගේන්නේ නැහැ කියලා පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ කථා කළා අපට මතකයි. හැබැයි, වාහන ගෙනාවාට පස්සේ ඒ අය කිව්වා, ඒ වාහන විකිණෙන්නේ නැහැ කියලා. සීමිත වාහන සංඛ්‍යාවක් ගේන්නේ කියලා තමයි කථා කළේ. හැබැයි, අද ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ. වාහන සඳහා වෙළෙඳ පොළ විවෘත කරපු එක ගැන කිසි දෙයක් කථා කරන්නේ නැතුවයි මෙතුමන්ලා අද කටයුතු කරමින් ඉන්නේ.

අපි දන්නවා, මේ රටේ වෙනස් කරන්න ඕනෑ කාරණා ගණනාවක් තිබෙන බව. අපට අද මේ පනත් සංශෝධනය කරන්න සිදු වෙලා තිබෙන්නේ ඇයි? පසුගිය කාලයේ මේ රටේ ආයෝජකයන්ට මුහුණ පාන්න වුණු තත්ත්වය අපි හොඳින් දන්නවා. අද වෙනකොට සමහර වෙලාවට ඒ ආයෝජකයන් අපෙන් ඉඩම් ඉල්ලාගෙන එනවා. සමහර වෙලාවට අවුරුදු 6ක්, 7ක් තිස්සේ ඒ ආයෝජකයන්ට ඉඩම් ලබා ගන්න බැරි වෙච්ච අවස්ථා අනන්තවත් තිබෙනවා. අවුරුදු 6ක්, 7ක් තිස්සේ ඒ අයට

ඉඩම් ලබා දීලා නැහැ. ඒ වාගේම ඔවුන්ගෙන් විශාල වශයෙන් මුදල් ඉල්ලා තිබෙනවා, ඔවුන්ගේ ව්‍යාපාර සඳහා හෝ ආයෝජන සඳහා හෝ අවසර දෙනකොට. අපි දැන් ඒවායින් ඔවුන් නිදහස් කරලා, ඔවුන්ට අවශ්‍ය කරන ඉඩම්ද, ඔවුන්ට අවශ්‍ය කරන වටපිටාවද කෙටි කාලයක් තුළ හදලා දීලා තිබෙනවා. ඒ වාගේම ඒ ආයෝජකයන්ට බැංකුවලින් අදාළ කටයුතු කර ගැනීමට තිබුණු බාධා අපි ඉවත් කරලා තිබෙනවා. ආණ්ඩුවක් හැටියට ඒ ආයෝජකයන්ට අවශ්‍ය කරන අනෙකුත් පහසුකම් පවා අපි සලසා තිබෙනවා, මේ රට වේගවත් සංවර්ධනයක් කරා ගෙන යන්න ඕනෑ නිසා. ඒ නිසා අපි ආණ්ඩුවක් හැටියට සහතික කරලා කියනවා, විපක්ෂයේ අයටත් සහතික කරලා කියනවා, අපි මේ අණ පනත් වෙනස් කරන්නේ පෞද්ගලිකව අපට තිබෙන අවශ්‍යතාවක් නිසා නොවෙයි, රට ගැන හිතලායි කියන එක. ජාත්‍යන්තර ව්‍යාපාරිකයන් මේ රටට ගෙන්වා ගන්න ඕනෑය කියන සුබවාදී දැක්මෙන් තමයි අපි මේ අණ පනත් වෙනස් කරන්නේ. ඒ බව ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.38]

ගරු කන්දසාමි ප්‍රභූ මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதம் நடைபெறுகின்றது. குறித்த சட்டமூலமானது, 2007ஆம் ஆண்டின் 07ஆம் இலக்க, கம்பெனிகள் சட்டமாக அறிமுகப்படுத்தப்பட்டு இருந்தது. அந்தச் சட்டத்தில் இருக்கின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வதற்காக நாங்கள் திருத்தங்களை மேற்கொள்ளவேண்டி ஏற்பட்டு இருக்கின்றது. அந்த அடிப்படையில், சட்ட நபர்களின் இறுதி நன்மையை வகிக்கும் உரிமையை இனங்காணுதல், அவற்றுக்கான வசதிகளைத் திட்டமிடுவதற்குத் தேவையான சட்ட ஏற்பாடுகள் என்பவற்றின் பொருட்டு இச்சட்டத்தில் திருத்தங்கள் மேற்கொள்ளப்பட்டுள்ளன. கம்பெனிகள் சட்டத்தில் திருத்தங்களைக் கொண்டுவருவதன்மூலம் "இனங்காணப்பட்ட சட்ட நபர்களின் இறுதி நன்மை பயக்கும் உரிமையை இனங்காணுதல்" என்ற எண்ணக்கருவின் ஊடாக அச்சட்டத்திலுள்ள பல இடைவெளிகளை நிரப்பவேண்டிய தேவை ஏற்பட்டிருக்கின்றது. அந்த அடிப்படையில், இலங்கையில் கடந்த ஆட்சிக் காலத்தில் புரையோடிப்போயிருந்த ஊழல், மோசடி, கறுப்புப் பணத்தை தூய்மையாக்குதல், பயங்கரவாதம், இனவாதம் மற்றும் மதவாதத்தைத் தூண்டுவதற்கான நிதியளிப்பு என்பவற்றைத் தடுக்கும் செயன்முறைகளுக்குத் தேவையான வசதிகளைத் திட்டமிட்டு வழங்குவதை நோக்கமாகக்கொண்டு குறித்த சட்டத்தில் திருத்தங்களை மேற்கொள்வதற்கு எமது அரசாங்கம் எதிர்பார்த்து இருக்கின்றது.

எமது நாட்டின் தனிநபரின் சராசரி வருமானத்துக்கு மேல், ஒவ்வொரு குடிமகனும் கடனாளியாக மாற்றப்பட்டு இருக்கிறார்கள். எமது நாட்டின் சனத்தொகை அதிகரித்தாலும், பிறக்கின்ற ஒவ்வொரு குழந்தையும் கடனாளியாகவே பிறக்கின்றது. இந்த நாட்டை 76 வருடங்களாக மாறி மாறி ஆட்சிசெய்த ஆட்சியாளர்கள், எமது நாட்டின் சட்டத்தையும் நீதித்துறையையும் மதிக்காது, நமது தேவைகளைத் தமது பங்காளிகளின் தேவைகளுக்காக ஆட்சிசெய்ததே இதற்கு முழுமையான காரணமாகக் காணப்படுகின்றது. மேலும், கடந்த காலங்களில் இந்த நாட்டின் பொருளாதாரம் வங்குரோத்து நிலையை அடைவதற்கு நாட்டில் நடைமுறையில் இருந்த ஊழல், மோசடிகளுடன்கூடிய ஆட்சியே காரணமாகும்.

கடந்த ஆட்சியில் இருந்த மத்திய வங்கி ஆளுநர் தொடக்கம் நிதி அமைச்சர் வரை குற்றவாளிகளாகப் பெயரிடப்பட்டு, தற்போது விசாரணைகள் நடைபெற்று வருகின்றன. கடந்த காலங்களில் பேசுபொருளாக இருந்த மத்திய வங்கியில் இடம்பெற்ற பிணைமுறி மோசடி விடயத்தை நீங்கள் அறிந்திருப்பீர்கள். இது இந்த நாட்டில் இடம்பெற்ற பாரிய மோசடியாகக் கருதப்படுகின்றது. சர்வதேச ரீதியாக இடம்பெறும் பண மோசடியைத் தடுத்தல், பயங்கரவாதத்துக்கு நிதியளிப்பதைத் தடுத்தல் போன்ற வேலைத்திட்டங்களைத் தரநிலைப்படுத்தல் ஊடாக மேற்கொண்டு, எதிர்காலத்தில் நாட்டை ஊழல், மோசடியற்ற மற்றும் பயங்கரவாதமற்ற நாடாக மாற்றும் நோக்கிலே எமது அரசாங்கம் கம்பெனிகள் சட்டத்தில் திருத்தங்களைக் கொண்டுவந்து, அதை வலுவான ஒரு சட்டமாக மாற்ற வேண்டுமெனப் பரிந்துரைத்துள்ளது.

தற்போதைய எமது ஆட்சியில் நீதித்துறை, பாதுகாப்புத்துறை, பொதுத்துறை என்பன மிகவும் சுயாதீனமாகவும், மக்கள் மத்தியிலும் சர்வதேச மட்டத்திலும் மிகவும் வினைத்திறனாகவும் செயற்படுவதைக் காணக்கூடியதாக உள்ளது. கடந்த ஆறு மாதங்களில் அதிகளவான இலஞ்ச, ஊழல் முறைப்பாடுகள் விசாரிக்கப்பட்டுள்ளதுடன், கடந்த காலத்தில் அதிகாரத்தில் இருந்த ஆட்சியாளர்கள், அவர்களின் உறவினர்கள், அவர்களுடன் இணைந்து செயற்பட்ட அரச அதிகாரிகள் நீதிமன்றத்தினூடாகத் தண்டனை பெற்று சிறைச்சாலைக்குச் செல்லும் நிலையையும் நாங்கள் பார்க்கின்றோம்.

இச்சட்டத்தில் இருக்கும் குறைபாடுகளை நிவர்த்தி செய்வதனூடாக சர்வதேச ரீதியாக எமது கம்பனிகளைப் பாதுகாக்கலாம். புதிதாக ஒரு கம்பனியை ஆரம்பிக்க இருப்பவர்கள், கம்பெனிகள் சட்டத்துக்கு ஏற்றவாறு அதனை ஆரம்பிக்கும்போது, இருக்கின்ற குறைபாடுகளை நிவர்த்தி செய்துகொள்ள முடியும். அதேநேரம், தங்களது கம்பனியையும் அவர்கள் பாதுகாத்துக் கொள்ளலாம். குறிப்பாக, வடக்கு, கிழக்கில் மிகக் குறைந்தளவான கம்பனிகளே பதிவுசெய்யப்பட்டு இருக்கின்றன. அதிலும், ஏற்றுமதி சார்ந்த கம்பனிகளை எடுத்துப்பார்த்தால், ஒரு கம்பனி மாத்திரமேஇப்பொழுது இயங்கி வருகின்றது. அது, வட மாகாணத்திலுள்ள யாழ்ப்பாணத்தைச் சேர்ந்த ஒரு கம்பனியாகும். அரசாங்கம் என்ற ரீதியில், கம்பனிகளைப் பாதுகாக்கவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. இது சட்டரீதியாகவும் transparencyஆகவும் இருக்கவேண்டிய தேவையும் எழுந்திருக்கின்றது.

நான் இந்தச் சபையில் இன்னுமொரு விடயத்தைக் கூறலாமென நினைக்கின்றேன். இப்போது செம்மணி புதைகுழி தொடர்பான கருத்தாடல் மக்கள் மத்தியில் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. கடந்த காலங்களில் நாங்கள் செம்மணி படுகொலை பற்றி பேசும்போதும், அந்தப் புதைகுழியில் இருக்கின்ற உடலங்களை இனங்காணும்போதும், அப்போதிருந்த ஆட்சியாளர்கள்

[ගරු කන්දසාමි ප්‍රභූ මහතා]

அவற்றைத் தடுக்கின்ற செயற்பாடுகளையே செய்தார்கள். ஆனால், இன்று தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள் அரசாங்கம் என்ற ரீதியில், செம்மணிப் புதைகுழி தொடர்பான செயற்பாடுகளை தொடர்ச்சியாக முன்னெடுப்பதற்குரிய நிதி விடுவிப்புகளைச் செய்து வருகின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු කන්දසාමි ප්‍රභූ මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
நான் முடிக்கின்றேன்.

இறுதியாக, செம்மணிப் படுகொலை தொடர்பில் நீதியானதொரு விசாரணை இடம்பெறும் என்பதை இந்த நேரத்தில் தெரிவித்துக்கொண்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி. வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.44]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අපි කථා කරනකොට අපේ අවධානය යොමු කරන්න ඕනෑ, රට තුළ තිබෙන ආයෝජන, රටට ලැබෙන ආයෝජන සහ රටේ ව්‍යාපාරිකයන් කරන ආයෝජන පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි දැක්කා, ඇමෙරිකාවේ තීරු බදු පැනවීමත් එක්ක අපේ රටේ නිෂ්පාදනයට කොයි ආකාරයෙන්ද ඒක බලපෑවේ කියලා. ඒ වාගේම අපේ රටේ නිෂ්පාදනයට ඉතා වැදගත් වන කාරණයක් තමයි, GSP Plus එක. මේ GSP Plus එක පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, ලබන අවුරුද්ද වන විට මේ පිළිබඳව නැවත වතාවක් යුරෝපා සංගමය ඇතුළු රටවල්වල සාකච්ඡාවක් ඇති වනවා. ඒ නිසා අපේ රටේ ආර්ථිකය ගොඩ ගැනීම සඳහා අවශ්‍ය GSP Plus කියන මේ විශේෂ දිරිගැන්වීම ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත් වනවා.

ත්‍රස්තවාදී කටයුතුවලට මුදල් යෙදවීම සහ අයථා ලෙස මුදල් ඉපැයීම පිළිබඳව අවධානය යොමු කරනකොට, එදා අපේ රටේ අහිංසක ජනතාවට පාස්කු බෝම්බ ප්‍රහාරය එල්ල කරන්න මුදල් දුන්න ඊබ්‍රාහිම් කියන පුද්ගලයා එදා ඒ මුදල් කොහොද සැපයුවේ? ව්‍යාපාරිකයෙකු හැටියට එතුමාගේ ව්‍යාපාරයෙන් ලැබෙන මුදල් මේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා එදා වැය කළාය කියන එක අපි මතක් කර දෙනවා. ඉතින්, අනාගතයේත් මේ දේවල් වෙන්න පුළුවන්. ඒ නිසා මේ පිළිබඳ අවධානය යොමු කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම මේ රටේ සමාගම් පවත්වාගෙන යන්න හෝ, එහෙම නැත්නම් රටට ආයෝජකයන් පැමිණෙන්න හෝ සාමාන්‍ය ජනතාවට ජීවත් වෙන්න හෝ මේ රටේ සාමය, නීතිය, සාධාරණත්වය, යුක්තිය ක්‍රියාත්මක විය යුතුයි.

අද මාරවිල ප්‍රදේශයේ අහිංසක දෙදරු මවකට සහ කුඩා දරුවෙකුට වෙඩි වැදිලා තුවාල වෙලා තිබෙනවා. අපි දන්නේ නැහැ, ඒ අයගේ ජීවිත අහිමි වෙයිද කියලා. *[බාධා කිරීමක්]* දෙදරු මව මරණයට පත් වෙලා තිබෙනවා. ඒක සිද්ධ වුණේ අපේ හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාගේ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ප්‍රදේශයේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ආරක්ෂාවට අද මොකද වෙලා තිබෙන්නේ? හැම තැනම මහ දවාලේ වෙඩි තියනවා. එදා මේ අය කිව්වේ, එවකට හිටපු ඇමතිවරුන්ගේ, එහෙම නැත්නම් ඒ හෙංචයියලා පාතාලයත් එක්ක සම්බන්ධයි කියලා. දැන් ඒ ඇමතිවරු නැහැ. දැන් ඉන්නේ ඔබතුමන්ලාගේ ඇමතිවරු. ඇයි, ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා හරියාකාරයෙන් කටයුතු කරන්නේ නැත්තේ කියන ප්‍රශ්නය අපි අහනවා.

ඒ වාගේම, මේ රටේ දැවැන්ත ඖෂධ හිඟයක් තිබෙනවාය කියන එක පැහැදිලිවම රජයේ සෞඛ්‍ය නිලධාරින්ගේ සංගමය ඇතුළු වෛද්‍යවරු ප්‍රකාශ කරනවා අපි දැක්කා. ඒ වාගේම, මේ රටේ නිෂ්පාදනය කරන ඖෂධ ජාත්‍යන්තරයට යැවීම සඳහා, එහෙම නැත්නම් අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කළ යුතුයි. මේ බලපත්‍ර නිකුත් නොකර, මේ ආයතනවල - NMRA එකේ- කට්ටිය මොනවාද කරන්නේ කියන එක අපට ප්‍රශ්නයක්. අපි දන්නවා, සෞඛ්‍ය ක්ෂේත්‍රය යම් තැනකට ගෙනියන්න නලින්ද ජයතිස්ස ඇමතිවරයා වෙහෙසක් ගන්නා බව. හැබැයි, අපි වෛද්‍ය ආනන්ද මහත්මයාගෙන් අහනවා, ඒ නිලධාරින්ගෙන් අහනවා, රට තුළ නිෂ්පාදනය කරන ඖෂධ අපනයනය කිරීම සඳහා අවශ්‍ය ලියාපදිංචිය - registration - ඒ අයට ලබා දෙන්නේ නැත්තේ ඇයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, 2028 වනකොට අපි ලෝකයට ණය ගෙවන්න ඕනෑ බව. මේ රටේ බදු ගෙවන ජනතාවගේ බෙල්ල මිරිකලා කොච්චර බදු ගත්තත් අපට රුපියල්වලින් ණය ගෙවන්න බැහැ. අපට ඩොලර් ආදායමක් ඕනෑ. එහෙම නම්, අපනයනයට අවශ්‍ය ශක්තිය අපි ලබා දෙන්න ඕනෑය කියන එක මේ අවස්ථාවේ මතක් කර දෙනවා.

ඒ වාගේම කතෝලිකයකු හැටියට, මන්ත්‍රීවරයකු හැටියට මට දැනෙන හැඟෙන ප්‍රශ්නයක් තමයි, මේ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර සිද්ධිය. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා අද පැහැදිලි හෙළිදරව්වක් කළා. ඒ පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. මට මතකයි, අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ පූජක දිවියේ Golden Jubilee එකට අතිගරු ජනාධිපතිතුමා පැමිණ කරපු ප්‍රකාශය. එතුමා කිව්වා, මේ පරීක්ෂණ කරනකොට රජය විසින් රජය පරීක්ෂාවට ලක් කරන්න සිදුවෙලා තිබෙනවා කියලා. අපි අහනවා, එතුමා එදා කියපු කාරණයද අද මේ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ කිව්වේ කියලා. නැඟෙනහිර පළාතේ ආඥාපති හැටියට කටයුතු කරපු වර්තමාන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා මේ තොරතුරු දැනගෙන හිටියාද? මේ ප්‍රහාරය පිළිබඳව බුද්ධි තොරතුරු හමුදා බුද්ධි අංශ දැනගෙන හිටියාය කියන එක ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ පැහැදිලිව සඳහන් වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ තිබෙන ආකාරයට ඒ බුද්ධි නිලධාරින්-

එක පැත්තකින් කථා කරනවා "සොනික් සොනික්" ගැන. තව පැත්තකින් කථා කරනවා අබු හින්ද් ගැන. තවත් පැත්තකින් කථා කරනවා සාරා ගැන. ඒ අයට හමුදා බුද්ධි අංශත් එක්ක

සම්බන්ධතා තිබුණාය කියලා මේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "බංකු බංකු" ඒ පිළිබඳව දැනගෙන ඉඳලාත් නිසි ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රකාශ කර තිබෙනවා. එහෙම නම් මේ පරීක්ෂණවලට ඉඩ දීලා එතුමා, ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා එක්කෝ තනතුරෙන් ඉල්ලා අස් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ආණ්ඩුව මැදිහත් වෙලා එතුමා ඉවත් කරලා, මේ පරීක්ෂණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම පාර්ලිමේන්තුවේදී සඳහන් වුණා අපි දැක්කා, කතෝලික සභාවේ ඉල්ලීම මත තමයි ශානි අබේසේකරත්, රවි සෙනෙවිරත්නත් පත් කළේ කියලා. ගරු සිරිල් ගාමිණී පියතුමා කාදිනල් හිමිපාණන් වෙනුවෙන් ප්‍රකාශයක් කරනවා, කතෝලික සභාව එහෙම කිසි දවසක ඉල්ලීමක් කළේ නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තුළින් මොකක්ද ගම්‍ය වෙන්නේ? මේ රටේ ආගමික සංහිඳියාව පලුදු කරන්න මේ අය කටයුතු කරනවාද? මේ ආණ්ඩුව මේ රටේ ආගමික සංහිඳියාව පලුදු කරන්න ඒකට මැදිහත් වෙනවාද, කතෝලික සභාව නොකියපු දෙයක් ප්‍රකාශයට පත් කරලා? එතකොට, ඒ නිලධාරීන් -රවි සෙනෙවිරත්නත්, ශානි අබේසේකරත්- හරියට රාජකාරිය නොකළොත් ඇඟිල්ල දිගු වෙන්නේ කතෝලික සභාවට. අපි සියලුදෙනාම කතෝලික සභාවේ නියෝජිතයෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක දැවැන්ත ප්‍රශ්නයක්. ගරු කාදිනල් උන්නාන්සේ නොකියපු දෙයක්, කතෝලික සභාවෙන් නොඉල්ලපු දෙයක්, කතෝලික සභාවේ ගිණුමට බැර කරන්න උත්සාහ ගැනීම අපි පිළිකුලින් යුතුව හෙළා දකින බව ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ සාකච්ඡාවට භාජන කරන්නේ, 2007 අංක 7 දරන සමාගම් පනත සංශෝධනය පිළිබඳව. නමුත් අද අපි කනගාටු වෙනවා, මේ හරවත් විවාදයට, සමාගම් පනත සංශෝධනය පිළිබඳ විවාදයට විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ තිබුණු ඒ දායකත්වය ගැන. අපි බලාපොරොත්තු වුණේ, මීට වඩා බොහොම සාධනීය සාකච්ඡාවක්.

ඒ කෙසේ වෙතත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලි කරන්නම් සිද්ධි කිහිපයක්. එල්ටීටීඊ සංවිධානයේ ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන්ම මුදල් ගලා ගෙන ආවේ විදේශීය රටවල වාසය කළ ඒ දමිළ ජාතික ඩයස්පෝරාව මගින්. 2005 එක්සත් රාජධානියේ මගී උමං මාර්ගයක සිදු වෙච්ච බෝම්බ ප්‍රහාරයට අරමුදල් සැපයෙන්නේත් ඒ විධියට. ඒ වාගේමයි 2001 සැප්තැම්බර් 21වෙනි දා ඇමෙරිකාවට එල්ල වූ ඒ ප්‍රබල ත්‍රස්ත ප්‍රහාරයට අරමුදල් සම්පාදනයත්. ඒ වාගේම අපේ රටේ ඒ කුප්‍රකට මල්වානේ නිවසත්, Pandora Papers කියන ඒවා අපට සිහියට එනවිට ගම්‍ය වෙන්නේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් ලබා දීම පිළිබඳ කාරණයයි. ඒ පිළිබඳ පැහැදිලි චිත්‍රයක් අපේ මනසේ නිර්මාණය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ඉතිහාසය ගත්තොත්, මීට වසර 4000කට එහා දිව යනවා. විශේෂයෙන්ම මේක පටන් ගන්නේ චීනයෙන්. චීනය ව්‍යාපාරිකයන්ට බදු පනවනවා. ඒ ව්‍යාපාරිකයන් රජයට බදු ගෙවීමෙන් වැළකී සිටිනවා. ඔවුන් එසේ සැඟවී සිට ඔවුන්ගේ ආදායම් මාර්ග සඟවනවා. මෙන්න, මෙහෙම තමයි මේ විශුද්ධිකරණය කියන කාරණාව කරළියට එන්නේ. මොකක්ද මේ විශුද්ධිකරණය කියන්නේ? මුදල් විශුද්ධිකරණය කියන්නේ, නීත්‍යනුකූල නොවන ආකාරයෙන් උපයා ගන්නා ලද ධනයට නීත්‍යනුකූල මුහුණුවරක් දීමේ ක්‍රියාවලියයි. මේක කියන්නේ, 2008දී Australian Transaction Reports and Analysis Centre. එහෙම නම්, මුදල් විශුද්ධිකරණය කියන්නේ ඉතා සංකීර්ණ, නීතියේ රැහැනට හසු කර ගන්න අමාරු, ඒ වාගේම රටක ආර්ථිකයක් අස්ථාවර කරන්න බලපාන කාරණාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල් විශුද්ධිකරණය රටකට අභියෝගයක්. මේ හරහා ලෝකයේ රටවල මූල්‍ය පද්ධතිවලට දැඩි අවදානමක් ඇති වෙනවා. රටේ ජාතික ආරක්ෂාවටත් ඒක ප්‍රබල අභියෝගයක්. ඒ රටේ ආර්ථික ස්ථාවරත්වයටත් අභියෝගයක්. යම් රටක් ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් දුර්වල කරන්න මේ කාරණාව බලපානවා. ලෝකයේ මේ සම්බන්ධයෙන් කළ අධ්‍යයන තිබෙනවා. විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා, ලෝක නිෂ්පාදිතයේ මූල්‍ය අගය ගත්තොත්, ඒකෙන් සියයට 2ක්, සියයට 5ක් අතර ප්‍රමාණයක් විශුද්ධිකරණයට ලක් වෙලා තිබෙනවා කියලා. එහෙම නම් මේක ගෝලීය ප්‍රශ්නයක්, ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ දෙයක්. ඒ නිසා ලෝකයේ හැම රටක්ම මේක නියාමනය කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල් විශුද්ධිකරණය ඇයි අපි වළක්වන්න ඕනෑ? මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය හරහා රටක මූල්‍ය පද්ධතිය අස්ථාවර වෙනවා. විටෙක මහා විශාල මුදල් ප්‍රමාණයක් රට තුළට ගලා ගෙන එනවා. ඒ වාගේම හදිස්සියේම ඒ මුදල් ටික ඒ රටින් පිටට යන්න පුළුවන්. ඒ වාගේම සාර්ව ආර්ථික පද්ධතිය නොසිතූ විරූ අන්දමින් දැඩි විචලනයකට ලක් වෙන්න පුළුවන්. ඒක විදේශ විනිමය අනුපාතයට ඉතා දැඩි ලෙස බලපානවා. මේ මුදල් විශුද්ධිකරණය නිසා රජයේ බදු ආදායම අඩු වෙනවා, අපරාධ වැඩි වෙනවා, රටක මූල්‍ය විනය, නීතිය සම්බන්ධයෙන් තිබෙන විශ්වාසය පලුදු වෙනවා. එහෙම නම්, මෙය නියාමනය කළ යුතුයි. මෙන්න මේ නියාමනය සඳහා 1989දී පැරිසියේ ඇති වෙච්ච G7 සමුළුවේ දී නිර්මාණය වෙනවා, මූල්‍ය කාර්ය සාධක බලකාය. ඒ හරහා මුදල් විශුද්ධිකරණය වාගේම, ත්‍රස්තවාදය සඳහා මූල්‍යනය කිරීම කළමනාකරණය කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දිනට නියමිත සභාවේ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමවරට 1990දී මේ මුදල් විශුද්ධිකරණයට අදාළ නිර්දේශ 40ක් ඉදිරිපත් වුණා. ඒ වාගේම අපි දන්නවා, 2001 වර්ෂයේ සැප්තැම්බර් 11වැනි දා ත්‍රස්ත ප්‍රහාරයත් එක්ක ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමත් ඇතුළත් වන පරිදි නැවත නිර්දේශ 9ක් නිර්මාණය වෙලා තිබෙන බව. ඒ නිර්දේශ 49ම අරගෙන, ඒක කෙටි කරලා නිර්දේශ 40ක් ලෝකයට ඉදිරිපත් වෙනවා. එතැනදී අපි ආසියානු පැසිෆික් කලාපයේ, Asia-Pacific Group එකේ රටක් විධියට ලංකාවේ මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් නියාමනයට ලක් වෙනවා. ඒ 2011දීත්, 2017දීත් කරන ලද ඇගැයීම්වලින් අපේ රට උපාය මාර්ගික දුර්වලතා සහිත රටක් බවට සනිටුහන් වෙනවා. ඒ අනුව අපි අළු ලේඛනයට - grey list එකට - ඇතුළත් වෙනවා. මේ මොහොත වන විට මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සම්බන්ධ මූල්‍ය කාර්ය සාධක බළකායේ නිර්දේශ 40න්, 39ක් අපි ක්‍රියාත්මක කරනවා. නමුත්, එහි තිබෙන 24වැනි වගන්තිය අපි අනුගමනය කරලා නැහැ. ඒ 24වැනි වගන්තියෙන් කියන්නේ මොකක්ද? රටක් තුළ නෛතික පුද්ගලයන්ගේ ප්‍රතිලාභ හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු අවශ්‍ය වේලාවට භාවිත කරන්න කිසියම් නිශ්චිත ස්ථානයක රැස් කරලා, ගබඩා කරලා තබන්න ඕනෑ කියන කාරණාව. එතැනදී තමයි අපි සමාගම් පනත මේ සඳහා උපයෝගී කර ගන්නේ. එහෙම නම් අපේ රටේ බලපැවැත්වෙන 2007 අංක 07 දරන සමාගම් පනතේ සමහර වගන්ති වර්තමාන තත්ත්වයට, ජාත්‍යන්තර ප්‍රමිතියට ගැළපෙන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ඒ නිසා ජාත්‍යන්තර ප්‍රමිතියට ගැළපෙන විධියට මෙය improve කරන්න කියලා IMF එකේ යෝජනාවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කරන ඉල්ලීමට අවනතවීමටත්, මේ සියලු තොරතුරු එකතු කරලා තමයි අපි මේ සංශෝධනය කරන්නේ. මේ හරහා අපි 2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 20කට ආසන්න ප්‍රමාණයක් සංශෝධනය කරනවා. ඒක තමයි අද දවසේ මේ සාකච්ඡාවෙන් සිදු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."- [ගරු වසන්ත සමරසිංහ මහතා]
தீர்மானிக்கப்பட்டது:
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு வசந்த சமரசிங்ஹ]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Wasantha Samarasinghe]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. PRESIDING MEMBER iin the Chair.]

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 3 ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 51ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 4.- (*Amendment of section 51 of the principal enactment*)

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, 9 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වූ කොටස් සහතිකයක් අයත් නොවේ.

(2) එහි (4) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ (i) වන අනුඡේදයේ "කොටස් සංඛ්‍යාව; සහ" යන වචන වෙනුවට, "කොටස් සංඛ්‍යාව සහ එම කොටස් නිකුත් කරන ලද්දේ කවරෙක් සඳහා ද, එකී තැනැත්තන්ගේ නම්;" යන වචන ආදේශ කිරීමෙන්;' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4, as amended, ordered to stand part of the Bill.

5 සහ 6 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
5ஆம், 6ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 5 and 6 ordered to stand part of the Bill.

7 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් කාණ්ඩයක් ඇතුළත් කිරීම)
வாசகம் 7.- (முதன்மைச் சட்டவாக்கத்தில் புதிய பிரிவை உட்புகுத்துதல்)
CLAUSE 7.- (*Insertion of new division in the principal enactment*)

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "5 වන පිටුවේ, 26 සහ 27 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(3) සමාගමක සෑම අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයකු විසින් ම, එම අධ්‍යක්ෂවරයා හෝ ලේකම්වරයා සමාගමේ අර්ථලාභී අයිතිය'"

(2) "8 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'තැනැත්තකු වන්නා වූ ස්වභාවික තැනැත්තකු, බලය පවරන ලද තැනැත්තකු ලෙස, නියම කරනු ලබන පරිදි පත්' "

(3) "8 වන පිටුවේ, 23 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(3) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාළ කලින් වූ යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාපිත හෝ ලියාපදිංචි කරන ලද සෑම සමාගමක් ම, 2025 අංක දරන සමාගම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දිනයේ සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත (1) වන වගන්තියේ සඳහන් කර ඇති බලය පවරන ලද තැනැත්තාගේ තොරතුරු හෙළිදරව් කළ යුතු ය.' "

(4) "8 වන පිටුවේ, 24 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මහජනතාව සඳහා තොරතුරු. 130ඇ.(1) රෙජිස්ට්‍රාර්වරයා විසින්, මහජනයාට, සමාගමක අර්ථලාභී අයිතිකරුවන් පිළිබඳ තොරතුරුවලට, විද්‍යුත් ආකාරයෙන් හෝ භෞතික ආකාරයෙන් සැනෙකින් ප්‍රවේශවීමට ඉඩ සැලසිය යුතු ය. එකී තොරතුරු අර්ථලාභී අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම් සහ ඉන් පෙර සම්පූර්ණ නම් (ඇත්නම්), ද්විත්ව පුරවැසිභාවයන් ද ඇතුළුව ජාතිකත්ව (අදාළ වන්නේ නම්), පදිංචි රටවල්, ව්‍යාපාර ලිපින සහ සමාගමේ අර්ථලාභී අයිතියේ ස්වභාවය සහ ප්‍රමාණයට සීමා විය යුතු ය.' "

(5) "9 වන පිටුවේ, 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'උපවගන්තියේ දක්වා' "

(6) "9 වන පිටුවේ, 6 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති තොරතුරුවල සත්‍යායනය කරන ලද පිටපතක් ලබා ගැනීමට අදහස් කරන මහජනයා අතරින් යම් අයකු, නියම කරනු ලැබිය හැකි ගාස්තුවක් ද සමඟ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.' "

(7) "10 වන පිටුවේ, 23 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.' "

(8) "12 වන පිටුවේ, 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'තිහක් ඇතුළත තහවුරු කිරීම, වාර්තා කිරීම, වාර්තාගත කිරීම' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 7, as amended, ordered to stand part of the Bill.

8 සිට 13 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
8ஆம் வாசகத்திலிருந்து 13ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 8 to 13 ordered to stand part of the Bill.

14 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 471 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 14.- (முதன்மைச் சட்டவாக்கத்தின் 471ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 14.- (*Amendment of section 471 of the principal enactment*)

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"16 වන පිටුවේ, 13 වන සහ 14 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අඇ) අතිරේක සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වශයෙන් හෝ අතිරේක සමාගම් රෙජිස්ට්‍රාර්' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

14 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
14ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 14, as amended, ordered to stand part of the Bill.

15 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
15ஆம் வாசகத்திலிருந்து 18ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 15 to 18 ordered to stand part of the Bill.

19 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 513අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම)
வாசகம் 19.- (முதன்மைச் சட்டவாக்கத்தில் 513அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)
CLAUSE 19.- (*Insertion of new section 513A in the principal enactment*)

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 30 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

***19* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 19, as amended, ordered to stand part of the Bill.

20 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 529 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 20.- (முதன்மைச் சட்டவாக்கத்தின் 529ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 20.- *(Amendment of section 529 of the principal enactment)*

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "20 වන පිටුවේ, 33 වන සහ 34 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '(අ) සමාගමේ කොටස් හැර, කොටස් හිමියකුගේ ප්‍රතිලාභය උදෙසා හෝ ඒ වෙනුවෙන් කෙලින්ම හෝ අනායාකාරයකින් මුදල් හෝ දේපළ මාරු කිරීම; හෝ" "; සහ

(2) "21 වන පිටුවේ, 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

20 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
20ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 20, as amended, ordered to stand part of the Bill.

21 සහ 22 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
21ஆம், 22ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 21 and 22 ordered to stand part of the Bill.

උපලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Schedule ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න.

පළමුවැනි ප්‍රශ්නය, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

කල්තැබීමේ ප්‍රශ්න
ஒத்திவைப்பு வினாக்கள்
ADJOURNMENT QUESTIONS

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් මම මේ ප්‍රශ්නය අහනවා.

2022 ජනවාරි 01වන දින සිට සුබෝධිනී වැටුප් වාර්තාව පදනම් කර ගනිමින් ඇමති අනුකමිටුවක් විසින් සකස් කරන ලද වැටුප් ව්‍යුහයට අනුව ගුරු විදුහල්පති වැටුප ඉහළ දමන ලදී. ඒ මොහොතේ ගුරු අධ්‍යාපනඥ සේවයේ වැටුප් වැඩි නොකිරීම හරහා හටගත් විෂමතාව මේ දක්වා ඉවත් කර නොමැත. එවැනි තත්ත්වයක් තුළ 2005 ජූනි මස බඳවා ගත් නවක කථිකාචාර්යවරුන් ගුරු සේවයේ වැටුප උපයාගෙන ගුරු අධ්‍යාපනඥ සේවයට පැමිණි නිසා මේ වන විට ගුරු අධ්‍යාපනඥ සේවය තුළ අභ්‍යන්තර වැටුප් විෂමතාවක් හටගෙන ඇත. එබැවින්, ඒ සම්බන්ධයෙන් පැන නැඟී ඇති පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ගරු අමාත්‍යතුමියගෙන් බලාපොරොත්තු වෙමි.

මම හිතන විධියට ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වෙන්න ඇති, උත්තර ලබා දෙන්නේ.

01. එවැනි වැටුප් විෂමතාවක් ඇති බව පිළිගන්නේද?

02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයාට වඩා නවක කථිකාචාර්යවරයාගේ වැටුප ඉහළ අගයක් ගනී. මේ හේතුව විද්‍යා පීඨ ගුරු මධ්‍යස්ථාන සහ ගුරු විද්‍යාල තුළ අභ්‍යන්තරික ගැටලු කිහිපයක් නිර්මාණය වීමට බලපාන බව පිළිගන්නේද?

03. මෙම වැටුප් විෂමතාව ඉවත් කරන්නේ කවදාද?

04. මෙවර අය වැය මඟින් මෙම වැටුප් විෂමතාව තවත් උග්‍ර වන බව ඔවුන්ගේ අදහස වී ඇත. ඉකුත් 14වැනි සඳුදා දින ඒ පිළිබඳව ඉසුරුපාය ඉදිරිපිට දැවැන්ත උද්ඝෝෂණයක් ඔවුන් විසින් සිදු කළ නමුත්, කිසිදු නිලධාරියෙක් ඒ සඳහා සවන් දී නොමැත. මහජන දිනයේ නිලධාරින් අමාත්‍යාංශයේ රැඳී නොසිටින්නේ ඇයි?

05. වැටුප් විෂමතාව විසඳන තෙක් ඔවුන් විසින් අන්තර්කාලීන දීමනාවක් ඉල්ලා ඇත. එය ලබා දීමට කටයුතු කරන්නේ කෙසේද?

06. අනෙකුත් විධායක ශ්‍රේණිවල නිලධාරින් වසර 12කින් පළමු ශ්‍රේණියට උසස්වීම් ලැබුවද, ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරින් උසස්වීම් ලබන්නේ වසර 17කට පසුවය. මෙම උසස්වීම් ක්‍රමය ඔවුන්හට කරන අසාධාරණයක් බව පිළිගන්නේද?

07. මෙම ක්‍රමවේදය ගුරු අධ්‍යාපනඥ සේවයට ලබා නොදෙන්නේ ඇයි? එය ලබා දීමට මේ අවස්ථාවේ ගන්නා පියවර කවරේද?

08. 2023-2024 අපොස (උසස් පෙළ) සමත් සිසුන් මේ වන තෙක් විද්‍යා පීඨ සඳහා බඳවාගෙන නොමැති අතර, ඔවුන් බඳවා ගන්නේ කවදාද?

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙයට අමතරව මම තව ප්‍රශ්නයක් ඔබතුමාගෙන් අහනවා. ඒ ප්‍රශ්නය ඇසීමෙන් ඔබතුමා අපහසුතාවට පත් වෙන්නේ නැහැ. දැන් විද්‍යා පීඨවලට අලුතින් මානව සම්පත ලබා දුන්නාට, විශේෂයෙන්ම නව තාක්ෂණික උපකරණ ඇතුළු භෞතික සම්පත්වල දැවැන්ත හිඟයක් විද්‍යා පීඨවල තිබෙන බව ඔබතුමාත් දන්නවා. මේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට යනවා නම්, ගුරුවරුන් සහ සිසුන් දැනුමෙන් සහ නවීන තාක්ෂණයෙන් සන්නද්ධ කරන්න ඕනෑ බව අපි දන්නවා. ඒ පිළිබඳවත් ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගය පැහැදිලි කරන්න.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා, මෙම ප්‍රශ්නය යොමු කිරීම සම්බන්ධයෙන්. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. ඒ සම්බන්ධව අංක 1925/37 හා 2015.07.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා සීමිත හා විවෘත පදනම මත නිලධාරින් බඳවා ගැනීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා ගුරු සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය හා ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවය යන සේවාවලින් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගනු ලබන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5 ඡේදය අනුව සීමිත පදනම මත බඳවා ගන්නා ලද නිලධාරින් පෙර සේවයේ ලද අවසන් වැටුප පදනම් කරගෙන නව වැටුපෙහි නිලධාරින් ලෙස බඳවා ගනු ලැබේ. මම හිතන විධියට, මේ කාරණාව අවසන් වැටුප සම්බන්ධව තමයි එන්නේ.

රාජ්‍ය සේවයේ SL-1 වැටුප් ලබන දීපව්‍යාප්ත හා දීපව්‍යාප්ත නොවන විධායක සේවා කිහිපයක් පවතින බැවින් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරින්හට පමණක් වැටුප් විෂමතාව ඉවත් කිරීම තුළින් අනෙකුත් විධායක සේවාවල වැටුප් විෂමතා ඇති විය හැක. එම නිසා මේ සම්බන්ධයෙන් සියලුම විධායක සේවාවල වැටුප් පිළිබඳව සලකා බලා ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්නම්. මේ සම්බන්ධයෙන් අපි දීර්ඝ කාලීනව අධ්‍යාපනය හා සම්බන්ධ සේවාවල සිටින බොහෝ නිලධාරින් සමඟ සාකච්ඡා වට කිහිපයක්ම පවත්වනු ලැබුවා. එහිදී අපි මතු කරගත් කාරණා කිහිපයක් තිබෙනවා. පසුගිය වසර කිහිපයක් ඇතුළත මේ වැටුප් සම්බන්ධයෙන් ගත් තීරණ තනි තනි සේවා වශයෙන් ගත් නිසා තමයි මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත්, අපි ආණ්ඩුව විධියට මේ සම්බන්ධයෙන් පිළිතුරු සැපයිය යුතුයි. ඒ නිසා මම ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග ගැනත් කථා කරන්නම්.

මේ මොහොතේදී අපි අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත්තොත්, නිශ්චිතව සේවා 5ක් තිබෙනවා. මේ සේවා 5ට අදාළව අධ්‍යාපන කවුන්සලයක් ඇති කරලා මේ සේවාවල වැටුප් සම්බන්ධව ඉදිරියේදී එන ප්‍රශ්නවලට ඒ සේවා එකින් එක ගෙන නිශ්චිත පිළිතුරු සපයන්න අපි උත්සාහ කරනවා. මේ සේවාවල වැටුප් සම්බන්ධව තිබෙන ප්‍රශ්න තනි තනිව ගත්තායින් පස්සේ තමයි මේ ප්‍රශ්න එන්නේ කියන එක මම හිතන විධියට ගරු මන්ත්‍රීතුමියත් පිළිගන්නවා ඇති. ඒ නිසා විශේෂයෙන් 2014දී ගත් සේවා ව්‍යවස්ථා සංශෝධන ඇතුළු විවිධාකාර දේවල් ගැන අපි පසුගිය දවස්වල ගුරු අධ්‍යාපනඥ සේවා සමඟ සාකච්ඡා කළා, පීඨාධිපතිවරුන් සමඟත් සාකච්ඡා කළා. මේ සම්බන්ධයෙන් අපි ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග ගැන මම ඉතිරි ප්‍රශ්නවලට උත්තර සැපයීමේදී කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

02. මේ සම්බන්ධ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරින් සීමිත පදනම මත බඳවා ගැනීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 5වන ඡේදය අනුව පෙර සේවයේ ලද අවසන් වැටුප පදනම් කරගෙන නැවත වාරයක් නව වැටුපෙහි නිලධාරින් පිහිටුවනු ලැබේ. ඉදිරි පිළිතුරුවලදී මේ සම්බන්ධයෙන් වැඩිදුර කාරණා සාකච්ඡා කරන්නම්.

03. මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත. ඒ තමයි, SC/FR/077/2025 දරන නඩුව. එබැවින් මේ සම්බන්ධව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ලබා දෙන තීරණය පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

04. අධ්‍යාපන අමාත්‍යාංශයේ මහජන දිනය වන සඳුදා දිනයේදී අමාත්‍යාංශය තුළ සේවා කවුළු ක්‍රියාත්මක වන අතර, සහභාගිවූවන් අතරින් පස්දෙනෙක් විෂයභාර අතිරේක ලේකම්, අධ්‍යාපන සේවා ආයතන සමඟ සාකච්ඡාවක් සිදු කරන ලදී.

05. ඉහත සඳහන් කර ඇති පරිදි නඩු කෘත්‍යයක් (SC/FR/077/2025) පවතින බැවින්, ඒ සඳහා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලැබෙන නියෝගය පරිදි කටයුතු කිරීමට පෙර වෙනත් ආකාරයකට කටයුතු කිරීම යෝග්‍ය නොවේ.

[ගරු මධුර සෙනෙවිරත්න මහතා]

06. මේ සම්බන්ධයෙන් මේ වනවිට අමාත්‍ය මණ්ඩල සන්දේශයක් කෙටුම්පත් කර ඇත.

07. ඉහත 06 පිළිතුරට අනුව මෙම ගැටලුව සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට නියමිතය.

08. 2023, 2024 අ.පො.ස. (උසස් පෙළ) සමත් සිසුන් 2025 දෙසැම්බර් මුල් සතිය තුළ බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

කොවිඩ් වසංගතය හා රටේ පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් විද්‍යා පීඨ සඳහා බඳවා ගැනීම් ප්‍රමාද වූ අතර, මේ වනවිට 2022 උසස් පෙළ දක්වා බඳවා ගැනීම් සිදු කර අවසන් කර ඇත. මෙම ප්‍රමාදය යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා එකවර උසස් පෙළ කණ්ඩායම් දෙක බැගින් බඳවා ගැනීමට සිදු විය.

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය සඳහන් කළ කාරණය නිවැරදියි. පසුගිය දවස්වල අපි සාකච්ඡා කිහිපයක් කළා, පීඨාධිපතිවරුන් සමඟ. එම ප්‍රමාදය මත භෞතික සම්පත්වල හිඟකමක් සහ නේවාසිකාගාර තදබදයක් ඇති වෙලා තිබෙනවා. මානව සම්පත්වල හිඟකමකුත් ඇති වෙලා තිබෙනවා, විශේෂයෙන්ම විෂයානුබද්ධව.

ඉතින්, මේ සම්බන්ධයෙන් විද්‍යා පීඨයන්හි පවතින යටිතල පහසුකම් හා අධ්‍යයන කාර්ය මණ්ඩල කළමනාකරණය කර ගනිමින් බඳවා ගත හැකි සංඛ්‍යාව තීරණය කරන ලදී. මේ වනවිට 2024 උසස් පෙළ ප්‍රතිඵල ද නිකුත් වී ඇත. 2023 උසස් පෙළ කණ්ඩායම පමණක් බඳවා ගත්තේ නම් 2024 උසස් පෙළ කණ්ඩායම බඳවා ගැනීමට සිදු වන්නේ 2026 ජූලි මාසයෙන් පසුවය. එබැවින් මෙම 2023, 2024 උසස් පෙළ කණ්ඩායම් දෙකම එකවර බඳවා ගැනීමට කටයුතු යොදා ඇති අතර, ඉන් අනතුරුව සියලු බඳවා ගැනීම් වාර්ෂිකව සිදු කිරීමට අවස්ථාව උදා වේ. මෙහිදී අපි පීඨාධිපතිවරුන් සමඟ සාකච්ඡාවක් කළා. එතැනදී යටිතල පහසුකම්, නේවාසිකාගාර පහසුකම් සහ සියලු ගුණාත්මක තත්ත්ව වර්ධනය කළ හැකි වාතාවරණයක් තුළ පමණයි ඒ අය බඳවා ගන්න අපි තීරණය කළේ. එහෙම නැතුව සංඛ්‍යාත්මකව නොවෙයි.

මෙම බඳවා ගැනීමට අදාළ ගැසට් නිවේදනය මේ වනවිට සකස් කර අවසන් අදියරේ පවතින අතර, අයදුම්පත් කැඳවීමට අදාළ මාර්ගගත දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. 2025 අගෝස්තු මුල් සතියේ මෙම ගැසට් නිවේදනය නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ. ඉන් අනතුරුව විද්‍යා පීඨ මට්ටමින් සම්මුඛ පරීක්ෂණ පවත්වා ශික්ෂණලාභීන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. මෙම ශික්ෂණලාභීන් කණ්ඩායම 2025 දෙසැම්බර් මුල් සතිය තුළ බඳවා ගැනීමට නියමිතව ඇත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමිය මතු කරපු කාරණාව ඇත්ත. අපි විද්‍යා පීඨ 20 එකින් එක ගත්තා, භෞතික සම්පත් අනුව මානව සම්පත් කොච්චර ප්‍රමාණයක් ඇතුළත් කළ හැකිද කියලා. අපි මේ වනකොට ඒ කාරණාව ගැන සාකච්ඡා කරලා තිබෙනවා. අපි ඊළඟ වර්ෂයට අය වැය ඉදිරිපත් කරනකොට නිශ්චිත තීරණ වගයක් අරගෙන තිබෙනවා. ඒ, සංඛ්‍යාත්මකව නොවෙයි, විශේෂයෙන් ගුණාත්මක සංවර්ධනයක් සැලසෙන පරිදි ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විද්‍යා පීඨවලට ඇතුළු කර ගන්න. මොකද, ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තමයි ඉදිරියේදී ගුරුවරු විධියට පාසල්වලට යන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපි විශේෂයෙන් සංවේදියි.

බොහොම ස්තුතියි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්න කිරීමක් නොවෙයි, පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවස්ථාව ලබා දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

තත්පර කිහිපයක් වැනි ඉතාම කෙටි කාලයක් ගන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

2025 අගෝස්තු මුල සතියේ ගන්නවාය කිව්වේ, 2023, 2024 සිසුන් වෙන්න ඕනෑ. එහෙම නේද?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ඔව්, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

Cabinet Paper එක ඉදිරිපත් කරන්නේ අනෙක් විධායක ශ්‍රේණිවල අයට දෙන උසස්වීම විධියටම වසර 12කින් අරගන්න කියලාද? එතකොට ඒගොල්ලන්ගේ එම ගැටලුව විසඳෙනවාද?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

තවම එය කෙටුම්පත් කරමින් තිබෙන්නේ. ඒ සම්බන්ධව අපි ඉදිරියේදී ගරු සභාවට දැනුම් දෙන්නම්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

හොඳයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟ ප්‍රශ්නය, ගරු රොෂාන් අක්මීමන මහතා.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙතයි.

1995 අංක 8 සහ 2008 අංක 42 දරන පනත් මඟින් සංශෝධිත 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනත මඟින් පිහිටුවා වන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ - CRIB - මෙහෙයුම් සහ අධීක්ෂණය සම්බන්ධයෙන් ස්ථාවර නියෝග යටතේ පහත ප්‍රශ්නය මතු කිරීමට කැමැත්තෙමි.

1. අඩු ආදායම්ලාභී සහ ග්‍රාමීය ප්‍රජාවන්ට මූල්‍ය සේවා සැපයීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ ණය තොරතුරු වෙත

ප්‍රවේශ වීමේදී හෝ සත්‍යාපනය කිරීමේදී බොහෝවිට සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙන සමුපකාර සමිති, සමෘද්ධි බැංකු සහ ග්‍රාමීය බැංකුවලට ණය වාර්තා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයට සෘජු ප්‍රවේශය ලබා නොදෙන්නේ ඇයි?

2. ණය තොරතුරු වාර්තා බොහෝවිට ණය පියවීම්වල නිවැරදි තත්ත්වය පිළිබිඹු නොකරන බවත්, එමඟින් නව ණය පහසුකම් ලබා ගැනීමට පුද්ගලයන්ට ඇති හැකියාවට අහිතකර ලෙස බලපාන බවටත් පැතිර යන මහජන පැමිණිලි විසඳීමට CRIB එක ගෙන ඇති පියවර මොනවාද?

3. බලපෑමට ලක් වූ ණය ගැතියන්ට ඔවුන්ගේ හිඟ වගකීම් පියවීමට සහ ඔවුන්ගේ ණය වාර්තා නිවැරදි කිරීමට හැකි වන පරිදි, දැනටමත් බලපත්‍ර අවලංගු කර ඇති හෝ අක්‍රියව ඇති බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී සහ ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී වැනි බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ණය දත්ත අඛණ්ඩව සහ නිවැරදිව යාවත්කාලීන කිරීම, සහතික කිරීම සඳහා CRIB ආයතනය විසින් ක්‍රියාත්මක කර ඇති පියවර මොනවාද?

4. i රුපියල් බිලියන 4.8ක් ඉක්මවන මූල්‍ය සංචිතයක් පවත්වාගෙන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය මුදල් අමාත්‍යාංශය යටතේ ගැසට් කර ඇති ආයතනයක් වුවද, විගණකාධිපතිවරයා එහි මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ නිත්‍ය විගණනය සිදු නොකරන්නේ ඇයි?

ii රජය විසින් නියාමනය කරන ලද ආයතනයකට වඩා පෞද්ගලික ආයතනයකට සමාන සීමිත රාජ්‍ය අධීක්ෂණයකින් CRIB එක ක්‍රියාත්මක වන බව පෙනෙන්නේ ඇයි?

5. ණය තොරතුරු සේවා සැපයීමේ ලාභදායී ව්‍යාපාරයක නියුක්ත වෙමින් තීරණාත්මක මහජන කාර්යයක්ද ඉටු කරන රාජ්‍ය ආයතනයක් වුවද, CRIB එක පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ - COPE එකේ - අධීක්ෂණයට ලක් නොවන්නේ ඇයි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. මෙම පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන පමණක් කාර්යාංශය වෙත ණය තොරතුරු සැපයීමට සහ ඒවා පරිශීලනය කිරීමට හිමිකම් ලබනවා. කාර්යාංශය සමඟ සිදු කරන සියලුම දත්ත හුවමාරු කටයුතු, ඒවායේ නිවැරදිතාව, අඛණ්ඩතාව තහවුරු කෙරෙන ප්‍රමිතීන්ට හා ක්‍රමවේදවලට යටත්ව ඒක සිදු කරනවා. කෙසේ වෙතත්, සමුපකාර සමිති, සමෘද්ධි බැංකු, ග්‍රාමීය බැංකු ආදී ආයතන මහ බැංකුවේ නියාමනයන්ට යටත් වෙන්නේ නැහැ. ඒ නිසා මේ කටයුතු පාලනය වෙන්නේ වෙනම පනතකින්.

2 සහ 3 ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දීමට ප්‍රමාණාත්මක තොරතුරු ලබා ගන්න අවශ්‍ය වෙනවා, ආයතන දෙකක් සම්බන්ධයෙනුත් ප්‍රශ්නය ගොනු කරලා තිබෙන නිසා. එම නිසා ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාගෙන ඉදිරියේදී ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු ලබා දීමට කටයුතු කරනවා.

4. i 1990 අංක 18 දරන ණය තොරතුරු කාර්යාංශ පනතේ 18වැනි වගන්තියට අනුව විගණකාධිපති විසින් එහි ගිණුම් විගණනය කළ යුතු බවට වූ ප්‍රතිපාදනය පසුකාලීනව යම් හේතුවක් මත විගණකාධිපතිවරයා එම කාර්යයවලින් ඉවත් කරලා තිබෙනවා. මූලිකව ඒ පනතට අනුව විගණකාධිපතිවරයාට ඒ මූල්‍ය විගණනය කිරීමේ බලය තිබෙනවා. කෙසේ වුවද, නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විසින් 2024 අගෝස්තු මස 12වැනි දින ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මහ ලේකම් වෙත නිකුත් කරන ලද ලිපිය මඟින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය රාජ්‍ය ආයතනයක් ලෙස සැලකිය යුතු බවට උපදෙස් ලබා දී තිබෙනවා. ඒ අනුව භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED/S/CRIB/6/11, 2025.06.18 දිනැති ලිපිය මඟින් 2024 අංක 24 දරන මූල්‍ය කළමනාකරණ පනත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ඇතුළු මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ හා මාර්ගෝපදේශවලට අනුගත වෙමින් කටයුතු කළ යුතු බවට විගණකාධිපති වෙතද පිටපතක් සහිතව ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සභාපති වෙත උපදෙස් ලබා දී තිබෙනවා. ඊට අමතරව විශේෂයෙන්ම කළමනාකරණ විගණන කටයුත්තක් සිද්ධ කරලා තිබෙනවා, 2025.04.21 දාතමව. ඒ විගණන වාර්තාව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ආයතනික කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කරලා තිබෙනවා.

එහි තිබෙන්නේ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙහි මූල්‍ය පරිපාලනය, ප්‍රසම්පාදන කළමනාකරණය සහ කළමනාකරණය පිළිබඳ විගණන වාර්තාව. එහි බලය, පසුබිම, විෂය පථය පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ඒ වාගේම, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ කාර්යභාරය ඒ පනතේ 7(a) වගන්තියට අනුව පැහැදිලිව ඉදිරිපත් කර තිබෙනවා. එහි කාර්යයන් තුළ තිබෙනවා, විශේෂයෙන්ම කාර්යාංශයේ සාමාජිකත්වය දරන බැංකු සහ මූල්‍ය ආයතනවල අදාළ ණය හා මූල්‍ය තොරතුරු ඒ අදාළ පුද්ගලයන් සහ ආයතනවල ඉල්ලීම පරිදි ලබා දීම, ඒ වාගේම credit ratings සම්බන්ධයෙන් කටයුතු කිරීම යනාදී වශයෙන් කොහොමද මේ මූල්‍ය තොරතුරු, ණය තොරතුරු ලබා දීම කළමනාකරණය කරන්නේ කියලා. ඒ පිළිබඳව විගණන වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. මෙක කළමනාකරණ විගණන වාර්තාවක්. මම මේ වාර්තාවත් **සභාගත*** කරනවා, ඒ විගණනයේ මැදිහත්වීම පරිශීලනය සඳහා.

ඊළඟට, මෙම ආයතනයේ තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් එක් පැත්තකින් රහස්‍යභාවය රැකීම ඉතාම වැදගත් වෙනවා. අනෙක් අතට, ඒ ආයතනයේ වගවීම ද අත්‍යවශ්‍ය බව මම පෙන්වා දෙන්න කැමැතියි.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු අනිල් ජයන්ත මහතා]

ii. මුදල් ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මීට පෙර ද විවිධ අවස්ථාවලදී ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය රාජ්‍ය ආයතනයක් ලෙස කටයුතු කළ යුතු බව දන්වා යවා තිබෙනවා. එහිදී CRIB එක හා මුදල් අමාත්‍යාංශය අතර සමීප සම්බන්ධතාවක් මෙන්ම රාජ්‍ය මූල්‍ය විනයෙහි තුලනයක් ඇති කිරීමේ අවශ්‍යතාවත් පෙනී යනවා.

5. මෙම කාර්යාංශය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විෂය පථයට අයත් විය යුතු ආයතනයක්. ඒ අවශ්‍යතාවට අනුව මෙම කාර්යාංශය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට කැඳවීමේ හැකියාව තිබෙනවා. මෙම කරුණු කාරණා විශේෂයෙන්ම මා කලින් සඳහන් කරපු විගණන වාර්තාවේත් යම්තාක් දුරකට සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා එහි කාර්යභාරය සහ විෂය පථය ගත්තොත්, විශේෂයෙන්ම වගවීම, තොරතුරුවල රහස්‍යභාවය රැකීම සහ ණය දීමේදී, ණය ගැනීමේදී තිබුණු අවදානම් අවම කර ගැනීමත් අයත් වෙනවා. ඒ කියන්නේ, මූල්‍ය කළමනාකරණයේ විනය ආරක්ෂා කර ගැනීමේ කාර්යයේදී විශේෂ වැඩකටයුත්තක් කරන රාජ්‍ය ආයතනයක්, මේක.

2 සහ 3 ප්‍රශ්නවලට අදාළ පිළිතුර දීර්ඝ විස්තර සහිතව ඉදිරියේදී ලබා දෙන්න කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු අමාත්‍යතුමනි, ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධ දත්ත දැනට CRIB එකේ අන්තර්ගත වෙනවාද, ඊට අමතරව අනාගතයේදී හෝ ක්ෂුද්‍ර මූල්‍ය දත්ත, telephone bills, utility bills වාගේ දේවල් මේකට අදාළ කර ගැනීමේ අවස්ථාවක් පවතිනවාද, ඒ සම්බන්ධ යෝජනාවක් තිබෙනවාද කියා දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු මන්ත්‍රීතුමා, ක්ෂුද්‍ර මූල්‍ය කියන්නේ දීර්ඝව සාකච්ඡා කළ යුතු මාතෘකාවක්. සරලව ගත්තොත්, මෙය විශාල පරාසයක් තිබෙන ක්ෂේත්‍රයක්. ක්ෂුද්‍ර මූල්‍ය කිව්වාම විවිධ ආකාරයෙන්, ඇත්තටම ඒක ක්ෂුද්‍ර මූල්‍ය ද, නැද්ද කියා සොයන්න බැරි ආකාරයකට විවිධ ආයතන මැදිහත් වෙලා කටයුතු කරනවා. බැංකු, බැංකු නොවන මූල්‍ය ආයතන මේ සම්බන්ධයෙන් තිබෙනවා. මේවායින් අගතියට පත් වෙච්ච පාර්ශ්ව ඉන්නවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය මැදිහත් වෙලා අදාළ කටයුතු කරමින් නිසි ලෙස ඒ මුදල් විනය, ණය දීම, ණය ගැනීම කළමනාකරණය සහ ඒවා පරිපාලනය කිරීම පිළිබඳ දැනටමත් කටයුතු ආරම්භ කර තිබෙනවා. ඉදිරියේදී එය යම් විධිමත් පද්ධතියකට ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.
පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ජූලි 24 වන බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி. ப 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.
அதன்படி பாராளுமன்றம், 2025 யூலை 24, வியாழக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.
Parliament adjourned accordingly until 9.30 a.m. on Thursday, 24th July, 2025.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.